# 2045
# ලංකාවේ ඉරණම

## නිදහස් අධ්‍යාපනය හා ධරණීය සංවර්ධනය
## Free Education and Sustainable Development

# 2045
# ලංකාවේ ඉරණම

---

## නිදහස් අධ්‍යාපනය හා ධරණීය සංවර්ධනය
## Free Education and Sustainable Development

ආසියානු මානව හිමිකම් කොමිසමේ අධ්‍යක්ෂක

**ජ්‍යෙෂ්ඨ නීතිඥ බැසිල් ප්‍රනාන්දු**

**විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය**

2045 ලංකාවේ ඉරණම

---

© බැසිල් ප්‍රනාන්දු

---

ප්‍රථම මුද්‍රණය : 2021

---

ISBN : 978 - 955 - 691 - 000 - 0

---

පිටකවරය : පුෂ්පානන්ද ඒකනායක

---

පරිගණක පිටු සැලසුම : පුෂ්පානන්ද ඒකනායක
'ද ෆොන්ට් මාස්ටර්'
45/96 නාවල පාර, කොළඹ 05.
(පොනිති 12 අභය ෆොනුරුවෙනි.)

---

මුද්‍රණය : විජේසූරිය එන්ටර්ප්‍රයිසස්

---

ප්‍රකාශනය : **විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය**
812, මරදාන පාර,
පුංචි බොරැල්ල,
දුරකථනය : 2696675

# හැඳින්වීම

## 2045 පරපුරේ ඓතිහාසික ඉරණම

වසර 2045 දී ශ්‍රී ලංකාවට නිදහස් අධ්‍යාපනය ලැබී ශතවර්ෂයක් පරිසමාප්ත වීම සමරනු ලබනු ඇත. 20 වන ශතවර්ෂය පටන් ගැනීමෙන් පසු ලංකා ඉතිහාසයේ සිදු වූ අතිශයින්ම වැදගත් සිද්ධිය වන්නේ නිදහස් අධ්‍යාපනය සඳහා වන අයිතිය සියලුම ජනතාවට හිමි විය. එය ලංකාවේ මේ දක්වා අත්පත් කොට ගත් ඉහලම සමාජ සංවර්ධන ජයග්‍රහණය පමණක් නොව අනාගත ලංකාව කුමක්ද යන්න නිර්ණය කරන ඉතාම වැදගත්ම සාධකයක් සේද කැපී පෙනෙනු ඇත.

නිදහස් අධ්‍යාපනයේ ශත සංවත්සරයෙන් අවුරුදු 3 කට පසු නිදහස ලැබීම පිළිබදව ශත සංවත්සරයද සමරනු ඇත. එය පිළිබදව ඇත්තේ නිදහස් අධ්‍යාපනය පිළිබදව පවතින සමාජ පිළිගැනීමක් නොව, බරපතල ලෙස කලකිරීමක් හා දැඩි විවේචනයකි. කෙටියෙන් කිවුවොත් නිදහස් අධ්‍යාපනයේ පරමාර්ථ හා මේ දක්වා ලංකාවේ නිදහසෙන් පසු දේශපාලන අභිමතාර්ථවල ප්‍රයත්න හා ක්‍රියාකාරීත්වය අතර ඉතා දැඩි පරස්පර විරෝධයක් පෙනෙන්නට ඇත.

නිදහස් අධ්‍යාපනයේ අභිලාශය හා නිදහසෙන් පසුව ඇති වූ දේශපාලනය පදනම වී ඇති සංකල්ප අතර ඇති ගැටීම විසඳනු ඇත්තේ කුමන බලවේගය අනාගතයේදී වඩා බලපෑමක් ඇති

කරාවිද යන ප්‍රශ්නය මත ය. මේ ලිපියේ පදනම වී ඇත්තේ අනාගතයේදී මේ දක්වා පවත්වාගෙන ආ දේශපාලන ක්‍රමය යටපත් කරමින් නිදහස් අධ්‍යාපනයේ අභිලාශය පදනම වන සමාජ ක්‍රමයක සංකල්පයන් ලංකාව තුල වඩාත් පැලපදියම් වේය යන අනාගත දැක්ම තුළ ය.

## නිදහස් අධ්‍යාපනයේ අභිලාශය

නිදහස් අධ්‍යාපනයේ අභිලාශය කුමක් ද? එහි අභිලාශය වූයේ සකල ජනතාවගේ අධ්‍යාපන මට්ටම ඉහළ දැමීම තුලින් ඔවුන්ට ජීවිතයේ මෙතෙක් අත්පත් කර ගැනීමට බැරි වූ දේ අත්පත් කර ගැනීමට හැකියාව ඇති කිරීමය. අධ්‍යාපනයේ දියුණුව මගින් ජනතාවගේ දැනීමේ වර්ධනයක්ද, කල්පනා කිරීමේ හැකියාවේ වර්ධනයක්ද, තමන්ගේ උවමනාවන් වඩා හොදින් ඉටුකර ගන්නේ කෙසේද යන්න පිළිබදව වැඩි අවබෝධයක්ද වැඩි දියුණු වීම බලපොරොත්තු විය. එමෙන්ම සමාජයේ සාමූහික පිළිගැනීම් හා වටිනාකම් පිළිබදව වඩා ගැඹුරු අවබෝධයක් මත පදනම් වීල අනාගත ලංකාවට වඩා සුදුසු සාමූහික මානසික තත්වයන් හා ඒ මත පදනම වූ සමාජ රටාවන් නිර්මාණය කර ගැනීමට හැකිවේය යන බලාපොරොත්තුවද අඩංගු විය.

නිදහස් අධ්‍යාපනයෙන් පසු අවුරුදු 75 කට කිට්ටු කාලයක් තුල මේ අභිලාශයන් කොතෙක් දුරට ඉටු වී තිහේද? සෑම බලාපොරොත්තුවක් මෙන්ම නිදහස් අධ්‍යාපනයෙන් ඇති වූ බලාපොරොත්තුද සාක්ෂාත් වීම දෙස බැලිය යුත්තේ පරිණාමවාදී ආකල්පයකිනි. එනම් ඉතා කුඩා දෙයින් පටන් ගෙන ටිකින් ටික ඇතිවන වර්ධනයක් මෙන්මල වර්ධනය තුලින් ඇතිවන පසුබෑම්ද ඒ පසුබෑම් ජය ගැනීම සදහා කරනු ලබන ප්‍රයත්නයන්ද ආදිය තුලින් පරම්පරාවෙන් පරම්පරාවට වර්ධනය වන යම් සමාජීය ජයග්‍රහණයන් මේ පරිණාමවාදී සංකල්පයෙහි අන්තර්ගත වේ.

## එදා සහ අද

නිදහස් අධ්‍යාපනයේ වර්ධනය සිදුවන්නේද ඒ ආකාරයෙන්මය. මුලුමනින්ම මෙන්ම සාමාන්‍ය ජනතාවට ගැඹුරු අධ්‍යාපනයකට

ඉඩකඩ වසා තිබූ සමාජයක් තුල නිදහස් අධ්‍යාපනය ටිකින් ටික ව්‍යාප්ත වීමට පටන් ගත්තේය. නිදහස් අධ්‍යාපනය පවත්වාගෙන යාමට අවශ්‍යය ගුරුවරුන් නිර්මාණය කර ගැනීම, පාසල් ආදිය නිර්මානය කර ගැනීම හා මේ සියල්ලටමත් වඩා වැඩිහිටි ජනතාවට තමුන්ගේ දරුවන්ට වැඩි අධ්‍යාපනයක් ලබාදීම පිළිබඳව ආශාව හා උනන්දුව වර්ධනය කර ගැනීම ආදිය මෙන්ම, අධ්‍යාපනයට අවශ්‍යය වන පත පොත ආදිය වර්ධනය කර ගැනිම්ද සිදු වූයේ අඩියෙන් අඩියය. මේ වන විට එම ක්ෂේත්‍රයන් තුල විශාල වෙනසක් දැක ගත හැකි ය.

ලංකාවේ බොහෝ පළාත්වලම පාසල් පවතී. මේ සමහර පාසල් කෙරෙහි දක්වන උනන්දුව මන්දගාමීය යන විවේචනයද ඒ සමගම පවතී. කෙසේ උවත් 1945 පමණ වන විට පැවති අධ්‍යාපන පහසුකම් හා අද පවතින අධ්‍යාපන පහසුකම් අතර ඇත්තේ අතිවිශාල වෙනසකි. අතිවිශාල ප්‍රමාණයකින් මේ පහසුකම් පළල් වී ඇත. එමෙන්ම ඉහළ අධ්‍යාපනයට වැඩි දෙනෙකුගේ යොමුවීම තුලින් අධ්‍යාපන කටයුතු කරගෙන යාමට අවශ්‍යය වන මානව සම්පතද බිහි වී ඇත. විද්‍යාව වැනි නිදහස් අධ්‍යාපනයේ මුල් කාලයේදී වැඩි පළල් ජනතාවට අධ්‍යාපනයක් ලබා ගැනීමට නොහැකිව පැවතුනු විෂයන් අද ඉතා පළල්ව පැතිර ගොස් සියලුම ගම්මානයක මෙන්ම විද්‍යාව විෂය පිළිබඳව අවබෝධයක් ඇති හා අධ්‍යාපන සුදුසුකම් ඇති අයද සිටිති. විද්‍යාව මෙන්ම අන් සියලු විෂයන් සම්බන්ධයෙන්දල එවැනිම විශාල පළල් දැනීම් සම්බාරයක් ඇති ජන කොටස්වල වර්ධනය ඇත්තේ නව ප්‍රාතිහාර්යාත්මක මට්ටමකින් වර්ධනය වී පවතී.

මේ සියල්ලටම වඩා තමන්ගේ දරුවන්ට අධ්‍යාපනය ලබාදිය යුතුය යන පිළිගැනීම සමාජය තුල පළල් වී පවතිනවා පමණක් නොව ඒ සඳහා විශාල වශයෙන් වෙහෙස මහන්සි වී රැකියාවල යෙදෙන දෙමාපියන්ගේ ගති පැවතුම්ද පළල්ව වෙනස්ව ගොස් ඇත. බොහෝ වැඩිහිටියෝ තමන්ගේ ජීවිතයේ වැඩිම ශක්තියක් ඇති කාලපරිච්ඡේදය ගත කරන්නේ දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා අවශ්‍යය මූල්‍ය සම්පත් අත්පත් කර ගැනීම හා වියදම් කිරීම මගිනි. මූල්‍ය සම්පත් ලබාදීම නොව දරුවන්ගේ අධ්‍යාපනයට ඔවුහුද සම්බන්ධ වෙති. පාසල් යන දැරුවාට අකුරු කියාදීමේ හා වෙනත් විෂයන් කියා දීමේ හැකියාව බොහෝ දෙමව්පියන්ට

පවතී. 1945 අසල කාලපරිච්ඡේදයන්හි එම හැකියාව ලංකාවේ බොහෝ පවුල් තුල පැවතුනේ නැත. මෙය සමාජයක් විසින් අත්පත් කර ගන්නා ඉතා විශාල ජයග්‍රහණයකි.

මේ ජයග්‍රහණයන් තුල දැඩි කලකිරීම්ද ඇති බවද ඉතා පැහැදිලිය. නිදහස් අධ්‍යාපනය නිසා අධ්‍යාපන සුදුසුකම් ලබා ගනමින් සමාජයේ වැඩි සහභාගිත්වයක් පෙන්නුම් කිරීමට හැකි විශාල කොටස් වලට ඒ සඳහා ඇති ඉඩකඩ ඇහිරී ගොස් ඇත. මේ නිසා අධ්‍යාපනයේ මාර්ගයෙන් දියුණු විය හැකි යි යන අදහසද අඩපන වෙමින් පවතී. ප්‍රසිද්ධ නාට්‍ය කරුවකු විසින් ,අපට පුතේ මගක් නැතේ, යනුවෙන් විසිවන ශත වර්ෂයේ අග භාගයේදී නිර්මානය කරන ලද නාට්‍ය, මේ හැඟීම සටහන් කරයි. එසේ වුවත් මූලිකවම රට පුරා ඇත්තේ අධ්‍යාපනය හැරදමා වඩා පසුගාමී තත්වයකට නැඹුරුවීමේ උවමනාව නොව දැන් පවතින අමාරු තත්වය තුලදි ඇතිවන ගැටලු වලටත් මුහුන දී වඩා හොද අධ්‍යාපණයක් තම දරුවන්ට ලබාදීමේ ආශාවය.

මෙය සාමාන්‍ය ජනතාව අතර වඩාත් ප්‍රකාශයට පත්වූයේ පිටරට රැකියා සොයමින් යන ජනගහනයේ ප්‍රමාණය විශාල වශයෙන් වැඩිවීමත් සමගමය. මෙසේ පිටරටවල අමාරු රස්සාවල් පවා කිරීමට පෙළඹෙන වැඩිහිටි ගැහැණු පිරමි ඔවුන්ගේ අභිලාශය කරගෙන ඇත්තේ දරුවන්ට අධ්‍යාපනයක් ලබාදීම හා තම පවුල්වලට ජීවත් වීමට නිවාස බිහිකර ගැනීමය. වැඩි ආදායමක් පිටරටින් උපයා ගන්නා මේ වැඩිහිටියෝ හොදය යි සලකනු ලබන අධ්‍යාපනයක් සොයා වැඩි වියදමක් දරා හෝ තම දරුවන් සඳහා සුදුසු පාසල් සොයති. ඒ අනුව පාසල් ක්‍රමය තුලත් එක්තරා ප්‍රමානයකට ගෙවා අධ්‍යාපනය ලබා ගන්නා ක්‍රමද පළල් වී ඇත. මේ ආකාරයෙන් වැඩි අධ්‍යාපනයක් සඳහා සමාජයේ ඇති උවමනාව අධ්‍යනය කිරීම තුලින් ලංකාවේ සැබෑ තත්වය පිළිබඳ ව වැඩි අවබෝධයක් ලබාගතත හැකිවනු ඇත.

## නිදහස් අධ්‍යාපනයේ අභිලාෂ හා ගරා වැටුනු දේශපාලන ක්‍රමය අතර ඇති ගැටුම

නිදහස් අධ්‍යාපනයේ අභිලාෂ හා නිදහසෙන් පසුව ඇති වූ දේශපාලන ක්‍රමය අතර බරපතල ගැටීම් අඛණ්ඩව පැවත ඇත.

ලංකාවේ ඇති වූ ප්‍රචණ්ඩත්වයට යොමුවූ ජනතා විමුක්ති පෙරමුණ එල්.ටී.ටී.ඊ. හා ඊට අනුබද්ධ ව්‍යාපාර දෙමළ තරුණයන්ගේ ව්‍යාපාරයන් වල වැඩි ශක්තියක් දැරූ නායකයන් බිහිවූයේද නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් ලෙසය. නිදහස් අධ්‍යාපනය තුලින් තමුන් ලැබිය යුතු සමාජ තත්වයන් නොලැබෙන තත්වයක් තුල හා සමාජය අවශ්‍යය වේගයකින් වෙනස් නොවන තත්වයක් තුලල එය ප්‍රචණ්ඩ අරගල වලින් කරගත හැකි ය යන මිත්‍යාවක් මේ මුල් පරම්පරාවන් තුල ඇති විය.

බලාපොරොත්තු ඉටුකර ගැනීම පිළිබඳව සමාජයේ ඇතිවන වෙනස්කම්ද ඇතිවන්නේ පරිණාමවාදී ආකාරයකිනි. මේ අනුව ප්‍රචන්ඩ අරගල කාලය දෙස බැලිය යුත්තේ අධ්‍යාපනයෙන් දියුණු වන නමුත් සමාජ බුද්ධිය අතර තවමත් පසුගාමී තත්වයක පසුවන නව කණ්ඩායම් තුලින් තමුන්ගේ ශක්තිය වැඩි කිරීමට ගන්නා අසාර්ථක ප්‍රතිඵලයන්ය. එහෙත් මේ අසාර්ථක ප්‍රතිඵල වලින් යම් ඵලයක්ද ඇත.

එනම් කල වැරදි අවබෝධ කරගැනීමේ අවශ්‍යතාවය සමාජය තුල මතු වීමය. ප්‍රචණ්ඩත්වය නිදහස් අධ්‍යාපනයේ ඵල නෙලා ගැනීමේ උපක්‍රමයක් නොව එය පසු පස්සට ඇද දැමීමටත් එම නිදහස් අධ්‍යාපනය තුලින් මල් ඵල ගැන්වී උපදින තරුණයන්ගේ ජීවිත වලින් විශාල ගණනක් හානියටත් මෙන්ම සමාජයේ ප්‍රතිග ාමී බලවේග වල වර්ධනයටත් හේතු වන සාධකයක් බවල දැන් ලාංකීය සමාජය තුල පැතිර පවතින අදහසකි.

මේ නිසා ඉදිරියට ඇතිවන වෙනස්කම් වලදී එවනි මාර්ගවල නොව වඩා මුහුකුරා ගිය මනසකින් සමාජය තේරුම් ගනමින් ඒ සමාජය තුල තමුන්ගේ සහභාගිත්වය වැඩි කර ගැනීමට දරණ උත්සාහය තුලින් තමන්ටත් සමස්ත සමාජයටත් වඩා හොද තත්වයක් නිර්මාණය කරගැනීමේ අභිලාශයද දැන් ජන මනස තුල නිර්මාණය වී හමාරය. මේ අනුව නිදහසින් පසුව ඇතිවුනු දේශපාලන පර්යේෂණ වල අසාර්ථකත්වය පිළිබඳව ඇති අවබෝධයත්ල නිදහස් අධ්‍යාපන ක්‍රමයෙන් ඵල නෙලා ගැනීම තුලින් ඇති අවශ්‍යතාවය උපදින අභිලාෂයනුත් එකිනෙක ගැටීමෙන් පවතී. මේ ගැටීම ඉදිරි අවුරුදු 24ක පමණ කාලය එනම් නිදහස් අධ්‍යාපනයේ ශත සංවත්සරය සමරන කාලය වන විට

කොයි දිශාවකට ගමන් කරාවිද. මෙය අද සමාජය තුල පවතින විශාලම ප්‍රශ්ණයකි.

## නව පරපුරක්

අද උපදින දරුවා 2045 වර්ෂය වන විට අවුරුදු 24 ක් වයසැති වනු ඇත. අද පාසල් ජීවිතයේ ඉන්නා දරුවන් වැඩි දෙනෙකුගේ වඩා ක්‍රියාකාරී ජීවිත කාලයද මේ කාලය වනවා ඇත. මේ නිසා අනාගත ලංකාව බිහි කරන්නෝ ඔවුන් වෙනවාට සැකයක් නැත.

මෙසේ බිහිවන නව පරම්පරාව කුමන වර්ගයේ එකක්ද? එය හුදෙක්ම සාධනීය වශයෙන් පමණක් නොව සාධනීය නොවන පැත්තත් අනුව බලා තේරුම්ගත යුතු කරුණකි.

වඩා සාධනීයත්වයෙන් බලන කල ඔවුහු මෙතෙක් ලංකාවේ ජීවත් වූ සියලුම පරම්පරාවලට වැඩි ගතානුකත්වයෙන් අඩු පරම්පරාවක් වනු ඇත. අතීතයට තිබූ බැඳීම් ඉතා ගැඹුරු ලෙසින් කැඩී ඇති අතර ඔවුන් එම දිසාවට යොමු කර ගැනීමට කරන ප්‍රයත්නයන් කල් පවතින ඒවා නොවනු ඇත.

මේ නව පරම්පරාව වැඩි ස්වාධීනත්වයකින් යුතු පරම්පරාවකි. එමෙන්ම අවුරුදු 100 අධ්‍යාපන කාලය තුලින් ඇතිවුනු අභ්‍යන්තර හා සමාජ අදහස් හුවමාරු කිරීම් වල උරුමයද ඔවුන් සතුව ඇත. එම නිසා ප්‍රකාශයට පත් වූවත් නොවූවත් ඔවුන් තුල වඩා ගැඹුරු සමාජ අවබෝධයක්ද පැළපදියම් වී ඇත. මේ සියල්ලටම වඩා වැදගත් වන්නේ අතීත කාලය තුල සමාජයේ වැඩි කොටසක් තුල පටවා තිබූ බියේ සංස්කෘතිය හා යටහත් පහත් බාවයේ සංස්කෘතීන්ගෙන් මේ තරුණ පරපුර අත්මිදීමට කරන ප්‍රයත්නය මෙතෙක් ලංකාවේ කිසිම සමාජ අවධියක සිදු වූ ප්‍රමාණයට වඩා වැඩි වනු ඇත. ඔවුන්ගේ ප්‍රකාශන මාධ්‍ය හා සහභාගි වීමේ මාධය පෙර පරම්පරාව වල මාධ්‍යන්ට වඩා වෙනස් වනවාට කිසිම සැකයක් නැත. එයට හේතුව ලෝකය පුරාම අද අත්දකින අදහස් හුවමාරු කර ගැනීමේ ක්‍රමයන් තුල ඇති වී ඇති මහා විප්ලවය ලෝකයේ කෙදිනකවත් නුදුටු ප්‍රමාණයේ මහා පරිමාන සිදුවීමකි. මේ මහා පරිමාණ සිදුවීමෙන් පරිබාහිරව සිටීමට අතීතයේදී උත්සාහ කරන

ලද නමුත් අනාගතයේදී එවනි ප්‍රයත්නයන් කෙරෙහි නැගී එන තරුණ ජනතාවගේ ආකර්ශණයක් ඇති නොවීම ස්වභාවිකය.

මේ අනුව නව පරම්පරාවන් ඔවුන්ගේ සමාජ සහභාගිත්වය සඳහා නව උපක්‍රමයන් හා බුද්ධිමය හැකියාවන් වර්ධනය කරගනු ඇත. එම නිසා සහභාගීත්ව සදහා පවතින උනන්දුව හුදෙක් පාර්ලිමේන්තුවේ ආසනයක් ලබා ගැනීමට හෝ පක්ෂයක් පසු ගමන් කරමින් යම් ලාභ ලබා ගැනීමට හෝ බලවතුන් පසුපස ගමන් කිරීමෙන් යන ගමනක් නොව ස්වාදීන ක්‍රියාවලිවක් වනු ඇත. තමන්ගේම යහපත හා පොදු යහපත අතර එකමුතුවක්, එකගතාවයක් ඇති කර ගැනීමට කරන උත්සාහය නව පරම්පරාවේදී දකින්නට ලැබෙනු ඇති බවද අනාවැකියක් පමණක් නොවනු ඇත. එය හේතු ඵල වශයෙන් ඇති වන සිද්දිමය ක්‍රියාධාමයක් ලෙස ප්‍රකාශයට පත් වනු ඇත.

මේ වෙනස්කම් තුල ඇති වන සාධනීය නොවන අංශයන් වශයෙන් සිදු වන්නේ බොහෝ විට දේශපාලන ක්‍රමය විසින් පරාජයට පත් කරනු ලැබූ මිනිසුන් ගේ දරුවන් වන මේ තරුණ පරම්පරාව තුලද කලකිරීමේ මානසික තත්වයක් පැතිරීමද වැලැක්වීම නොහැකි වනු ඇත. ඔවුහු හොද තත්වයක්, වඩාත් හොද තත්වයක් බවට පත් කර ගැනීමට උත්සාහ කරන පරම්පරාවක් නොව ඉතාමත් නරක තත්වයක් සාධනීය තත්වයක් බවට හරවා ගැනීමට උත්සාහ කරන පරම්පරාවක් වනු ඇත.

මෙය පුද්ගලික අංශයේ මෙන්ම සමාජය තුලත් විවිධ ගැටීම් ඇතිවීමට හේතු විය හැකි ය. පුද්ගලික ක්ෂේත්‍ර තුලදි ගතානු ගතික සමාජයෙන් වෙන්වීමත් සමගම සමහර සමාජීය වගකීම් අතහැර දැමීමත් මේ පරම්පරාව තුලින් සිදු විය හැකි ය. එනම් තමන්ගේ වැඩිහිටි දෙමාපියන් ආදීන්ගෙන් හා වැඩිහිටියන් පිළිබදව ඇති යුතුකම් වලට බැදී නොසිට තමන්ගේම පැවැත්ම පිළිබදව යොමු වීමක්ද මෙවනි සමාජ තත්වයක් තුල ඇතිවිය හැකි කනගාටුදායක ක්‍රියාදාමයකි. සමාජ ගතානුගතිකත්වයකින් වෙනස් වීම හා සමාජයක ආචාරධර්ම හා සධාචාරධර්ම වලින් වෙන්වීම යනු එකක්ම නොවේ. එය බොහෝ විට එකිනෙකට පරස්පර විරෝධීය. එහෙත් පරිනාමයේ යම් අවස්ථාවන් වලදී මෙවනි ගැටීම් ඇති වීමද වැලැක් විය නොහැකි ය. මේ නිසා සමාජ සුභ සාධනය හා සාරධර්ම වර්ධනය පිලිබද කටයුත්තේදී කුමන මාවතක් ඇතිවේද

යන්න කල්පනාවට බාජනය කිරීම අනාගතය පිලිබදව සොයා බලන කාගේ උනත් වගකිමක් වනු ඇත.

## නව බුද්ධිමය රටාවක අවශ්‍යතාවය

මෙයින් කියවෙන්නේ අනාගත පරම්පරාව කොපමණ ප්‍රමාණයකට තමන් තුල ඓතිහාසිකව හමිකර ගැනීමට හැකියාව ඇති අභිමතාර්ථයන් සැබැවින්ම අත්පත් කර ගනීවිද යන ප්‍රශ්ණය බොහෝ දුරට නිරාකරණය වනු ඇත්තේල මේ පරම්පරාව හා බද්ධව වර්ධනය වන ලංකාවේ නව බුද්ධිමය පරම්පරාවක් තුලින් පමණය. දැනීමේ වර්ධනය පමණක් අධ්‍යාපනයේ අරමුණ නොවේ. නිදහස් අධ්‍යාපනයේ මල් ඵල දැරීම සිදුවන්නේ එය ලාංකික සමාජය තුල ඇති කල්පනා කිරීමේ හැකියාව වඩා ඉහල මට්ටමකට දමනතාක් තුරු පමණය. මෙය දැඩි ප්‍රයත්නයකින් ඉටු කල යුතු විශාල වගකීමකි. වෙනස් සමාජයන් දෙස බලන කල බුද්ධිමය වර්ධනයන් කොතෙක් ප්‍රමාණයකට සමාජ වර්ධනයන් කෙරෙහි බලපෑවාද යන්න ඉතා පැහැදිලිව දැක ගත හැකි ය. ලාංකීය සමාජය තුලද අද වැඩිම සාධනීය බලපෑමක් ඇත කිරීමේ හැකියාව ඇත්තේ වඩා ගැඹුරින් රටේ ඇති ප්‍රශ්ණ මෙන්ම, ලෝකයේ ඇති ගැටලුද කිරා බලා එම තත්වයන් තුලින් වඩා සාධනීය ජීවන ක්‍රමයන් හා සමාජ පද්ධතියක් ගොඩනගා ගැනීම කෙරෙහි වැඩි කල්පනා ශක්තියක් පොදු ජනතාව තුලම ඇති කරන්නනේ කෙසේද යන ප්‍රශ්ණයයි.

මේ ප්‍රශ්ණය විසඳා ගැනීමේ හැකියාවද අනාගත පරම්පරාව තුල ඇත. එයට හේතුව නම් ඔවුහු පරාජයන්ගේ ගැඹුරු බර හා වේදනාව තමන්ගේ අභ්‍යන්තරික මානසික තත්වයන් තුල පැලපදියම්ව ඉපදුනු පරම්පරාවක් වන නිසාය. වේදනාව ලෝකයේ ඇත බලවත්ම ගුරුවරයා වේ. සමාජයේ ඇති වී ඇති සියලුම විශාල වෙනස්කම් පිටුපස ඇත්තේ යම් කාල පරිච්ඡේදයන්හි එක් එක් සමාජයන් තුල ඇති වූ ඉතා වේදනාකාරී සිදු වීම්ය. ලංකාවේ පහුගිය නිදහසෙන් පසු කාලය විශේෂයෙන්ම 1978 න් පසු ඇති වූ කාලය ඉතාමත් වේදනාකාරී කාලයකි.

# පටුන

හැඳින්වීම - 2045 පරපුරේ ඓතිහාසික ඉරණම

**පළමු වන කොටස**

නිදහස් අධ්‍යාපනයේ ඵල නෙලා ගැනීම 01

නිදහස් අධ්‍යාපනයේ ඵල නෙලා ගැනීම 02

නිදහස් අධ්‍යාපනයේ ඵල නෙලා ගැනීම 03

නිදහස් අධ්‍යාපනයේ ඵල නෙලා ගැනීම 04

නිදහස් අධ්‍යාපනයේ ඵල නෙලා ගැනීම 05

නිදහස් අධ්‍යාපනයේ ඵල නෙලා ගැනීම 06

**දෙවන කොටස**

ජනතා ඉතිහාසයක අවශ්‍යයතාවය.

ජන ජීවිතයේ අතීතය

ආදිවාසීන් විසින් ලංකාවට දායාද කල මහා උරුමය.

අපේකම යනු කුමක්ද?

අපේකම හා සදාචාර පද්ධතිය.

අපේකමේ ආධ්‍යාත්මික පසු බිම.

කෘෂිකාර්මික අතිරික්තයක් තුලින් ඇති වුනු
සංස්කෘතික ගැටලුවක්

වෙන අතක යා හැකිව පැවතුනි

ලංකාවේ සංස්කෘතික අපරාධ විද්‍යාව පිළිබදව ප්‍රවේශයක්.

**තුන්වන කොටස**

ආසියානු සිවිල් සමාජය හා මානව හිමිකම් පිළිබඳ
ආචාරධර්ම

සාමය, යුක්තිය හා ශක්තිමත් ආයතනවලින් තොරව
කුසගින්න තුරන් කළ නොහැකි ය

සක්‍රීය රාජ්‍ය ආයතනවලින් තොරව කුසගින්න තුරන් කළ නොහැකි ය

කුසගින්න මුලිනුපුටා දැමීමේ මාර්ගය පොදු ආයතන සවිබලගැන්වීමයි

වින්දිතයන්ට උපකාර කිරීමට, ප්‍රතිපත්ති පෙරළියට හා ප්‍රතිසංවිධානයට සමර්පිත මෙන්ම විවිධාංගීකරණය වූ නිවැරදි සංවිධානයන් අවශ්‍යයි

ජනශ්‍රැති ක්‍රමවේදය තුළ අන්තර්ගත පක්ෂපාතීත්ව න්‍යාය

## පළමු වන කොටස

# නිදහස් අධ්‍යාපනයේ
# එළ නෙළා ගැනීම

# නිදහස් අධ්‍යාපනයේ ඵල නෙලා ගැනීම 01

19 වන ශත වර්ෂයේ මෙන්ම විසි වන ශත වර්ෂයේ මුල් භාගයේත් අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථාව සැලසී තිබුණේ ජනගහනයෙන් සියයට දෙකක් හා තුනක් අතර ප්‍රමාණයකට පමණි. 1944 නිදහස් අධ්‍යාපනය පැමිණීමත් සමගම අධ්‍යාපන ක්ෂේත්‍රය තුල විශාල වෙනසක් වීමට පටන් ගත්තේය. එම වෙනස වූයේ කාට වුවත් අධ්‍යාපනය ලබා ගැනීමට පුලුවන් කම පමණක් නොව දරුවන් පාසලට යැවීමද නීත්‍යානුකූලව ඇතිවුන වගකීමක් බවට පත්වීමත් සමගයි. මෙසේ සියයට දෙකකට තුනකට තිබුනු අධ්‍යාපනය පල්ල වීම තේරුම් ගැනීමට හැකි වන්නේ යටත් විජිත සමයේ දී පැවතුන අධ්‍යාපන ප්‍රතිපත්තිය තේරුම් ගැනීමෙනි.

ඉන්දියාව බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් බවට පත් විය. එසේ පත් වුන විශාලම රට ඉන්දියාවයි. ඉන්දියාව හැඳින් වූයේ බ්‍රිතාන්‍යය කිරුලේ මාණික්‍ය වශයෙනුයි. ඉන්දියාවට බ්‍රිතාන්‍යයෙන් ඉදිරිපත් කල යුත්තේ මොන විධියේ අධ්‍යාපන ක්‍රමයක්ද යන්න විශාල විවාධයක් බ්‍රිතාන්‍යයේ පරිපාලකයන් අතරත් බ්‍රිතාන්‍යයේ බුද්ධිමතුන් අතරත් ඇති විය. එක් කණ්ඩායමක් කියා සිටියේ ඉන්දියාවේ අධ්‍යාපනය සංස්කෘතික භාෂාවෙන් හා අරාබි භාෂාවෙන් කල යුතු බවයි. එයට හේතුව හින්දු සාහිත්‍ය සංස්කෘතික භාෂාවෙන් ලිය වී තිබීමත් මුස්ලිම් සාහිත්‍ය අරාභි භාෂාවෙන් ලිය වී තිබීමත් යන හේතු නිසාය. නමුත් තවත් මතයක් වුනේ ලෝකයේ මේ

දක්වා දියුණුවෙමින් තිබුණු සියලුම විද්‍යාවන් හා අදහස් ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශයට පත් වී තිබීම නිසා අධ්‍යාපනය ඉංග්‍රීසි භාෂාවෙන් කල යුතුයි කියායි. අවසානයේ දී බ්‍රිතාන්‍ය ප්‍රතිපත්තිය බවට පත් වුනේ ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය දිය යුතුය යන්නයි.

මේ විවාධයේ අවසාන නිගමනයත් පිලිබඳව යටත් විජිත අධ්‍යාපන ප්‍රතිපත්තිත් නීති ප්‍රතිත්තිත් සකස් කිරීම ගැන ප්‍රධාන මට්මින් සහභාගි වුනු මැකෝලි නැමති සාමිවරයා ලියා තිබෙනවා. ඔහු පැවසුවේ අධ්‍යාපනය ඉංග්‍රීසි භාෂාවෙන් කල යුතු බවත් රටේ සියලුම දෙනාට ඉංග්‍රීසි ඉගැන්විය යුතු බවත්ය. එහෙත් ඔහු තව දුරටත් කියන්නේ ඒ ආකාරයෙන් සියලු දෙනාටම ඉංග්‍රීසි ඉගැන්වීමේ හැකියාව බ්‍රිතාන්‍යයට පැවතුනේ නැති බවයි. එම නිසා ඔහු යොජනා කලා සුලු කණ්ඩායමකට ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යාපනය ලබා දෙන්න, ඒ කණ්ඩායම ඔවුන්ගේ භාෂා වලින් රටේ අනෙක් ජනතාවට එය කියා දෙනවා ඇතයි යන බලාපොරොත්තුව ඇතිව. එම යෝජනාව රජ්‍යය ප්‍රතිපත්තිය බවටද පත් වුනා. ඉන්දියාවේදී ඇතිකර ගත් එම ප්‍රතිපත්තිය දකුණු ආසියාවෙත්, වෙනත් සියලුම බ්‍රිතාන්‍යය යටත් විජිත වලත් ප්‍රතිපත්තියක් බවට පත් වුනා. මෙය ලංකාවේ ක්‍රියාත්මක කිරීම තුලින් කාලයාගේ ඇවෑමෙන් සියයට දෙකක් තුනක් පමණ ඉංග්‍රීසි අධ්‍යාපණය ලබා ගත්තා. ඒවා සඳහා විශේෂ පාසල් ඇති කලා. ඒ පාසල් වලින් ඉංග්‍රීසි භාෂාවෙන් විවිධ විශයන් ඉගෙන ගත් කණ්ඩායමක් ඇති වුනා. මේ කණ්ඩායම තමන් ඉගෙන ගත් දේ රටේ අනිත් අයට කියා දේවි යන බලාපොරොත්තුව වෙනුවට සිද්ධ වුනේ එසේ ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය ලබා ගත් කණ්ඩායම ඒ මාර්ගයෙන් තමන්ගේ ප්‍රයෝජන වැඩිකර ගැනීමට උනන්දු වී වෙනම විශේෂ කණ්ඩායමක් බවට පත් වීමයි.

බ්‍රිතාන්‍යය අධිරාජ්‍යයේ ඉතිහාසය පිළිබඳව පවතින එන්සයික්ලෝපීඩියා ග්‍රන්ථයේ හතර වන වෙලුමේ සඳහන් වෙනවා ලංකාවේ පහත රට කණ්ඩායමක් අලුතෙන් ඇති වූ ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා ගත් ආකාරයත් ඒ මාර්ගයෙන් එය ඔවුන් තමන්ගේම වාසියටත් තමන්ගේ සමාජ තත්වය, ආර්ථික තත්වය ඇතිකර ගැනීමටත් යොදා ගත් ආකාරය. ඉංදියාවේ මේ කණ්ඩායමෙන් කොටසක් බ්‍රිතාන්‍යයෙන් අත්මිදීමේ විමුක්ති

ව්‍යාපාරයක් පටන් ගත් අතර එම ව්‍යාපාරය විශාල වශයෙන් පළල් කිරීමට දායක වුනා.

පසු කාලීනව නිදහස් ඉංදියාවේ නායකත්වය බවට පත් වුනේ එවනි ඉංග්‍රීසි අධ්‍යාපණයක් ලැබුණු නමුත් ඒ අධ්‍යාපනයේ ප්‍රතිපලයක් ජනතාව අතරට ගෙන ඒමේ උත්සාහයක යෙදුනු බ්‍රිතාන්‍යයන්ගෙන් අත් මිදීමේ නායකත්වයක් එසේ ඇති විය. ලංකාවේ එවනි දෙයක් සිදු වූයේ නැත. මෙහි ප්‍රතිඵලය වූයේ සියයට දෙකක පමණ ප්‍රමාණයක් අලුතෙන් ඇති වුනු නව අධ්‍යාපන ක්ෂේත්‍රයට ඇතුල් වීමට අවස්ථාව ලබා ගැනීමත් අනෙක් අයට එය නැතිව යාමත්ය. එම බ්‍රිතාන්‍ය ප්‍රතිපත්තියට වෙනස්ව රටේ සියලුම දෙනාට අධ්‍යාපනයක් ලබා දීම පිළබඳව බරපතල පියවරක් බවට පත් වුනේ සී ඩබ්ලිව් ඩබ්ලිව් කන්නන්ගර මැතිදුන්ගේ නායකත්වයෙන් හා ඔහු වටා සිටි නිළධාරීන්ගේ සහයෝගීතාවයෙන් නිදහස් අධ්‍යාපනය රටේ ජනතාවට හිමි කර දීමයි. මේ නිසා විශාල අවස්ථාවක් නිර්මාණය වුනා, රටේ ස්වභාවයම වෙනස්කර ගැනීමට. ඒ සඳහා කාලය අවශ්‍යය වුනා. දැන් අප ජීවත් වන්නේ නිදහස් අධ්‍යාපනයෙන් අවුරුදු හැත්තෑවකට වැඩි කාලයක් ගත වුනායින් පසුවයි. මේ නිසා නිදහස් අධ්‍යාපනයේ ඵල නෙලා ගැනීම සඳහා අවස්ථාව දැන් නිර්මාණය වෙමින් පවතී.

මේ වාතාවරණය තුල කාගේත් පරම උණන්දුව විය යුතු වන්නේ තමන්ගේ ප්‍රකාශන ශක්තිය සමාජයේ සියලුම කටයුතු සම්බන්ධයෙන් වර්ධනය කර ගන්නේ කෙසේද යන්නය. ලබාගත් අධ්‍යපනය උපයෝගී කොට ගෙන ඒ තුලින් තමන්ගේ කල්පනා ශක්තිය වර්ධනය කර ගනමින් තමන්ගේ කටහඩින් තමන්ගේ අනාගතය ගැන කතා කිරීමේ ශක්තිය නිර්මාණය කර ගැනීමට පසු බිම රටේ දැන් වැඩි කොටසකට පවති. එහෙත් ඒ කල්පනා රටාව තවමත් දියුණු වී නැත. එම කටහඩ තවම ඇසෙන්නට පටන් ගෙන නැත.

# නිදහස් අධ්‍යාපනයේ ඵල නෙලා ගැනීම 02

නිදහස් අධ්‍යාපනය නිසා ලාංකීය සමාජයේ යටි තලය මුලුමනින්ම වෙනස් විය. රට පුරාම සමාජ ජීවිතයෙහි සම්බන්ධ විය හැකි පමණට අධ්‍යාපණයක් ඇතිවීම නිසා ජන ජීවිතය තුල මහා පරිමාණ පරිවර්තනයක් සිදු වී හමාරය. මොනම ආකාරයකින්වත් අතුගා දැමිය නොහැකි පමණට මේ සමාජ පරිවර්තනය සිදු වී ඇත.

රට පුරාම විවිධ ගම් වලින්, උප නගර වලින්, නගර වලින් ඇති වූ ජනතාව අතර විද්‍යාවන් පිලිබදව අවබෝධයක් ඇති කණ්ඩායම් පැතිරී පවති. වෛද්‍ය විද්‍යාව ඉංජිනේරු විද්‍යාව වැනි විද්‍යාවන් පමණක් නොව අන් සියලු විද්‍යාවන් පිළිබදව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ශාරීරික විද්‍යාවන් ආදී මෙන්ම ගණිතය පිළිබදව දැනීම ඇති පුද්ගලන්ගේ ප්‍රමාණය විශාල වශයෙන් වැඩි වී පවතියි. සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, ආර්ථික විද්‍යාව, කලමනාකරණය ආදී සමාජ විද්‍යා සම්බන්ධයෙනුත් අවබෝධයක් හා අධ්‍යාපනයක් ඇති ප්‍රමාණයද වෙනස් වී පවතියි. මේ ආකාරයෙන් විවිධ විෂයන් පිළිබදව මෙන්ම තාක්ෂණය පිළිබදව අවබෝධයද ඒ ආකාරයෙන්ම වැඩි වී පවතියි. මේ නිසා සමාජයක දියුණුවට පැවතිය යුතු මනුෂ්‍ය සම්පත රට පුරාම දැන් පවතියි. ගැටලුව වශයෙන් පවතින්නේ යටි තලයේ එනම් ජන ජීවිතයේ ඇතිවී ඇති මේ මහා පරිමාණ වෙනස තවමත් සමාජයේ උඩ තලයේ ප්‍රකාශයට පත් වී නොතිබීමයි. යටි තලයේ ඇති වූ වෙනස

සමාජයේ මැද හා උඩ තලයන්ටද පැතිරීයාම කරගත හැක්කේ කෙසේද යන්න ලාංකීය සමාජයේ පවතින ප්‍රධාන ප්‍රශ්නයයි. මේ ප්‍රශ්ණය විසඳා ගත යුත්තේම ද නිදහස් අධ්‍යාපනයෙන් ඇති වූ ජන කොටස් තුලින්මයි. එය විසඳා දීමට පිටින් කිසිවෙක් ඉදිරිපත් නොවෙනවා පමණක් නොවෙයි එම වෙනස ඇතිවීමට අකමැති හා විරෝධය දක්වන්නන්ද සිටි.

1962 පොලීසියේ හා හමුදාවේ නායකයන් විසින් ලංකාවේ ආණ්ඩුව පෙරලා දමා තමන් කැමති ආණ්ඩුවක් පිහිටුවා ගැනීමට කරන ලද කුමන්ත්‍රණයේ පසුබිම වූ ප්‍රධානතම හේතුව වූයේද නිදහස් අධ්‍යාපනය නිසා සමාජයේ ඇතිවෙමින් තිබූ විශාල වෙනසට ඉහල තලයේ පැවති විරුද්ධතාවය බව වාර්තා වලින් පෙනේ. ඇමරිකාවේ සමාජ විද්‍යාඥයෙකු විසින් ලංකාවේ 1962 කැරුල්ලේ නායකයන් සමග පසු කාලයේදී කරන ලද සාකච්ඡාවලදී ඔවන් කියා සිටියේ තමන් ඒ පියවර ගැනීමට උත්සාහ කලේ අතීතයේදී තමන්ගේ තරාතිරම පිළිබදව තමන්ට තිබූ උරුමය තමන්ගේ දරුවන්ට නොලැබෙන බව පෙනීයාම නිසා, පසු කාලයේ තිබූ තත්වය නැවත ඇති කර ගැනීම සදහාත්, මේ කුමන්ත්‍රණය කල බවයි. කුමන්ත්‍රණය පරාජය වුවත් කුමන්ත්‍රණය පිටුපස සිටි බොහෝ දෙනෙකු පිළිබදව නිදහස් අධ්‍යාපනය හා ඒ නිසා ඇතිවෙමින් තිබූ සමාජ පරිවර්තනය දෙස විශාල වපර ඇසකින් බැලීමක් පැවතුනා.

1977 බලයට පත් වූ එක්සත් ජාතික පක්ෂය නායකත්වයේ සිටි ජේ.ආර්. ජයවර්ධන මහතා මේ මතය නියෝජනය කල එක් අයෙක්. ඔහු 1956 බණ්ඩාරනායක ආණ්ඩුව බලයට පත්වීම සහ එක්සත් ජාතික පක්ෂයේ පරාජය හැදින්වූයේ රට පුරා දේශපාලන මුහුකුරා යාමක් පැවතීමේ ලකුණක් ලෙස තමා දකින බවයි. එම මුහුකුරා යාමට ඔහු කැමති වූයේ නැත. 1978 ව්‍යවස්තාව මගින් ගත් මූලික පියවර වල ප්‍රධාන අංශය වූයේ සමාජයේ යටි තලයේ ඇතිවෙමින් තිබූ මේ විශාල වෙනස හැකි පමණින් පස්සට ඇද දැමීමට කරන ලද උත්සාහයයි. මේ උත්සාහය නිසා සමාජයේ යටි තලයේ ඇති වුන විශාල වෙනස සමාජයේ මැද හා උඩ තලයනට ගමන් කිරීමේ වේගය විශාල වශයෙන් වියවුලට පත් වුනා. අද දක්වාත් ඒ වියවුල නොවිසිදී පවතින මහා ගැටලුවක්.

මෙවනි වාතාරණයකදී නිදහස් අධ්‍යාපනයකින්ම ඇති වූ ජනකොටස් තමන්ගේ අනාගත දියුණුව ගොඩනගා ගත හැක්කේ කෙසේද යන ප්‍රශ්ණය රට පුරා පවතියි. මෙහි තවම සිදු වී නැති සමහර වෙනස්කම් හඳුනාගත යුතුය. නිදහස් අධ්‍යාපනය නිසා වැඩි දැනුමක් ඇති අධ්‍යාපනයක් ඇති කණ්ඩායම් රටේ විශාල වශයෙන් ඇති වුනා. එහෙත් දැනීම හා ප්‍රකාශන ශක්කිය අතර විශාල වෙනසක් තවමත් පවති. තමන්ගේම උවමනාවන් තමන්ගේම වචනයෙන් සමාජයට හෙළිදරව් කර ගැනීමේ ඇති හැකියාව ප්‍රකාශණ ශක්තිය වශයෙන් හැදින්විය හැකි යි. නිදහස් අධ්‍යාපනයෙන් ඇති වූ කණ්ඩායම් මේ ප්‍රකාශන ශක්තිය දියුණු කරගෙන නැහැ. මා මෙහිදී කතාකරන්නේ හුදෙක් දේශපාලන ප්‍රකාශනය ගැන නොවේ. සෑම විශයක් පිළිබඳවම, සමාජයේ සෑම අංශයක් පිළිබඳවම කතිකාවක යෙදීමේ හැකියාව ඇති කර ගැනීම තුලින් නිදහස් අධ්‍යාපන්යේ යටි තලයේ ඇති වූ වෙනස මැද තලයට හා ඉහල තලය දක්වා ගමන් කර ගැනීමට හැකි වේ. නිදහස් අධ්‍යාපනයේ ලාභය ලැබූ කාගේත් පරම උනන්දු විය යුතු වන්නේ තමන්ගේ ප්‍රකාශන ශක්තිය සමාජයේ සියලුම කටයුත්තක් සම්බන්ධයෙන් වර්ධනය කර ගන්නේ කෙසේ ද යන ප්‍රශ්ණය විසඳා ගැනීමයි.

# නිදහස් අධ්‍යපනයේ ඵල නෙලා ගැනීම
# 03

සමාජයේ කොටසක් තමන්ගේ ප්‍රකාශන ශක්තිය දියුණුකර ගැනීමට ගන්නා උත්සාහයද සිදුවන්නේ අන් සියල්ලේදීම මෙන්ම පරිනාමයක ආකාරයටයි.

නිදහස් අධ්‍යාපනයෙන් බිහි වූ මුල් පරම්පරාව තුල අධිවේගි ප්‍රවණතාවයක් ඇති වුනා, ඉතා ඉක්මනින් තමන්ගේ තත්වයන් ඉහලට දමා ගන්නේ කෙසේද යන්න පිළිබදව. එනම් නිදහස් අධ්‍යපනයෙන් ඇති වූ වෙනසට අනුව තමන්ගේ සමාජ ශක්තියද, ආර්ථික ශක්තියද වර්ධනය කර ගන්නේ කෙසේද යන්න අධිවේගී ආකාරයකින් කර ගැනීමට ඔවන්ට උවමනා වුනා. 1971 කැරුල්ලට පසුබිම් වන්නේ මේ උවමනාවයි. එහෙත් සමාජයේ මහා විපර්යාසයන් යටින් පටන්ගෙන දියුණු වූ තත්වයක් ඉහලට ගෙන යාමට දරන උත්සාහය ප්‍රචණ්ඩ මාර්ගයෙන් කිරීමට යෑමෙන් සිදු වූයේ මේ මුලු ප්‍රවාහයම මර්ධනය කර ගැනීමට රාජ්‍ය බලය හා මිලිටරි බලය යොදා ගැනීමට අවස්ථාව සලසාදීම පමණයි. ඉතා දරුණු ආකාරයකින් 1971 කැරුල්ල මැඩ පැවැත්වීමට හේතු වූයේ හුදෙක්ම කැරලිකරුවන් මර්ධනය කිරීම පමණක් නොවේ. ඇත්තෙන්ම ඒ ආකාරයෙන් මර්ධනය කිරීමට තරම් වූ විශාල කැරුල්ලක් 1971 සිදු වූයේ නැත. රාජ්‍ය පාලකයන්ට ඒ අවස්ථාවේදී අවශ්‍යය වූයේ යටින් ඇතිවෙමින් තිබූ මේ ප්‍රවාහය පස්සට තල්ලුකර ගැනීමයි. ඒ සදහා කැරලිකරුවන්ගේ ප්‍රචණ්ඩත්වයට විරුද්ධව රාජ්‍ය ප්‍රචණ්ඩත්වය විශාල වශයෙන් යොදා ගැනීම

තුලින් සමාජයේ ඇතිවුන හැකිව තිබූ වෙනස කාලයකට පමා කර ගැනීමට ඔවුනට හැකි විය. මේ ආකාරයටම ලංකාවේ දෙමළ කතා කරන කණ්ඩායම් අතරද නිදහස් අධ්‍යාපනය නිසා බිහි වූ විශාල කණ්ඩායමක් ඇතිවුනා. ඊට පෙර අවධියේදී සියයට දෙකකට හා තුනකට පමනක් අධ්‍යපන අයිතිය තිබූ අවදියේදී ඇති වූ දෙමළ බුද්ධිමතුන් බොහෝ දුරට ඔවුන්ගේ සමාන සමාජ තත්වයක සිටි සිංහල කණ්ඩායම් සමග ආර්ථික වශයෙන් වෘතීමය වශයෙන් සමාජීමය වශයෙන් සම්බන්ධ වී ඒ අනුව යමින් ඔවුන්ගේ තත්වයද ඉහල මට්ටමින් පවත්වාගෙන ගියා. දෙමළ කතා කරන නිදහස් අධ්‍යාපනයෙන් බිහි වූ කණ්ඩායම් වලට එම තත්වය හම්වුනේ නෑ. ඔවුන්ද රටේ නිදහස් අධ්‍යාපනයෙන් සිංහල කණ්ඩායම් වල ඇති වූ ප්‍රශ්ණයන්ටත් භාෂාව නිසා ඇති වූ සමහර ප්‍රශ්ණයන්ටත් මැදි වී කල්පනා කලේ තමන්ගේ ප්‍රශ්ණ ප්‍රචණ්ඩත්වයක් තුලින්, ප්‍රචණ්ඩ ක්‍රම පාවිච්චි කිරීම තුලින් තමන්ගේ අයිතිවාසිකම් හා සමාජ තත්වයන් ඉස්මත්තට තල්ලු කර ගැනීමටයි. මේ අනුව කරන ලද අවුරුදු 30 ක පමන අරගලය නිසාත් එම අරගලය තුල මහා පරිමාණයෙන් ප්‍රචණ්ඩත්වය පාවිච්චි කිරීමට ඇති වූ ඉඩ කඩ නිසාත් එය දැඩි ප්‍රචණ්ඩත්වයක් බවට පත් වුනා. මෙහිදීද රාජ්‍ය පාලකයන් කටයුතු කලේ එම කැරලි කරුවන් මර්දනය කර කැරලිකාර තත්වය නැති කිරීම සදහා පමණක් නොව, සමාජයේ යටි තලය තුලින් ඉස්මත්තට ඒමට උත්සාහ කරමින් සිටි ජන කොටසක් හැකිතාක් ප්‍රමාණයකින් පස්සට තල්ලු කර දැමීමට උත්සාහ කිරීමයි. මේ සදහා දැඩි රාජ්‍ය ප්‍රචණ්ඩත්වයක් පාවිච්චි කල බව රහසක් නොවේ.

ඒ වගේම මේ තත්වය තුලින් ඇති කරන ලද ජාතිවාදී ද අරමුණ වුනේ රට තුල බොහෝ කාලයක් පවත්වාගෙන යා හැකි වර්ගවාදී අර්බුදයක් රට තුල සාදා ගැනීමයි. මේ වර්වාදී අර්බුදයේ අරමුණ වශයෙන් පවතින්නේ නිදහස් අධ්‍යාපනය නිසා සමාජය තුල ඇති වී තිබෙන, සමාජයේ යටිතලය තුල එනම් සමාජයේ ජන ජීවිතය තුල ඇති වී තිබෙන මහා වෙනස සමාජයේ මැද තලයට හා ඉහල තලයට ගමන් කිරීමට ගන්නා වෑයම තව බොහෝ කාලයකට පස්සට දැමීමත් එම ප්‍රයත්නයේ යෙදෙන්නන් හැකි පමණින් අධෛර්යමත් කිරීමත් මේ මගින් නිදහස් අධ්‍යාපනයෙන්

ඇති වූ සමාජ වෙනස රටේ බල කේන්ද්‍රයන් තුලට හා දේශපාලන ආර්ථික කේන්ද්‍රයන් තුලට ඉක්මනින් ගලා ඒම වලක්වා ලීමත් යන කරුනුයි. මේ නිසා එක අතකින් නිදහස් අධ්‍යාපනය නිසා ඇති වූ කණ්ඩායම්ම අතර එකිනෙකා බෙදීම මගින් සියල්ලන් යටපත් කිරීමේ සම්ප්‍රදාය යොදා ගැනීමක් පවතිනවා. මෙය ලංකාවේ පමණක් සිදු වුන දෙයක් නොව ඕනෑම සමාජයක යම් කලක් යටි තලයේ සිටි කණ්ඩායමක බලාපොරොත්තු වැඩි වී අයිතිවාසිකම් සඳහා උවමනාව වැඩියෙන් ප්‍රකාශයට පත් කරමින් ආර්ථික සමාජීය ප්‍රතිලාභයන් ලබා ගැනීමට කරන ප්‍රයත්න වලදී ඔවුන් සියල්ලන් පරාජය කිරීමේ මාවත වන්නේ එකිනෙකා බෙදීමයි. දැනට මේ ක්‍රියා කලාපය සිදු වෙමින් පවතිනවා.

# නිදහස් අධ්‍යාපනයේ ඵල නෙලා ගැනීම
# 04

නිදහස් අධ්‍යාපනය නිසා ඇතිවී ඇති විශාල වෙනස සමාජය තුල ඔවුන්ගේ ප්‍රකාශන ශක්තිය වැඩි කර ගැනීමට යොදා ගන්නේ කෙසේද යන්න අපි මීට පෙර සාකච්ඡා කලා. ප්‍රකාශන ශක්තිය යනුවෙන් අදහස් කරන්නේ ඉතාම සරල දෙයක්. එනම් තමන් වටා තිබෙන විවිධ සමාජ ගැටලු පිලිබඳ කල්පනා කොට එම කල්පනාව ප්‍රකාශයට පත් කිරීම මගින් ජන ගත කිරීමට ඇති හැකියාවයි. මෙය පටන් ගැනීම සාමාන්‍යයෙන් සිදුවන්නේ ඉතා ක්ෂණිකව තමන් ඉදිරිපිට ඇති ප්‍රශ්ණ හදුනා ගැනීමට ගන්නා උත්සාහය සමගයි. අපි උදාහරණ මගින් මෙය පැහැදිලි කර ගනිමු. තමන් ජීවත්වන ප්‍රදේශයේ පානීය ජලය පිළිබඳව ප්‍රශ්ණ ඇතිවී තිබීමට පුලුවන්. එය දැන් රටේ බොහෝ ප්‍රදේශවල ඇති ප්‍රශ්ණයක්. ජල ප්‍රවාහයන් තුලට රසායන ද්‍රව්‍යයන් එකතු වීම නිසා පානීය ජලය විස වීම. ඒ නිසා ඇතිවන ඉතා බරපතල ලෙඩ රෝගත් හැම තැනකම වගේ පවතිනවා. මේ ප්‍රශ්ණයට ඉහලින් පිළිතුරු ලැබෙනතුරු බලා සිටිනවාට වඩා මේ ප්‍රශ්ණයට භාජනය වූ ජනතාවට සම්බන්ධ වූ, අධ්‍යාපනයට යම් සහභාගීත්වයක් නිදහස් අධ්‍යාපනය නිසා ලබා ගැනීමට හැකි වූ කණ්ඩායම් මේ ප්‍රශ්ණයේ අග මුල සෙවීමට උනන්දු විය යුතු වෙනවා. ඒවා විසඳා ගැනීම පිළිබඳවම ජනතාව සමගම ජනතාවගෙ ම අදහස් මොනවා දැයි හදුනා ගැනීමට හා විවධ ස්ථාන වල හෝ රට වල මේ ප්‍රශ්ණ විසඳා ගත්තේ කෙසේ දැයි හොයා බැලීමට

උනන්දු විය යුතු වෙනවා. ඒ මගින් ඔවුන්ට මේ ප්‍රශ්ණය විසඳා ගැනීම පිළිබඳව අදහසක් ඇති කර ගැනීමටත්, යෝජනා ඉදිරිපත් කිරීමටත් ඒ ගැන සාකච්ඡාවක් ඇති කර ගැනීමටත් දායක විය හැකි වෙනවා. මේවා වෙනත් ප්‍රශ්ණ වලටත් ඒ ආකායෙන්ම බලපානවා. උදාහරණයක් වශයෙන් තමන් ඉන්නා ප්‍රදේශයේ දරුවන්ට හානි කරමින් මත්ද්‍රව්‍යය පැතිරී යමින් පැවතීම සලකා බලමු. මේ පිළිබදව ගැටලුවද ඉහතකී ආකාරයෙන්ම තමන්ගේ කල්පනාවට භාජනය කොට මේ ප්‍රශ්ණ වලට මැදිහත් වූවන් සමග සාකච්ඡා කිරීමෙන් තවත් තමන්ගේ කල්පනා ශක්තිය දියුණු කර ගත හැකි ය. එසේ ඇති කරගත් කල්පනා ප්‍රවාහය වෙනත් අය සමග සාකච්ඡාවට භාජනය කිරීම මගින් මේ ප්‍රශ්ණ පිළිබදව සාකච්ඡාවක් රට තුල ඇති කිරීමට තරම් පළල් වූ කණ්ඩායමක් නිදහස් අධ්‍යාපනය තුලින් ලංකාවේ බිහිකර ගත හැකිව පවතිනවා. මෙවනි දහසකුත් ප්‍රශ්ණ සම්බන්ධයෙන් මෙවනි කල්පනාධාරා රට තුලින් පහල වේ නම් එයින් යටි තලයේ සිට මැදට හා ඉහළට අදහස් ගලා ඒමට වැඩි වීමට හැකි වෙනවා.

දැනට බොහෝ විට කෙරෙන්නේ ඉහළ තලයෙන් විවිධ ප්‍රශ්ණ පිළිබදව ගන්නා තීරණ පහළට බලයෙන් මෙන් තල්ලු කිරීමයි. බොහෝ විට එසේ ඉහල තලයේ නිගමන ගන්නවුන්ට මේ ප්‍රශ්ණ වලට භාජනය වූ මිනිසුන් පිළිබදවවත් ප්‍රශ්ණ ඇති වූ වාතාවරණය පිළිබදවවත් ජීවිතයෙන් ලබා ගත් අත් දැකීමක් පවතින්නේ නෑ. නිදහස් අධ්‍යාපනයෙන් ඇති වූ ජන කොටස් වලට මේ අත්දැකීම පවතිනවා. ඔවුන් මේ වාතාවරණයේම ජීවත් වන නිසාත්, ඒ වාතාවරණ වල ඉතිහාසය තමුන්ගේ පවුල් ඉතිහාස තුලින්ම දන්නා නිසාත්, වඩා ගැඹුරකින් හා අර්ථවත්ව ප්‍රශ්ණය පිළිබදව අර්තකථනයක් දීමේ හැකියාව ඔවුන්ට පවතිනවා. මෙහිදී එම කණ්ඩායම් තමුන්ගේ මත ප්‍රකාශ කිරීමට ගත් විට ඉහලින් ගලා එන අදහස් හා යෝජනා පහලින් ඉහලට ගලා එන අදහස් හා යෝජනා අතර එක්තරා හමු වීමක් ඇතිවෙනවා. මේ හමුවීම තුලින් එකිනෙකාට මේ ප්‍රශ්ණයේ විශාල පැති ගණනාවක් හදුනා ගැනීමේ හැකියාව වර්ධනය වෙනවා.

යම් සමාජයක් ඉහලින් පහලට අදහස තල්ලු කරන සමාජයක් වන තරමට එම අදහස් ක්‍රියාත්මක කිරීමේ හැකියාව නැති වන

නිසා ඒවායේ ප්‍රයෝජන බොහෝ වෙලාවට ලබා ගත නොහැකි යි. එහෙත් යටින් ගලා එන අදහස් ප්‍රකාශයට පත් කර ගැනීමට හැකිකමක් ඇත්නම් එම අදහස් ඉහලින් එන අදහස් සමග ඇති වන හමු වීමේ දී වඩා පොහොසත් ආකාරයකින් ප්‍රශ්ණ පිළිබඳව අවබෝධයක් සේම ප්‍රශ්ණය විසඳා ගැනීමේ මාර්ග පිළිබඳව අවබෝධයකුත් ඇති වෙනවා. මේ මගින් රටේ ක්‍රියාත්මක වෙන වැඩ කටයුතු නිදහස් අධ්‍යාපනයෙන් ප්‍රතිලාභ ලැබූ අයගේ අදහස්ද සමග එකතු වීම නිසා රට ගැනම හා රටේ පවතින ප්‍රශ්න පිළිබඳව අවබෝධය පළල්ව සමාජගත වෙනවා. කල්පනා ශක්තිය මරා දමණ මතවාද මේ ප්‍රවාහයට හාත්පසින්ම වෙනස් දෙයක් වෙන්නේ හුදෙක් අනුකරණ ආකාරයකින් කල්පනාවෙන් තොරව තමන් තුල ඇතිවෙන්නට ඉඩ දෙන මතවාදයන් විසින්. මතවාදයක ලක්ෂණය නම් ප්‍රශ්ණයට අදාල පුද්ගලයාගේ ස්වාධීන කල්පනාව ඒ තුල නැති වීමයි. කවුරුන් හෝ කොතනකින් හෝ ඇතිකරන ලද මතවාදයක් යට සිටින කණ්ඩායම් තුලට පටලනු ලබනවා. මෙය උදාහරණයක් වශයෙන් අතීතයේදී මාක්ස්වාදය පිළිබද අදහස් වශයෙන් කියනු ලැබූ දේ ගත හැකි ය. ජාතිවාදය පිළබදව මතවාදයද මේ ආකාරයෙන් පිටින් උඩින් පහළට ගලා යන මතවාදයක් බවට පත් වූනා. උඩින් එන අදහස තමුන්ගේ ඔලුවේ දමාගෙන එය නැවත ප්‍රකාශ කිරීම හැර, ස්වාධීන කල්පනා ශක්තියක් තමුන්ගේ ඇස් වලින්ම තමන් වටා ඇති ලෝකය හඳුනා ගැනීමක්, තමන්ගේම අදහස් තවත් අය සමග කතා කිරීම තුලින් ඇති කර ගන්නා ප්‍රායෝගික ඥානයක් ඇති වීම ආදිය මතවාදයන් විසින් මරා දමනු ලබයි. මේ නිසා අතීතයේදී නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵල ලබා ගැනීමට මේ මතවාද බාධාවක් වුනා. මේ වෙනුවට නිදහස් අධ්‍යාපනය නිසා තමන්ගේම ඇසින් වටා පිටාව දෙස බැලීමටත් ඒ මගින් තමුන්ගේ කල්පනාධාරව දියුණු කරගෙන එය ප්‍රකාශයට පත් කිරීමටත් හැකියාව දැන් රටේ පවතිනවා. එසේ කිරීමට අධිෂ්ඨානයක් ඇත්නම් එය දැන් කල හැකි ය.

# නිදහස් අධ්‍යාපනයේ ඵල නෙලා ගැනීම
# 05

ආයතනික වෙනස්කම් ඇති කර ගැනිම සඳහා සිවිල් සමාජයේ නිපුණතාවය වර්ධනය කර ගැනීම අවශ්‍යය.

පසුගිය කාලයක් පුරාම සිවිල් සමාජය ක්‍රියාත්මක වීම බොහෝ දුරට කේන්ද්‍රගතවී පැවතුනේ පක්ෂක්ග්‍රාහී දේශපාලනය ඔස්සේය. රටේ වර්ධනය වූ මර්ධකාරී තත්වයන් නිසා පාලනයේ සිටි පාලක පක්ෂයක් බලයෙන් පහකිරීම අරමුණු කොටගෙන 2015 මැතියණයට පෙර වූ සිවිල් සමාජයේ ක්‍රියා කාරීත්වය නව ආණ්ඩුවක් පිහිටුවා ගැනීම කෙරෙහි යොමු විය. නව ආණ්ඩුවක් පත්වීමෙන් පසු එම ආණ්ඩුව ලව්වා විවිධදේ කර ගැනීමට උත්සාහයක් වශයෙන් සිවිල් සමාජයේ ක්‍රියා කාරීත්වය පැවතුනු අතර එයම පසුකාලීනව සිවිල් සමාජයේ ක්‍රියාත්මක භාවය කෙරෙහි සමාජයේ නොසතුටක් පැතිර වීමටද හේතු විය.

සිවිල් සමාජය තුල ආයාතනික වෙනස්කම් ඇති කර ගැනීමේ උවමනාවක්වත් එවනි ආයාතනික වෙනස් කම් ඇති කර ගැනීම සඳහා අවශ්‍යය නිපණතාවයක්වත් ලංකාවේ සිවිල් සමාජයේ ක්‍රියා කාරීත්වය තුල දකින්නට ලැබෙන්නේ ඉතාමත් සුලු වශයෙනි. බොහෝදුරට සිවිල් සමාජය තුල රටේ ආයාතනික වෙනස්කම් ඇති කර ගැනීම පිළිබඳව මානසික උවමනාවක්වත් තිබෙන්නේද යන ප්‍රශ්ණය ඇසීමද අසාධාරණ නැත. මන්දයත් එවනි මානසික තත්වයක් හෝ ක්‍රියා කාරීත්වයක් සිවිල් සමාජයේ ආයාතන තුලින් ප්‍රකාශයට පත්වී ඇත්නම් එසේ ඇතිවී ඇත්තේ ඉතාම අල්පමාත්‍ර වශයෙන් වන නිසාය.

සිවිල් සමාජය යනුවෙන් මේ ලිපියෙහි අදහස් කරන්නේ හුදෙක් එන්.ජී.ඕ යන නමින් ලංකාවේ ප්‍රසිද්ධියට පත්වී ඇති යම් කණ්ඩායම්ම පමණක් නොවේ. සිවිල් සමාජය යනු රටේ සියලුම වෘතීන් අතර, සාමාන්‍යය ජනතාව අතර විශේෂයෙන්ම කාන්තා සංවිධාන ඇතුලු සියලු සංවිධාන තුල කල්පනා ශක්තියක් යොදා තමන්ගේ අවශ්‍යතාවයන් හදුනාගෙන එම අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සදහා නිපුණත්වයක් වර්ධනය කර ගන්නා අතරම ඊට අදාලව ක්‍රියාකාරීත්වයේ යෙදෙන සියල්ලන් සිවිල් සමාජය වශයෙන් මෙහි හදුන්වනු ලබයි. සිවිල් සමාජය යනු මේ අනුව ඉතා පළල් ජන කොටසක් ඇතුලුව සැදුම් ලද්දකි.

සිවිල් සමාජය වෙනස් වන්නේ රාජ්‍යය සංවිධාන වලිනි. රාජ්‍යය සංවිධාන තුල බලය ක්‍රියාත්මක කිරීම හා එම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිළධාරී මට්ටමින් සහභාගී වීම සිදුවේ. බලය පාවිච්චි කිරීමට ඇති හැකියාව තුලින් විවිධ ගැටලු විසඳා දීම රාජ්‍යයට සම්බන්ධ වූ කොටස් තුලින් සිදු විය යුතු කාර්ය වේ. බොහෝ විට මේ කාර්ය වෙනුවට රටේ අවශ්‍යයතාවයන් නොතකමින් විවධ වූ දෙයෙහි යෙදීමත් බොහෝ විට දූෂණය හා බලය අනිසි ලෙස පාවිච්චි කිරීම ආදී කර්තව්‍යයන් කෙරෙහි රජයට සම්බන්ධ ක්‍රියා කරන්නන් පෙලෙබවීමද සිදු වේ. රජයක් මගින් සිදු විය යුතු කාර්ය හා ඇත්තෙන්ම ඔවුන් ඉටු කරන කාර්ය අතර විවිදාකාර පරස්පර විරෝධයන් ඇතිව තිබීම හෝ ඒවා අඩුව තිබීම නිර්ණය වන්නේ එම සමාජය තුල පවතින සංස්ථා කුමන ආකාරයකින් එම සංස්ථාවල යුතුකම් කිරීමේ එම හැකියාව ඔවුන් ඇත්තෙන්ම ක්‍රියාත්මක කරන්නේද යන කරුනු මතිනි.

සිවිල් සමාජයට රාජ්‍යය බලයක් ඇත්තේ නැත. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක සියලු දේශපාලන බලයේ උල්පත වන්නේද සිවිල් සමාජය ය. මෙහි බැලූ බැල්මට කිසියම් පරස් පර විරෝධයක් ඇතැයි පෙනෙන්නට පුලුවනි.

ජනතා ස්වෛරීත්වය ජනතාව තුල පවතින බවත් එම ස්වෛරීත්වය රාජ්‍ය බලයේ උල්පත බවත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට පදනමවන ප්‍රධානම සංකල්ප වේ. එහෙත් මේ ස්වෛරීභාවය ක්‍රියාත්මක වන්නේ හුදෙක් බලයට පත් වන පුද්ගලයන් මගින් නොවේ. එය ක්‍රියාත්මක වන්නේ රටේ නිර්මාණය කර ඇති ප්‍රසිද්ධ සංස්ථාවන් හා එම සංස්ථාවන් වල ක්‍රියා කාරීත්වය තුලිනි.

රටේ ප්‍රසිද්ධ සංවිධාන රටාව පක්ෂ දේශපාලනයෙන් පරිබාහිරව පැවතිය යුතු බවත් එය හුදෙක්ම පවතින නීතින් තුල ක්‍රියාත්මක විය යුතු බවත් නීතිය මත පාලනය යන සංකල්පයේ පදනම වේ. නීතීන් නිර්මාණය කිරීම ව්‍යවස්ථාධායකයේ වගකීම වන අතර රජයේ අන් සියලුම සංස්ථාවන් වල වගකීම වන්නේ එම නීති නිසි ලෙස නෛතික රාමුවක් තුල පමණක් ක්‍රියාත්මක කර වීමය.

මෙයින් පෙනී යන්නේ රටක ප්‍රසිද්ධ සංස්ථා ව්‍යූහය ක්‍රියාත්මක වීම කෙරෙහි ප්‍රධාන බලපෑම් දෙකක් ගැටෙන බවය. එම ප්‍රධාන බලපෑම් නම් බලය හිතුවක්කාර ලෙස පාවිච්චි කිරීමට රජයන් තුල ඇතිවන ප්‍රවනතාවය එක පැත්තකය. ඊට වෙනස්ව රජයක් තුලින් තමන්ගේ උවමනාවන් ඉටු කර ගැනීම සදහා යොමු කරවා ගැනීමට සිවිල් සමාජයට ඇති අවශ්‍යතාවය අනෙක් පැත්තේ ඇත. මේ ජනතා ස්වෛරීත්වය යන්න ක්‍රියාත්මක වන්නේ මේ ප්‍රවනතාවයන් දෙක මැද්දේය. සිවිල් සමාජයට තමන්ගේ උවමනාවන් ඉටු කර ගැනීමට රාජ්‍ය සංස්ථා වල සහයෝගය ලබා ගැනීමට හැකියාව ඇති කර ගැනීම තුලින් රාජ්‍ය බලය පාවිච්චි කරන්නන් එම බලය අනිසි ලෙස සොදා ගැනීමට ඇති ඉඩ කඩ සීමා කිරීම සිදුවේ.

රාජ්‍ය පාලනය ජීවමාන කටයුත්තකි. සිවිල් සමාජයේ පැවැත්මද එසේම ජීවමාන කටයුත්තකි. මෙයින් එකිනෙක කෙරෙහි බලපෑමට ශක්තියක් අඩුවන කණ්ඩායමටද එහි ප්‍රතිඵල බුක්ති විදීමට සිදුවේ. එනම් රජයක් තුලින් ඉටුවිය යුතු යුතුකම් එම රටේ පවතින ප්‍රසිද්ධ සංස්ථා තුලින් ඉටුකරවා ගැනීමට ශක්තියක් සිවිල් සමාජයට තිහේනම් ඒ මගින් සිවිල් සමාජයට තමන්ගේ උවමනාවන් ඉටු කර ගත හැකි ය. එසේ නැත්නම් සිවිල් සමාජයට අනිසි ලෙස රාජ්‍යය බලය පාවිච්චි කරන රාජ්‍යයක් තුලින් ඇතිවන සියලුම අනිසි ප්‍රතිඵල බුක්ති විදීමටද සිදුවේ.

සිවිල් සමාජය තුලට විවිධාකාර ප්‍රශ්ණ ගලා එමින් පවතින්නේනම් උදාහරණයක් වශයෙන් ආහාර පිළිබද ප්‍රශ්න, පානීය ජලයේ පිරිසිදු කම ගැන ප්‍රශ්න, පරිසරයේ ඇතිවෙන්නා වූ විවිධ ගැටලු පිළිබද ප්‍රශ්න, කාන්තාවන්ට සමාජයේ ලැබිය යුතු තත්වය නැති වීම පිළිබදව ප්‍රශ්ණය, අධ්‍යාපන සෞඛ්‍යය සේවාවන් පිළිබද ප්‍රශ්න ආදී දහසකුත් ප්‍රශ්ණ උග්‍ර වෙමින් පවතින්නේ නම්, ඊට ප්‍රධාන හේතුව වන්නේ සිවිල් සමාජය තවමත් තමන්ගේ

උවමනාවන් ඉටු කර ගැනීම සඳහා තමන්ම මෙහෙයවා ගැනීමේ ශක්තිය වර්ධනය කරගෙන නොතිබීමය.

සිවිල් සමාජය අනිසි ආකාරයෙන් පක්ෂ දේශපාලනයට යටත් වීමෙන් සිදු වන්නේ සිවිල් සමාජයෙන්ම ඉටු විය යුතු යුතුකම් වෙනත් ආකාරයකින් ඉටුවේය යන බලාපොරොත්තුවක් තුල මංමුලා තත්වයකට ඇද වැටීමය. සිවිල් සමාජයක් තමන්ගේ උවමනාවන් ඉටුකර ගැනීම සඳහා කල යුතු කාර්ය නොකරන්නේ නම් අනිවාර්යෙන්ම රාජ්‍ය බලය අනිසි ලෙස පාවිච්චි කිරීම සිදු වීම වැලැක්විය නොහැකි යි. රාජ්‍ය බලය හා ජනතා ශක්තිය අතර ඇති සම්බන්ධය එයවේ.

ලංකාවේ සිවිල් සමාජයට තමන්ගේම උවමනාවන් නිසි ලෙස ඉදිරිපත් කර ගැනීමට ඇති නොහැකියාව තුල මේ පිලිබඳ නිපුනතාවයක් සිවිල් සමාජය තුල වර්ධනය නොවීම පිළිබඳ ප්‍රශ්ණයට මුහුණදිය යුතුව ඇත. බොහෝ දුරට දැන් පක්ෂ දේශපාලනය ඇතිවීමත් සමග එනම් 20 වන සියවසේ මුල් භාගයේ පමණ සිටම විවිධ දේශපාලන පක්ෂ වටා රැස්වීම තුලින් එම සිවිල් සමාජයේ කාර්ය මේ පක්ෂ වලට භාරදීමක් සිදු විය. එය මුලින්ම සිදු වූයේ වාමාංශික පක්ෂ සම්බන්ධයෙනි. සමසමාජ පක්ෂයේ ඇතිවීම හා වර්ධනය මුල් කාලයේ දී බොහෝ දුරට සිදු වූයේ සිවිල් සමාජයේ අවශ්‍යයතාවයන් ඉටු කර ගැනීමට එම පක්ෂයෙන් ලැබුනු අනුබල දීම මතය. පසු කාලයකදී පාර්ලිමේන්තුවේ මන්ත්‍රීකම් ලබා ගැනීම් ආදිය මගින් රාජ්‍ය බලය තමන් වෙත යොමු කර ගැනීමේ උවමනාවට සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය ආදිය යොමු වීමත් සමගම සිවිල් සමාජය එම පක්ෂවල අත කොලුවක් බවට පත් වූවා මිස සිවිල් සමාජයේ අවශ්‍යතාවයන් ඉටු කරවා ගැනීම සඳහා මේ පක්ෂ ක්‍රියාත්මක කරවා ගැනීමට තිබූ ඉඩ කඩ ඇහිරී ගියේය. මුල් කාලයේදී වෘතීය සමිති වර්ධනය කෙරෙහි මේ පක්ෂ වල අනුබලයක් හා මග පෙන්වීමක් තිබුනු නමුත් පසු කාලයේදී වෘතීය සමිති ව්‍යාපාර විනාශවී යාම කෙරෙහි ඇති වූ ප්‍රවණතාවයන් වලටද බොහෝ සේ වගකිව යුතු වන්නේ දේශපාලන බලය සඳහා කම්කරුවන්ගේ හා වෙනත් ජන කණ්ඩායම් වල අවශ්‍යයතාවයන් යටපත් කිරීමට මේ පක්ෂයන්ට සිදුවීම නිසාය.

පසු කාලයේදී මේ ක්‍රියාදාමයන් සියලුම පක්ෂයන් කෙරෙහි විසිරී ගියේය. සිවිල් සමාජයේ ක්‍රියා කාරීත්වය ක්‍රමක්‍රමයෙන් ඒ තුල පැවතිය යුතු ස්වාධීනත්වයෙන් මිදී පක්ෂවල උවමනාවන් ඉටු කරවා ගැනීම සඳහා යොමු වීම දකින්නට හැකි ය. මේ පිලිබඳව විශාල අත්දැකීමක් රටේ පවතින හෙයින් ඒ පිලිබඳව වැඩි දුරට මේ අවස්ථාවේදී සාකච්ඡා කිරීමට අවශ්‍ය නැත. අවශ්‍යව ඇත්තේ පවතින ප්‍රශ්ණය එනම් සිවිල් සමාජය දේශපාලන පක්ෂවල ග්‍රහණයට හසු වීම නිසා ලබා ඇති පරාජිත හා දුර්වල වීමේ තත්වයෙන් ගොඩ එන්නේ කෙසේද යන්න පිළිබඳව බරපතල සාකච්ඡාවක් රට තුල ඇති කිරීමය.

මෙහිදී රටේ ආයාතන තමන්ගේ උවමනාවන් එනම් ජනතාවගේ සාධාරණ උවමනාකම් ඉටු කර ගැනීම සඳහා යොමු කරවා ගැනීමටනම් ඒ සඳහා සිවිල් සමාජය තුල තිබිය යුතු නිපුණතාවයන් මොනවාදැයි හඳුනාගෙන එම නිපුණතාවයන් වර්ධනය නිරීම කෙරෙහි කටයුතු කිරීම තුලින් රට තුල ජනතාව මුහුණ දෙන ගැටලු විසඳා ගැනීමේ මාවත විවෘත කර ගත හැකි ය.

මේ නිපුණතා මොනවාද? එක් එක් ආයතන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එම ආයාතන වල ස්වභාවය එම ආයාතන වලින් නීත්‍යානුකූල ආකාරයෙන් කර ගත හැකි දේවල් මොනවාද යන්න පිළිබඳ අවබෝධය, එම සෑම සංස්ථාවක් තුලම යාන්ත්‍රණය මොන ආකාරයක එකක්ද යන්න තේරුම් ගැනීම හා එම යාන්ත්‍රණය ක්‍රියාත්මක කරවා ගැනීමට නීත්‍යාණුකූලව සිවිල් සමාජය තුල ඇති ඉඩ කඩ පවතින්නේ කොයි තැන් වලදැයි තේරුම් ගැනීම පිළිබඳ අදහස මේ අතර මුලින්ම දැනුවත් විය යුතු කරුණු වේ. සිවිල් සමාජය තුල වැඩි ක්‍රියාත්මක බාවයකින් කටයුතු කරන්නන් මේ කර්තව්‍යයේදී සාමාන්‍යයෙන් ඉතා විශාල සේවයක් කල යුතු කණ්ඩායම වේ. ලෝකය පුරාම සිවිල් සමාජය ශක්තිමත්වී පවතින සෑම රටක් තුලම දැකිය හැක්කේ සිවිල් සමාජය තුල ඇති වන විවිධ ක්‍රියාධරයන් සමස්ථ සිවිල් සමාජය තුල රටේ පවතින ආයාතනික රටාව ජනතාව තුලට ගෙන යාමට කරන විශාල ප්‍රයත්නයයි. මෙසේ ප්‍රයත්න දරන්නන් අතර විවධ වෘතිකයෝද, බුද්ධිමය අංශයන්හි යෙදෙන්නන්ද, විවිධ සමාජ ව්‍යාපාර වල වැඩි ක්‍රියාධර බාවයකින් කටයුතු කරන්නන්ද ආදී වශයෙන් විවිධ පළල් කොටසක් සම්බන්ධ වේ.

උදාහරණයක් වශයෙන් රටක කාන්තාවන්ගේ අයිතිවාසිකම්, කාන්තවන්ගේ උවමනාවන් එම සමාජයේ පවතින සංස්ථාවන් තුලින් ඉටු වන්නේ කොතෙක් දුරටද, එම ඉටුවීම් වලට ආයාතනිකව පවතින බාධා මොනවාද, එම බාධා ජය ගැනීම සඳහා සිවිල් සමාජය තුලින් පැවතිය යුතු ක්‍රියාකාරීත්වය මොනවාගේ දෙයක්ද, මේ පිළිබඳව විවිධ සාකච්ඡාවන් සිවිල් සමාජය තුලම ඇති කර ගන්නේ කෙසේද, යන කරුනු උදාහරණයක් වශයෙන් ගත හැකි ය. මෙය සියලුම උවමනාවන් පිළිබඳවමද එසේම බලපවත්වයි. උදාහරණයක් වශයෙන් රටේ ආහාර ප්‍රශ්ණයද එවනිම ප්‍රශ්ණයකි. රටේ විශාල ණය බරක් පැවතීම තුලින් එම ණය බර අඩුම ආදායම් ලබන්නන් කෙරෙහි බල පැවැත්වෙන ආකාරයද තවත් ප්‍රශ්ණයකි. මේ ආකාරයකට ප්‍රශ්ණ නම් කරන්නේනම් එය අති විශාල ලයිස්තුවකට ඇත. ඒත් අවශ්‍යයව ඇත්තේ මේ සියල්ලටම පොදුවේ පවතින මූලික කරුණ කෙරෙහි යොමු වීමය. එනම් රාජ්‍ය සංස්ථාවන් මේ ප්‍රශ්ණ විසඳා ගැනීම සඳහා යොමු වෙනවාද නැද්ද යන්න ගැන සිවිල් සමාජය හඳුනා ගන්නේ කෙසේද, වෙනස්කම් අවශ්‍යය ස්ථාන පිළිබඳව දැනීමක් රටේ සමස්ථ ජනතාව තුල ඇති කර ගැනීමට සිවිල් සමාජයට කල හැක්කේ මොනවාද හා එවනි කර්තව්‍යන් සිදු කිරීම සඳහා සිවිල් සමාජය තුලම පැවතිය යුතු නිපුණත්වයන් මොනවාද යන ප්‍රශ්ණ හඳුනා ගැනීමය.

වල් පල් දෙඩවීමට හා විවිධ ආකාරයේ වැදගැම්මකට නැති සාකච්ඡාවන් කිරීමට පමණක් සිවිල් සමාජයට හැකියාව ඇත්නම් එයින් ප්‍රකාශයට පත් වන්නේ රටේ සිවිල් සමාජය තුලම ඇති වන ගැටලුය. රජයකින් ඇතිවන ගැටලු කෙලින්ම විසඳීමට සිවිල් සමාජයට බැරිය. සිවිල් සමාජයට කල හැක්කේ එහි ශක්තිය මගින් රාජ්‍ය ආයාතන පිළිබඳව ඇතිකර ගන්නා සහයෝගය හා විවේචන තුලින් තමන්ගේ අයිතිවාසිකම් ඉදිරියට ගෙන යාමයි.

මෙමෙ කරුණු සම්බන්ධයෙන් ලංකාවේ සිවිල් සමාජය තුල උවමනාවක් ඇති වුවහොත් හා ඒ පිළිබඳව තමන් පිළිබඳවම විවේචනශීලිව බැලීමට හැකියාවක් වර්ධනය උවහොත්, ලංකාවේ පවතින ප්‍රශ්ණ විසඳා ගැනීම සඳහා විශාල දායකත්වයක් සිවිල් සමාජය මගින් ලබා දිය හැකි ය.

# නිදහස් අධ්‍යපනයේ ඵල නෙලා ගැනීම
# 06

නිදහස් අධ්‍යාපනය සමාජීය සචලතාවය (Social mobility) ලංකාව පුරා වැඩි දියුණු තත්වයකට පත් කිරීම කෙරෙහි බලපෑ ඉතා ප්‍රධාන හේතුවක් සේ පවතී. සමාජ සචලතාවය තුලින් බිහි වූ සමාජ පුබුදුව හා ගමන් වේගය වර්තමාන ලාංකීය සමාජ ස්වභාවය නිර්ණය කරන ඉතා ප්‍රධාන සාධකයක් සේ පවතී. මෙය තේරුම් ගත හැක්කේ මේ සමාජ සචලිත භාවය ඇති වීමට පෙර පැවති සමාජයත් සමග දැන් පවතින සමාජය සංසන්දනය කිරීම මගිනි. අඩුම වශයෙන් පොළොන්නරු හුගයේ සිට ලංකාවේ ඇති වූ සංස්කෘතිය, කුලය මත පදනම වූ සමාජ සංවිධාන රටාවක් තුල ගොනු වී තිබුනි. ඉතිහාසඥයන් පෙන්වා දී ඇති ආකාරයට සමාජ සංවිධානයේ ප්‍රධාන සාධකය වූයේ කුලයයි. මෙහි අර්ථය කුමක්දැයි වටහා ගැනීම ලංකාවේ දැන් පවතින තත්වය වටහා ගැනීමේදී අත්‍යාවශ්‍යය සාධකයක් වේ.

අඩුම වශයෙන් පොළොන්නරු යුගයේ අග සිට පැවති ශතකයන් හිදී සමාජය සංවිධානය වී තිබුණේ සමාජ සචලතාවයට ඉඩ කඩ මුලුමනින්ම අහුරාය. කුලය යන සමාජ සංවිධානයෙහි ප්‍රධානම සාධකය නම් කිසියම් අයෙකුට තමන්ගේ සමාජ තත්වය වෙනස් කර ගැනීමට අයිතියක් නැත යන ප්‍රධාන සමාජ සංකල්පයේය. මෙය ඉතා සරලව විස්තර කලහොත් මෙයින් අදහස් වන්නේ යම් පුරුෂයෙක් අනිවාර්යෙන්ම තමන්ගේ පියා යෙදුනු රැකියාවෙහිම යෙදිය යුතු බවය. එම පුද්ගලයා කුලීන යන

කණ්ඩායමක් තුලට වැටේ නම් ඔහුගේ වැඩ එම තමන්ගේ පියාට උරුම වූ විෂයට සීමා වේ. එනම් ඔහු රදලයෙක් නම් උපතින්ම ඔහුගේ පුතාද රදලයෙකු වන අතර පියා කල කටයුතු වල ඔහුද යෙදිය යුතුය. අනෙක් අතට ඔහු කුල හීන යන ගනයට වැටුන හොත් ඔහුගේ පියා කල රැකියව ඔහුද යොමු විය යුතු රැකියාව වේ. පියා මාලු අල්ලන්නෙක් නම් පුතාද එසේම විය යුතුය. පියා කුරුඳු කර්මාන්තයේ යෙදෙන්නනේ නම් පුතාද එසේම විය යුතුය. පියා නැට්වුක් කාරයෙක් නම්, ඔහු බෙර වාදනය නරන්නෙක් නම් පුතාද එම කාර්යයම කල යුතුය. පියා රෙදි සෝදන්නෙකු නම් පුතාද එම කාර්යෙහිම යෙදිය යුතු වේ. මේ ආකාරයට මූලික සිද්ධාන්තය නම් සමාජය තුල එක් රැකියාවක සිට තවත් රැකියාවක් කරා යොමු වීමටවත් එක සමාජ තත්වයක සිට තවත් සමාජ තත්වයකට ඉහට බැසීමට හෝ පහල බැසීමටවත් කිසිවකුට ඉඩක් ඇත්තේ නැත.

මේ සමාජ සචලතාවය රැකගනු ලැබූයේ බොහෝ උපක්‍රම යොදමිනි. ඒවා අතර ප්‍රධාන තැනක් ගත්තේ ඇඳුම් පැඳුම්ය. කුලීනයන්ගේ ඇඳුම් පැලඳුම් ඔවුනගේ ඉහල තරාතිරමක් පෙන්නුම් කරන ආකාරයට සකස් කර තිබුනි. කුලහීන යැයි කණ්ඩායම් වල පිරමින්ට බොහෝ විට ශරීරයේ ඉහල කොටස වසා ඇඳුමක් ඇඳීම පවා තහනම් කර පැවතියේය. මේ පිළිබඳව විශාල අධ්‍යනයන් සිදු කර ඇති අතර ඒවායේ එදා ඇඳුම් පිළිවෙත් පිළිබඳවද රූප සටහන් පවා දැක ගත හැකි ය.

මේ අචංචල සමාජය තුල වෙනස්කම් ඇති කරමින් සමාජ සචලභාවයක් ඇති කරවීම සඳහා සාධක ගනනාවක් ඇති විය. විශේෂයෙන් යටත් විජිත බලපෑම් වලට ලක්වීමත් සමග ගමනා ගමන පහසුකම් දියුණු වීමෙන් ගම මූලිකව පැවති කුල සමාජය තුල වෙනස් කම් ඇති විය. තමන් පරම්පාරාවෙන් පරම්පරාවට ජීවත්වූ ප්‍රදේශයක් අතහැර වෙනත් ප්‍රදේශ කරා ගමන් කර විශේෂයෙන්ම අලුතෙන් ඇති වෙමින් පැවතුනු කර්මාන්තයන් පැවති ස්ථානයන් කරා ගමන් කර කර්මාන්තවල සේවකයන්සේ සේවය කිරීමෙන් පවා එක්තරා සමාජ වෙනස්කම් මතුවීමට පටන් ගත්තේය. එහෙත් සමාජය තුල ඉතා ගැබුරෙන්ම මහා වෙනසක් කරා යොමු කරන ප්‍රධාන සාධකය වූයේ නිදහස් අධ්‍යාපනයයි. මේ මාර්ගයෙන්

කුල නොතකා සියලු දෙනාටම පාසල් යෑම අනිවාර්ය කරන ලද අතරම එම නිසාවටම එකිනෙකා අතර හමුවීම් හා ගැටීම්ද සිදු විය. පසු කාලීනව විශ්ව විද්‍යාල ඇති වීම මෙන්ම අධ්‍යාපනය මත පිහිටා රැකියාවන් වලට බදවා ගැනීමේදී ද පියාගේ රැකියාව පුතා කල යුතුය යන මතය බරපතල ලෙස හැල්ලු වී ගියේය.

දශකයෙන් දශකයට මේ සමාජ සචලතාවය වඩ වඩාත් වර්ධනය වීම නිසා අද ඉතා ඉහල තනතුරුයැයි සලකන වෛද්‍ය වෘතිය, විවිද විද්‍යාවන් වලට සම්බන්ධ වූ වෘතීන් ගුරුවර වෘතිය විශ්ව විද්‍යාල වල ආචාර්යවරුන් මහාචාර්යවරුන් ආදිය පිලිබදව පවතින රැකියාවන් මෙන්ම කලමණාකරුවන්, වානිජ්‍ය පිළිබදව කටයුතු වල යෙදෙන්නන්, වෙළදාම ආදී කටයුතු වල යෙදෙන්නන්ද, නීතිඥයන් මෙන්ම අධිකරණ නිලධාරීන් ආදී වශයෙන්ද සමාජයේ සෑම අංශයක්කරාම නිදහස් අධ්‍යාපන ක්‍රමය තුලින් බිහිවූ අයටද ඇතුල්වීමේ ඉඩ කඩ පළල් විය.

මේ සමාජ චචලතාවය බිදිය නොහැකිසේ දැන් ස්ථාවර වී හමාරය. කුල ක්‍රමයේ මූලික පදනම බිදී ගොස් හමාරය. එය හුදෙක් විවාහය, පවුල් සම්බන්ධ කටයුතු වලදී ඇති වී ඇති වෙනස්කම් වලට විශාල වශයෙන් වැඩි ප්‍රමාණයකින් රැකියා ක්ෂේත්‍රයට හා සමාජ සම්බන්ධයන් පිළිබද ක්ෂේත්‍රයන්ට බොහෝ දුරට පැතිරී ගොස් ඇත.

මෙසේ සමාජ සචලතාවය තුලින් නව ජීවන රටාවන් කරා යොමු වීමට හැකියාව ලැබුනු නිදහස් අධ්‍යාපනය තුලින් ඇතිවුනු පරම්පරාවන් කොයි ආකාරයකින් තමන්ගේ සමාජ තත්වයන් ස්ථාවර කරගන්නවාද යන ප්‍රශ්ණය මෙන්ම තමන්ගේ සමාජයෙන් නිර්මාණය කරන්නන් බවට පත් වන්නේ කෙසේද යන්න ලාංකීය ඉතිහාසයෙහි ඉතාම වැදගත් ප්‍රශ්ණයක් සේ පවතී. මේ කර්තව්‍ය කර ගැනීම සදහා අවශ්‍යය වාතාවරණය සමාජ සචලතාවය තුලින් ඇති වී ඇත. කෙනෙකුට තමන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කර ගැනීමට අවශ්‍යයනම් ඊට පදනම පාසල් වල ලබන අධ්‍යාපනය, විශ්ව විද්‍යාල වල ලබන අධ්‍යාපනය මගින් හම්කරදී ඇත. අධ්‍යාපනය වනාහි සාගරය මෙන් විශාල ක්ෂේත්‍රයකි. එම අංශයන්හි වැඩිපුර යෙදීමටත් එල ප්‍රයෝජන ගත හැකි කම මීට

පෙර සමාජයේ පහල ආදායම් මට්ටම් වල ඉපදුනු අය සතුව පැවතුනේ නැත. එහෙත් දැන් එය කාත් සතුව පවතී. බොහෝදුරට අවශ්‍යය පදනම වන්නේ ස්වයං උත්සාහය හා අධිෂ්ඨානයයි. එම ස්වයං උත්සාහය හා අධිෂ්ඨානය ඇත්නම් බොහෝදේ ඉගෙන ගෙන අලුත් නිපුණතාවයන් ඇති කරගෙන එම නිපුණතාවයන් ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව අද පළල්ව පවතී.

මෙසේ සමාජ සචලතාවය තුලින් ඇති වූ තවත් කොටසක් නම් විදේශ රැකියාවන් සඳහා රටෙන් පිට වී සිටින බොහෝ දෙනාය. ඔවුන් අතර වැඩි දෙනෙක් සුලු රැකියාවන්හි යෙදෙන නමුත් ඔවුන් එයින් ලබන ආදායම ලංකාවේදී ඔවුන්ට ලැබිය හැකිව තිබූ ආදායමට වඩා වැඩි ආදායමකි. මෙසේ ලබා ගන්නා ආදායම බොහෝ විට වැඩි දෙනෙක් යොදනු ලබන්නේ තම දරුවන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කර ගැනීම සඳහායි. මේ නිසා මේ කණ්ඩායම් තුලින්ද රටේ සමාජ සචලතාවය වර්ධනය වීම ඉතා පළල් ලෙස සිදු වෙමින් පවතියි.

# නිදහස් අධ්‍යාපනය හා කුල ක්‍රමයෙන් ඇති වූ හීනමානයේ බලපෑම
# 07

කුල ක්‍රමයේ බලපෑම මුලුමනින්ම නැතිවී ගොස් ඇතැයි කීම අතිශෝක්තියකි. කුල ක්‍රමයේ සමාජ බලපෑම අඩු වෙමින් පවතින නමුත් මානසිකව මෙහි ඇති බලපෑම තවමත් ඉතා ගැඹුරින් පවතී. ශතවර්ෂ ගනනාවක් සමාජයේ නොවැදගත් පුද්ගලයන් සේ සලකනු ලැබූ කුල හීනයැයි කියනු ලැබූ කණ්ඩායම් තුල එම සමාජ ක්‍රියාවලිය තුලින් ඇති කරනු ලැබූ හීන මානයක් පවතී. මෙය නැතැයි ප්‍රතික්ෂේප කිරීම තමන්ගේ ලාභයට නොව තමන්ගේ පාඩුවට පිහිට වන කරුණකි. මේ නිසා නිදහස් අධ්‍යාපනයේ ඵල නිසි ලෙස ලබා ගැනීමට නම් රටේ කුල හීනයයි කලෙක සලකනු ලැබූ කණ්ඩායම් මගින් ඉස්මතු වන අය තුල අතීතයෙන් ඇති කරන ලද භීතිය මෙන්ම සමාජ කටයුතු වලදී ඉදිරිපත් නොවී පසුබා සිටීමේ ගති ලක්ෂණය හා සමාජ කතිකාවේ සහභාගි වීමට ඇති චකිතය ආදී ගුණාංගයන් නැති කර ගැනීම හිතා මතාම කලයුතු දෙයක් බවට පත්විය යුතුය. මෙය ඉබේම නැතිවන්නේ නැත, මන්දයත් නිතරම සමාජයේ වෙනස්කම් වල වේගයෙන් මනසේ ඇතිවන වෙනස්කම් සිදු නොවේ. මනසේ වෙනස්කම් සිදු වන්නේ හෙමිහිටය. ඒවා ඉවත් කර ගත හැක්කේ දැනුවත්වම එම ගැටලු හඳුනාගෙන ඒවා පරාජය කිරීමේ අධිෂ්ඨානයක් ජනතාව තුල ඇති වීම පමණි.

මේ පිළිබඳ උදාහරණයන් ලෝකය පුරාම පවතී. උදාහරණයක් වශයෙන් වහලුන්යැයි කලෙක සලකනු ලැබූ පුද්ගලයන් නිදහස්

මිනිසුන් බවට පත්වීම යුරෝපය, ඇමරිකාව ආදී රටවල් වලින් ඇති වුනු අත්දැකීම සලකා බැලිය හැකි ය. වහලා සලකනු ලැබුවේ සතෙකු ලෙසය. වහලා ස්වාමියාගේ භාණ්ඩයක් විය. ස්වාමියාගේ කැමැත්තට අනුව වැඩ කිරීම මෙන්ම ස්වාමියා දෙන දෙයක් පමණක් ලබා ගැනීම ඔහුට හිමි වූ උරුමය වී තිබුනි. මේ තත්වයට මිනිසුන් පත් කර ගැනීම සඳහා ඉතා බරපතල ලෙස මිනිසුන්ට දඬුවම් කිරීමට සිදුවිය. මේ කාලයේ බරපතල වදහිංසාවන් මගින් වහලුන් පාලනය කිරීම සිදු වූ බවට විශාල වශයෙන් සාක්ෂි එකතු කොට දැන් කෞතුකාගර වල ප්‍රදර්ශණය කර ඇත. මේ තත්වයෙන් ඔවුන් මිදුනේ හිතාමතාම ඔවුන්වත් ඔවුන්ට ආධාර කල අය මගින් ඔවුන්ගේ ආත්ම ශක්තිය වර්ධනය කර ගැනීමත් තමන්ද අන් කිසිම මිනිසකුට නොදෙවෙනියි යන අදහස ඔවුන් තුල ඇතිකර ගැනීමටත් ඒ මාර්ගයෙන් සමාජයෙන් තමන්ට ලැබිය යුතු සමාජ තත්වය ලබා ගැනීමට ඔවුන් තුල ඇති වූ ඒ ධෛර්‍යය සම්පන්න අරගලයත් නිසාය.

මේ අනුව සමාජ චලිතතාවය තුලින් ඇතිවුනු මහා වෙනස වඩාත් ගැඹුරු මට්ටමකට ගෙන යාමටනම් එම ගැඹුරු මට්ටම තුලින් ජනතාවට තමන් සිටි පහළ මට්ටම් වල සිට මැද හා ඉහල ගමන් කිරීම අතර සචලභාවය ස්ථාවර කර ගැනීමටත් ඒ මාර්ග යෙන් මුලු සමාජය තුල පවතින සමාජ රටාව මෙන්ම සමාජ වටිනාකම් වෙනස්කර ගැනීමටත් ඇති හැකියාව අද ලංකාවේ නිදහස් අධ්‍යාපනයෙන් බිහිවූ පරම්පරාවන් අතට හිමි වී ඇත. එසේ කර ගැනීම සඳහා ඉතා දැනුවත් ව්‍යාපාර ඇති වී මිනිසුන්ගේ ආත්ම ශක්තියේ විශාල වෙනස්කමක් ඇති වීම රැඳී පවතින්නේ ටික දෙනෙක් මේවා පිළිබඳව උනන්දුවීම තුලින් ඇති කර ගත හැකි වෙනස තුලිනි.

මීට ඉතා කිට්ටු උදාහරණයක් ඉන්දියාවේ කේරල ප්‍රන්තයේදී සිදු විය. කුලහීනයිය සලකනු ලැබූ කණ්ඩායම් ඉතා දරුණු ආකාරයකින් සලකනු ලැබූ ඉන්දීය සමාජය තුල ඒ පිළිබඳව විශාල වෙනසක් ඇති කර ගැනීමට හැකිවූ එක් ප්‍රාන්තයක් නම් කේරල ප්‍රාන්තයි. එහි සිටි බොහෝ දෙනා රා පෙරීම පිළිබඳ කර්මාන්තයන්හි යෙදී සිටි අතර කිසි ආකාරයක සමාජ ප්‍රගතියක් ලබා ගැනීම වලක්වා තිබුනි. එහි ඇතිවූ ඉතා දක්ෂ සමාජ පරිවර්තකයකු වූ

නාරායනගුරු ස්වාමි යන අයගේ නායකත්වය තුලින් මේ මිනිසුන් ඔවුන්ම හමිකරගෙන සිටි මානසික තත්වයෙන් මුදාගත් අතර එයින් ඇතිවූ සමාජ වෙනස දැන් කේරල ප්‍රාන්තයේ දැකගත හැකි ය. කලෙක ඉතා බෙලහීන කණ්ඩායමක් වශයෙන් සිටි එම රා පෙරීමේ කර්මාන්තයේ යෙදුනුවුන් අද එම ප්‍රදේශයේ සිටින ධනවත්ම කොටස් හා සමාජයේ බලවත්ම කොටස් බවට පත්වී ඇත. මෙවනි පරිවර්තනයක් ඇතිකර ගත්තේ හිතාමතා තමන්ගේ අධිෂ්ඨාන ශක්තිය යොදා ගනමින් සමාජ සචලතාවයේ ඇතිවී ඇති වෙනසත්, එල නෙලා ගැනීමට උත්සාහ කරන පරම්පරාවක ව්‍යායාමය තුලිනි.

## දෙවන කොටස

# ඉතිහාසය

# ජනතා ඉතිහාසයක අවශ්‍යතාවය. 01

ඉතිහාසය නායකයන්ගේ හා බලවතුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව සටහනක් සේ සැලකීම සාමාන්‍ය සිරිතකි. එවනි ආකාරයේ ඉතිහාසය ලිවීම බොහෝ කාලයක් පුරාම පැවත ඇත. විවිධ රජවරුන්ගේ හෝ බලවත් සෙනෙවියන්ගේ හෝ පසු කාලීනව රාජ්‍ය නායකයන්ගේ කෙරුම්කාරකම් පිළිබඳව ලියවී ඇති ඉතිහාස ග්‍රන්ත අපමණය.

ඉතිහාසය හුදෙක් රජවරුන්ගේ හා බලවතුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව සටහනක් නොවන බවත්, සමාජයන්හි විසූ මිනිසුන් කලකී හා හිතුදේ බවත් ලිවීම, ඓතිහාසික ක්ෂේත්‍රයට එලබුනේ මෑත කාලයේදීය. මේ අනුව ඇමරිකානු ඉතිහාසය සම්බන්ධයෙන් ජනතා ඉතිහාසය ලියවී ඇති අතර ඒ තුලින් සාමාන්‍ය ඉතිහාස ග්‍රන්ත වලට ඇතුලත් නොවන බොහෝ කරුනු හෙලිදරව් විය. මේ ආකාරයටම ඉන්දියාව තුලද ඉතිහාසය පිළිබඳව, ලිවීම පිළිබඳව අදහස් වෙනස් වීමක් 20 වන ශත වර්ෂය පුරා දැක ගත හැකි යි. බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය කාලයේදී ලියවුනු ඉතිහාස පොත් වල ඉන්දියාව පිළිබඳව ලිය වී ඇත්තේ බොහෝ දුරට ඉන්දියාවේ ප්‍රබල කුලය වූ බ්‍රාහ්මණයන් විසින් ඉන්දියාව පිළිබඳව ප්‍රකාශයට පත් කරන ලද අදහස්ය.

මේ තුලින් පැන නැගුනු විවිධාකාර මත බොහෝ කාලයක් තිස්සේ විශේෂයෙන්ම යුරෝපයේ ඉන්දියාව පිළිබඳය තිබූ අවබෝධය තීර්ණය කලේය. මේ අවබෝධයට අභියෝග එල්ලවීමට පටන් ගත්තේ ඉන්දියාව තුල ඇතිවූ නව බුද්ධිමතුන්

විසින් එතෙක් ඉන්දියාව පිළිබඳව ලියවී තිබූ වංශකතාවට වෙනස් කතාවක් නිර්මාණය කිරීමට පටන්ගත් පසුයි.

ලංකාව පිළිබඳවද ඉතිහාසයේ බොහෝ දුර ලියවී ඇත්තේ මුල් කාලයේදී මහාවංශය පදනම කරගත් වෘතාන්තයන් තුලත්, පසු කාලයේදී විශේෂයෙන්ම පෘතුගීසීන්ගේ පැමිනීමේ සිට බ්‍රිතාන්‍යයෙන් නිදහස්වීම අතර කාලය තුල විවිධ ආණ්ඩුකාරයන් විසින් කරන ලද ක්‍රියාවලීන් පිළිබඳව විස්තර කිරීමක් වශයෙනි.

## සාමාන්‍ය ජනයා කල කී දේවල්

මේ කාලවලදී සමාජයේ ජීවත් වූ මිනිසුන් කලේ මොනවාද? ඔවුන් ඔවුන් අතර පැවති සම්බන්ධකම් මොනවාද? ඔවුන් තමන්ගේ පැවැත්ම සඳහා විවිධ කර්මාන්තයන් වැවිලි කර්මාන්තයන් වර්ධනය කර ගත්තේ කෙසේද? සමාජය තුල ඇති වූ සංවිධානයට පදනම වූයේ කුමන අදහස්ද? එම සමාජ ක්‍රමය තුල සමාජයේ විවිධ තරාතිරම් වල අය බිහිවූයේ කෙසේද හා එසේ විවිධ තරාතිරම් වල ඉහල මට්ටමක යැයි සැලකූවන් හා එසේ නොවූවන් අතර සම්බන්ධය පැවතුනේ මොන ආකාර වලින්ද? මෙසේ පැවති විවිධ ක්‍රියාකාරකම් තුලින් ඉස්මතුවූ මානසික තත්වයන් මොනවාද? මේ මානසික තත්වයන් කොතෙක් දුරට රටේ පැවති සංස්කෘතිය නිර්මාණය කිරීම කෙරෙහි බලපා තිබේද? ආදී විවිධ කරුණු සලකා බැලීම මගින් ඒ ඒ කාලවලදී ජනතාව ජීවත්වූයේ කෙසේදැයි සලකා බැලිය හැකි ය.

මෙසේ ජනතා ඉතිහාසයක් පිළිබඳව සලකා බැලීමේදී ඉතාම වැදගත් කරුණක් වන්නේ එම සමාජය තුල කාන්තාව ජීවත්වූයේ කුමන ආකාරයෙන්ද යන්න පිළිබඳව අවබෝධයක් ඇතිකර ගැනීමය. ඉතිහාසය වනාහි පුරුෂයන් විසින් කරනු ලබන වැඩකටයුතු පිළිබඳ සටහනක්ය යන අදහස ඉතා ගැඹුරින්ම පැලපදියම් වී ඇති අදහසකි. එහෙත් කාන්තාවන් එම සමාජය තුල ජීවත්වූයේ කෙසේද? එසේ ජීවත්වීම කෙරෙහි බලපෑ කරුණු මොනවාද? පුද්ගලික ජීවිතයෙහි එනම් පවුල් ජීවිතය තුල කාන්තාව සතු කාර්ය මෙන්ම සමාජය තුලද ඇය සතු කාර්යක් පැවතුනේද? යම් සමාජයක් අවබෝධ කර ගැනීම සඳහා මේ කරුණු අත්‍යාවශ්‍යය කරුණු සේ පවති.

නූතන කාලයේදී විවිධ පුද්ගලයින් පිලිබඳ චරිතාපදාන ලියවී තිබුනත් බොහෝ විට දේශපාලන නායකයන් තමන්ගේ ජීවිත කතාවන් ලියා තිබෙන්නේ කිසියම් සත්‍යයක් ගවේෂණය කරන්නන් ලෙස නොව බොහෝ දුරට තමන් පිළිබඳව වැඩි ප්‍රචාරයක් ලබා ගැනීම සඳහා පමණක් බව ඉතා පැහැදිළිව පෙනීයයි. රටේ අග්‍රාමාත්‍යවරුන් වූ ජනාධිපතිවරුන් බවට පත්වූවන් ඔවුන් අතර සමහරුන් ඔවුන්ගේ ජීවිත කතා ලියා ප්‍රසිද්ධ කර ඇතත් ඒවා පිළිබඳව ජනප්‍රිය භාවයක් පැවතුනානම් එය ඔවුන්ගේ පාලන කාලයට පමණක් සීමාවූ එකක් බව ඉතා පැහැදිළිව පෙනීයයි.

මේ අනුව රටක ජනතාවක් ඇති වූයේ කෙසේද? එම ජනතාවගේ මානසික වර්ධනය වීමක් සිදුවී තිබේද? එම ජනතාවගේ සමාජ සහභාගීත්වයෙහි වෙනස්කම් ඇතිවී තිබෙන්නේ කුමන ආකාරයෙන්ද? රටක් තුල ඇතිවන අධ්‍යාපනික වෙනස්කම් ජනතාවගේ හැසිරීම් රටාවන් වෙනස් කිරීම සඳහා බලපා තිබේද ආදී වශයෙන් ජන ජීවිතයට අදාල කරුණු සොයා බැලීම මගින් පවතින සමාජය පිළිබඳව හා එහි විවිධදේ සිදුවන ආකාරය පිළිබඳව වඩා ගැඹුරු අත්දැකීමක් ඇති කර ගත හැකි ය.

ජනතාවගේ ඉතිහසය යනු ජනකවි ජනකතා ආදිය තුලින් පමණක් දැක, දැනගත හැකි ය යන අදහස බොහෝ කාලයක් සිට පැවත එන්නකි. මේ ජනකවි හා ජනකතා වල වැදගත්කම අඩුතක්සේරු කලයුතු නැත. එහෙත් ඒවා තුලින් පමණක් ජනතාව ජීවත්වූයේ හා එකිනෙකා අතර සම්බන්ධකම් පවත්වගෙන ගියේ මොන ආකාරවලින්ද යන්න වටහා ගැනීම ප්‍රමාණවත් නොවේ. ජන ජීවිතය පිළිබද සලකුණු සෑම තැනකම ඇත. මන්දයත් සමාජයේ සියලුම කටයුතුවල නිර්මාණ කරුවන් වන්නේ ඔවුන් නිසාය. කිසියම් කෘෂිකර්මයක හෝ වෙනත් කර්මාන්තයක හෝ ජනතාවගේ ඇඟිලි සටහන් නොමැකෙනසේ ලියවී ඇත. මෙවනි කර්මාන්තයන් වර්ධනය වූයේ කෙසේද? ඒවාට සම්බන්ධ වූ විවිධාකාර ගැටලු විසඳාගැනීමේදී ජනතාව අතර පැවති සාකච්ඡා හා අවබෝධයන් මොනවාද? එම කටයුතු වලදී එකිනෙකාගේ අදහස් කෙරෙහි සැලකිල්ලක් දැක්වීම මොන ආකාරවලින් සිදුවී තිබේද ආදී වශයෙන් විවිධ කර්මාන්ත සුලු හෝ පළල් කර්මාන්තයන් පිළිබඳව සොයා බලතහොත් ජනතාව ජීවත්වී

ඇති සංකීර්ණ ආකාරයත් ඔවුන් අතර පැවති සම්බන්ධයන්ගේ සංකීර්ණත්වයත් ඔවුන් මුහුණදුන් විශාල ගැටලුත් පමණක් නොව ඔවුන් තුල පැවති හැඟීම් ආදිය පවා ඉතා පළල් වශයෙන් දැන ගැනීමේ හැකියාව පවති.

## ජනතා සහභාගීත්වයේ ඉතිහාසය.

එමෙන්ම ජනතාවගේ සහභාගීත්වය වැඩි කිරීම හා අඩු කිරීම සම්බන්ධයෙන් රටේ ඇති වූ විවිධ ප්‍රසිද්ධ සංස්ථාවන් කටයුතු කර ඇත්තේ කෙසේද යන්නත් ජන ජීවිතය පිළිබද සොයා බැලීමේදී ඉතා වැදගත් අංශයක් වේ. බොහෝවිට සමාජයේ විවිධ සංස්ථාවන් පැන නැගෙන්නේ ජනතාවගේ කිසියම් උවමනාවන් සදහා මෙන්ම එම උවමනාවන් ඉටුකර ගැනීම සදහා ඔවුන් විසින් කරන ලද බලපෑම් හා ඉල්ලීම් තුලිනි. උදාහරණයක් වශයෙන් රෝග වලට ප්‍රතිකාර ලබාගැනීම පිළිබද උවමනාව සියලුම ජනතාව තුල පවති. මේ නිසා ඊට අදාලව විවිධ සංස්ථාවන් ගොඩනංවා ගැනීම සදහා උනන්දුව ඔවුන් තුල පවති. විවිධ මාවත් ඔස්සේ ඔවුන් තමන්ගේ මේ උවමනාවන් සමාජයේ ඉහලතල දක්වා ගෙන යාමට උත්සාහ කරති. එම කටයුත්ත සිදු කිරීම සදහා අතරමැදියෝද බිහිවේ. මේ අතර මැදියන් සමහරවිට ලේකබයන්, විවිධාකාර කතිකාවන් පවත්වන්නන් උදාහරණයක් වශයෙන් ආගමික කතිකාව, විවිධාකාර විෂයන් පිළිබදව ඇතිවන කතිකාව ආදිය මේ ගනයට වැටේ. වර්තමාන කාලය වන විට බුද්ධිමතුන්ගේ කර්තව්‍යද මේ අතර මැදියන්ගේ කාර්යභාරයට වැටේ. මේ අතර මැදියන් කොතෙක් දුරට ජනතාවගේ උවමනා එපාකම් නිසිලෙස ප්‍රකාශයට පත් කරන්නෝද නැතහොත් එම ජනතා ප්‍රකාශයන් යම් ආකාරවලින් මැඩපවත්වීමේ යෙදෙන්නෝද යන්න වැදගත් කරුණකි. බොහෝදුරට ජනතාවගේ බලපෑම් සමාජ සංස්ථාවන් තුලට ඇතුලත්වීම කෙරෙහි මේ අතැ මැදියන් බලපවත්වයි. යම් විෂයන් පිළිබදව දැඩි උවමනාවකින් කටයුතු කරන අතරමැදියන් ඇතිවුවහොත් ඔවුන් තුලින් ජනතාව එම එක් එක් සංස්ථාව තුලින් බලාපොරොත්තුවෙන්නේ මොනවාද, එම බලාපොරොත්තු ඉටුකල හැකිසේ එම සංස්ථාව සකස්කර ගන්නේ කෙසේද, එම සංස්ථාවෙහි දැනට පවතින අඩුපාඩුකම් මොනවාද

ආදිය ප්‍රකාශයට පත්කරනු ලබයි. මේ ප්‍රකාශය ජනතාවතුල මෙන්ම පාලනයට සම්බන්ධවන්නා වූ නිළධාරී තන්ත්‍රයන් තුලද සාකච්ඡාවක් ඇතිකිරීමට සමත්වේ. එවනි සාකච්ඡාවක් පවතින සමාජයක් ඇතිවන්නේ කෙසේද? එසේ නැත්නම් එවනි සමාජයක් බිහිවීම කෙරෙහි අගතිකාමී ආකාරයකින් බලපැවති ඓතිහාසික සාධක මොනවාද යන්න පිළිබඳව සොයා බැලීමේදී ජන ජීවිතය පිළිබඳව ඉතා ගැඹුරු අවබෝධයක් ඇතිකරගත හැකිවේ.

## දේශපාලන වාචාලකම

මේ නිසා ජනතා ඉතිහාසය පිළිබඳව ලිවීම හා කතිකාව හොඳින් වර්ධනයවන තරමට සමාජයතුල ඇතිවන විවිධ කතිකාවත් වඩා බුද්ධිගෝචර ආකාරයකින් හා කාටත් ප්‍රයෝජනවත් වන ආකාරයකින් පවත්වා ගත හැකියි. එසේ ජන ජීවිතය හා ජන ඉතිහාසය පිළිබඳව ගැඹුරු ප්‍රකාශයක්පත් නොවන සමාජයක්තුල බොහෝදුරට දේශපාලන වාචාලකම පැතිරීයයි. උඩින් සිට දොඩවන්නන්ගේ හඩින් සමාජය දෝංකාරය වේ. එසේ උඩින් සිට දොඩවන්නෝ වැඩි වශයෙන් දේශපාලඥයන් වීම පුදුමයක් නොවේ. ජන ජීවිතයේ උවමනා එපාකම් ඉටු කිරීමට බද්ධවූ දේශපාලඥයා හා එසේත් නැතුව තමන්ගේ පැවැත්ම සඳහා දේශපාලනයක් පවතින දේශපාලඥයන් අතර ඇති ප්‍රධාන වෙනස්කම්නම් මේ දෙවනි ඝණයට අයත් වන දේශපාලඥයන් බොහෝදුරට නන්දොඩවන, විකාර කතිකාවක් පවත්වාගෙන යාමට උත්සාහ කරන වාචාල සංස්කෘතියක් බිහිකිරීමට උත්සාහ කරයි. එය එසේ වන්නේ ජන ඉතිහාසය හා ජන ජීවිතය පදම් වූ සකාච්චාවක් කිරීමට හැකි ප්‍රමාණයක් සහභාගිවන්නන් නැති වූ තැන ඇතිවන හිස්තැන පිරිවීම සඳහායි. මේ නිසා බුද්ධිගෙ ්චර ආකාරයකින් සමාජයේ සංවාදයන් දියුණුකර ගැනීම සඳහා අත්‍යාවශ්‍යය එක් කොන්දේසියක් වන්නේ ජන ජීවිත ඉතිහාසය ගැන වඩා වගකිව යුතු ආකාරයකින් සලකා බැලීම කිරීම තුලිනි. මේ ක්ෂේත්‍රයේ දියුණුවක් ඇතිවීම පොදුවේ සිවිල් සමාජය තුලිනුත් අනෙක් අතින් බුද්ධිමත් කණ්ඩායම් අතින් හා මාධ්‍ය තුලිනුත් සිදු කල හැකි ය.

# ජන ජීවිතයේ අතීතය
# 02

ලංකාවේ අතීත ඉතිහාසය කොපමන කාලපරිච්ඡේදයකට දිව යන්නේද යන ප්‍රශ්ණය පැන නැගුවහොත් ඊට ක්ෂනිකවම ලැබෙන පිළිතුර වන්නේ ලංකාවට අවුරුදු 2500 වැඩි ඉතිහාසයක් පවතින බවයි. මෙය බොහෝදුරට නිර්ණය කර ඇත්තේ විජය රජු හා ඔහු සමග පැමිණි කණ්ඩායම පැමිණි දින සිට පටන්ගන්නා ඉතිහාසයක් වශයෙනි. විජය රජු පිළිබද මත්‍යා කතා වටා ඇත්තේ ලංකාවට සංක්‍රමණිකයන් පැමිනීමත්, එම සංක්‍රමණිකයන් අතරින් පටන්ගත් ඉතිහාසයක් ලංකාවේ පහළ වූ බවය.

එහෙත් ඉතිහාසය පිළිබදව වර්තමානයේදී කරනු ලබන සාකච්ඡාවල් එයට බොහෝ ඈත කාලයක් පිළිබදව කෙරෙන කතාවක් සේ පවතී. ලෝකයේ පැවැත්ම වසර බිලියන ගනනාවකට පෙර සිදුවූවක් සේ අද විද්‍යාත්මකව පිළිගනු ලබයි. එහි ඇති විවිධ අවධීන් තුලින් ඉස්මත්තට අවුත් මිනිසුන්ගේ පටන්ගැන්ම අවුරුදු හැත්තෑ දහසකට පමණ පෙර සිදු වූවක් සේද සලකනු ලබයි. ඉතිහාසය පිළිබදව මේ පළල් දැක්ම අත්‍යාවශ්‍ය එකක් සේ සලකනු ලබන්නේ ඒ මගින් මනුෂ්‍යයාගේ පරිණාමය පිළිබදවත්, මනුෂ්‍යය වර්ගයාගේ පරිණාමය පිළිබදවත්, එම පරිනාමට බද්ධ වූ ස්වභාවධර්ම වර්ධනයේ පරිණාමය පිළිබදවත්, එකානෙකින් වෙන් නොකර කරන සාකච්ඡාවක් වශයෙන් ඉතිහාසය පිළිබද කෙරෙන සාකච්ඡාව වර්තමාන ලෝකයේදී සිදු කරනු ලබන නිසාය.

මෙහිදී මනුෂ්‍යයන් ලංකාව තුල මුලින්ම ඇතිවූයේ කවදාද? මොන ආකාරයෙන්ද? යන ප්‍රශ්ණය ඇතිවේ. මේ පිළිබඳව විශාල දැනුමක් දැනට ඒකරාශීවී නොමැත. එසේ උවත් පොදුජන ව්‍යවහාරයේ පවා දන්නා දෙයක්නම් සංක්‍රමණිකයන් ලංකාවට පැමිණි කාලයට පෙර ආදිවාසී ජනතාවක් ලංකාවේ ජීවත්වූ බවය. මේ ආදිවාසී ජනතාව වැද්දන් ලෙස නම්කරනු ලැබ ඇත. ඔවුන්ගේ ඉතිහාසය කොපමණ දුරක ඈතට යන්නේද යන්න පිළිබඳව වැඩි දැනීමක් ඇතිකර ගැනීමට හැකිවන තරමට, ලංකාව තුල ගොඩනැගී ඇති සමාජ සංවිධාන රටාව මෙන්ම සංස්කෘතිය පිළිබඳවත් වඩා ගැඹුරු අවබෝධයක් ඇතිකර ගත හැකි ය. වර්තමානයේ පවතින විවිධ සමාජ විෂමතාවයන් ඇතිවීම සම්බන්ධයෙන් සොයා බැලීමේදී මේ අතීත දැනීම ඉතා වැදගත් වේ.

සංස්කෘතික සාකච්ඡාවල් තුලින් වැදි ජනතාව එනම් ලංකාවේ ආදිවාසීන් වෙන්කර කතා කිරීම බොහෝදුරට සිදුවන්නේ ලංකාවේ ඉතිහාසයේ පටන් ගැන්ම මේ ආදිවාසී ජනතාව පරාජය කිරිමෙන් පසුව පටන්ගත් එකක්සේ මෙතෙක් සලකා තිබීම නිසාය. මෙසේ කරනු ලබන වෙන්කිරිම තුලින් කියවෙන්නේ ලංකාවේ ආදිවාසී ජනතාවට සංස්කෘතියක් නොතිබුනාය යන්නය. එවනි මතයන් වෙනත් රටවල් තුලද එක්තරා කාලයකදී පැවත ඇත. එහෙත් ආදිවාසීන් පිළිබඳව ඇති දැනීම වැඩිවීමත් සමගම ඔවුන්ට සංස්කෘතියක් නොතිබුනාය යන සංකල්පය ඉතා වැරදි සහගත අදහසක් සේ හෙළිදරව් වී ඇත.

ලෝක ඉතිහාසය දෙස බලනකල ආදිවාසීන් ජීවත්වූ කාලය හා ඉන්පසු සංවිධාත්මක කෘෂිකර්මය බිහිවීම අතර විශාල සංස්කෘතික වෙනස්වීමක් සිදුවූ බව ගවේෂණය කොට ඇත. සංවිධානාත්මකව ගොවිතැන දියුණු කිරීම මත පදනම වන ජන සංවිධාන බිහිවීම සිදුවූයේ දැනට අවුරුදු දොළොස් දහසකට පමණ පෙරයැයි දැන් පවතින ගවේෂණ මත පොදුවේ පිළිගත් මතයක් සේ පවතී.

මේ අනුව ලංකාවේ ආදිවාසීන්ගේ යුගය එනම් දඩයමෙන් ජීවත්වූ මිනිසුන්ගේ යුගය පසුකොට සංවිධානාත්මකව ගොවිතැන් කිරීම මත පදනම වන යුගය පටන් ගත්තේ කවදාද යන්න නිශ්චය කර ගැනීම ලංකාවේ සංස්කෘතික වර්ධනය පිළිබඳව හෝ

සංස්කෘතික පසුබැම් පිළිබඳව අවබෝධයක් ඇතිකර ගැනීම සඳහා අවශ්‍යයව ඇත.

කෙසේවුවත් පිටරට සංක්‍රමණිකයන් ලංකාවට පැමිණ පදිංචි වීමට බොහෝ කාලයකට පෙර සිටම ලංකාවේ ආදිවාසීන් ජීවත් වූ බව විවාදයෙන් තොරව පිළිගතහැකි කරුණකි. ලංකාව පුරාම විශාල වශයෙන් කැලෑව පැවතුන අතර එම කැලෑවන්හි මේ ආදිවාසීහු ජීවත්වූහ. ආදිවාසීනගේ සමාජය පැවති කාලය හා සංවිධානාත්මක ගොවිතැන පටන්ගත් කාලය අතර ඇති ප්‍රධාන වෙනස නම් ධනය ඒකරාශීකර ගැනීම මත සමාජ විශමතාවයන් ඇතිවූ කාලය පටන්ගනු ලබන්නේ සංවිධානාත්මකව කෘෂිකර්මය පදනම වූ ආර්ථිකයක් ඇතිවීමත් සමගය යන්න පිළිබඳව අද ගවේෂකයන් අතර ඇති පොදු එකගතාවය මතය.

ආදිවාසීන් ජීවත්වූ සමාජය තුල පරිසරය පිළිබඳව පැවතියේ සංවිධානාත්මක කෘෂිකර්මාන්තය පටන්ගත් කාලයේ පැවති මිනිසුන් තුල ඇතිවූ සංකල්පයනට වඩා වෙනස් අදහස්ය. ඔවුහු තමන්ගේ එදිනෙදා ජීවිතය සඳහා දඩයම් කිරීමෙන් හෝ විවිධ ප්‍රමාණයන්ගෙන් යම් වැවිලි වල යෙදීමෙන්ම ස්වභාවධර්මයේ වෙනත් සම්පත් අත්කර ගැනීම මත ඔවුන්ගේ ජීවිකාව ගෙන ගියහ. සවභාවධර්මය විනාශවී යන ආකාරයකට ස්වභාවධර්මයේ සම්පත් යොදාගැනීම පිළිබඳ අදහසක් හෝ ඒ මත පදනම වූ ගතිපැවතුම් ආදිවාසී සමාජය තුල පැවතියේ නැත. එය ස්වභාවිකවම ඇති වූ පරිසරය හා ආදිවාසී ජනතාව අතර තිබූ සම්බන්ධය තුලින්ම පැන නැගුණකි. ඔවුන් ජීවත් වූ පරිසරය ඔවුන් විසින්ම නිර්මාණය කරගත් පරිසරයක් නොවේ. එය බොහෝදුරට ස්වභාවධර්මය විසින් දායාද කරන ලද පරිසරයක් වේ. එම පරිසරයේ ඇතිවූ භව බෝග හා සතුන් තමන්ගේ ආහාරය හා පැවැමේ වෙනත්දේ, උදාහරණයක් වශයෙන් වෙදකම සම්බන්ධයෙන් යොදාගත් ඔවුහු ධනය රැස්කිරීම පිළිබඳ අදහස්වූ සංකල්පයන් කරා අවතීර්ණයවී තිබුණේ නැත. මේ නිසා අද ලෝකයේ විශාල ප්‍රශ්ණයක් බවට පත්ව ඇති අධිවේගී ආකාරයකින් ස්වභාවධර්මය විසින් දෙන ලද සම්පත් පාරිභෝජනය සඳහා යොදා ගැනීම තුලින් ඇතිවී ඇති මහා පරිමාණ ගැටලුවල පටන් ගැන්ම සිදුවූයේ මේ ආදීවාසී කාලයන්හි නොවීය. එය ඇතිවූයේ ඉන්පසු කාලයකදීය.

සංවිධානාත්මකව කෘෂිකර්මය පටන්ගැනීමත් සමගම ධාන්‍ය ඒකරාශී කිරීම සම්බන්ධවද විශාල වෙනස්කම් ඇතිවීමට පටන් ගත්තේය. මේ පිළිබඳව කතා සෑම සංස්කෘතියක් තුලම ඇත.

බෞද්ධ සංස්කෘතිය තුල මෙය සිදුවූ ආකාරය බුදුන් වහන්සේ මෙසේ සදහන් කොට ඇත. මුලින්ම මිනිස්සු උදේ නැගිට අසල්වාසීන් සමග කැලයට ගොස් එහි ඇති වූ ධාන්‍ය එදිනෙදාට සෑහෙන්න ප්‍රමාණයක් පමණක් ගෙන පැමිණියහ. මෙය බොහෝ කාලයක් පැවති සිරිතක් බවට පත් විය. එහෙත් එක් දිනයකදී එක් අසල්වැසියෙක් තවත් එක් අයෙකුට කතාකොට අපි ධාන්‍ය ගෙන ඒමට යමුයි යෝජනා කල විට ඔහු කියා සිටියේ මට අද යෑමට අවශ්‍යය නැත. මන්දයත් මම ධාන්‍යය අදටත් හෙටටත් අවශ්‍යය ප්‍රමාණයට ඊයේ එකතු කරගෙන ආ නිසාය. මෙය ඇසූ අසල්වැසියා එදින ධාන්‍ය එකතු කිරීමේදී එදාට පමණක් නොව තවත් දින ගණනකට සෑහෙන පමණකට ධාන්‍ය එකතු කරගෙන පැමිණියේය. මෙසේ කිරීම සියලුදෙනා අතරම පැතිරගිය පුවතක් බවට පත් විය. මෙහි ප්‍රතිඵලය වූයේ එතෙක් පැවති ධාන්‍ය ඉක්මනින් නැතිවී යාමත් සමගම ඇති වූ හිගයය.

මෙවනි කතා විවිධ සංස්කෘතීන්හි සටහන්වී ඇත. මෙයින් පෙනී යන්නේ එක්තරා අවධියකදී ආදිවාසීන් තුල පෙර පැවති පුරුද්ද එනම් එදිනෙදාට අවශ්‍ය වන සේ ස්වභාවධර්මයෙන් තමන්ට අවශ්‍ය දේ ලබා ගැනීමේ පුරුද්ද නැතිවී ගොස් ඉන් පසු අනාගතය සදහා ධනය එකතු කිරීම පිළිබඳව මෙන්ම සමාජය තුල යම් බලගතුකම් ඇති කිරීම සදහාත්, මිනිසුන් තුල පලපුරුදු පිළිබඳව විශාල වෙනසක් ඇතිවූ බවය. එය එක් එක් සමාජයන් තුල විවිධ මට්ටමින් වර්ධනයවීම එක්තරා කාලයක් ඔස්සේ සිදු විය.

මෙහිදී අපට වැදගත් වන්නේ පරිසරය හා ඉතිහාසය එක්කොට සලකා ජීවන උපක්‍රමයන් යොදා ගැනීම පැවති කාලයක් තිබූ බවත්, එම කාලය ක්‍රමයෙන් අහෝසිවීමක් සිදුවූ බවත් යන කරුණුය. මෙය සමාජය තුල ඇති වූ එකිනෙකා අතර සම්බන්ධයන් කෙරෙහි බලපෑ මූලික සම්බන්ධයක් බට පත්වන්ට විය.

ඉඩම් හිමිකර ගැනීම් තුලින් වැඩි ධාන්‍ය ප්‍රමාණයක් එකතු කිරීමේ හැකියාව ඇත්තන් එසේ කරන්නට වූ අතර එසේ සාර්ථකව කල අයට වෙනත් අයට වඩා බලයක් ඇතිව ජීවත් වීමටත් හැකි විය. මෙය රටක ආචාරධර්ම වර්ධනය මෙන්ම රටේ මිනිසුන් අතර පැවති සාමූහිකත්වය පිළිබඳව ගැටලු මතුවන ප්‍රථම අවස්ථාව වශයෙන් සලකනු ලබයි. පසු කාලීන ඉතිහාසය තුල ප්‍රබලවම මතුවන කරුණක් වන්නේ, මෙසේ ධනය එකතු කර ගැනීම තුලින් බල පුලුවන්කාර කමක් ඇති කර ගැනීම තුලින් සමාජයේ වැඩි බලයක් ඇති පුද්ගලයන් ඇති වීමත් සමග, සමාජ සම්බන්ධ තාවයන්ගේ ඇතිවන විවිධ අසමබර තාවයන් හා ඒ වටාපිටාව අනුව ඇතිවන මානසික තත්වයන්ද, එම මානසික තත්වයන් යටතේ ඇතිවන විවිද ගැටුම් බවද පෙනී යයි.

මේ නිසා ජනතාවගේ ඉතිහාසය හෝ ජනතාවගේ කතාව යම් රටක් තුල වර්ධනය වූයේ කෙසේද යන්න සොයා බැලීමේදී ඉතිහාසය පිලිබඳ අතීතයේදී ඉදිරිපත් කර ඇති මතවාදයන් නැවත් සලකා බැලීම වටී. එම සලකා බැලීමේදී සිදුවිය යුතු ප්‍රධානම කරුණක් වන්නේ ස්වභාවධර්මයත් ජනතාවත් අතර ඇති සම්බන්ධය කොතෙක් දුරට සාමූහික වගකීමෙන් යුතු එකක්ද, නැතහොත් එසේ නොවන එකක්ද හා පරිසරය ආරක්ෂා කරන එකක්ද, නැතහොත් පරිසරය තුල ප්‍රශ්ණ ඇති කරන පැවැත්මක්ද යන්නය. එම අවබෝධය අතීතය ගැන පමණක් නොව වර්ථමානය හා අනාගතය හදුනා ගැනීම සදහාත් අවශ්‍යය.

# ආදිවාසීන් විසින් ලංකාවට දායාද කල මහා උරුමය.

# 03

ආදිවාසීන් කිසිදු සංස්කෘතික උරුමයක් ලංකාවට එකතුකර නැත යන පදනම මත ලංකාවේ ඉතිහාසය බොහෝදුරට ලියවී ඇත. එහෙත් ලංකාවේ ආදිවාසීන් ජීවත් වූ කාලය, ඉන්පසු ඇති වූ කාලයට වඩා ඉතා ගැඹුරු සාධනීය සාධකයන් ලංකාවේ සංස්කෘතියට උරුමකර දී ඇති බව ඉතා පැහැදිලිව පෙන්නුම් කල හැකි ය.

මෙවනි සුලු ලිපියකින් එම කාර්ය කල නොහැකි නමුත් කෙටියෙන් එම බලපෑම සිදු වූ ආකාරය පෙන්නුම් කල හැකි ය.

ආදිවාසී යුගය පුරාම පවතින්නේ පරිසර හිතකාමී පැවැත්මක් හා චින්තන ක්‍රමයකි. එම කාලය තුල ස්වභාවධර්මය හෝ ශ්‍රමය සූරා කෑම තුලින් ධනය එකතු කිරීම පිළිබඳ සංකල්පය නොපැවතිණ. එසේ පැවතීමට හේතුවක් තිබුණේද නැත. කෙටියෙන් කීවොත් ධනය යනු පසු කාලීනව ඇතිවූ සමාජ පැවැත්මක් තුලින් ජනිත වූ අදහසකි.

ආදිවාසීහු ජීවත් වූ පරිසරය කැලෑ පරිසරයයි. එම පරිසරය තුල ජීවත් වීමට ඔවුහු දැන පුරුද්දක් ඇති කරගෙන තිබුණේය. එම දැන පුරුදුකම වර්ධනය වුනේ ඉතා දීර්ඝ කාලයක් ඔස්සේය. එය කොපමණ අවුරුදු ලක්ෂයක් හෝ ඊට වැඩි කාලයක් බව පුරාවිද්‍යාඥයින් පෙන්වා දී ඇත. කෙසේ උවත් ඔවුහු බොහෝ කාලයක් ලාංකීය පරිසරය තුල ජීවත් වූ බවත්, එම පරිසරය

ප්‍රයෝජනයට ගත් පළමු වන මනුෂ්‍ය වර්ගයා (Homo Sapiens) ඔවුන් බවත් පැවසිය හැකි ය.

ඔවුහු එදිනෙදා ජීවිතයේ අවශ්‍යයතාවයන් සඳහා තමන්ගේ පරිසරයේ තිබුනු දේ ප්‍රයෝජනයට ගත්හ. දඩයම ඔවුන්ගේ මූලික පැවතුම් ක්‍රමයක් විය. මේ නිසාම අනවශ්‍යය ආකාරයෙන් දඩයම් කිරීමේ පුරුද්දක් ඔවුන් තුල පැවතුනේ නැත. ඇත්තෙන්ම ඒ ආකාරයෙන් හිතුවක්කාර ලෙස දඩයම් කිරීම මගින් තමන්ගේ පැවැත්මට තර්ජනයක් වන බව ඔවුහු දැන සිටියහ. පුද්ගල හා සාමූහික පැවැත්ම එකිනෙකින් වෙනස්කල නොහැකි බව ඔවුහු දැන සිටියහ. වැඩිහිටි ආදිවාසීන්ගෙන් ජීවිතය පිළිබඳ ඉගෙන ගැනීම මේ කාලයේදී පැවති අධ්‍යාපන ක්‍රමය විය. පාසල් පදනම වී හෝ අකුරු ලිවීම, ගණන් හැදීම ආදිය පදනම වූ අධ්‍යාපන ක්‍රමයක් නොවීය. එවනි අධ්‍යාපන ක්‍රමයක අවශ්‍යතාවයක්වත් පැවතුනේ නැත. එකිනෙකාට කිට්ටුවෙන් ජීවත් වූ ඔවුහු ඔවුන්ගේ අදහස් හුවමාරු කරගැනීම සඳහා නොයෙක් සද්ද නැගීම් වලට පුරුදු වූ අතර එම සද්ද මාලා මගින් ඔවුන්ට ආවේණික වූ භාෂාවක් නිර්මාණය කර ගත්හ. එම භාෂාව ලිඛිත භාෂාවක් වීමේ අවශ්‍යතාවය පැවතුනේ නැත.

ඇත්තෙන්ම පෙනී යන්නේ ඔවුන් අතර පැවති මූලික අදහස් හුවමාරු කිරීම වූයේ ඉරියව් මගින් යැයි සිතාගත හැකි ය. දඩයමේ යෑමේදී හෝ, මී පැණි එකතු කිරීමේදී හෝ එවනි කටයුතු වල යෙදුනු ආදිවාසීන්, ඒ ඒ අවස්ථාවේදී කල යුතු දේ ඉරියව් මගින් එකිනෙකාට පෙන්වා දීම හා ඒ ආකාරයෙන් පෙන්වූ දේ අනෙකා විසින් හඳුනා ගැනීම එතරම් අමාරු කාර්යක් නොවන්නට ඇත. දඩයම් කල යුතු සතෙක් ලගපාත ඉන්නවාද යන්න එකිනෙකාට ඉරියව් මගින් පෙන්වීම කල හැකි වුවා පමණක් නොව එය දඩයම් මාර්ගයක් වී තිබෙන්නට ඇතැයිද සිතිය හැකි ය. මන්දයත් සතෙකු දඩයම් කිරීමට උත්සාහ කරන ආදිවාසී කණ්ඩායමක් එය දඩයමට ලක්වීමට යන සතාට නොතේරෙන සේ කල යුතු විය. ශබ්ද මාර්ග යෙන් කතා කිරීමට පෙළඹෙන්නේ නම් එම ශබ්ද ඔස්සේ තමන්ට අනතුරක් ඇතැයි සංඥාවක් ලබන සතා පැන යාමට ඇති ඉඩ කඩ බොහෝය. මෙය ඇත්තෙන්ම විවිධ සත්ව වර්ගයන් අතරද දැක ගත හැකි ය. වතුර බීමට එන මුවන්ව හෝ ඌරන් වැනි

සතුන් අල්ලා ගැනීමෙන් තම ආහාරය සපයා ගන්නා කිඹුලා දියේ සැගවී සිටින්නේ කිසිවෙකුට නොදැනෙන ආකාරයෙනි.

ඉතා සුලුවෙන් පවා යම් ප්‍රාණියෙක් වතුරේ සැගවී සිටින්නේය යන්න ජලය පානය කිරීමට එන සතෙක් දැන ගතහොත් එම සතා එතනින් ජලය පානය කිරීමෙන් වැලකී සිටී. ස්වභාව ධර්මය තුලින් තම අවශ්‍යතාවයන් ඉටුකර ගත හැකි වූ ආදිවාසීන් ස්වභාව ධර්මයේ වෙනත් සතුන් හා වෙනත් ජීවීන් පමණක් නොව ගහ කොළ පවා ඇති වෙන නැති වෙන ආකාරයන් ඉතා හොඳින් දැන ගෙන සිටින්නට ඇති බව ලෙහෙසියෙන් තේරුම් ගත හැකි කරුණකි.

ආදිවාසී ජනතාවගේ යුගයේදී සංවිධානාත්මකව ගොවිතැන් කිරීම පටන්ගෙන තිබුණේ නැත. මෙයින් අදහස් කරන්නේ ඔවුන් යම් පැල හා බෝග වගා නොකලාය යන්න නොවේ. එයින් අදහස් වන්නේ සංවිධානාත්මකව මේ කටයුත්තේ නියලුනේ නැති බවත්, එය ඔවුන්ගේ සමාජ සංවිධානය තුල කිසියම් වර්ගීකරණයන් ඇති කිරීමට තුඩු නුදුන් බවත්ය.

ගොවි යුගය පටන් ගැනීමත් සමගම ඉඩම යන සංකල්පය අත්‍යාවශයෙන්ම පැන නැග්ගේය. යම් අයෙකු නොකඩවා වගා කිරීමට නම් එසේ වගා කරන බිම් කොටස ඔවුන් සතුවිය යුතු වේ. ඉඩම නැමති සංකල්පය ඇති වීමත් සමගම ජන සමාජයේ සංවිධාන රටාව මුලු මනින්ම  වෙනස් ස්වභාවයක් ගනී. සවභාවධර්මය තව දුරටත් සියලු දෙනා පොදුවේ බුක්ති විදින ස්ථානයක් ලෙස හඳුනා ගැනීම ඉඩම පදනම වූ සංස්කෘතියක් තුල විශාල වෙනසකට භාජනය කරයි. පොදු දේපළක් තුල කාටත් එහා මෙහා යාමේ අවසරය ඇත. එමෙන්ම තමන්ට අවශ්‍යය ප්‍රමාණයකට ගහකින් ඵලයක් කඩා ගැනීමේදී එය කාට උවත් කල හැකි දෙයක් සේ පවතී. එහෙත් ඉඩම යන සංකල්පය ඇති වීමත් සමග එහි කෙරෙන වගාවන් ඉඩමේ අයිතිකරුවනට පමණක් අයිති වේ. මේ නිසා ඉඩම පමණක් නොව ඉඩමේ කරන වගාවද ඒවායෙන් ලැබෙන ඵලයද ආදී සියල්ලම පුද්ගල පදනමක් මත විකාශනය වේ. ඉඩම යන සංකල්පයට සමාන්තරව මායිම යන අදහසද මුල් බැස ගනී. පසුව මායිම් වෙන්කර ගැනීම සිදු වේ.

ගොවිතැන තවත් ඉහල අවධියකට යන අතර ඇති වන්නේ වඩා බලවත් ඉඩම් හමියන් ඇති වීමය. තමන්ගේ බල පුරුවම්කාර

කමින් වැඩි බිම් ප්‍රමාණයක් අල්ලා ගැනීමට හැකි වූ තැනැත්තා එය තමා සතු දේපලක් බවට පත් කරගනී. මේ ආකාරයට ඉඩම මගින් පුද්ගලික ඓතිවාසිකම ඇති කරනවා පමණක් නොව එය තුලින්ම ඉඩම් හමියන් අතරම වර්ගීකරණයක් ඇති වේ. බල පුලුවම්කාර කමින් වැඩි ප්‍රදේශයක් හමිකර ගත් වුවන් හා එසේ කිරීමට බැරිවූ අය අතර විශාල වෙනසක් පැන නගියි. විශාල ඉඩම් හමියන් හා සුලු ඉඩම් හමියන් ලෙස කොටස් දෙකක් නිර්මාණය වේ.

මෙය තවත් ඉදිරියට යන්නේ විශාල බිම් කොටසක් හමි කරගත් ඉඩම් හමියන්ට ඒවා තමන් විසින්ම වගා කිරීමට ඇති නොහැකියාව නිසාය. ඔවුන්ගේ දේපළ විශාල වන තරමටම ඒවායේ සේවය කිරීම සඳහා මිනිසුන්ද අවශ්‍යය වේ. මෙසේ මිනිසුන් වෙනත් අයගේ ඉඩම් වල වැඩ කිරීමට එකග වන්නේ ඔවුන්ටම තමන්ගේ යැයි වගා කර ගත හැකි ඉඩම් නොතිබෙනතාක් දුරට පමණය. තමන්ගේ ඉඩමක් තුල තමන්ගේ යැපීම සඳහා දේ නිර්මාණය කර ගැනීමට හැකියාවක් නැති ගොවියා වෙනත් අයෙකුගේ ගොවිපළක සේවය කරන්නනෙක් බවට පත් වේ.

මේ නිසා ඉඩම් වැඩි පුර හමි කර ගැනීමට ඇතිකර ගත් බල පුලුවම්කාරකම ඉඩම් යම් අයගෙන් අහමි කිරීම සඳහා උපක්‍රමශීලීව කටයුතු කිරීම ඊලග අවධියකදී සිදු වේ. විවිධ මාර්ග වලින් ඉඩම් හමි නැති කණ්ඩායම් ඇති කරනු ලබයි. මොවුහු තමන්ගේ යැපීම සඳහා වෙනත් අයගේ ඉඩම් වල වැඩ කරයි. එය විවිධ ආකාර වලින් සිදුවන්නට ඇත. එයින් එක් ආකාරයක් වූයේ අඳ ගොවි ක්‍රමයය. එහිදී යමෙක් වෙනත් අයෙකුගේ ඉඩමක් වගා කර අස් වැන්න ඇති කරන අතර එයින් කොටසක් පමණක් වගා කරන්නාට හමි වේ. වගාවේ නොයෙදෙන හමියාට ඉන් කොටසක් හමි වේ. මෙහි තවත් පළල් වීමක් නම් වහලුන් හෝ ඊට සමාන තත්වයක සේවකයන් ඇති වීමය. මෙහිදී සිදු වන්නේ අර්ධ මානවයන් හෝ මුලු මනින්ම අමනුෂ්‍යයන් සේ සලකන කොටසක් ඇති වීමය.

බොහෝවිට මෙය ඉහේම කර ගත නොහැකි ය. මේ නිසාවටම විවිධ ආකාරයෙන් ඉඩම් වල වැඩ කරන්නන්ට දඬුවම් කිරීම්, හිරිහැර කිරීම් ආදිය අවශ්‍යය වේ. එය මිනිස් ස්වභාවය සමග කරන අරගලයක් නිසා මේ ප්‍රචන්ඩත්වය යොදා ගැනීම

නොවැලැක්විය හැකි ය. තම ශ්‍රමය යොදා ඉඩමක වැඩ කරන්නෙකු එම තමන් නිර්මාණය කරන අස්වැන්නට ඇති අයිතිය නිකම්ම අතහැර දමන්නේ නැත. ඔහු ලව්වා එසේ කරවා ගැනීම සඳහා විවිදාකාර වශයෙන් ප්‍රචන්ඩත්වය වර්ධනය කර ගැනීම ස්වාවිකවම මෙන් සිදු වන දෙයකි. මේ සිදුවීම එක්තරා අවධියකදී විවිධ මතවාද හා සමාජ දර්ශනවාද ඇති කිරීමට සමත් වේ. ඉඩම් හිමි බව තහවුරු කිරීම සඳහා විවිධ මතවාදයන් ඇති කරවන අතරම ඉඩම් නැතිවීම පිළිබඳව විවිධ දර්ශණවාදයන් ඇති කරනු ලබයි. මේ අනුව විවිධ ආගමික මතවාදයන් පවා වර්ධනය විය හැකි ය. ගැඹුරු දර්ශණවාදීන් අතර කරුමය පිළිබඳව පවතින අදහස් වලට වෙනස්ව, සමාජය තුල එම අදහස වර්ධනය වන්නේ ඉඩම් හිමියන් අතීතයේදී කරන ලද යහපත් ක්‍රියා නිසා දේපොළ හිමි කරුවන්වී ඇති බවත්ය. එසේ අතීතයේදී පින් කර නොමැති ඇත්තන් ඉඩම් හිමි කමකින් තොරව ඉපදුනු ඇත්තන් සේ හුවා දක්වන දර්ශණවාදයන් පැන නගී.

මෙය තවත් ගැඹුරු අවදියකට පැමිනෙන්නේ ඉතා විශාල ප්‍රමාණයක ඉඩම් අයිති කරගත් කණ්ඩායම් ඇතිවීමත් සමගය. ඔවුන්ට එම ඉඩම් වලින් ඵල ලබා ගැනීමට හැකි වන්නේ ඒවායේ වැඩ කිරීමට විශාල කණ්ඩායමක් සිටිනවානම් පමනි. එය ඉබේම ඇති නොවන හෙයින් විවිධ සමාජ ක්‍රම තුලින් මෙය ඇති කරනු ලබයි. දකුණු ආසියාවේ මුල් යුගයේ මේ ක්‍රමය ඇති කරන ලද්දේ කුල ක්‍රමය ඔස්සේය. ඉහලම කුලය ගොවි කුලය යන්නනෙන් සඳහන් කිරීම ලංකාවේ දකින්නට හැකි ය. එනම් විශාල වශයෙන් ඉඩම් හිමි කරගත් අය සමාජයේ ඉහල අය ලෙස සලකනු ලැබීම මේ ආකාරයෙන් සිදුවී ඇත. ඉන්දියාවේ මෙය සිදුවී ඇත්තේ වෙනත් ආකාරයකිනි.

කෙසේ උවත් සමාජය තුල ගැඹුරු වර්ගීකරණයක් ඇති කිරීම, එම වර්ගීකරණය තුල දේපල හිමි බව හා අහිමි බව ඇති කිරීම, දේපළ අහිමි බව හා නැතිකම අතර සමාජ උස්පහත් කම් ඇතිවීමත්, එම උස් පහත් කම් අනුව එකිනෙකාට සැලකීම වෙනස්වීමත් ආදී වශයෙන් විශාල වෙනසක් මිනිස් සමාජය තුල ඇති වේ.

මේ කිසිවක් ආදිවාසී සමාජය තුල පැවතුනේ නැත. ආදිවාසී සමාජය තුල සියලු දේපළ එනම් සණ වනාන්තර වල ඔවුන්

ජීවිත ගත කලේ කිසියම් වර්ගීකරණයකින් තොරවය. ඔවුන් අතර නායකයන්, ප්‍රමුඛයන් ඇති වීම ඉහල දේපළ පැවැත්ම මත ඇති වූවක් නොව විවිධ දක්ෂකම් මත හෝ වෙනත් හේතූන් මත ඇති වන අතර ඔවුන්ට රජවරුනට මෙන් විශාල වරප්‍රසාද ඇති වන්නේ නැත.

ආදිවාසී සමාජය තුල සාමූහිකත්වය පිළිබඳව පැවති එම ගැඹුරු සංකල්පය, අංග සම්පූර්ණව මකා දැමීමට පසු කාලීනව සිදු වූ සිද්ධීන්ට නොහැකි වී ඇත. මිනිසුන් මිනිසුන් අතර සම්බන්ධයේදී මේ සාමූහික භාවය තවමත් ලාංකීය සංස්කෘතිය තුල පවතී. එහෙත් සංවිධානය වූ සමාජය තුල එම සාමූහිකත්වය පවතින්නේ නැත. දේශපාලන වශයෙන්, ආර්ථික වශයෙන්, සමාජීය වශයෙන්, සමාජය ගොඩනැගී ඇත්තේ මේ සාමූහිකත්වයට පටහැනි වූ අදහස් ඔස්සේය. රාජ්‍යය තන්ත්‍රයන්, පාලන තන්ත්‍රයන් ආදී සියල්ල ගොඩ නැගීමේදී ඉහත සඳහන් සාමූහිකත්වය ඇති කිරීම සඳහා වශයෙන් එය නොපැවතනි. බොහෝ දුරට සමාජය තුල ඇති වූ විවිධ වෙනස්කම් හා බල පුළුවම්කාර කම් තහවුරු කිරීමටත්, බෙල හීන වූ කණ්ඩායම් එම තත්වයේම පවත්වාගෙන යාමටත්, පදනම කරගෙන පසු කාලීන සමාජය සංවිධානය විය.

මේ අනුව ලංකාවේ ආදිවාසීන්ගෙන් පොදුවේ ලාංකීය සංස්කෘතිය කෙරෙහි උරුම කර ඇත්තේ අතිශයින්ම සාධනීය වූ ගුණාංගයන්ය. පරිසරයට අගතියක් නොවන ආකාරයෙන් ස්වභාවධර්මය යොදා ගැනීම හා මිහිතලයෙහි දේපළ බෙදා ගැනීමේදී සාමූහිකත්වයක් තිබිය යුතුයි යන අදහස් ආදිවාසී සමාජය තුල ස්වභාවිකව පැවතුන අතර එවනි සමාජයක් දීර්ඝ කාලීනව පැවතීම තුලින් මේ පිළිබඳව ගැඹුරු මානසික බලපෑමක් සකල ජනතාව තුලම ඇති වූ බවට සැකයක් නැත. අතීතය පිළිබඳ ගැඹුරු මතකයක් මිනිස් මනස තුල පවතී. එය හුදෙක් එක් එක් අයෙකුගේ මතකය පිළිබඳ නොව, ඊට වඩා ගැඹුරින් සාමූහිකව පවතින තත්වයකි. එම තත්වය අවබෝධ කර ගැනීම තුලින් ආදිවාසී ජනතාව පිළිබඳව ලංකාව තුල පවතින අදහස් සාධනීය ආකාරයකින් වෙනස් කර ගත යුතුව ඇත. එසේ ඇති කර ගන්නා අවබෝධය ලාංකීය අනන්‍යතාවය පිළිබඳව වටහා ගැනීමට විශාල රුකුලක් වනු ඇත.

# අපේකම යනු කුමක්ද?

# 04

මේ දිනවල අපේකම පිළිබඳව වැදගත් සාකච්ඡාවක් නිර්මාණය වෙමින් පවතී. මෙයට එක් ප්‍රධාන හේතුවක් වන්නේ දැනට ලංකාවේ සමස්ථ ජනතාව තුලම ලංකාවේ ප්‍රාග් ඉතිහාසය පිළිබඳ ගවේශණ වල සොයා ගැනීම් පැතිරීමට පටන්ගෙන තිබෙන නිසාය. මෙය අතිශයින් වැදගත් වන සාකච්ඡාවක මුල් අවධියකි.

මේ නිසා අපේකම යන්න පිළිබඳ අදහස ලංකාවේ විකාශනය වී ඇති ආකාරය පිළිබඳව කල්පනා කිරීම වටී. ඉතිහාසයේ ප්‍රධාන අවධීන් හිදී මේ අදහස පිළිබඳව වෙනත් අර්ථකතනයන් පැවතී ඇති බව පෙනී යයි. අපේකම පිළිබඳ අදහසේ විකාශනය පහත සදහන් අවධීන් තුලින් සිදු වූ බව පෙනී යයි.

පළමු වන අවධිය ලංකාවට ආදිවාසී කණ්ඩායම් දැනට අවුරුදු එක් ලක්ෂ විසි පන්දහසක පමණ පෙර කාලයකදී අවතීරණය වී ක්‍රමයෙන් ඔවුහු ලංකාවේ ආදිවාසී ස්වදේශිකයන් බවට පත් විය. ඔවුහු දීර්ඝ කාලයක් තිස්සේ මූලික වශයෙන් දඩයක්කාරයන් හා ආහාර ස්වභාව ධර්මය තුලින් එකතු කර ගත් අය වූහ. දෙවනි අවධිය වන්නේ සංවිධානාත්මක කෘෂිකර්මය ලංකාවේ ඇති වීමය. ආදිවාසී ස්වදේශිකයන් ස්වභාවධර්මයෙන් ලබාගෙන බුක්ති විදි විවිධ භෝග වර්ගයන් වවන්නට පටන් ගත්හ. මෙය ක්‍රි.පූ. 6000 හෝ ඊට ලග කාලයක සිදු වූවයි සලකනු ලබයි. මේ මුල් අවධියේදී වගාව සිදු වූයේ එකි නෙකාගේ ආහාරය සදහාය. එහෙත් එක්තරා

කාලයකදී මේ මුල් ගොවියෝ අතිරික්තයක් නිර්මාණය කල හැකි පමණට කෘෂි කර්මය දියුණු කලහ. මේ අතිරික්තයද මුලින් පාවිච්චි කරගන්නට ඇත්තේ ඔවුන්ගේම පාරිබෝජනය සඳහාය. අස්වැන්න ලැබෙන කාලයේදී ලබාගත් ධාන්‍ය එසේ නොලැබෙන කාලයේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා ඔවුහු තරමක් ඒවා රැස් කර ගන්නට ඇතැයි සිතිය හැකි ය. මෙවනි පුරුද්දක් අද වන තුරුත් ලංකාවේ සුලු ගොවියන් අතර පවතී.

එහෙත් පසු කාලයේදී අතිරික්තයක් ලබා ගැනීමේ අරමුණින්ම ගොවිතැන් කිරීම ඇති වීමත් සමග ඉඩම් පිළිබඳ අදහස වර්ධනය වීමට පටන් ගත්තේය. වැඩි බිම් ප්‍රමාණයක් අයිති කර ගතහොත් ඒ තුල වැඩි ගොවි තැනක් කල හැකි බවත්, එම ගොවි තැනින් ලැබෙන ධාන්‍ය රැස් කර ගැනීම මගින් ඒවා විකිනීමට මෙන්ම ධනය උපයන මාර්ගයක් සේ යොදා ගැනීමට හැකි බවත් ඔවුනට පෙනී යන්නට ඇත. මේ කාලය තුල කෘෂිකර්මය හා ඊට බද්ධ වුනු වෙනත් වානිජ කටයුතු වර්ධනය වන්නට ඇතැයි සිතිය හැකි ය. මේ වානිජ කටයුතු ඔස්සේ ලංකාවට ස්වදේශික නොවූ පුද්ගයන් ඇතුලු වන්නට ඇති අතර ඔවුන් අතරින් ආ සංක්‍රමණිකයන් ලංකාවේ පදිංචිවන්නටත් ඇත. අනුරාධපුරය රටේ මුල් නගරය සේ ඇති වීමත් ඒ තුල වෙනත් දේ අතර වාරි මාර්ග පිළිබඳ දියුණුවක් ඇති වීමත් මේ සංවිධානාත්මක කෘෂිකර්මය මුලින් පටන්ගත් අවධියේ සිදු වන්නට ඇතැයි උප කල්පනය කල හැකි ය. ලංකාවට ලගා වූ සංක්‍රමණිකයන්ද, ඉන්දියාවට පැමිණ වර්ධනය වූ එම රටේ ස්වදේශීය ආදිවාසීන්ගෙන් පැවතෙන්නෝ යැයි සිතිය හැකි ය. උදාහරණ වශයෙන් ඉන්දියාවේ සමහර ප්‍රදේශ වල ජනයාගේ ශාරීරික ලක්ෂණ ලාංකිකයන්ගේ ශාරීරික ලක්ෂණ වලට බොහෝ දුරට සමානය. මෙය සිදුවන්නට ඇත්තේ ලාංකීය ස්වදේශීය ආදිවාසීන් මෙන්ම ඉන්දියාවේ සමහර ප්‍රදේශ වල ආදිවාසීන්ද ඈත අතීතයේදී එකම මූලයකින් පැන නැගුණු නිසා විය හැකි ය. එය එසේනම් ඒ තුල විශාල වටිනාකමක් ඇති ඓතිහාසික තොරතුරක් සැගවී තිබෙන්නට පුලුවන.

ස්වදේශීයභාවයේ වර්ධනය වීමේ තුන්වන අවධිය එක්තරා සදාචාර ධර්මයන් ලංකාව තුල ඇති වී වර්ධනය වීමයයි කිව හැකි ය. මේ අවදිය කෙරෙහි වැඩි වශයෙන් අවධානය යොමු ඇත්තේ

බුදු දහම ලංකාවේ පැතිරීම තුලිනි. අතිරිකතයක් නිර්මාණය කිරීම තුලින් විවිධ සමාජ ගැටලු ඇති වෙමින් පවතින කාලයකදී අවතීරණය වූ බුදු දහම ලංකාවේ ඉතා දියුණු සදාචාර පද්ධතියක් ඇති කිරීමට හේතු විය. එම සදාචාරය තුල මූලික වශයෙන්ම පැතිර වූ අදහස වූයේ තණ්හාව හෙවත් දේපළ කෙරෙහි කෑදරකම තුලින් ඇතිවන අනිසි ප්‍රතිඵලයන් මුල් කොට ගෙනය. තණ්හාවෙන් අත්මිදීම හා තෘෂ්ණාව මර්ධනය කර ගැනීම තුලින් තමා පුද්ගලයකු වශයෙන් සිදු කරන පැවැත්ම හා සාමූහික පැවැත්ම අතර සමතුලිත හා නිර්මාණාත්මක සම්බන්ධයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් මේ සදාචාර පද්ධතිය අතීශයින් වැදගත් කාලයක් විය. එයද ස්වදේශීකත්වයේ කොටසක් බවට පත් විය.

මෙයට බුදු දහම මෙන්ම ඊට පෙර යුගයකදී ලංකාවට අවතීර්ණ වීතිබූ තිබූ ජෛන ධර්මයද දායක වන්නට ඇත. මේ හැර ආදි කාලීන ස්වදේශිකයන්ගේ ජීවත් වූ දීර්ඝ යුගය පුරා පැතිරුණු ගස් ගල් වන්දනාව හා මිය ගිය ඇත්තන්ට ගරු බුහුමන් කරමින් ඔවුන් පිළිබඳව පැවති ඒ අදහස්ද මේ සදාචාර ධර්මතාවන් වර්ධනය වන්නට හේතුවන්නට ඇත.

මින් පසු එනම් අනුරාධපුර යුගයෙන් පසු ඇති වූ ඉන්දීය ආක්‍රමණයන් තුලින් වෙනත් සදාචාර ධර්මයන් හා දර්ශනයන් ලංකාව කෙරෙහි සම්ප්‍රාප්ත විය. ලංකාවේ කුල ක්‍රමය මුල් බැස ගන්නේ මේ කාලයේදී වන අතර පොළොන්නරු යුගය අවසන් වන විට ලංකාවේ සංවිධාන රටාව කුල ක්‍රමය මත පදනමව ඇති එකක් බව ඉතිහාසඥයෝ පෙන්වා දී ඇත. මේ අවදිය ගැබුරින් තේරුම් ගැනීම පසු කාලයකදී ලංකාවේ ඇති වූ වර්ධනයන් හා ගැටලු තේරුම් ගැනීම කෙරෙහි අත්‍යාවශ්‍යයම කටයුත්තකි. කුල ක්‍රමය ලංකාවට අවතීරණය වීම, එය මුල් බැස ගැනීම, එය ලාංකිකයාගේ මානසිකත්වය ප්‍රතිනිර්මාණය කරන තත්වයක් ඇතිවීම හා ඒ තුලින් ඇති වූ සමාජ බෙදීම පිළිබඳව ගැඹුරු අවබෝධයකින් තොරව අපේ කම යන්න තේරුම් ගැනීමට කරන උත්සාහය ඇත්තෙන්ම අපේකම සම්බන්ධයෙන් ලංකාවේ පවතින ගැඹුරු විරෝධතාවයන් මග හැරීමක් බවට පත් වේ. එසේ මග හැරීම තුලින් අපේකම පිළිබඳව නිර්මාණය වන්නේ බොරු ප්‍රතිරූපයක් වන අතර එවනි බොරු ප්‍රතිරූපයක් ආරූඩකර ගැනීම

ම රටක සාමූහිකත්වය ඇති කිරීමට හා සහයෝගීතාවය වර්ධනය කිරීමටත්, ඒ මගින් අපේකම යන්න ගැන සැබෑ පදනමක් තහවුරු කර ගැනීමටත් අතිශයින් බාධකයක්ව පවතී. කුල ක්‍රමය ඇතිවීම හා මර්ධනය සමාජ ගත වීම සිදු වූයේ ඓතිහාසිකව බලන කල මෑත කාලයකදී වන හෙයින් ඒ පිළිබඳව විශාල තොරතුරු පවතින බවට කිසිම සැකයක් නැත. ලංකාවේ අද ජීවත් වන සියලුම දෙනාත් මේ ගැටලු පිළිබඳව තමන් ලබා ඇති ගැඹුරු අවබෝධයක් ඇත්තෝ වෙති.

අපේකම පිළිබඳව ඊලග වර්ධනය වන්නේ යුරෝපීය යටත් විජිතවාදීන් ලංකාවට අවතීර්ණය වීම හා ඔවුන් විසින් ලංකාව තුල ඇති කල විවිධ සංවිධානාත්මක වෙනස්කම් හා වටිනාකම්ය. මේ කාලය තුල අපේකම පිළිබද විශාලම ගැටලුව ඇති කල සාධකය වූයේ යටත් විජිතවාදීන් අධ්‍යාපනය සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ප්‍රතිපත්තියය. මැකෝලි නැමති බ්‍රිතාන්‍යය යටත් විජිතවාදී ප්‍රතිපත්ති නිර්මාණය කිරීමෙහිලා විශාල බලපෑමක් ඇති කල නායකයා ඔහුගේ ලේඛණයක ලියා ඇත්තේ ඉන්දියාව තුල අධ්‍යාපනය දියුණු කිරිමේදී බ්‍රිතාන්‍යය විසින් විශාල විවාදයකින් පසු ඇති කර ගත් එකගතාවයය. එම එකගතාවයේ හරය නම් ස්වදේශිකයන් සුලු කණ්ඩායමක් සදහා ඉංග්‍රීසි අධ්‍යාපනය විවෘත කල යුතු බවත්, එම විවෘත කිරීම තුලින් ඇති වන නව බුද්ධිමත් පරපුරක් තුලින් බටහිර ඥාන සම්බාරය යටත් විජිත තුලට ගෙන ආ යුතු බවත්ය. ඉන්දියාවේදී නිර්මාණය කරගත් මේ දර්ශණය, පසු කාලීනව ලංකාව ඇතුලු යටත් විජිත වලට පැතිර ගියේය. මේ අනුව 20 වන ශත වර්ශය වන විට ලංකාවේ ජනගහනයෙන් සියයට තුනක් පමණ ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය ලබා ගත් අය වූහ. එය හුදෙක් භාෂාවක් ඉගෙන ගැනීමක් පමණක් නොවීය. ඒ තුලින් ඔවුන් අපේකම යන්න එක්තරා ආකාරයකට පිළිකුලකින් සැලකීමට පටන් ගත්හ. මුල් කාලයේදී ආදිවාසී ස්වදේශිකයන් අශීලාචාර ලෙස සැලකීමට සංක්‍රමණිකයන් පුරුදු වූවා සේ, ඉංග්‍රීසි බසින් අධ්‍යාපනය ලැබීමට පටන් ගත් මේ සුලු කණ්ඩායම එසේ නොවූවන් අඩු සංස්කෘතියක් ඇති හෝ සංස්කෘතියක් නැති කණ්ඩායමක් සේ සැලකීමට පටන් ගත්හ. මේ තුලින් ඉතාමත්ම ගැඹුරු භේදයක් රට තුල හට ගත්තේය. මෙහිදී අපේකම යන්න

පසුගාමී අදහසක් ලෙසත් යුරෝපීය කමට බද්ධවීම දියුණු වීමට පටන් ගැනීමක් ලෙස සැලකීමත් සිදු විය. මේ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමට පුරුදු වූ යටත් විජිතවාදීන්ගේ සේවයට කැපවුනු කණ්ඩායම රටේ බලවත්ම කණ්ඩායම බවට පත් විය. ධනය ඒකරාශී කිරීමේදී ඔවුන් යටත් විජිතයට කල සේවාවන්ට දෙන ප්‍රති උපකාරයක් සේ බොහෝ දේ ලබා ගත්හ. විශාල ප්‍රමාණයේ ඉඩම් ලබා ගත්හ. එමෙන්ම අලුතින් ඇති වූ කර්මාන්ත වලද ප්‍රධානීන් බවට පත් වූයේ මේ කණ්ඩායමය. මේ මගින් ලංකාවේ ස්වදේශීය භාවය පිළිබඳව ඇති වූ විශාල ගැටලුව අද අපේකම පිළිබඳව කෙරෙන සාකච්ඡාවේදී විසදිය යුතු බලවත් විශමතාවක් වේ.

මින් පසු අවධිය සිදු වන්නේ මේ ඉංග්‍රීසි භාෂාවෙන් යටත් විජිතවාදීන් සමග දැඩි සම්බන්ධයක් ඇති කරගත් කණ්ඩායම් නිදහසට කිට්ටුවන කාලයේදී තමන්ගේ ස්වදේශීය භාවය ඔප්පු කිරීම සදහා ගොඩනගා ගන්නා ලද ව්‍යාජ ප්‍රයත්නයන්ය. මේ ප්‍රයත්නයන්ගේ වර්ධනයේ ඉතා වැදගත් අවධියක් වන්නේ 1931 දී සර්වජන චන්දය ප්‍රකාශයට පත් කිරීමය. ලංකාවේ අනාගතයේදී බලය දරන්නන් මහජන චන්දයෙන් පත්විය යුත්තන් බව තේරුම් ගත් මේ මුලින් යටත් විජිතයට බද්ධ වූ කණ්ඩායම් ඒ අනුව තමන්ගේ මතවාදයන් වර්ධනය කිරීමට පටන් ගත්හ. ඔවුන් විසින් ව්‍යාජ අපේ කමක් නිර්මාණය කලහ. එය ස්වභාවයෙන් වර්ධනය වූ අපේකම නොව දේශපාලනය තුලින් හා දේශපාලන වාසිය සදහා වර්ධනය වූ අපේකමක් බවට පත් විය.

ඊලග අවධියනම් නිදහසේ සිට අද දක්වා පැවත එන කාලයයි. මේ කාලයේ මූලික ලක්ෂණය සේ පවතින්නේ කුල ක්‍රමය ඇති වූ යුගයේදී හා යටත් විජිත ක්‍රමය ඇති වූ කාලයේදී ඇති වූ දැඩි සමාජ බෙදීම් හා විෂමතාවයන් නිසි ලෙස විසඳා ගැනීමට නොහැකි වීම නිසා ඇති වන අතිශයින්ම භේද බින්න වූ කාලයකි. මෙහිදී භේද බින්න කාලය හා අපේ කාලය අතර අපේ කම අතර දැඩි ප්‍රති විරෝධී මතවාදයන් ඇති වීමට පටන් ගනී. දේශපාලනය සදහා අපේකම යොදාගත් අංකුර දේශපාලඥයෝ සූක්ෂමව සුලු ජාතිකයන් අපේ නොවන ආකාරයක් දැක්වීමටත්, මේ හා වෙනත් සමාන හේතු මගින් ගැටලු ඇති කිරීමටත් පටන් ගත්හ. එමෙන්ම

රටේ සියලුම ප්‍රදේශවල මන්ත්‍රීවරුන් පත් කර ගැනීමේදී කුලය ප්‍රධාන සාධකයක් බවට පත් වීමත් සිදු විය.

මේ ආකාරයෙන් ලංකාවේ අපේකම පිළිබඳව ඇති වූ මතවාද විකාශනය සලකා බැලීමේදී පෙනී යන්නේ අද අපේ කම යනුවෙන් ආදිකාලීන ස්වදේශිකයන් සැලකූ ස්වර්ණමය අදහස් හා වර්තමානයේ පවතින අදහස් අතර ඉතා ගැඹුරු වෙනස්කම් පවතින බවය. ආදිකාලීන ස්වදේශිකයන් පරිසර ආරක්ෂාව, සාමූහික පැවැත්ම, සහයෝගීතාවයෙන් කටයුතු කිරීම ඉතා දීර්ඝ කාලයක් ඔස්සේ නිර්මාණය කරමින්, ප්‍රතිනිර්මාණය කරමින් අතිශය ගැඹුරු දායාදයක් ලාංකිකයාට හිමිකර දී ඇත. අවාසනාවකට මෙන් කුල ක්‍රමය ඇති වූ කාලයේ සිට යටත් විජිත කාලය පුරා වර්ධනය වන්නේ භේදබින්න භාවයේ දර්ශණයන් හා මානසික තත්වයන්ය. මේ භේදබින්න භාවයේ මානසිකත්වයන් අභිබවා ආදිකාලීන ස්වදේශකයන් විශාල කාලයක් ඔස්සේ උරුමකර දුන් සංස්කෘතික ගති ගුණ නැවත ප්‍රතිනිර්මාණය කරන අතරම, ඒවා වර්තමාන ලෝකය තුල බලවත්ව ප්‍රකාශයට පත් කල හැකිනම්, පමණක් ලංකාව තුල විශාල ව්‍යසනයක් වැලැක්වීමට බැරි තත්වයක් නිර්මාණය වනු ඇත.

අද ලාංකික සමාජය බිඳ වැටෙමින් පවතින සමාජයක් බව කවුරුත් පිළිගන්නා කරුනකි. ආර්ථික ක්‍රමය බිඳවැටී ඇත. දේශපාලන ක්‍රමය බිඳවැටී ඇත. සමාජය තුල භේදබින්න භාවය වැඩි වී ඇත. මේ මගින් සදාචාරධර්ම පද්ධතිය විශාල අවුලකට පත් වී ඇත. එම සදාචාර පදනම කඩා වැටීම ලංකාව තුල වර්ධනය වී පවතින දැඩි අපරාධයන්ගේ පැතිරීමත්, ඒවා මර්ධනය කර ගැනීමට නොහැකිවීමත් තුලින් දැඩිවම ප්‍රකාශයට පත් වේ. සමාජය තුල පිළිවෙලක් ඇති කිරීම සඳහා ප්‍රධාන වන යුක්තිය පසඳලීමේ සංස්ථාවන් සමස්ත අර්බුදයේම කොටසක් බවට පත් වී ඇත. මේ කඩා වැටීම නතර නොකලහොත් ඉතා කෙටි කාලයක් තුල ලංකාවේ හිතා ගැනීමට බැරි සමාජ කඩා වැටීමක් ඇතිවිය හැකි බවත් ඒ තුලින් අපේකම පිළිබඳ අදහස වෙනුවට එකිනෙකා තමුන්ගේ පැවැත්ම සඳහා අනිකා අමාරුවේ දැමීම මත පදනම වූ, සමාජයක් බිහිවනු ඇති බව බොහෝ දෙනෙකු විසින් අවධානාත්මකව ප්‍රකාශ කර ඇති කරුණකි.

# අපේකම හා සදාචාර පද්ධතිය.

# 05

'හෝමෝසේපියන්ස්' නමින් හඳුන්වනු ලබන මානවයා ඇතිවීමත්, ඉන් පසු දීර්ඝ කාලයක් ඔස්සේ එම මානවයන්ගේ අත්දැකීම් හා කල්පනා ධාරාවන් තුලින් වර්ධනය වූ ආධ්‍යාත්මික ගතිගුණත්, පසු කාලීනව ඇති වූ සියල්ලන්ගේම දායාදයක් බවට පත් විය. එම දායාදය ඉතාමත් පොහොසත් කාලයකට එලබෙන්නේ එම මානවයන් අතර ඇති වූ ආචාරධර්මයන් හෙවත් සදාචාරයන්ගේ වර්ධනයත් සමගය. ඇත්තෙන්ම එම මානවයන්ගේ සාමූහිකත්වයේ ඇගිලි සලකුණ වන්නේ එම සදාචාර පද්ධතියයි.

අප්‍රිකාවෙන් උපත ලැබූ එම මානවයා ලෝකයේ බොහෝ දිසාවලට ගමන් කලහ. ඉන් පසු ඔවුහු යම් යම් දේශවලට අවතීරණව එම දේශවල තිබූ සම්පත් යොදා ගනමින් තමන්ගේ පැවැත්ම කරගෙන ගියහ. එම පැවැත්මේදී මේ මානවයා තුල තිබූ යම් ප්‍රධාන හැසිරීම් රටාවක් ජෝසෆ් ටෙනන්ට් නැමති විද්වතානන් විසින් ඔහුගේ සංකීර්ණ සමාජයන්ගේ කඩා වැටීම් (Collapse of complex societies) යන සුප්‍රසිද්ධ කෘතියෙහි සදහන් කරයි. එසේ ඔහු සදහන් කරන මුල් මානවයන්ගේ ගතිගුණ මෙසේය. ඔහු එක් ප්‍රදේශයක බොහෝ කාලයක් ජීවත් වූහ. එකම ප්‍රදේශයක දීර්ඝ කාලයක් ජීවත් වීම තුලින් එම ප්‍රදේශයේ දේශගුණය, එම ප්‍රදේශයේ පොලොවෙහි සරුසාරකම, එම පොලොවට ඔරොත්තු දෙන ගස් කොලන් පිළිබද දැනීම, එම ප්‍රදේශයේ ජීවත් වන සතුන්

පිළිබඳ දැනීම හා වෙනත් ස්වාභාවික වස්තූන් ජලය, ඉර අව්ව ආදිය පවතින ආකාර පිළිබඳව ඔවුහු අති විශේෂඥ ඥානයක් තමන් තුල ගොමු කර ගත්හ. මුල් කාලයේ මානවයා මෝඩයෙක්ය හා සීලාචාරයක් නොතිබුන කෙනෙක් යනුවෙන් නිර්මාණය කරගෙන ඇති අදහස මුලුමනින්ම වැරදි සහගත අදහසක් වන්නේ දීර්ඝ කාලීනව එක් ප්‍රදේශයක් තුල ජීවත් වීම තුල ඥානනයේ ඇතිවන මහා පරිමාණ වෙනස්කම හඳුනා ගැනීමට නොහැකි වූ නිසාය.

මහා පරිමාණව දැනීමක් දියුණු කරගන්නා මානවයා තුල ඇතිවන ප්‍රධානම වෙනසනම් ඔහු තුල ඇතිවන්නා වූ ප්‍රාඥ්ඥ ගුණයයි. ප්‍රඥ්ඥාව වනාහි පොත පත බලා ඇති කර ගත හැකි ගුණාංගයක් නොවේ. එය ඇති වන්නේ සාමුහික ජීවිතයේ ප්‍රායෝගීකව නියැලීම නිසා හදුනා ගන්නා ගුණාංග පිළිබදව හා ජීවත් විය යුතු ආකාරය පිළිබදව සිදු වන අවබෝධය මගිනි. ලංකාවට දැනට අවුරුදු එක් ලක්ෂ විසි පන්දහසකට පමණ පෙර පැමිණි එම මානවයා දීර්ඝ කාලයක් ඔස්සේ සාමූහිකව ජීවත් වී ඇති කරගත් ඥානයේ පදනම දැන් ජීවත් වන හා අනාගතයේදී ඇතිවෙන්නා වූ සියලුම ලාංකිකයන්ගේ සදාචාර පද්ධතිය හා ආධ්‍යාත්මික ගුණයන් ඇති කල කාලය විය.

පසු කාලීනව පැමිණි සංක්‍රමණිකයන් කිසිවෙකුට එවනි දීර්ඝ කාලීන අත්දැකීම් තුලින් ලබා ගත් ආචාරධර්ම පද්ධතියක් නොමැති බව කිව හැක්කේ එවනි සදාචාර පද්ධතියක් නිර්මාණය වී මුල් බැස ගැනීම සදහා අතිශයින් දීර්ඝ කාලයක් ගත වන නිසාය. මුලින්ම ශාරීරික වශයෙන් කකුල් දෙකක් මත සිටගත් වානරයාගේ සිට ිහෝමෝසේපියනී නැමති මානවයා ඇතිවීම දක්වා වර්ෂ මිලියන තුනක් පමණ ගත වන්නට ඇතැයි විද්‍යාඥයෝ ප්‍රකාශ කරති. ශාරීරික වර්ධනයේ පරිනාමික වෙනසක් ඇති කිරීමට එසේ දීර්ඝ කාලයක් ගත වූවා සේම සදාචාර පද්ධතියක් සමාජ ගත වීම සදහා ද විශාල කාලයක් ගත විය. මේ නිසා ලංකාවේ ආචාරධර්ම පද්ධතිය මුලින්ම ඇති වූයේ මේ ආදිකාලීන ස්වදේශීය මානවයාගේ දීර්ඝ කාලීන අත්දැකීම් ඔස්සේය.

මේ මානවයන්ගේ දෙවනි ලක්ෂණය වූයේ ඔවුන්ගේ පැවැත්මට ඉතා බරපතල තර්ජනයක් ඇති වූ අවස්ථා වලදී ඔවුහු වෙනත් තැන් වලට ගමන් කොට ඒ තැන් වල පදිංචිකරුවන් බවට

පත් විය. අධික වර්ෂාව නිසා හෝ, මැඩ පැවැත්විය නොහැකි ජල ගැලීම් වැනි ස්වභාවික හේතූන් නිසා හෝ අධික වශයේ රස්නය ඇති වීම වැනි විටින් විට ඇති වන ප්‍රශ්ණයන්ගේ හෝ, උල්කාපාතයන්ගේ කඩා වැටීම තුල ඇති වන වෙනස්කම් නිසා ආදී වශයෙන් බරපතල තර්ජනයක් ඇති වන කල්හි ඔවුහු තවත් තැනකට ගොස් පදිංචි වූහ. එකල ජීවත් වූ මානවකයන්ගේ ප්‍රමාණය විශාල නොවූ හෙයින් හා පාලු බිම් ප්‍රදේශයන් පැවති හෙයින්, එසේ එක් තැනක සිට තවත් තැනකට ගොස් පදිංචි වීමේ හැකියාව ඔවුන්ට තිබුණේය.

ඔවුන්ගේ පැවැත්මේ තවත් ලක්ෂණයක් වූයේ විශාල ගැටීම් නොපැවතීමය. මේ නිසා මෙයින් අදහස් කරන්නේ පුද්ගලික මට්ටමින් යම් ගැටීම් ඔවුන් අතර නොතිබුනාය යන්න නොවේ. එහෙත් මහා ගැටීම් සිදු වන්නේ හුදු පුද්ගලික හේතූන් මත නොව සාමූහික ලෙස ජන කොටස් මත ඇති වන ගැටලු නිසාය. ආදිවාසී ස්වදේශික මානවයාට මෙවනි ගැටලුවක් ඇති වීමට හේතුවක් ඇති වුනේ නැත.

## සරල හා සංකීර්ණ සමාජයන්

ඉහත සදහන් කරුණු නිසා ඔවුන් ජීවත් වූ සමාජය සරල සමාජයක් හැටියට සලකනු ලබයි. මෙහිදී සරල යනුවෙන් අදහස් වන්නේ අතිශයින් සංකීර්ණ නොවූ යන අදහසය. මානව පැවැත්ම තුල සංකීර්ණ බාවයක් පවති. එම සංකීර්ණ බාවය ආදි කාලීන මානවයාද අත් දකින්නට ඇත.  සරල සමාජය හා සංකීර්ණ සමාජය අතර ඇති වෙනස පදනම වන්නේ සමාජ සංවිධානයේ සරලභාවය හා සමාජ සංවිධානයේ සංකීර්ණ බව යන අර්ථ වලිනි. නාගරික ආර්ථිකයේ වර්ධනය වීමත්, තාක්ෂණයේ ඇති වන්නා වූ විශාල වෙනස්කම් නිසාත් මානව සමාජ සංවිධානයන් වඩ වඩාත් සංකීර්ණ බාවයට පත් විය. අප ජීවත් වන මේ කාලයේදී මේ සංකීර්ණ බාවය අදහාගත නොහැකි ප්‍රමාණයෙන් ඉහලට ගමන් කොට ඇත. අද දාර්ශණිකයන් පවසන්නේ මානව වර්ගයා මුහුණ දෙන මහා පරිමාණ ගැටලුවක් බවට මේ සංකීර්ණ බාවය පත් වී ඇත යන්නය.

මුල් කාලීන මානවයා හා ඊට බොහෝ කලකට පසු කාලීනව පැමිණි කණ්ඩායම් බොහෝ විට සංක්‍රමණිකයන් මෙන්ම විවිධාකාරයෙන් සෑම දේශයන්ටම ගලා එන වඩා සංකීර්ණ සමාජයන්ගේ බලපෑම ඇති වීමත් සමග සරල සමාජයක පැවති ජීවන රටාව මෙන්ම සදාචාරධර්ම පද්ධතිය සම්බන්ධයෙන්ද ගැටලු ඇති විය. එම ගැටලු හා අතීශයින් දීර්ඝ කාලයක් ඔස්සේ ගොඩ නැගුණු සදාචාර පද්ධතීන් අතර අන්තර් සම්බන්ධයක් ඇති වීමට පටන් ගනී. එම අන්තර් සම්බන්ධයේ දී බාහිරින් එන සමහර බලපෑම් මුලින් පැවති සමාජයේ ජීවත් වූවන් විසින් උකහා ගනු ලබයි. එසේ උකහා ගැනීම තුල සදාචාර පද්ධතියේ බිද වැටීමක් සිදුවන්නේ නැත. එයින් සිදුවන්නේ එක්තරා සංකීර්ණ බාවයක් වර්ධනය වීම හා පසු කාලීනව ඇති වන ගැටලු වලට මුහුණ දීමට ඇති වැඩි හැකියාවක් ඇති වීම පමණි.

එහෙත් පසු කාලීනව ඇති වී ගලා එන සමහර බලපෑම් විශාල කාලයක් ඔස්සේ වර්ධනය වූ සමහර ධර්මයන් සමග ගැටී ඇති අවස්ථාවන්ද ලෝකය පුරාම දැක ගත හැකි ය. රෝම අධිරාජ්‍යය වර්ධනය වී බොහෝ කාලයකට පසු එවනි ගැටීමක් ඇති වූ ආකාරයත් එම ගැටීම තුලින් රෝම අධිරාජ්‍යවාදය කඩා වැටුනු ආකාරයත් ඉතිහාසයේ සඳහන් වී ඇත. මෙවනි අවස්ථාවන් ලෝකය පුරාම දැක ගත හැකි ය.

## බෞද්ධ ආචාරධර්ම

බොහෝ කාලයක් වර්ධනය වූ ආචාර පද්ධතියක් හා ඒ සමග සාධනීයව බද්ද වන තවත් ආචාරධර්ම පද්ධතියකුත් අතර ඇති වන ඉතා උතුම් සම්බන්ධතාවයක් හා වර්ධනයක් බුදු දහම ලංකාවට පැමිණීමත් සමග සිදු වූ බව පෙනී යයි. මේ හමුවීමේදී කැපී පෙනෙන්නේ මුල් කාලයේ මානවයාගේ සරල සමාජය තුල නොතිබුනු අලුත් ගැටීම් ඇතිවන කාලයක දී, එනම් සංවිධානාත්මක කෘෂිකර්මය ඇති වීමත් ඒ මගින් අතිරික්තයක් නිර්මාණය වීමත් ඒත් සමගම, වානිජයේ ඇති වන වෙනස් කම් හා ඒ මගිනුත් ඒකරාශී වන ධනයේ වර්ධනයක් ඇති වීමත්, ඒත් සමගම ඇති වන රාජ්‍යත්වයත් සමගම පැන නගින රාජ්‍යයේ ඇති

වීමත් හා මේ කරුණු වලට අදාල වෙනත් කරුණු ඇති වීමත් සමග සදාචාරාත්මකව පැන නැගුණු ගැටලු විසදීමෙහිලා බෞද්ධ දර්ශණය නව ප්‍රාණයක් ලාංකික ජනතාව වෙත ලගා කරන ලදි. විශාල වශයෙන් තන්හාව හා කෑදරකම පැතිරී යාම මුල් කාලයේ මානවයා ජීවත් වූ සමාජය තුල පැවතියේ නැත. ධනය ඒකරාශී කිරීම මගින් ඇති වන සමාජ ගැටුම්ද එම සමාජයේ පැවතුනේ නැත. එම ගැටීම් නිසා ඇති වන්නා වූ විශාල ප්‍රචන්ඩත්වයන්ද දරුණු විනාශයන්ට පවා අතීත කාලයේ සරල සමාජය තුල පැවතුනේ නැත. සමාජ සංවිධානයෙහි ඇති වුනු සංකීර්ණ මේ ගැටලු විසදීමෙහිලා විවිධ දාර්ශණික මතවාදයන් පැන නැග්ගේය. ඒවා අතරින් ඉන්දියාවේදී ඇති වූ බලවත්ම සාධකය වූයේ මුල් කාලීන බුදු දහමය. මේ නිසා ඉතා පරිණත ආකාරයකින් සදාචාරධර්ම පද්ධතියක් සමාජගත කිරීමේ දැඩි ප්‍රයත්නයක් දැක ගත හැකි ය. බුදු දහම හැර ජෛන ආගමද මේ සාධනීය වර්ධනයන්ට බලපෑ සාධකයක් විය. මේ අවදියේදී සරල සමාජයක් තුලින් දීර්ඝ කාලීනව මුල් බැසගත් සදාචාරයක් වඩාත් පෝෂණය කිරීම බුදු දහම මගින් සිදු කරන ලදි.

## පසු කාලීන ඉන්දීය බලපෑම

පසු කාලීනව ඉන්දියාවෙන්ම පැමිනි තවත් දර්ශණවාදයක් බුදු දහමට පටහැනි දාර්ශණික මූලධර්මයන් තුල පිහිටා තිබුණේය. එම දර්ශණවාදය නියොජනය කෙරෙන්නේ අධිසංකර නමින් හැදින් වූ දාර්ශණිකයා තුලිනි. ඔහුගේ දර්ශණවාදයත් බෞද්ධ දර්ශණවාදයත් අතර ඇති වූ ප්‍රධාන දාර්ශණික වෙනස්කම වූයේ අධිශංකර්ගේ දර්ශණයේ පදනම වූයේ බාහිර ලෝකයත් මානසික ජානනයත් දෙකක් නොව එකක් යන අදහස මතය. බෞද්ධ ධර්මය පදනම වී තිබුණේ බාහිර ලෝකය, ජානනය හා ආධ්‍යාත්මය අතර අන්තර් සම්බන්ධතාවයක් ගැඹුරින් පවතින නමුත් මෙය එකක් නොව දෙකක්ය යන අදහස මතය. මේ දර්ශණවාද දෙක සදාචාර පද්ධතියක් සම්බන්ධයෙන් ඉතා ගැඹුරු වෙනස්කම් නිර්මාණය කරයි. මේ අධිශංකර් විසින් නියෝජනය කල දර්ශණවාදය ක්‍රි.ව. 8 වන ශත වර්ෂයෙන් පසු කාලයේදී ඉන්දියාවේ පැතිර ඉන්දියවේ පැවති බුදු දහම මුලු මනින්ම අතුරුදහන් කර දමන ලදි. එහි

බලපෑම ම පසු කාලීනව ලංකාවටද පැමිනි නමුත් ඉන්දියාවේ මෙන් බුදු දහමේ බලපෑම මුලු මනින්ම යටපත් කිරීමට බැරි විය. මෙහිදී මේ කතාව වැදගත් වන්නේ සදාචාරයක් වර්ධනයේදීත් සාධනීය වර්ධනයන් ඇති වන්නා මෙන්ම සාධනීය නොවන බලපෑමද ඇති වන බව පෙන්වීම සදහා පමනි.

## යුරෝපීය යටත් විජිතවාදී බලපෑම

පසු කාලීනව ඇති වූ යුරෝපීය යටත් විජිතවාදීන්ගේ කාලය තුල සිදු වූයේද එවනි තත්වයකි. ඒ තුල සදාචාරධර්ම වලට ඇති වූ ප්‍රධාන වෙනස නම් රටේ ස්වදේශික ජනතාවගේ ප්‍රයෝජනය සදහා නොව පිට රටක ප්‍රයෝජනය සදහා යම් බිමක් හා එම බිමෙහි ඇති වන ඵලදාව යොදා ගැනීම තුලින් ඇති වන මහා පරිමාණ ගැටලුය. එසේ එයද ධනය රුස් කිරීම වටා ඇති වන ගැටලුවක් විය. එම ධනය රුස්කරවා ගැනීම සදහා රටෙහි සුලු කොටසක් අධිරාජ්‍යවාදීන්ගේ උවමනාවන් ඉටු කර දීමට යොදා ගන්නා ලද්දේ අධ්‍යාපන ක්‍රමය තුල ඇති කරන ලද වෙනස්කම් නිසාය. ඔවුන් තුලින් ඇති වූ අචාරධර්ම බොහෝ දුරට රටේ හා රටේ ජනතාවගේ සුළු සිද්ධිය නොව අධිරාජ්‍ය වාදීන්ගෙන් හා ඔවුන්ගෙන් යැපුණු මේ සුලු කොටස සදහා යොමු විය. මේ අනුව මේ කාලය තුලද රටේ ආචාරධර්ම පද්ධතිය සම්බන්ධයෙන් ගැටලු මතු විය.

## කුල ක්‍රමයේ බලපෑම

අධිශංකර්ගේ බලපෑම යටතේ ඇති වූ ගැටලුත් අධිරාජ්‍යවාදීන්ගේ කාලේ ඇති වූ ගැටලුත් අතර මැද ඇති වූ තවත් විශාල ගැටලුවක් නම් ලංකාවේ සමාජ රටාව කුල ක්‍රමය මත පදනම කිරීම මගිනි. එය ලෝකයේ වර්ධනය වූ අතීශයින්ම සදාචාර ධර්මතාවන්ට පටහැනි වූ දෙයකි. බටහිර රටවල වහල් බාවයේ වර්ධනය වීමෙන් ඇති වූ අගතිකාමී බලපෑම වැනි තත්වයක් කුල කුල ක්‍රමය යටතේ සිදු විය. එය ලංකා සමාංජය තුල එකිනෙකා බෙදීම මත පදනම වූ සමාජ සංවිධානයක් බිහි කලේය. එම ක්‍රමය අවුරුදු දාහකට වැඩි කාලයක් රටේ ප්‍රධාන

සංවිධාන රටාව සේ පැවතියේය. මින් පසු විවිධ කුල කණ්ඩායම් 'අපේ මිනිසුන්' යනුවෙන් හදුන්වා ගත්තේ ඔවුන්ගේ කුලයට අයත් වූ අය පමණය. ආදි කාලීන ස්වදේශිකයාගේ කාලයේදී පැවති අපේ කම පිළිබදව අවබෝධයත් කුල ක්‍රමය ඇති වීමත් සමග අපේකම පිළිබදව ඇති වූ පටු අදහසත් අතර ගැටීමක් පසු කාලීන ලාංකීය සමාජය තුල දැක ගත හැකි ය. කාන්තාවන් යටපත් කිරීම මගින් ඇති වූ අගතිකාමී බලපෑම හා මේ ආකාරයෙන් ඇති වූ අගතිකාමී බලපෑම් අතරට ඉහතකී කරුනු එකතු වේ.

අවසාන වශයෙන් ලංකාව යටත් විජිතභාවයෙන් ස්වාධීන වූ පසුද විවිද ක්‍රම වලින් රට තුල ඇති වූයේද ආචාරධර්ම සම්බන්ධයෙන් සාධනීය නොවන බලපෑමය. මේ අනුව බලන කල රට තුල අපේ යැයි කියා ගත හැකි ඉතා පොහොසත් සදාචාරධර්ම පද්ධතියක් ඉතා ගැඹුරින්ම පදනම වී තිබෙන අතරම ඊට පටහැනි වූ බලපෑම් වලද පැතිරීමක් සිදු වී ඇත. ලංකාව තුල දැන් පවතින සියලුම අර්බුද හා ගැටලු සම්බන්ධයෙන් විසදුම් සෙවීමේදී, ආචාරධර්ම පද්ධතිය සම්බන්ධයෙන් පවතින මේ අතිශයින් සාධනීය වූ පැත්ත මෙන්ම අතිශයින් අගති ගාමී වූ පැත්තද සලකා බැලීම මග නොහැරිය හැකි කාර්යක් බවට පත් වී ඇත.

# අපේකමේ ආධ්‍යාත්මික පසු බිම.
# 06

අපේකම සම්බන්ධයෙන් සදාචාරාත්මක සංකල්පයන් හා දර්ශණයන් ලංකාවේ ස්වදේශිකව නිර්මාණය වී ඒවා තැන්පත් වී ඇත්තේ කෙසේද යන්න පසුගිය පරිච්ඡේදයකදී සාකච්ඡා කරන ලදි. මේ ලිපියෙහි තවදුරටත් සාකච්ඡා කරන්නේ ලාංකික මානවයා ඉතා දීර්ඝ කාලයක් ඔස්සේ තමන්ගේ ආධ්‍යාත්මික වර්ධනයක් නිර්මාණය කර ගත්තේ කෙසේද යන්නය. මෙහිදී සදාචාරක වර්ධනය හා ආධ්‍යාත්මික වර්ධනය අතර පවතින සම්බන්ධය කෙටියෙන් විස්තර කිරීම සුදුසුයි.

මෙහිදී ආධ්‍යාත්මික වර්ධනය මානවයන්ගේ අභ්‍යාන්තරික හැකියාවන් තුල නිර්මාණය වන, අතීශයින් සංකීර්ණ වූ ක්‍රියාදාමයකි. සදාචාරාත්මක පදනම බොහෝදුරට නිර්ණය වන්නේ එකිනෙකා අතර සම්බන්ධයේදී තිබිය යුතු හොඳ නරක පිළිබඳව අවබෝධයක් හා ඒ අවබෝධය මත සිත් තුල සටහන්ව ප්‍රකාශයට පත් වන, කිසියම් විනය රීති පද්ධතියක් මගිනි. මේ විනය නීති රීති පද්ධතිය ඉතා ගැඹුරින් මානවයාගේ සිත් තුල සටහන් වී ඇති දෙයකි. එකිනෙකා අතර මෙන්ම ස්වභාවධර්මයත් සමග දීර්ඝ කාලීනව ජීවත් වීම තුලදි ගොඩනගා ගත් අවබෝධය හා ගති පැවතුම් සදාචාරාත්මක පදනමෙහි සටහන් වී ඇත.

## මානව හැකියාව

ආධ්‍යත්මික පදනම අවබෝධ කරගැනීමේ දී මානවයා සතු ඉමහත් හැකියාවන් ගණනාවක් සාකච්ඡා කල යුතුව ඇත.

මානවයන් තුල දැකීමේ, ඇසීමේ, ස්පර්ශ කිරීමේ පළපුරුදු කම් උඩ බාහිර ලෝකය පිලිබඳව අදහස් හුවමාරු කර ගැනීම සිදු වේ. මෙය ජෛන දර්ශණය තුල ප්‍රචලිතව ඇති පසු කාලීනව ලංකාවේ කට කතාවක් තරමට පැතිර පවතින අන්ධයන් හතර දෙනෙක් අලියෙක් හඳුනා ගැනීමට ගත් උත්සාහය තුල පැහැදිළි කොට ඇත. අලියාගේ එක් එක් අංශයක් අතගා හඳුනා ගන්නා අන්ධයෝ හතර දෙනා තමන් අතගෑ කොටසේ තිබුණු හැඩරුව මගින් ඇතා මෙවනි සතෙක් විය හැකි යැයි ප්‍රකාශ කලහ. ඔවුන්ගේ කතාව අසා සිටි අන්ධයෙක් නොවූ පුද්ගලයෙක් ඔවුන්ට කීවේ ඔබ හඳුනාගෙන ඇත්තේ ඇතාගේ කොටසකි. මට පෙනීම ඇති හෙයින් මට ඇතා අංග සම්පූර්ණව දැක ගත හැකි ය. ඒ මත ඇ෴ා පිළිබඳව පළල් අවබෝධයක් ඇති කර ගැනීමට මට හැකියාව ඇත යන්නය. මේ කතාව පිළිබඳව විවිධ අර්ථකතනයන් ඇති අතර එම අර්ථතකතනයන් විවිද දර්ශන පතයන් ලෙහෙසියෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා ආධාර වී ඇත. එහෙත් මේ ලිපියේදී එම කතාවෙන් බලාපොරොත්තු වන්නේ ඉතා සරල අදහසක් ප්‍රකාශයට පත් කිරීම පමණය. එනම් දැකීමේල ස්පර්ශ කිරීමේ හා ඇසීමේ හැකියාවක් තුලින් මිනිසුන් තුල විවිධ දේ පිළිබඳව අදහස් ඇති කර ගැනීමේ හැකියාව ඇති බවය.

මෙසේ ඇති කර ගන්නා අදහස් පිළිබඳව වැඩිදුරටත් කල්පනා කිරීමේ හැකියාවද මානවයා සතුයි. එසේ කල්පනා කිරීම තුලින් තමා දකින දේ වල ස්වභාවයත් ඒවා විවිධ අවස්ථා වලදී විවිධ ආකාරයෙන් ක්‍රියාත්මක වීම පිළිබඳව සංකල්ප ගොඩ නැගීමේ හැකියාවද ඔහු සතුය. බාහිරව දෙයක් දැකීම එක් දෙයකි. දුටු දේ පිළිබඳව සංකල්ප තනා ගැනීම වෙනත් ක්‍රියාවලියකි.

තව දුරටත් ඇති කර ගන්නා සංකල්ප පිළිබඳව තර්ක ඥානයක් ගොඩ නැගීමේ හැකියාවද මානවයා සතුය. මානව ක්‍රියා කාරීත්වයේ සෑම මොහොතකම පවතින මේ හැකියාව මානවයා දැනීම අත් පත් කරගත් ආකාරය හඳුනා ගැනීමේදී ඉතාම වැදගත් අංශයක් වේ. මෙසේ තර්ක ඥානයක් වර්ධනය වීම ස්වභාවයෙන්ම සිදු වන්නකි. මේ නිසා මේ හැකියාවද ආදි කාලීන ස්වදේශික මානවයාගේ ජීවිතය මේ දිවයින තුල සිටිදා සිටම ඇති වූවකි. ඇත්තෙන්ම මුලින්ම අප්‍රිකාවේ යම් ප්‍රදේශවල

උපත ලැබූ මානවයා, එම අවස්ථාවේ සිටමත් මෙසේ තාර්කිකව තමන් දකිනදේ කෙරෙහි අවබෝධයක් කරා ලගා වීමෙහි හැකියාව ඇතිව සිටියහ.

දීර්ඝ කාලීනව සංකල්ප ගොඩනගා ගැනීම හා ඒවා පිළිබඳව තමන්ගේ සිත් තුල තාර්කිකව සිතා ගැනීමට ඇති හැකියාව තුල දැනීම ඇති වීම පටන්ගනී. මේ දැනීමද ක්‍රමක් ක්‍රමයෙන් ඔවුන්ගේ සමස්ත පැවැත්ම කෙරෙහිම බලපාන අතරම, එය පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රාප්ත වීමද සිදු වේ. මේ නිසා අලුතෙන් උපදින සෑම දරුවෙක් තුලම දීර්ඝ කාලයක් ඔස්සේ වර්ධනය වුනු දැනීම් සම්භාරයක් ගැබ් වී ඇත.

## වින්දනය

මානවයා සතු තවත් හැකියාවක් නම් වින්දනයේ හැකියාවයි. විවිධ ශබ්ද වලට ඇහුම්කන් දෙන මානවයා එම ශබ්ද තුලින් කිසියම් සතුටක් හෝ දුකක් ඇති කර ගනී. වින්දනයේ හැකියාව අභ්‍යන්තර හැගීම් පද්ධතිය තුලින් ඇතිවන දෙයකි. මානවයන්ගේ හැගීම් පද්ධතියෙහි බොහෝ අංගයන් ඇත. විවිධ පාට දැක එම පාට මගින් වින්දනයක් ලැබීමට මානවයාට හැකි ය. ජීවිතයේම ඇතිවන විවිධ සිදුවීම් පිළිබඳව සංකීර්ණ හැගීම් ඇති කර ගැනීමටද මානවයාට හැකියාව ඇත. ටිකින් ටික වර්ධනය වන මේ වින්දන හැකියාව තුලින් සියලුම කලාවන් උපත ලබා ඇත. මේ කලාවන්ගේ උපත හා වර්ධනයද ආදි කාලීන ස්වදේශීක මානවයාගේ සමස්ථ පැවතුම් කාලය තුල වර්ධනය වී ඇති වන්නකි. එසේ ස්වභාවිකව ඇති වින්දන හැකියාව පසුව තමන් විසින්ම නිර්මාණය කරගත් විවිධ උපක්‍රම මගින් ප්‍රති නිර්මාණය කිරීමටත්, හසුරුවා ගැනීමටත් ඇති හැකියාවද මානවයා සතුය. විවිද කලා භාන්ඩයන් වර්ධනය වන්නේ මේ හැකියාව පදනම කොට ගෙනය.

## භාෂණයේ හැකියාව

තම තමන් අතරේ සම්බන්ධ පවත්වගෙන යාම සඳහා එකිනෙකාට කතා කිරීමේ හැකියාවද මානවයා විසින් නිර්මාණය කර ගත් තවත් ප්‍රබල හැකියාවකි. එසේ සම්බන්ධ පවත්වාගෙන

යාමේ විකාශනය විවිධ ආකාරයෙන් සිදු වුනා විය හැකි ය. ඉරියව් මගින් යම් දෙයක් ප්‍රකාශ කිරීම මෙන්ම, විවිධ ශබ්ද මගින් යම් දේ ප්‍රකාශයට පත් කිරීමද සිදු වන්ට ඇත. මෙසේ නිතර නිතර පාවිච්චි වන ශබ්ද තුලින් පොදු අදහස් ප්‍රකාශයට පත් වීම හා ඒ මගින් බොහෝ දුරට සමාන පනිවිඩයක් ප්‍රකාශයට පත් කිරීමට ඇති වූ හැකියාව තුලින් ක්‍රමක් ක්‍රමයෙන් යම් ශබ්දයන් වඩාත් වර්ධනය වන අතර ඒ මගින් වඩා සංකීර්ණ වූ භාෂා ශෛලියන් වර්ධනය වීමට පටන් ගනී.

සමාජය බොහෝ දුරට සරලව පවතිනතාක් දුරට ඉතා සංකීර්ණ වූ භාෂා ශෛලියන් අවශ්‍යය වන්නේ නැත. එහෙත් පසු කාලීනව සමාජය හා ලෝකය පිළිබඳව විවිද දේ වඩා සංකීර්ණ වන තරමටම එම සංකීර්ණ වන අදහස් ප්‍රකාශ කිරීම සඳහා භාෂාවේ වර්ධනයද සිදු වේ. එහෙත් වැදගත් වන්නේ භාෂාවක් පටන් ගන්නේ එම සංකීර්ණ අවධියේ නොවන බවත්, මුලින් තමන්ට ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍යය වූ දේවල් ප්‍රකාශ කර ගැනීමට තරම් හැකියාවක් ආදිකාලීන ස්වදේශිකයන් විසින් නිර්මාණය කරගෙන තිබූ බවත්, එයද ඔවුන්ගේ සංහතියේ දායාදයක් බවට පත් විය.

## තමන් ගැනම කල්පනා කිරීමේ හැකියාව

මෙවනි ස්වභාවික හැකියාවන් වඩ වඩාත් වර්ධනය කර ගැනීම සිදු වීමේදී මානවයා තුල අන් කිසියම්ම හෝ සත්වයෙකුට නොමැති එක් විශේෂ ගති ගුණයක් ඉවහල් විය. එනම් තමන්ට තමන් ගැනම කල්පනා කිරීමට ඇති හැකියාව වර්ධනය වීමය. මානවයා තුල අභ්‍යයන්තරව තමන් ගැන සිතීමේ හා තමන් ගැනම විවේචනය කර ගැනීමේ තමන් තුල ඇති වන හැඟීම් හඳුනා ගැනීමේ, තමන් පාවිච්චි කරන සංකල්ප හඳුනා ගැනීමේ ආදි වශයෙන් කරන සියලු ක්‍රියා පිළිබඳව නැවත හැරී බැලීමේ හැකියාව, ස්වභාවිකවම මානවයා තුල පිහිටා ඇත. එම හැකියාව වර්ධනය වීම තුලින් විවිධාකාර දර්ශණයන් පහළ විය. මේ දර්ශණයන් ඉතා දීර්ඝ කාලයක් ඔස්සේ ඉතා සංකීර්ණව ලිඛිතව පැවතුනේ නැත. එය බොහෝ කාලයක් මිනිසුන් තුලම

අභ්‍යන්තරවම ප්‍රකාශයට පත් වූ අතර ඒවා පොදු දර්ශණයන් බවට හැරෙමින් එම පොදු දර්ශණයන් මත පිහිටා විවිධ ක්‍රියාවන් කිරීමටද ඔවුහු පුරුදු වූහ. ආදි කාලීන ස්වදේශිකයන් පිළිබඳව සොයා බලන ප්‍රාග් ඉතිහාසඥයින්ට හමු වී ඇති එක් දෙයක් නම් ඈත අතීතයක සිට පැවත එන ආදාහන සම්ප්‍රධායන්ය. සුසාන භූමි ඇති වීම හා මළවුන්ට ගරු කිරීමේ විවිධ සම්ප්‍රධායන් හා මළවුන් මතක් කිරීමේ සම්ප්‍රධායන් ගේ වර්ධනය තුල ඇත්තේ මිනිසුන් තමන්ගේ ජීවිතය පමණක් නොව, මරණය ගැනද කල්පනා කිරීම ඉතා ඈත අතීතයක සිට කරන පොදු ක්‍රියාවලියක් බවය.

මේ ක්‍රියාවලිය මෙන්ම ගස් ගල් ඇදහීම, විවිද ස්වභාවිකව සිදුවන දේ වන්දනාමාන කිරීම, ආදි කාලයක සිට මානවයන් තුල පැවත ඇති ඉතා සංකීර්ණ සිතුවිලි දාමයක් එළිදරව් කරයි.

තමන් වටා ඇති ලෝකයේ විවිධ බලවේග ක්ෂණිකව තමන් දකින හා හඳුනා ගන්නා දේ පිළිබඳව පමණකින් ප්‍රකාශයට පත් නොවන බවත්, තමන්ගේ අවබෝධයට හසු නොවන තවත් සුවිශාල දේ විශ්වය තුල පවතින බවත් යන හැඟීමේ වර්ධනය, ඕනෑම ආදිකාලීන ජන කොටසක් තුල දැකිය හැකි ය. මෙහිදී වැදගත් වන්නේ එම ගැඹුරු අවබෝධයන් පිළිබඳව හා තමන්ට නොතේරෙන බලවේගයන් සම්බන්ධයෙන් මානවයන් විසින් ප්‍රතික්‍රියා කර ඇති ආකාරයද ඉතා ගැඹුරින් පසු කාලීන පරම්පරා වලට හමු වන සේ තැන්පත් වී ඇති බවය. මේ අනුව ඇතිවන සංකීර්ණ ක්‍රියාදාමය ආධ්‍යාත්මික වර්ධනය සේ සලකනු ලබයි. අධ්‍යාත්මික වර්ධනයක් ඇති වීමත් එම වර්ධනයට පසු කාලීනව වඩා සංකීර්ණ වූ ප්‍රකාශනයන් අත්කර දීමත් යනු එකිනෙකට සම්බන්ධ වුවත්, එකක්ම නොවේ. මේ අධ්‍යාත්මක සංවර්ධනය ආදි කාලීන ස්වදේශිකයා ඇති වූ මුල් කාලයේ සිට අතිශය දීර්ඝ කාලයක් ඔස්සේ ස්වභාවිකව ඇති වූ ක්‍රියාදාමයකි. මේ ස්වභාවික ක්‍රියාදාමය එම ජන කොටස තුල ජීවත් වන මිනිසුන්ගේ සංස්කෘතියේ ඉතාම ගැඹුරු කොටසක් සනිටුහන් කරයි. ඒවා පිළිබඳව වඩා තර්කාණුකූල ප්‍රකාශන පද්ධතීන් නිර්මාණය වීම හා එසේ පසුව ඇති වන නිර්මාණ අතර විවිධ මතවාද ඇති වීම වෙනත් කරුණකි. වඩා වැදගත් කරුණ වන්නේ මේ ආධ්‍යාත්මික සම්ප්‍රදාය ඉතා දීර්ඝ කාලයක් තුල වර්ධනය වූ බවය. එය ඔවුන්ගෙ

න් පැවත එන සංහතිය තුල අතුගා දැමිය නොහැකි කොටසක් සේ පැලපදියම්ව පවතී.

නූතන මනෝවිද්‍යාව මානවයාගේ සිත් තුල මුලු මානව සංහතියේ මෙන්ම සත්ව සංහතියේද, අතීතය ජීවත් වන සියලුම දෙනාගේ විඥ්ඥානය තුල පැල පදියම්ව ඇති බව තේරුම් කර දී ඇත. මෙය මානය විද්‍යාවේදී හඳුන්වන්නේ ˜අවිඥ්ඥානික මනසී ඃඹබජදබ්ජසදම් එසබා* යනුවෙනි. නින්දේදී දකින සිහින මේ අවිඥ්ඥානික මනස මගින් ඇති කරවන බව බලවත්ව ප්‍රකාශයට පත් කලේ කාල් ජුන් ඃ ක්‍රක ඡමබට* නැමති ප්‍රධාන පෙලේ මනෝවිද්‍යාඥයකු විසිනි. මානවයන් කරන බොහෝ දේ පිළිබඳවත්, ඔවුන් සිතන සිතිවිලි පිළිබඳවත් අවිඥ්ඥානික මනසේ ඇති ගැඹුරු බලපෑම හඳුනා ගැනීම විසි වන ශත වර්ෂයේ මිනිසා විසින් අත් කරගත් විශාල ජයග්‍රමණයක් සේ සලකනු ලබයි.

මේ සියල්ලෙන් හෙළිදරව් කරන්නේ ආදිකාලීන ස්වදේශිකයා අදත් අප තුල ජීවත් වන බවය.

මෙයින් පෙනී යන්නේ යම් කාලයක් යම් පරිසරයක් තුල ජීවත් වීම තුලින් අත්දැකීම් සම්භාරයක් ජන මනස තුල තැන්පත් වන බවත්, එම අත්දැකීම් සමග මිනිස් මනස තුල සිතුවිලි ධාරාවන් ජනනය වන බවත්, එම සිතුවිලි ධාරාවන් දෙස නැවත හැරී බැලී වඩා සංකීර්ණ ක්‍රියාධාමයක් වර්ධනය වන බවත් මේ අත්දැකීම්, සිතුවිලි ජනනය වීම් ඒවා පිළිබඳ නැවත ආපසු හැරී බැලීම් නොකඩවාම සෑම පුද්ගලයකු තුලත්, සෑම ජන සමාජයක් තුලත් සිදුවන බවය. මෙවනි ක්‍රියාධාමයක් අවුරුදු ලක්ෂයකට වැඩි කාලයක් සිදුවීම තුලින් සුවිශාල ඥාන සම්භාරයක් එකතු වීමත් හා ඒ තුලින් යම් ප්‍රඥ්ඥාවක් වර්ධනය වන බවත්ය. එම ප්‍රඥ්ඥාව ප්‍රකාශයට පත් කිරීම තුලින් විවිධ දර්ශණවාදයන් ජනනය වේ. මෙහිදී වැදගත් වන්නේ ජීවිතයේ අත්දැකීම් තුලින් වැඩෙන සාමූහික ඥානය තුලින් විවිධ දර්ශණවාදයන් ජනිත වෙනවා මිස දර්ශණවාදයන් පටන් ගෙන ජීවිතය නිර්මාණය කිරීමක් සිදු නොවන බවය. සාමූහික අත්දැකීම් තුලින් ජනනය වන ඥානය හා ප්‍රඥාව මුල් තැන ගනී. දර්ශණවාදයන්ට හිමි වන්නේ දෙවනි තැනකි.

# කෘෂිකාර්මික අතිරික්තයක් තුලින් ඇති වුනු සංස්කෘතික ගැටලුවක් 07

## සාරාංශය

| | | | | |
|---|---|---|---|---|
| අවුරුදු 1000000 කට වැඩි කාලයක් | අවුරුදු 6000 ක පමණ කාලය | අවුරුදු 4000 කට පමණ පෙර සිට කාලය | | |
| ආදිකාලීන ස්වදේශිකයාගේ සාමකාමී සහජීවනය | වැවීම පටන් ගැනීම | කෘෂිකාර්මික අතිරික්තය හා ඉඩම් හිමි හා අහිමි අය | දාස භාවය හා කුල ක්‍රමය මර්දනය හා කෲරත්වය | අපේකම හා භේදභින්න භාවය. එම භේදභින්න භාවය ආර්ථික, සමාජීය, දේශපාලන හා සංස්කෘතික අංශයන්ට පැතිරී යාම |

අපේකම පිළිබඳව කෙරෙන සාකච්ඡාවෙහි ප්‍රධානම මූලය වන්නේ ශ්‍රී ලාංකිකයාට අවුරුදු ලක්ෂයකට වැඩි සංස්කෘතියක් පවතින බවය. මේ සංස්කෘතියේ විවිධ අවධීන් ඇති බවත් පසු ගිය ලිපි වලදී සාකච්ඡා කලෙමු.

මේ ලිපියෙන් සාකච්ඡා වන්නේ අවුරුදු 6000 පමණ පෙර ආදිකාලීන ස්වදේශිකයන් විසින් ස්වභාවධර්මයෙන් හදුනාගත් විවිධ පැලෑටි වර්ග තමන්ම වැවීමට පුරුදු වූ කාලයකි. මෙයට ගොවිතැන පටන් ගත් කාලය ලෙස සදහන් කල හැක. මුලදී තමන් ජීවත් වූ පරිසරය තුලින් ආහාර හා බෝග වලට ප්‍රතිනිර්මාණය කල හැකි විවිධ පැලෑටි වර්ග ආදිය හදුනා ගැනීම සිදු විය. ඉන් පසුව විශේෂයෙන්ම ආහාර සදහා යොදා ගත හැකි පැලෑටි තමන් විසින්ම වැවීම පටන් ගන්නා ලදි. මෙය ලෝකයේ සෑම රටක් තුලම විවිධ ආකාර වලින් අතීතයේදී සිදු වූ ක්‍රියාධාමයකි. මෙය හෝමෝසේපියන් යනුවෙන් හදුන්වනු ලබන මානවයාගේ වර්ධනයේ වැදගත් අවස්ථාවකි.

වැවීම පටන් ගැනීමත් සමගම ඊට අදාල විවිධ ප්‍රශ්ණ විසදීමටද මේ මානවයාට සිදු විය. වැවිල්ලට අවශ්‍ය වන වතුර ලබා ගැනීම, විවිධ කෘමීන්ගෙන් එම වැවිල්ල ආරක්ෂා කර ගැනීම ආදී වශයෙන් දහසකුත් ගැටලු වැවීමේ ක්‍රියාදාමය තුලට ඇතුලු විය. මේවා විසදීම කෙරෙහිද එම මානවයා විවිධ උපක්‍රමයන් යොදාගත් අතරම, ක්‍රමක් ක්‍රමයෙන් එම උපාය මාර්ගයන් සමාජගත විය. එම උපාය මාර්ගයන්ගේ සමාජගත වීම ඔවුන්ගේ සිත් තුල පැල පදියම් වී විශාල දැනුම් සම්භාරයක් බවට පත් විය. මේ දැනුම් සම්භාරය පරම්පරාවෙන් පරම්පරාවට දායාද වූ අතර ක්‍රමක් ක්‍රමයෙන් එම ඥානය වඩාත් පළල් විය.

## අතිරික්තයක් ලබා ගැනීම සදහා කෘෂිකර්මයේ යෙදීම

කෘෂිකර්මය එක්තරා ප්‍රමාණයකට වර්ධනය වූ පසු තමන්ට අවශ්‍ය ප්‍රමාණයේ ආහාර පමණක් නොව ඊටත් වඩා ආහාර හා වෙනත් දේ හදා ගැනීමේ අවස්ථාවක් ඇති විය. ක්‍රමයෙන් තමන්ගේ පැවැත්ම සදහා පමණක් නොව අතිරික්තයක් ලැබීම සදහාද වැවීම ඇරබියේය. මේ අවදියට සංවිධානාත්මක කෘෂිකර්මය ඇරබි යුගය යැයි කීම සුදුසුය.

සංවිධානාත්මක කෘෂිකර්මය තුල විවිධ උපාය මාර්ග යන් වර්ධනය වීම එම සමාජයේ සංස්කෘතියක් බවට පත් විය. උදාහරණයක් වශයෙන් වැවක් සාදා ඒ මගින් වතුර එකතු කර

ගැනීම ගැන බලමු. සාමාන්‍යයෙන් අප අසා ඇති කතාව නම් මෙය කිසියම් රජෙකු විසින් සිදු කල බවය. එහෙත් එය එසේ සිදු විය නොහැකි දෙයකි. මෙසේ වතුර එකතු කර ගැනීමේ ප්‍රයත්නය, ටිකෙන් ටික සිදු වන්නට ඇත්තේ කෘෂිකර්මයේ යෙදුනු මිනිසුන්ගේම ප්‍රයත්නයක් වශයෙනි. ඔවුන් ජලය එකතු කර ගන්නා ආකාරයන් මෙන්ම, ජලය විවිධ කුඹුරු වලට ගලා යාමට සකස්විය හැකි ආකාරයන් ආදිය ටිකෙන් ටික වර්ධනය කරගත්තා යැයි සිතීම ස්වභාවිකය. මෙසේ ස්වභාවිකවම සමාජගත වුනු මේ ක්‍රියාවලිය තුලින් ඇති වූ අවබෝධයෙන්, මේ වැව් නිර්මාණය කර ගැනීමේ සංකල්පය හා ක්‍රියාදාමය ඇති වුනු බව සැකයෙන් තොරව සිතා ගත හැකි ය.

## ජන විඥ්ඥානය දියුණු වීම හා රාජත්වයේ ආරම්භය.

මෙයට පාලකයන්ගේ හෝ රජවරුන්ගේ සම්බන්ධය ඇති වන්නේ රාජත්වය ඇති වන ක්‍රියාධාමයන් කිසියම් පාලනයක් යටතේ කර ගැනීමට අවශ්‍යය වූ අවස්ථාවකදී, එසේ කර දීමට හැකි නායකත්වයන් පහළ වීමත් සමගය. මේ නායකත්වයෙන් කරනු ලබන්නේ අලුත් ඥානයක් ක්‍රියාත්මක කිරීම නොවේ. රාජත්වය හා පාලනය වශයෙන් සංවර්ධනය වන ව්‍යුහයන් තුලින් දැනටමත් සමාජ ගතවී ඇති ඥානයන්ට අනුව වතුර බෙදා හැරීම හා වෙනත් කෘෂිකර්මයට අදාල සේවාවන් ඇති කරදීම සිදු වන්නට පටන් ගනී. මේ නිසා රජවරුන්ගෙන් සිදුවන ක්‍රියාදාමය වන්නේ, මුලුමනින්ම අහසින් ඔවුන්ගේ සිත් තුලට භාජනය වූ අදහසක් ක්‍රියාවට නැගීම නොව සමාජගත වී දියුණු වුනු ජන අත්දැකීමකට අවශ්‍යය සංවිධාන රටාවක් සපයා දීමය. මෙයද සිදුවන්නේ ජන සහයෝගීතාවය හා පාලකයාගේ ක්‍රියාකාරීත්වය අතර ඇතිවන අවබෝධය මතය.

කෘෂිකර්මයේ සංවර්ධනයට සංවිධාන රටාවක් අවශ්‍යය වූවා මෙන්ම කෘෂිකර්මයෙන් පාලනය වන අතිරික්තය පාලනය කිරීමෙහිත් සංවිධාන රටාවක් අවශ්‍යව තිබුනි. මේ සංවිධාන රටාව හදුනා ගැනීමේදී ලංකාවේ ජීවත්වූවන් අතර ඇතිවන පලවෙනි විශාලම භේදය ඇති වීමද දැකිය හැකි ය.

## ඉඩම් බෙදා ගැනීම හා ඒ මත ඇතිවන භේදයන්

එනම් කිසියම් බල පුලුවම්කාරකමක් පාවිච්චි කර ගන්නා සමහරු වැඩි බිම් ප්‍රමාණයක් තමුන් සතුකර ගැනීම තුලින්, වැඩි අතිරික්තයක හමිකරුවන් වීමට උත්සාහ කරති. මෙහිදී එක අතකින් ටිකින් ටික විශාල ඉඩම් හමියන් ඇති වන අතරම, එසේ ඉඩම් නැති අයද හෝ අඩු ඉඩම් ප්‍රමාණයක් ඇති අයද ඇති වෙන්නට පටන් ගනී. එසේ ඇතිවීම තුල ඇතිවන ප්‍රශ්ණ විසඳා ගැනීම සඳහා වූ අරගලයේදී කිසියම් මර්දනකාරී උපාය මාර්ග යන් යොදා ගැනීමට ඉඩම් වැඩි වශයෙන් හමි කරගත් කණ්ඩායම් වලට සිදු විය. මේ ආකාරයෙන් ස්වභාවිකව, ජනහිත කාමීව එකිනෙකා අතර සාමයෙන් ප්‍රශ්ණ විසඳා ගැනීමේ ආදිකාලීන ස්වදේශිකයන්ගේ ක්‍රමය වෙනුවට, යම් බරපතල ගැටීම් මැද ජීවත් වන සමාජ රටාවන් ඇති වීමට පටන් ගනී.

## දාස භාවයේ පරිනාමය

මෙය වඩාත් දියුණු කෘෂිකර්මයක් බවට පත් වන තරමටම, කෘෂිකර්මය සඳහා ඉඩම් වලට අයිතියක් නොකියන කණ්ඩායම් යොදා ගැනීමේ අවශ්‍යතාවය පැන නගී. මෙය ලෝකයේ සෑම රටක් පාසාම සිදු වී ඇති දෙයකි. මේ සිදුවීම විකාශනය වීම තුලින් දාස බාවය යන සංකල්පයද සමාජ ගත වන්නට පටන් ගනී. සමහරු වෙනත් අයගේ දාසයන් බවට පත් වේ. සමහර විට එසේ දාසයන් බවට පත්වන්නේ පෙර යම් ඉඩම් වලට අයිතියක් තිබූ අයමය. මේ නිසා තමන්ට අතීතයේදී අයිති වූ ඉඩම් වල අලුතෙන් බලය පවරා ගත් ඉඩම් හමියකුගේ දාසයන් බවට පත් වීමට ඔවුන්ට සිදු වේ.

අවසාන වශයෙන් මේ බෙදීම නිසා ඇති වන්නේ තමන්ගේම ආහාරය හා මූලික අවශ්‍යයතාවයන් දාස බාවය තුලින් පමණක් ඉටු කර ගත හැකි කණ්ඩායම් ඇති වීමත්, එම කණ්ඩායම් වල මානසිකත්වයන් එම පැවැත්ම විසින්ම නිර්මාණය කිරීමත් සිදු වීමත් සමගය.

## මර්ධනය මගින් දාස භාවය සමාජගත කිරීම

එහෙත් මෙය ස්වභාවිකවම පමණක් සිදුු වන්නේ නැත. දාසයා දාසයාගේ සීමාව තුල රදවා ගැනීමට විශාල ඉඩම් හමියන්ට සිදු වේ. ඒ නිසා සමාජය තුල ඉඩම් අයිතිය වටා සමාජ තත්වයන් නිර්මාණය වීමට පටන් ගනී. සමාජ තත්වය තුල එක අතකින් ඉඩම් වලටත්, ඉඩම් වලින් ඇතිවන අතිරික්ත ධනයටත් වැඩි හමි කමක් ඇත්තන් හා ඔවුන්ගෙන් යැපීම සිදු කර ගන්නට වූවන් අතර තරාතිරම් දෙකක් ඇති විය. මෙහි වැඩි බලය ඇත්තන් ඔවුන්ගේ තරාතිරම රැක ගැනීම සදහා විවිධ සිරිත් විරිත් නිර්මාණය කර ගනී. එම සිරිත් විරිත් වලට අනුව ජීවිතයේ සියලුම දේ පවා ප්‍රති නිර්මාණය වීමට පටන් ගනී. ඉඩම් හමියන් හා ඔවුන්ගේ පවුල් වල ඇදුම් පැලදුම්, කෑම බීම හා ගෙවල් හදා ගන්නා ආකාරය හා එම ගෙවල් වල ප්‍රමාණය, ඔවුන් විසින් අදිනු ලබන විවිධාකාර ආයිත්තම් වල ස්වභාවය පමණක් නොව ඔවුන් ගමන් කරන විලාශය හා කතා කරන ආකාරය පිළිබදවද ඉතා ප්‍රභල වෙනස්කම් සමාජ ගත වීමට පටන් ගනී. ඊට සමාන්තරව අඩු ආදායමක් ඇත්තන් වෙන්කර හදුනා ගැනීම සදහාද පෙර ආකාරයේම ඇදුම් හා සියලුම දේ පිළිබදව වෙනසක් ඇති විය. බාහිරව බලන්නෙකුට ඉතා පැහිදිළිව වැඩි ධනයක් ඇත්තේ කා අතරද, ඔවුන්ගෙන් යැපෙන්නන් කවරහුද යනුවෙන් ඉතා පැහැදිලිව පෙනෙන ආකාරයට මේ වෙනස සිදු වේ.

## කෲරත්වයේ පරිණාමය

මේ වෙනස ඇති කිරීම සදහා ඇති වන මර්ධනය තුලින් කෲරත්වය පිළිබදව ඉතා තීරනාත්මක අවධියක් එම සංස්කෘතිය තුල ඇති වේ. වැඩි ඉඩම් හමි කමක් හා අතිරික්තයක් ලබා ගැනීමට හා ඒවා පාලනය කර ගැනීමට හැකි වන ආකාරයෙන් මර්ධන රටාවන් පැන නගින අතර එම රටාවන් රැක ගැනීම සදහා ප්‍රචන්ඩ දඩුවම් නියම කිරීම හා ඒවා ක්‍රියාවට දැමීම සිදු වේ. මේ තුලින් ඇති වන රටාව පරම්පරාවෙන් පරම්පරාවට උරුම වෙමින් අලුත් සංස්කෘතියක් ඇති වෙන්නට පටන් ගනී. එය බලය හා මර්ධනය යන සංකල්ප ක්‍රියාත්මක කිරීමේදී වැඩි ජන කොටසක් සමග සිදු වන ගැටීම් මත පදනම වේ.

# කුල ක්‍රමයේ පරිණාමය

පසු කාලීනව මේ ගැටීම් සාධාරණීකරණය කර ගැනීම සඳහා විවිධ මතවාද හා ඒ මතවාද අනුව සමාජ ප්‍රතිසංස්කරණය කිරීමක් සිදු වේ. ලංකාවේ එම ප්‍රති සංස්කරණය සිදු වූයේ කුල ක්‍රමය තුලිනි. වැඩි ඉඩම් වලට හා අතිරික්තයට හිමිකම් වූ අය එක කුලයක් සේ සැලකීමත්, එසේ නොවන්නන් විවිධ අඩු කුලයන් සේ සැලකීම සිදු වන්නේ කෘෂිකර්මයේ අතිරික්තය නිසා සිදු වන ගැටලු නිරාකරණය කර ගැනීමේ පහසු ක්‍රමයක් වශයෙනි. මෙයින් ගෙන යන පනිවිඩය වන්නේ අතිරික්තයට හිමිකම් නොකියන අයට එවනි අතිරික්තයක් සඳහා අයිතියක් නැති බව සදාචාරාත්මක වශයෙන් හා ආධ්‍යාත්මික වශයෙන් හේත්තු ගැන්වීමෙනි. තමන්ගේ සීමාව දැනගත යුතු යැයි ජනප්‍රවාදව තුල ඇත්තේ එම දර්ශණයයි. මේ ආකාරයෙන් ලාංකීය සංස්කෘතිය තුල අති විශාල පරිවර්ථනයක් සිදු විය. එම පරිවර්ථනය වටහා ගැනීමකින් තොරව රටේ සංස්කෘතිය වටහා ගැනීමට කරන ප්‍රයත්නය බොහෝ දුරට  පවතින ප්‍රශ්ණයන් වංක ආකාරයෙන් යට ගසා දැමීම සඳහා කරන ප්‍රයත්නයක් වේ.

# කුහකකමේ පරිණාමය

මර්ධනයන් සාධාරණය කර ගැනීම සඳහා වර්ධනය වන තවත් උපක්‍රමයක් වන්නේ කුහකකමය. කුහකකම යන්න මූලික වශයෙන්ම ඇත්ත තත්වයක් වසන් කර වෙන මවා පෑමක් ඇති කර එම මවා පෑම සත්‍යයක් සේ සැලකීමට මිනිසුන් පුරුදු කිරීමය. වැඩි ඉඩම් හිමියන්ට තමන්ගේ තත්වය පවත්වාගෙන යෑම සඳහා මේ කුහකත්වය අත්‍යාවශ්‍යය සමාජ ගුණයක් බවට පත් වේ. මෙය ස්වභාවධර්මය තුලද දැකිය හැකි ය. විවිධ සතුන් තමන් ගොදුරු සෙවීමේදී ගොදුරට භාජනය වන්නන් ගෙන් තමන්ගේ සැබෑ ලක්ෂණය හා අරමුණ වසන් කර ගැනීම සඳහා ඔවුන්ගේ හම් වල පාට හෝ ඔවුන්ගේ විවිධ ගති ලක්ෂණ වෙනස් කර ගනී. මෙය ඉතා දැනුවත් ආකායකින් කර ගැනීමට මිනිසුන්ට පුලුවනි. කුහකත්වයේ මූලය පවතින්නේ ඉහත සඳහන් කෘෂිකර්මයේ අතිරික්තය හිමි කර ගැනීම සඳහා කරන තරගය තුලිනි.

ලාංකීය සමාජයේ හා සංස්කෘතියේ වර්ධනය මර්ධනයේ හා කුහකත්වයේ වර්ධනය පිළිබඳව අවබෝධයක් නැතිව වටහා ගත නොහැකි ය. විවිධ සුරංගනා කතා මගින් අතීශයින් සෞන්දර්යාත්මක වූ දෙයක් සේ සංස්කෘතිය මවාපෑමට උත්සාහ කලත්, පසු කාලීනව එනම් සංවිධානාත්මක කෘෂි ක්‍රමය ඇති වූ කාලයේ සිට ඇති වූ පැවැත්ම මර්ධනය පිළිබඳ සාකච්ඡාවෙන් හා කුහකත්වය පිළිබඳ සාකච්ඡාවෙන් තොරව කිරීම ව්‍යාජ ප්‍රයත්නයකි. මේ නිසා අපේකම, පිලිබඳ සාකච්ඡාවේදී අපේකම යන අදහස වර්ධනය වීම හා එයට ප්‍රතිවිරුද්ධව ඇති වූ සමාජ අත්දැකීම් හා සංකල්ප ලංකාවේ කෘෂිකාර්මික අතිරික්තය හමි කර ගැනීම සඳහා සිදු වූ ක්‍රියාවලියත් සමග සම්බන්ධ කොට සාකච්ඡා කල යුතුය. එක අතෙකින් අපේකම පරමාදර්ශයක් සේ පවතී. අනෙක් අතින් අපේකම කුරිරු ලෙස බිඳ දමා සමාජය භේද බින්න කිරීමේ ප්‍රයත්නයද සමහරු පරමාදර්ශයක් කර ගනිති. මේ අනුව ලංකාවේ ජනතාව තුල තමන්ගේ පරම අභිලාෂයන් පිළිබඳව එකගතාවයක් ඇත්තේ නැත. එවනි එකගතාවයක් සාධනීයව ඇති කිරීම අපේකම පිළිබඳව කෙරෙන අව්‍යාජ සාකඡාවක මූලෝපාය බවට පත් විය යුතුය.

## වෙන අතක යා හැකිව පැවතුනි

ජ.වි.පෙ හා එල්.ටී.ටී.ඊ පටු මතවාදයන් හා වගකීම් විරහිත ප්‍රචණ්ඩත්වයෙන් තොරව ජනතාවගේ ප්‍රශ්ණ විසදීම කරා යා හැකිව පැවතුනි.

ඉතිහාසයේ සිදුවිය හැකිව තිබූ වඩා සාධනීය වර්ධනයන්, ඒවා නැතිවුනායින් පසු කල්පනා කිරීම වැඩක් නැති වැඩක් යැයි කාට හෝ සිතුනහොත් එහිද සාධාරණත්වයක් ඇත. එසේ උවත් වැරදුනු තැන් හදුනා ගැනීම් තුලින් අනාගතයේ වැඩි සාධනීය වර්ධනයන් මිනිසුන් විසින් අත්පත් කර ගත හැකි බව සෑම මිනිස් ක්‍රියාකාරීත්වයක් තුලින්ම පිළිබිබු වේ. මේ අනුව වැරදුනු තැන් සොයා බැලීම නිශ්ඵල ක්‍රියාවක් නොවේ.

ඉතිහාසයේ තවත් පාඩමක්නම් යම් ගැටලු මිනිසුන් හදුනා ගැනීමත්, ඒවා නිරාකරණය කර ගැනීමත් අතර බොහෝ විට

එක්තරා කාලයක් ගතවන බවය. මුලින් තද බලව යම් ප්‍රශ්ණ පිළිබඳව හිතටගත් සමහරුන් ඒ පිළිබඳව ක්ෂණික විසඳුමක් සොයා ගැනීමට කර ඇති උත්සාහයන්ද ඉතිහාසය පුරාම පෙනෙන්ට ඇත. එවනි උත්සාහයන් අනිවාර්යෙන්ම නිශ්ඵල වනවා පමණක් නොව තමන් බලාපොරොත්තු වන අනාගතය පසු බැස්සවීමද තවත් ඉතිහාසයෙන් ඉගෙනගත හැකි පාඩමකි.

මේ ලිපිය පදනම වන්නේ ඉහත කී පූර්ව නිගමනයන් පදනම කරගෙනය. ජනාතා විමුක්ති පෙරමුනේ පැන නැගීමට මෙන්ම දෙමළ කතාකරන ජනතාව අතරට යම් එල්.ටී.ටී.ඊ වැනි සංවිධාන බිහිවීමත් අස්වාභාවික දෙයක් නොවේ. මන්දයත්, එය යටින් ඇත්තේ තමන්ට බලපාන සමහර ප්‍රශ්ණයන් පිළිබඳව යම් අවබෝධයක් යම් කණ්ඩායම් තුල වර්ධනය වෙමින් පැවතුන බවත්, එම අවබෝධයට යම් ප්‍රකාශයක් දිය හැකි එක්තරා නායකත්වයන්ද පැන නැගුණු බවත්ය.

## ජ.වි.පෙ. පැන නැගීම

ජනතා විමුක්ති පෙරමුණේ පැන නැගීම සම්බන්ධයෙන් දීර්සව සාකච්ඡා වී ඇති අතරම ඒ ගැන නොයෙක් වාර්තා හා ලේඛණද පල කොට ඇත. මේවායේ සාරාංශය මෙසේ දැක්විය හැකි ය.

අලුතින් ඇති වුනු තරුණ පරපුරක් තමන්ට ලාංකික ආර්ථිකය තුල හා එහි පැවතුන සමාජ තත්වය තුල අත්පත් කර ගත හැකි අනාගතය, එතරම් සොඳුරු එකක් නොවනා බව වටහා ගන්නට පටන් ගත්හ. එක් අතෙකින් විරක්ෂා භාවය පිළිබඳව ඇත වූ ඕනෑම සමාජයක වෙනස්කම් ඉල්ලා සිටීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයකි. ඊට අමතරව අලුතින් අධ්‍යාපනය ලබා ඉදිරියට පැමිණි මේ කණ්ඩායම් බොහෝ දුරට අතීතයේදී ඉතාම පීඩිත තත්වයන්ගෙන් පසු වුනු පවුල් වලින් ඇති වූ අය වූහ.

මේ පිළිබඳව 1971 ඇතිවුනු කැරැල්ලෙන් සුලු දින ගණනක් ඇතුලත ජේ.වී.පී යට සම්බන්ධ යැයි සැක කරන ඕනෑම පුද්ගලයෙකුට රජයට භාර වන සේ අවස්ථාවක් එකල පැවති සිරිමාවෝ බණ්ඩාරණායන ආණ්ඩුව විසින් ලබා දෙන ලදි. ඒ අනුව

විශාල ප්‍රමාණයක තරුණයන් එසේ රජයේ බාරයට පත් විය. එසේ භාරයේ සිටින අතර ඔවුන්ගේ වග තුග පිළිබඳව කරුණු සොයා බැලීමක්ද සිදු විය. මේ කරුණු සොයා ගැනීම සඳහා තෝරා ගන්නා ලද්දේ රජයේ ඉහල තනතුරුවල සිටි අයය. ඔවුන් මෙසේ අත්තඩංගුවට ගත් අයගෙන් ගත යුතු තොරතුරු සම්බන්ධයෙන් ප්‍රශ්ණාවලියක් නිර්මාණය කර තිබුනි. මේ ප්‍රශ්ණාවලියේ එක් ප්‍රධාන ප්‍රශ්ණයක් වූයේ අදාල පුද්ගලයා කුමන කුලයකට අයිතිද යන ප්‍රශ්ණයයි. මේ පිටුපස පැවති පූර්ව නිගමනය නම් යම් පීඩිතයැයි සලකනු ලැබූ කුල වල පුද්ගලයන් වැඩි වශයෙන් ජනතා විමක්ති පෙරමුණට ක්‍රියාකාරීව සහයෝගය දුන්නා යැයි යන මතයය.

මේ මතය වඩාත් තහවුරු කරන සාධකය වූයේ බෙල්ජියමේ මහාචාර්ය වරයෙකු වූ ෆ්රැන්ක්වුවා හුටාට් (Francois Houtart) නැමති සමාජ විද්‍යාව පිළිබඳව ලෝක ප්‍රසිද්ධියක් දැරූ විද්වතෙක් ජනතා විමුක්ති පෙරමුණේ සිදුවීම් වලට ටික කාලයකට පසු ලංකාව සම්බන්ධයෙන් යෙදුනු සමාජ සමීක්ෂණය මගින් හෙලිදරව් කල කරුණුය. තමන් ලබාගත් දත්තයන් විශ්ලේෂණය කල හූටාට් මහාචාර්යවරයා කියා සිටියේ ජනතා විමුක්කි පෙරමුණ අඩු කුල හෝ කුල හීනයැයි සැලකූ කණ්ඩායම් තුලින් පැන නැගුණු විරෝධතා ව්‍යපාරයක් බවය.

ඇත්තෙන්ම මේ කරුණ පිළිබඳව කිසිදු සැකයක් ඇති කර ගැනීමට පදනමක් නැත. අත්තඩංගුවේ පත් වූ සමහර පුද්ගලයන් ඔවුන් නිදහස් වුවාට පසු ඔවුන්ට සිදුවූ විවිධ සිදුවීම් විටින් විට වාර්තා කොට ඇත. එම අවස්ථාවලදී ද ඔවුන් ඉතා පැහැදිලිව ප්‍රකාශ කොට ඇත්තේ කුලය පිළිබඳව ප්‍රශ්ණය ඉතා තදින් සලකා බැලූ ප්‍රශ්ණයක් බව ඔවුන්ගෙන් කල ප්‍රශ්ණ කිරීම් වලදී පැහැදිලි වන බවය.

මේ අනුව එක් අතකින් විරක්ෂා භාවය වැනි කරුණුත් අනිත් අතින් සමාජයේ මුල් බැස තිබූ විෂම තාවයන් තුලින් දීර්සකාලීනව භුක්ති විද ඇති විපරීත සැලකිලි වලට විරුද්ධව නැගුණු හඬක් වශයෙන්ද ජනතා විමුක්ති පෙරමුණ හැඳින්විය හැකි ය.

# එල්.ටී.ටී.ඊ යේ පැනනැගීම

මේ කරුණම ඒ ආකාරයෙන්ම දෙමළ තරුණයන් අතරමද ප්‍රකාශ වූ බව පැහැදිළියි. එම එල්.ටී.ටී.ඊ යට අදාල හා ඊට සමානම තවත් ව්‍යාපාර වලට අදාළ බොහෝ පුද්ගලයන් දෙමළ සමාජයේ ඉහල කුලයෙන් ඇති වූ අය නොවේ. ඔවුන් එම සමාජ ක්‍රමය තුල ඉතා දරුණු පීඩානයට පත් වූ සමාජ ස්ථර වලින් ඇති වූ අය වූහ. මේ අනුව මේ ව්‍යාපාර දෙකේම සහභාගි වූවන්ගේ සමාජ පසුබිම බොහෝ දුරට සමානය. දෙමළ සටන් කරුවන් හා එකල ජීවත් වූ තරුණයන් සාමාන්‍යයෙන් සියලු ලාංකික තරුණයන් පොදු වේ ආර්ථික වශයෙන් අඩු ආදායම් ලැබූ කණ්ඩායම් වල තරුණයන්ට තිබූ ප්‍රශ්ණ භුක්ති විඳි අතරම, ඕනෑම රටක සේ සුලු ජාතීන්ට සිදු වූ විවිධ විෂමතා සැලකිලි පැවති බවට පිලිගැනීමෙන් වැලකී සිටීමට ඉඩක් නැත. ඉතාම දරුණු ආකාරයෙන් ජාතිවාදී මත දරන්ණන් පවා සුලු ජාතියක් හැටියට දෙමළ කණ්ඩායම් වලට විෂමතා සැලකිල්ලක් පැවති බව ප්‍රශ්ණ කරන්නනේ නැත. ඔවුන් ප්‍රශ්ණ කරන්නේ එම ප්‍රශ්ණය විසඳා ගැනීම සඳහා යොදා ගන්නා ලද විධික්‍රමය හා මූලෝපායන් සම්බන්ධයෙනි.

ඕනෑම සමාජ ව්‍යාපාරයක් කිසියම් සමාජ හේතුවකින් පැන නැගෙන අතර බොහෝ විට එය ව්‍යාපාරයක් බවට පත් වීමේ දී ඔවුන් විසින්ම කියාගන්නේ තමන් ගැන පදනම වන ඇත්ත ප්‍රශ්ණ පමණක් නොවේ. තමන්ගේ ප්‍රශ්ණ අතිශයයෝක්තියට නැගීම දේශපාලන ප්‍රචාරයේදී කොතනත් සිදු වන දෙයකි. කිසියම් හෝ දේශපාලන ව්‍යාපාරයක් තමන් ගැනම කියන දේවල් වලින් පමණක් ඔවුන්ගේ ඇත්ත ස්වභාවය හඳුනා ගත නොහැකි ය.

මේ අනුව ජනතා විමුක්කි පෙරමුණ මෙන්ම එල්.ටී.ටී.ඊ ය හා ඊට සම්බන්ධ වෙනත් සංවිධානත් ඔවුන්ගේ ප්‍රශ්ණ නිරාකරණය කර ගැනීමට පටන් ගත්තේ ඔවුන් එය නිරාකරණය කර ගැනීමට යෝජනා කරන ලද මූලෝපායේ හා පසුබිමේ පිහිටාය. මේ කණ්ඩායම් දෙකම ලංකාවේ ආයුධ සන්නද්ධ අරගලයක් අවශ්‍ය යන පදනමක ඔවුන්ගේ මූලෝපාය පිහිටුවා තිබුනි. එය රටේ ජනතාව ඉදිරියේත්, ජාත්‍යන්තරය ඉදිරියේත් සාධාරනීකරණය කිරීම සඳහා තමන් පිළිබදව ඇති විශ්ලේෂණය සකස් කර ගැනීමට ඔවුන්ට

සිදු විය. මෙයද කිසිදු අහම්භයක් නොවේ. ලෝකයේ ඇති වූ සියලු සමාජ ව්‍යාපාරයන් ඒවා වාමාංශික වූවත් දක්ෂිනාශික වූවත් තමන්ගේ ප්‍රචාරයේදී බොහෝ දුරට තමන්ගේ මූලෝපායට අනුව තමන්ගේ ප්‍රශ්ණය නිර්වචනය කිරීමට හා පැහැදිලි කිරීමට උත්සාහ කරති. මේ අනුව ප්‍රශ්ණයෙන් පටන් ගෙන උත්තරයක් දක්වා යෑම වෙනුවට, උත්තරයෙන් පටන්ගෙන ප්‍රශ්ණයට විශ්ලේෂණයක් දීම සමාජ විද්‍යාව තුලින් මෙවනි ව්‍යාපාර හැදෑරීමේදී ඉතා පැහැදිළිව පෙනී යයි.

## ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතික්ෂේප කිරීම

මේ අනුව මේ ව්‍යාපාර දෙකටම ප්‍රතික්ෂේප කිරීමට සිදු වූ එක කරුණක් ඇත. එනම් ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුල තමුන්ගේ ප්‍රශ්ණ විසඳා ගැනීමට ඉඩක් නැතැයි යන මතය තමන් වටේ සිටි තමන්ගේම කණ්ඩායම් වලටත් රටේ ජනතාවටත්, ජාත්‍යයන්තරයටත් ඔවුන්ට කියා පෑමට සිදු විය.

මෙය වෙනස් වූවානම් එනම් ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් ඔස්සේ සමස්ථ ලංකාවේ පාලන ක්‍රමය පිහිටුවා ගැනීමේ පදනම මත, තමන්ගේ ප්‍රශ්ණ ප්‍රජාතන්ත්‍රවාදීව විසඳා ගැනීමේ මාවතක් පවතිනවාය යන විශ්වාසය ඔවුන් තුල පිහිට වූයේ නම් හා ඒ මත ඔවුන්ගේ මූලෝපායන් පිහිට වූයේ නම්, ඔවුන් වටා සිටි ඉතා කැපවීම් වලින් කටයුතු කල ක්‍රියාධරයන් තුල සමස්ථ ජනතාව තුලින් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබදව විශාල පිබිදුවීමේ හැකියාවක් ඔවුන්ට තිබුනි. එසේ වූවානම් සිදුවීමට බොහෝ දුරට ඉඩකඩ තිබුණේ ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන උවමනාවක් ඇති කණ්ඩායම් ඉතා දෘඩි බැඳීමකින් යුතුව එකමුතු වීමය. ඔවුන්ගේ විවිධත්වයන් නොතකා ඉතා දෘඩි බැඳීමක් මත එකමුතු වීමක් ඇති වීමට ඉඩ කඩ තිබුනි.

ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයක ශක්තිය පවතින්නේ සාමූහිකව ඇති වන පොදු එකගතාවයන් ඔස්සේය. රටේ විරක්ෂාභාවය පිළිබද ප්‍රශ්ණ හා ඊට අදාල ආර්ථික ප්‍රශ්ණ මෙසේ විසඳා ගත හැකි ය යන සාකච්ඡාවක් රට තුල ඇති වූයේ නම් මේ වන විට ලංකාවට ඉදිරියට යෑම සදහා ඉතා ප්‍රබල ජන අවබෝධයක්

නිර්මාණය කල හැකිව පවතී. මේ ජන අවබෝධයෙන් තොරව කෙරෙන ඕනෑම ව්‍යාපාරයක් අවසාන වශයෙන් පරාජය වීමත්, ඔවුන්ගේ අරමුණු නිශ්ප්‍රභා වීමත් වැලැක්විය නොහැකි ය.

## දක්ෂිණාංශික මූලෝපායේ ගොදුරක් බවට පත් වීම

මන්දයත් ලංකාව තුල ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වීමට විරුද්ධ බරපතල දක්ෂිනාංශික කණ්ඩායමක්ද සිටී. ඔවුන්ගේ පළමුවනම ප්‍රකාශණය වූයේ 1962 දී සිදු කිරීමට උත්සාහ කල රාජ්‍ය පෙරලීමේ කුමන්ත්‍රණයයි. මීට සම්බන්ධ වූ ඒ කාලයේ ඉහල තත්වයේ සලකන ලද පොලීසියේ හා මිලිටරි නිළධාරීන් පමණක් නොව, ඔවුන් පිටුපස ක්‍රියාත්මක වුනු ප්‍රභල දේශපාලඥයන්ගේද අවශ්‍යතාවය වූයේ නිදහස් අධ්‍යාපනය පදනම කරගෙන ලංකාව තුල ඇති වෙමින් තිබූ නව ජන අවබෝධය, පස්සට තල්ලු කර දැමීමේ අවශ්‍යතාවයය. ඉහත සදහන් කුමන්ත්‍රණයේ නායකයෝ මෙය ප්‍රසිද්ධියේම ප්‍රකාශයට පත් කල අතර, එය ඇමරිකාවේ මිලිටරි පිළිබදව විශාරදයකු විසින් ඔහු ලියූ පොතක ඉතා පැහැදිලිව ප්‍රකාශයට පත් කොට ඇත. එම මහාචාර්යවරයාට මේ නායකයන් කියා තිබුණේ අප මේ කුමන්ත්‍රණය කිරීමේ හේතුව වූයේ අපි ලංකාමේ බුක්තිවිදිමින් තිබූ වරප්‍රසාද අපේ දරුවන්ට නැති වී යන නිසා, එසේ අලුතෙන් ඇති වී තිබෙන තත්වය වෙනස් කිරීම සදහා තමන් මේ කුමන්ත්‍රණය කල බවය.

කුමන්ත්‍රණය අසාර්ථක විය. එහෙත් ඊටත් වඩා දක්ෂ ආකාරයකින් මේ කුමන්ත්‍රණය පිටුපස වූ මූලික අදහස එනම් ලංකාවේ අලුත් බුද්ධිමත් පරම්පරාවක් විසින් ඇතිකරමින් ගිය අවබෝධයත් එම අවබෝධය නිසා ඇති වූ එකගතාවයත්, ඒ තුලින් පළල් විය හැකිව තිබූ ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පදනමත් අවුල්කර හෝ පස්සට ඇද දැමීමය. මේ සදහා අවශ්‍යය නායකයා එකල සිටියේය. එනම් පසුව ජනාධිපති වූ ජේ. ආර්. ජයවර්ධන මහතාය. ඔහු ඔහුගේම මූලෝපාය එනම් ප්‍රජාතන්ත්‍රවාදයට ඇති ඉඩකඩ මුලුමනින්ම යටපත් කිරීම සදහා ව්‍යාපාරයට ඉතා ප්‍රභල නායකත්වයක් දුන්නේය. මේ සදහා ඔහු සකල ව්‍යවස්ථා නීතියම මුලුමනින්ම වෙනස් කලේය. ලංකාවට ප්‍රජාතන්ත්‍රවාදී නොවන

ව්‍යවස්ථාවක් සාර්ථකව ඉදිරිපත් කොට එය සාර්ථකව පවත්වාගෙන යාමේ තත්වය උදාවිය. එදා සිට අද දක්වා එම ක්‍රියාදාමය තව තවත් පළල් වෙමින් ප්‍රජාතන්ත්‍රවාදය ලංකාවේ නටබුන් අතරට එක් වී ඇත. අනුරාධපුරයේදී ඓතිහාසික නටබුන් නරඹනවා මෙන්ම කොළඹ නගරයේ ඉතිහාසය දෙස බලන විට ඇතිවෙමින් තිබූ ප්‍රජාතන්ත්‍රවාදයක විනාශයේ නටඹුන්ද දැක ගත හැකි ය.

එහෙත් එය හුදෙක් මෙවනි දක්ෂිණාංශික බලවේග වලට පමණක් පැවරීම තුලින් සිදු වන්නේ ජනතාව තුලම ඇතිවී හැකිව තිබූ හා අනාගතයේදී ඇතිවීමට හැකිව තිබෙන සාමූහිකත්වය පිළිබඳව හැඟීම හා තමන්ගේ ප්‍රශ්ණ විසඳා ගැනීම සඳහා එකට එක් කරන මූලෝපායක් ගොඩ නැගීමේ ඇති අවස්ථාව නැති වී යාමය. එම අවස්ථාවේ පදනම ප්‍රජාතන්ත්‍රවාදය හැර වෙන එකක් නොවේ.

දැන් ප්‍රජාතන්ත්‍රවාදය වශයෙන් පවතින්නේ නයෙකු විසින් හැර දැමූ හමක් සේ පමනි. හමේ පාට යම් ආකාරයකින් පෙර සේ තිබිය හැකි වුවත්, එය යට තිබූ ප්‍රාණ ජීවියා එහි නැත.

මේ ලිපියෙහි සඳහන් වන්නේ මේ කරුණ පිළිබඳව අනිවාර්යෙන්ම ඇති විය යුතු ගැඹුරු හැදෑරීම් වල හා කල්පනා ධාරාවක පැවතිය යුතු යම් පූර්ව නිගමනයන් පිළිබඳව සඳහන් කිරීමක් පමනි. මීට වඩා පළල්ව මේ විෂය හැදෑරිය යුතු අතරම, එය කාලයක් තිස්සේම රට තුල පැවතිය යුතු කල්පනාධාරාව බවට පත් විය යුතුව ඇත.

# ලංකාවේ සංස්කෘතික අපරාධ විද්‍යාව පිළිබඳව ප්‍රවේශයක්.

# 08

සංස්කෘතික අපරාධ විද්‍යාව පිළිබඳව අධ්‍යාපනය ලංකාවේ සංස්කෘතියේ වර්ධනයට සම්බන්ධ කොට සාකච්ඡා කල යුතුව ඇත. ලංකාවේ සංස්කෘතික ඉතිහාසය තුල හරි වැරදි පිළිබඳව හා අපරාධ පිළිබඳව අදහස් වර්ධනය වූ ආකාරය තුලින් සංස්කෘතික අපරාධ විද්‍යාව දෙස බැලීමේදී ඉතා සුවිශේෂ වූ ඉතිහාසයක් ඇති බව අපට පෙනී යයි.

මේ අනුව මේ විෂය හැදෑරිය යුතු කාල පරිච්ඡේදයන් මෙසේ වෙන් කල හැකි ය.

01. ආදිකාලීන ස්වදේශිකයන් ලංකාවේ පදිංචිවීමේ සිට සංවිධානාත්මක කෘෂිකර්මය ඇති විම දක්වා කාලය. (එනම් දැනට අවුරුදු එක් ලක්ෂ විසි පන්දහසක කාලයේ සිට දැනට අවුරුදු හය දහසක පමණ කාලය දක්වාය.)

02. කෘෂිකර්මාන්තය ඇති වීම. මෙයද අවදීන් දෙකකට වෙන් කල හැකි ය. (එනම් දඩයමින් හා ආහාර එකතු කර ගැනීමෙන් ජීවත් වූ මානවයා ඉන් පසු තමන් විසින් ආහාරයට හා මනුෂ්‍ය පැවැත්මට ආධාර කල හැකි යැයි සිතූ වැවිලි වගා කරන්නට පටන් ගන්නා මුල් කාලය හා යම් අවදියකදී සංවිධානාත්මක ගොවි තැන ඇති වීම පිළිබඳ කාලයයි.)

03. රාජ්‍යත්වයේ ඇති වීම හා ඒ මාර්ගයෙන් පරිපාලනයේ ඇති වුනු වෙනස්කම්.

04. ලංකාවේ සමස්ථ සංවිධාන ක්‍රමය කුල ක්‍රමය තුල වර්ධනය වූ කාලය (මෙය ක්‍රි.ව. හත්සියය, අටසියය පමණ කාලයේ සිට විසිවන ශත වර්ෂය දක්වාම දිව යයි).

05. ඊලග අවදිය වන්නේ යටත් විජිත පාලනයට පෙර ලංකාවේ මුහුදු කරයත් පසුව සමස්ත ලංකාවමත් යටත් වීමේ කාලයයි. මෙය දහසය වන ශත වර්ෂයේ මුල් කාලයේ සිට එක් දහස් නමසිය හතලිස් අටේ නිදහස දක්වා පැතිර යන කාලයකි. මේ කාලය තුල යුරෝපයේ අපරාධ පිළිබඳව ඇති වී තිබූ අදහස් හා ඒවා මර්ධනය කර ගැනීම සඳහා යොදා ගන්නා ලද උපක්‍රමයන් ලංකාව තුලට ගෙන එන ලදි.

06. ඊලග අවදිය වන්නේ නිදහසේ සිට අද දක්වා පවතින කාලයයි.

දැන් මේ එක් එක් කාලයන් වෙන් කොට ඒවා අපරාධ නීතියේ වර්ධනය සම්බන්ධයෙන් වැදගත් වන ආකාරය සලකා බලමු.

## ආදිකාලීන ස්වදේශිකයන්ගේ කාලය

මෙය ඉතා දීර්ඝ කාලීන එකකි. මේ දීර්ඝ කාලය පුරාම පවතින ලක්ෂණ පසු ගිය කාලයන්හිදී ලංකාවේ පුරාවිඥාඥයන් විසින් සොයා ගන්නා ලද කරුණු තුලින් හෙලි වී ඇත. මේ කරුනු වලින් ඉතාම පැහැදිලිව ප්‍රකාශයට පත් වන්නේ මේ ආදිවාසී ස්වදේශිකයන් අප්‍රිකාවේ යම් ප්‍රදේශයක සිට ලෝකය පුරා පැතිර ගිය කණ්ඩායම් වලින් පැවති අය බවය. දැනට වසර එක්ලක්ෂ විසිපන්දහසකට පමණ පෙර කාලයේදී ඔවුන් සම්ප්‍රාප්ත වූ බවට විශාල කරුණු ඔප්පු කොට ඇත.

මේ ආදීකාලීන ස්වදේශිකයන් තමන්ගේ ආහාරය හා පදිංචිය සාදාගන්නා ලද්දේ ස්වභාවධර්මය සමග ඉතාම කිට්ටු සම්බන්ධතාවයක් පවත්වාගෙන යෑමෙනි. මෙසේ බොහෝ කාලයක් පුද්ගලයන් හා පවුල් හා කණ්ඩායම් එකට ජීවත්වීම තුලින් ඔවුන් තුල කිසියම් විඥ්ඥානයක් අවබෝධයක් වර්ධනය වේ. මේ අනුව යම් දේවල් කිරීම සුදුසුය යම් දේවල් කිරීම අහිතකරය යන වටහා ගැනීමක් පොදුවේ වර්ධනය වන්නට විය. එම පොදුවේ

වර්ධනය වෙමින් පැවතුන අදහස් වලට අනුව ඔවුහු විවිධ සිරිත් විරිත් ගොඩනගා ගත්හ. ඒවා බොහෝ දුරට පොදු අරමුණු තුලින් නිර්මාණය වූ ඒවා මිස කිසියම් පිටස්තර නායකත්වයක් විසින් පැටවූ ඒවා නොවේ. මෙසේ ඇති වූ සිරිත් විරිත් වලින්ම තමන්ගේ ගැටලු විසඳා ගැනීමට ඔවුන්ට හැකියාව තිබුනි. මේ නිසා මේ කාලය තුල ලිඛිත නීතීන් සෑදීම හෝ ඒවා ප්‍රසිද්ධ කිරීම මගින් ඒවාට අනුකූලව ජන මතය හැඩ ගැස්වීම හෝ විවිධාකාර සංවිධාන මගින් මේවා පිළිබදව මත භේද නිර්මාණය කර ගැනීම හෝ ආදී දේ අනවශ්‍යය නොවීය. ඒ කාලය තුල පවතින්නේ එකිනෙකාගේ සමීප සම්බන්ධතාවය තුල ගැටලු විසඳා ගැනීමේ කාලයකි. මේ අනුව එදා වැරදි පිළිබදව අවබෝධය හා ඒවා නිරාකරණය කර ගැනීම පිළිබද අවබෝධය හුදෙක්ම සාමූහික අවබෝධය හා ඒ වටා ගොඩ නැගුනු සිරිත් විරිත් අනුව සිදු විය.

මේ කාලය තුල දේපල සදහා පුද්ගලික අයිතිය යන සංකල්පය වර්ධනය වී තිබුණේ නැත. පුද්ගලයා හා සමාජය අතර ඉතා කිට්ටු සම්බන්ධයක් තිබුනු අතර ස්වභාවධර්මයේ සම්පත් සියලු දෙනාගේම ප්‍රයෝජනය සදහා එකිනෙකාගේ වගකීම් මගින් ආරක්ෂා කොට පොදුවේ බුක්ති විදින ලදි. ඒ පිළිබදව යම් සුලු ගැටලු ඇති විය හැකිව තිබූ නමුත් ඒ ගැටලු විසඳා ගැනීමේ ක්‍රමය වූයේ සාමාන්‍ය අවබෝදයයි.

මේ අනුව මේ කාලය තුල රාජ්‍යය යන සංකල්පයද වර්ධනය වී තිබුණේ නැත. පාලක ව්‍යුහයක්වත්, පාලක කණ්ඩායමක්වත්, පාලනය කරන නීතීන්වත් ආදී දේ නොව පොදු අවබෝධය මත ජීවිතය ගෙන යාම මේ කාලයේ තිබූ ඉතාමත් වැදගත් සාමූහික ගුණය වේ.

මෙය අවුරුදු එක් ලක්ෂ විසිපන්දහසක පමණ කාලයක් පැවති හෙයින් මෙය කොතෙක් දුරට ලංකාවේ ජන මනස තුල කාවැදී ඇත්දැයි සොයා බැලීම අත්‍යාවශ්‍යයව ඇත. එසේ සොයා බැලීම තුලින් ලංකාවේ සදාචාර පද්ධතියේ පදනම කුමක් වී දැයි දැන ගත හැකි ය. එම සදාචාර පද්ධතිය කිසියම් දර්ශණවාදයක් නිසා හෝ ආගමක් නිසා හෝ රජුගේ අණක් නිසා හෝ ආදීවශයෙන් ඇති වූවක් නොව ස්වභාවික අත්දැකීම් තුලින් බිහි වූ ස්වභාවික අවබෝධයක් තුල පවතින බව පැහැදිලිය.

මුල් කෘෂිකාර්මික අවදිය :මේ අවදියේදී ආදිකාලීන ස්වදේශිකයා බොහෝ කාලයක් තිස්සේ ස්වභාවධර්මය තුල සැරි සැරීම මගින් හදුනාගත් ජීවිතයට හිතකාමී වන වෘක්ෂ ලතා තෝරාගෙන ඒවා තමන් විසින්ම වවා ගැනීම දැක ගත හැකි ය*. මෙයද ජීවත් වීම තුලින් ඇති වූ අවබෝධය තුලින් මේ බීජ හා පැළෑටි තෝරා ගැනීමක් සිදු වී ඇති බව ඉතා පැහැදිළිය. මෙය මේ ආකාරයටම අන් සියලු ශිෂ්ඨාචාරයන්හිදී ද සිදු වී ඇත. ලංකාවේ පරිසරය, ලංකාවේ හැදී වැඩුනු පැළෑටි පිලිබද අවබෝදය, එම පැළෑටි වල ඇති ගුණ හා අගුණ පිළිබදව ඇති අවබෝධය ආදිය මේ තෝරා ගැනීමට පදනම වේ.

වැවීම සදහා පැළෑටි පමණක් තෝරා ගැනීම සෑහෙන්නේ නැත. වැවීම සදහා ජලය සොයා ගැනීම නිසි ආකාරයට එම පැලෑටි විවිධ කෘමීන්ගෙන් ආරක්ෂා කර ගැනීම හා වෙනත් ස්වභාවික අතවරයන්ගෙන් ආරක්ෂා කර ගැනීම ආදියද කිරීමට සිදු වේ. මේවා පිළිබදව ඥානයද ඔවුන් වර්ධනය කර ගත්තේ ඔවන්ගේම අත්දැකීම් තුලිනි.

එහෙත් මේ කාලය තුල වඩා පැහැදිළිව කිරීමට සුදුසු දේ කුමක්ද කිරීමට නුසුදුසු දේ කුමක්ද යන්න පිළිබදව අවබෝධය වර්ධනයක් දැකිය හැකි ය. මෙහිදී හුදෙක් තමන්ගේ පැවතීමට සුදුසු දේ කුමක්ද යන්න පැවසීමට පමණක් නොව තමන් වගා කරන දේ ආරක්ෂා කර ගැනීමට සුදුසු හැසිරීමක්ද ක්‍රමයෙන් නිර්වචනය වේ. අහවල් දේ කලහොත් තමන් වවන දෙයට බාධාවක් ඇති වන බවත්, ඒ නිසා ඒවායින් වැලකිය යුතු බවත් ආදී වශයෙන් හොද නරක පිළිබද අවබෝධයක් වර්ධනය වේ. එයත් සමගම යම් දේ නොකිරීම යම් හානිකර දේ විශේෂයෙන්ම තමන්ගේ පැවැත්මට හානිකර දේ වලක්වා ගැනීම සදහාද යම් ක්‍රියා මාර්ගයන් අවශ්‍යය වේ. එහෙත් මේ අවදියේද මේ ක්‍රියා මාර්ගයන් හුදෙක්ම වඩා තියුණු වන අවබෝධයක් මගින් සිදු වනවා මිස කිසියම් සංස්ථා මාර්ගයෙන් හෝ රජයක මැදිහත් වීමෙන් සිදුනොවේ. මේ කාලයේද රජයේ යනුවෙන් සංස්ථාවක් නොපවතී. එහෙත් මේ කාලය තුල එක්තරා ප්‍රමාණයකින් පුද්ගලික යම් තමන් වවන දේ

හා එම භූමිය පිළිබඳව පුද්ගලික අයිතිය පිළිබඳව අවබෝධයක් ඇති වේ. එම අවබෝධය අනුව යම් මායිම් වෙන් කර ගැනීම හා එක් මායිමක් තුල සිදු කරන වැවීමේ ඵලදාව එසේ කරන අයටම අයිතිවීම ආදිය පිළිබඳව යම් වටහා ගැනීම් ඇති වේ. ඒ අනුව එකිනෙකා ඔවුන්ගේ හැසිරීම් රටාව යොමු කර ගනී. ජලය බෙදා ගැනීම ආදිය සියලු දෙනාගේම වැවිලි වලට අවශ්‍යය වන හෙයින්, ඒවා කාටත් ප්‍රයෝජනවත් වන සේ යොදා ගන්නා ආකාරය ගැන අවබෝධයක් වර්ධනය වේ. එමෙන්ම යම් සේවාවන් සියලු දෙනාම එක් වී කර ගැනීම පිළිබඳවද අවබෝධයක් ඔවුන් තුල ඇති වේ. එහෙත් මේ වන විට ලිඛිත නීති හා එම නීති පිට සිට බලෙන් ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව අවශ්‍යතාවයක් පැන නගින්නේ නැත.

## සංවිධානාත්මක ගොවිතැන ඇතිවීම

සංවිධානාත්මක ගොවිතැන ඇති වීම යනුවෙන් මෙහි අදහස් කෙරෙන්නනේ අතිරික්තයක් ලබා ගැනීම සඳහා ගොවිතැන කරන කාලයයි. හුදෙක්ම තමන්ගේ එදිනෙදා සඳහා වන බීජයන් හා පැළෑටි දියුණු කරගෙන ඒවා භාවිතා කිරීමෙන් එහාට ගොස්, යම් අතිරිකතයක් සදා ගැනීම අරමුණු කොට ගෙනම වැඩියෙන් වගා කිරීමටත් එසේ වගා කිරීමෙන් ලබා ගන්නා ඵල ආරක්ෂා කිරීමත් සිදු වේ. මෙය විශේෂයෙන්ම සිදු වීමට එක හේතුවක් වන්නට ඇත්තේ කාලගුණය තුල ඇතිවන වෙනස්කම්ය. යම් කාල වලදී යම් වගාවන් කල හැකි බවත් ඒවායින් ඵල ලැබෙන්නේ යම් කාලයකදී බවත් එමෙන්ම එක්තරා කාලයක් තුල එසේ වැවිලි කර ඵලදාවක් ලබාගත නොහැකි බවද යන අවබෝධය තුල ඵලදාවන් නැති කාලයේදී බුක්ති විඳීම සඳහා ආහාර එකතු කර ගැනීමක් සිදු විය.

මෙහි තවත් අවදියක් වන්නේ හුදෙක්ම තමන්ගේ භාවිතා කිරීම සඳහා පමණක් නොව වෙළඳාම් කිරීම සඳහා එනම් තමන් ඇතිකර ගන්නා ඵලදාව වෙනත් ඝණයක් බවට හරවා ගැනීම සඳහා වැඩි අතිරික්තයක් නිර්මාණය කිරීමට පටන් ගන්නා කාලයයි.

මේ කාලය තුල පහත සදහන් ලක්ෂණ දැක ගත හැකි ය.

පුද්ගලික අයිතිය පිළිබද අදහස වඩා තීව්‍ර බවට පත් විය. තමන් විසින් තමන්ගේ වගාව මගින් ඇති කර ගන්නා ලද ඵලය තමන්ට පමණක් අයිතිය යන අදහසත් ඒ මගින් පුද්ගලික දේපළ පිළිබදව ඇතිවන අයිතිය සමාජගත වේ. එමෙන්ම තමන් එසේ වගා කරන භූමිය තමන්ට පමණක් අයිතිය යන අදහස තවත් එකකි.

තුන්වැන්න නම් මෙසේ ලබා ගන්නා ලද ඉඩම මෙන්ම ඵලදාව කාලයක් තමන් මත රදවා ගැනීම සදහා මායිම් ආදිය වඩා සුරක්ෂිත සේ ගොඩනගා ගැනීම සිදු විය. මේ අනුව මායිම් පිළිබදව අවබෝධය හා මායිම් වලට ගරුකිරීම පිළිබදව ඇතිවන එකගතාවයන්ද ඇති වීමට පටන් ගනී.

මේ ක්‍රියාදාමය සිදුවන විට පළමු වන වරට එකල ජීවත් වූ ජනතාවක් අතර භේදයන් ඇතිවීමට පටන් ගනී. එම භේදයට මූලික වන්නේ ඉඩම් පිළිබද අයිතියයි. යම් බල පුලුවම්කාරකම් ඇත්තන් විසින් වැඩි භූමි ප්‍රදේශයන් අල්ලා ගැනීමත් සමග වෙනත් අයට එම භූමිය අහමි වේ. එසේ අහමි වූවන් අතරින් කොටස් දෙකක් ඉස්මත්තට පැමිනේ. එනම් ඉඩම් වලට හමිකම් නැත්තන් හා ඉතා සුලු ප්‍රමාණයක් ඉඩම් වලට අයිතියක් ඇත්තන් ආදී වශයෙනි. මේ ගැටීම් ඇති වීමත් සමගම ගැටීම් නිරාකරණය කර ගැනීමේ උපක්‍රම අවශ්‍යය වේ. විවිධ රීතීන් නිර්මාණය කිරීමත් ඒවා ලිඛිතව හෝ එසේ නැතිව ප්‍රකාශයට පත් වීමත්, ඒවා කැඩීම වරදක් සේ සලකන්නනේ  මේ අවදියේය.

වැරදි වලක්වා ගැනීම සදහා දඩුවම් අවශ්‍යය විය. එසේ වැරදිවලට දඩුවම් කිරීම සදහා ඇතිවන උපක්‍රම අපරාධ නීතිය ඇතිවීමේ මූලික අවදිය වශයෙන් පවතී. මේ අපරාධ සමහර වෙලාවට වතුර බෙදා ගැනීම, මායිම් වලට ගරු කිරීම, වගාවට හානි නොකිරීම, අතිරික්තයක් ඇත්තන්ගෙන් සොරා නොග ැනීම ආදී විවිධාකාර කාලයේ අවශ්‍යතාවයන් උඩ නිර්වචනය කරගන්නා වැරදිත් එම වැරදි වැලැක්වීම සදහා ගන්නා උපක්‍රමත් හදුනා ගැනීම තුලින් ලංකාවේ අපරාධ නිතියේ මුල්ම අවධිය අවබෝධ කරගත යුතු වේ.

ඊළග අවධිය රාජත්වයේ අවදියයි. මෙහි මූලික වශයෙන් සිදුවන්නේ මේ පොදුවේ පිළිගන්නා ලද වැරදි හා ඒවා වලක්වා ගන්නා ක්‍රමයන් ක්‍රියාවට දමා යම් බාහිර සාමයක් හා ස්ථාවරත්වයක් බිහිකර ගන්නා පාලන ක්‍රමයක් බිහිකර ගැනීමට ගන්නා උත්සාහයයි. එම ආදිවාසී ස්වදේශිකයන් අතරම බලවත් වූ සමහරුන් පසුව මෙහි ප්‍රමුඛයන් හෝ නායකයන් බවට පත්විය. ඉන් පසු මේ නායකයන් අතරින් සියල්ලන්ටම ඉහලින් සිටින්නෙකු පත් වීමත් සමගම රාජත්වය ඇති විය.

රාජත්වය ඇතිවීමත් සමගම නීති පැනවීමේ බලයක් ඇත්තෙකුගේ ඇති වීමද දැක ගත හැකි ය. ඉන් පෙර අවදියේදී අප දකින්නේ කිසියම් අවබෝධයක් තුලින් වර්ධනය වන එකගතාවයන්ය. පසු කාලයේදී එම යම් අයෙකුට මෙය මෙසේ කල යුතුයි කියා නීති පැනිවීමේ අයිතියත් එසේ නොකරනනවුන්ට දඬුවම් කිරීමේ අයිතියත් ඇති වේ. මේ නිසා ලංකාවේ අපරාධ නීතියේ වර්ධනය පිළිබඳව මේ රාජත්වය ඇතිවීම සමග ඇති වන කාලය ඉතා වැදගත් වේ.

එහෙත් මෙයින් අදහස් වන්නේ මුල් කාලයේ රජවරුන් ඉතා දැඩි ලෙස මිනිසුන් මර්ධනය කර පාලනය කරා යන්න නොවේ. බොහෝ දුරට අතීත කාලයක් තිස්සේ තිබූ අවබෝධය, මිනිසුන් අතරම ඇති වූ අවබෝධයන් තුලින් ඇති වූ එකගතාවයන් ක්‍රියාත්මක කර වීමේ කටයුත්ත ඔහු අතින් සිදු වන්නට ඇත. හිතාමතාම යම් දේවල් වර්ධනය කර ගැනීම සදහා රජ හා ඔහුවටා ඇති අයගේ මැදිහත් වීමද සිදුවන්නට ඇත.

කිසියම් මර්ධන රටාවක් අපරාධ නීතියක් මගින් ක්‍රියාත්මක වීමට පටන් ගන්නා නමුත් එය බොහෝ සේ පොදු එකගතාවය හා අවබෝධය සමග පවතින්නක් බවට පත් වේ.

## සංස්කෘතික අපරාධ විද්‍යාවට අදාලව කුල ක්‍රමයේ බලපෑම සලකා බැලීම

මෙහි ඊළග අවදිය වන්නේ කුල ක්‍රමය ඇතිවීම පිළිබද අවදියයි.

සමස්ත ලංකාවම එකම සංවිධාන රටාවක් තුලට ගෙන එන ලද ප්‍රධාන අවස්ථාව ලංකාවේ කුල ක්‍රමය ඇති කරන ලද අවස්ථාවය. මේ දක්වා විවිද දේ පිළිබඳව විවිද නීති හා රෙගුලාසි පැවතුන නමුත් සමස්ථ සමාජයම එකම සංවිධාන රටාවක් යටතට ගෙන ඒමේ ප්‍රයත්නයක් හෝ එම ප්‍රයත්නය සාර්ථක කර ගැනීම සඳහා සංවිධාන රටාවක් ඇතිවී තිබුණේ නැත. එය ඇතිවූයේ කුල ක්‍රමය ලංකාව තුල පැලපදියම් කිරීම තුලිනි.

එය කෙසේ ඇතිවීද කෙසේ පැතිර ගියේද යන කරුන ඉතිහාසයට අදාල කරුණකි. අපට මෙහිදී අවශ්‍යය වන්නේ මෙය ලංකාවේ නීතිය සකස් කිරීමෙන් විශේෂයෙන්ම අපරාධ නීතිය පිළිබද සංකල්ප හා ඒවා ක්‍රියාත්මක කරන ක්‍රමයන් වර්ධනය කිරීමේදී ඇති කරන ලද බලපෑම හඳුනා ගැනීම සඳහාය.

කුල ක්‍රමය ලංකාවේ සමාජ පැවැත්මේ සියලුම අංගයන් කෙරෙහි බල පවත්වන ලිඛිත හෝ එසේ නොවූ නීතීන් ගණනාවක් සමාජගත කලේය. මෙසේ සමාජගත කරන ලද නීතීන් පහත සඳහන් කරුනු වටා එක් රොක් විය.

01. සමාජ තරාතිරම් පිළිබඳව නීති හා ඒ වටා ඇති කරන බලයෙන් ක්‍රියාත්මක කරවන සිරිත් විරිත්. යම් කණ්ඩායම් ඉහල තත්වයකට අයිතිබව පිළිගැනීමට අන් සියල්ලන්ටම සිදු විය. එසේ ඉහල කණ්ඩායමකට අයිතිවූවන් කෙරෙහි තමන් මොන ආකාරයකින් හැසිරිය යුතුද යන්න පිළිබඳවද මේ සම්ප්‍රදායන් බලපෑවේය. මේ තරාතිරම් අනුව ඉහල යැයි සලකනු ලැබූ හෙවත් කුලීනයයි සලකනු ලැබූ කණ්ඩායම් සතු වරප්‍රසාදයන් සමාජය තුල පිලිගන්වන ලදි. ඔවුන්ට ආමන්ත්‍රණය කල හැකි ආකාරයෙන් ඔවුන් ඉදිරියේදී ගරුසරු ඇති ආකාරයෙන් හැසිරිය යුතු ආකාරය, ඔවුන් දෙන අණ පිළිපැදිය යුතු ආකාරය, ඔවුන් විසින් පවරනු ලබන වැඩ කටයුතු කල යුතු අකාරය ආදිය මේ වැදගත් නොවැදගත් භේදය තුලින් ප්‍රකාශයට පත් විය. මේ සෑම සම්ප්‍රදායක්ම කරවන ලද්දේ එසේ පිලිනොගන්නා අයට බරපතල දඩුවම් පැමිනවීමේ මාර්ගයෙනි.

02. කුල ක්‍රමය තුලින්ම ඉඩම් අයිතිය පිළිබඳව විදික්ක්‍රමය රට තුල මුල් බස්සවන ලදි. ඉහල පැලැන්තිය යනුවෙන් මූලිකව හඳුන්වන ලද්දේ වැඩි ඉඩම් හිමිව තිබූ කණ්ඩායමටය. මේ අනුව

එම ඉඩම් වල ආරක්ෂාව තහවුරු වන සේ සමාජයේ අන් කවුරුන් විසිනුත් හැසිරිය යුතුව තිබුනි. ඔවුන්ගේ දේපළට ගරු නොකිරීම හා ඒවාට හානි නොකිරීම රටේ සම්ප්‍රධාය තුලින් පත්වුනු රටේ ප්‍රධාන නීතියක් බවට පත් විය.

03. කුල ක්‍රමය තුලින් සේවා සැපයීම පිළිබඳවද සම්ප්‍රධායන් පනවන ලදි. වැඩි ඉඩම් හමි ඉහල කුලයේ යැයි සලකනු ලැබූවන්ගේ ඉඩම් හා වෙනත් දේ පිළිබඳව එසේ නොවූ අය විසින් ඉටුකල යුතු යුතු කම් ඉතා පැහැදිළිව සම්ප්‍රදායානුකූලව ස්ථාවර කරන ලදි. ඒ අනුව ඒ වැඩ කරදීමද ඒ වැඩ වලින් ලැබෙන ඵලය එම ඉඩම් හමියනට හමි වන සේ කටයුතු කිරීම ප්‍රධානම සම්ප්‍රධායක් විය. ඒ සමග ඇති වුනු සම්ප්‍රධායක් නම් එම දේපළ යම් ආකාරයකින් සොරකම් කරන හෝ ඒවාට වංචාකරන හෝ වෙනත් ආකාරයකින් හානි පමුණුවන ඕනෑම කෙනෙකුට බරපතල දඬුවම් කිරීමද මේ කාලයේ ස්ථාවරය විය. මේ නීතීන් අතර ඉතාම කැපී පෙනෙන නීතිය නම් සුලු වරදකට පවා කුල හීනයැයි සලකන කණ්ඩායම් වලට මරණ දණ්ඩනය දීමට පවා ඉහල කුලයේ අයට තිබූ අයිතියයි. මෙසේ දඬුවම් පැමිණවීමට රජයේ මැදිහත් වීමක් නොවීය. කෙලින්ම දඬුවම් කිරීමේ ක්‍රමය පැවතිණි. එය සාම්ප්‍රදායානුකූලව නිවරදි ක්‍රියාමාර්ගයක් වශයෙන් සලකන ලදි. එහෙත් ඊටත් වඩා වැදගත් වන්නේ වරදක් කල පුද්ගලයාට පමණක් නොව ඔහුගේ මුලු පවුලටමත් එපමණක් නොව ඔහුගේ සංහතියටමත් දඬුවම් කිරීමට තිබූ අයිතියයි. පවුලක් පිටින්ම ඔවුන් වැඩකල ස්ථානයෙන් එලවා දැමීම, එවනි වරදක් කල අය වටා සිටි පවුල් වල ගෙවල් පවා ගිනිබත් කිරීම ආදිය සාමාන්‍ය පුරුද්දක් සේ පැවතිණි. මෙය ඇත්තෙන්ම ලංකාවේ පමණක් පැවති සම්ප්‍රධායක් නොව ඉන්දියාවේද මේ ක්‍රමය තදබල ලෙස පැවතුන බව මේ පිළිබඳව ගවේශණයේදී බොහෝ දෙනෙකු පෙන්වා දී ඇත.

## විවාහ පිළිබද නීති.

කුලයන් අතර විවාහ සිදුවිය නොහැකි යි යන විශේෂයෙන්ම ඉහල කුලයක අය සහ පහල කුලයක අය අතර විවාහයක් සිදු

වීම සලකනු ලබන්නේ මරණයෙන් සිදු විය හැකි දඬුවමක් හෝ තම කුලයෙන් පලවා හැරීමට සෑහෙන කරුනක් වශයෙනි. මෙය ඉතා තද බල ආකාරයකින් විවිද දඬුවම් වලට දමන ලදි. මෙයටද මූලික හේතුවක් වන්නට ඇත්තේ දේපළ පිළිබද ආරක්ෂාවය. තමන්ගේ යැයි කියාගන්නා කණ්ඩායම් වලින් පිට අය සමග විවාහ වීම තුලින් ඉඩම් පිළිබද අයිතීන් ගැන භේදයක් ඇතිවිය හැකි නිසා එවනි විවාහ වලට විරුද්ධ සම්ප්‍රධායන් ගොඩනැගෙන්නට ඇතැයි සිතිය හැකි ය. අඩුයැයි සලකන කුලයක අයෙක් තවත් එවනි අයෙකු සමග විවාහ වීමද සලකනු ඇත්තේ බරපතල වරදක් වශයෙනි. ඔවුන්ට දඬුවම්දීමද එම කුලයේ නායකයන්ට තිබූ වගකීමක් සේ සලකන ලදි. බ්‍රිතාන්‍යයන් ලංකාවට පැමණීමෙන් පසු සමහර පොලිස් වාර්තාවල මෙවනි සිදුවීම් පිළිබද පරීක්ෂණ සටහන් කොට ඇත.

තවත් ප්‍රධාන සම්ප්‍රධායක් වූයේ පියාගේ රැකියාව හැර වෙනත් රැකියාවක් කිරීමට කිසිවෙකුට අයිතියක් නොතිබීමය. මෙය කුල ක්‍රමයේ පරම නීතිය වශයෙන් සලකනු ලබයි. තාත්තාගේ රැකියාව පුතා විසින් සිදු කල යුතුයි. මේ මාර්ගයෙන් යම් සේවාවන් නොකඩවාම හා අත්හිටුවීමකින් තොරව තහවුරු කරන ලදි. යම් අයෙකු ඉහල යැයි සලකනු ලැබූ අයෙකුගේ වත්තක කුලියට ගොවිතැනේ නියලී සිටියා නම් ඔහු මිය ගිය පසු එම කටයුත්ත ඔහුගේ පුතා විසින් කල යුතු විය. මේ ආකාරයෙන් මෙය අන් සියලුම සේවාවන් කෙරෙහි බලපවත්වන ලදි. මේ අනුව අඩු වියදමකින් වැඩි සේවාවක් අකන්ඩව පවත්වාගෙන යාමේ සම්ප්‍රධායන් ඇති විය. ඒ සම්ප්‍රධායන් දඬුවම් මාර්ගයෙන් ක්‍රියාත්මක වූ නිසා එය අපරාධ නීතියක් සේ සැලකිය හැකි ය.

මේ සියල්ලේ ප්‍රතිඵලයක් ලෙස තමන් සිටි තැන්වල සිට වෙන තැන්වලට යාමේ අයිතියද අඩු කුලයේ යැයි සලකන අයට තහනම් කිරීමේ සම්ප්‍රධායක් ඇති විය. මෙයද ඉහත සදහන් ආකාරයට ඉඩම් හා වෙනත් දේ පිළිබදව සේවාවන් ලබා ගැනීම සදහා ඇති කරන ලද සම්ප්‍රධායක් යැයි සැලකිය හැකි ය. තමන්ගේ තරාතිරම් තමුන්ගේ ඇදුමින් ප්‍රකාශයට පත් කිරීමේ පවා සම්ප්‍රදායක් ඇති විය. සමහර කුල වල පිරමින්ට උඩුකය වැසෙන සේ ඇදුමක් ඇදීම තහනම් විය. එසේ කිරීම වරදක් සේ සලකන ලද අතර

එසේ කරන වැරදි වලට දඬුවම් කිරීමේ අයිතිය පැවතියේය. රටේ සමහර ප්‍රදේශ වල කාන්තාවන්ට මේ සම්ප්‍රධායම බලපෑ බව පොත පතෙහි සඳහන් වේ. මෙය විවිධ චිත්‍ර මගින්ද ප්‍රදර්ශණය කොට ඇත. ඉතා මෑත කාලයක් පුරා පැවතුන මේ සම්ප්‍රධාය පිළිබඳව සමහරුන් විසින් ඔවුන්ගේ අත්දැකීම් ප්‍රකාශයට පත්කොට ඇත.

ඉහත සඳහන් වන්නේ කුල ක්‍රමය තුලින් ඇති වුනු නීති සම්ප්‍රධාය පිළිබඳව අංග සම්පූර්ණ විස්තරයක් නොවේ. ඉන් සඳහන් වන්නේ මේ කරුණ පිළිබඳව හැදෑරීමක් සඳහා ප්‍රවේශ වීමකට මග පෙන්වීමක් පමනි. ලංකාවේ ඉතිහාසය පිලිබඳ තොරතුරු මෙවනි ගවේශණයක් තුලින් හෙළිවන අතරම විශේෂයෙන්ම ලංකාවේ අපරාධ නීතියේ සංස්කෘතික පසු බිම ඉතා ගැඹුරින් අධ්‍යනය කිරීමට මෙය ආධාර වනවාට කිසිම සැකයක් නැත.

## යටත් විජිතවාදී යුගය

යටත් විජිත යුගය මුල් වතාවට පළල් ආකාරයකින් ලිඛිත නීති ලංකාවට ඉදිරිපත් කරන ලද කාලය වශයෙන් සැකයෙන් තොරව සඳහන් කල හැකි ය. පෘතුගීසීන්ගේ පැමිණීමත් විශේෂයෙන්ම ලංදේසීන්ගේ පැමිනීම හා බ්‍රිතාන්‍ය යටත් විජිතවාදීන්ගේ පැමිණීමත් සමගම ලංකාවද යුරෝපයේ රටවල් වල වර්ධනය වී තිබුනු නීති ක්‍රමයන් හා එම නීතී ක්‍රියාවට දැමීමේ ක්‍රමයන්ද උකහා ගන්නා ලදි.

අද ලංකාවේ පවතින බොහෝ නීතිවල පදනම වන්නේ මේ යටත් විජිත කාල වලදී ඇති කරන ලද නීති මෙන්ම, එම නීති ක්‍රියාත්මක කිරීම සඳහා ගොඩ නගන ලද සංස්ථාවන් සම්බන්ධයෙනි. නිශ්චිත සංස්ථාවන් මගින් නීති ක්‍රියාත්මක කිරීම පිළිබඳ ආකල්පය පළමු වතාවට ලංකාවේ ඉතිහාසයට ඇතුල් වන්නේ මේ කාලයේදී යැයි සැලකිය හැකි ය. කෙසේවුවත් එය පළල් හා අංග සම්පූර්ණ ආකාරයකින් ඇති වන ආකාරය මේ යටත් විජිත කාලය තුල බව සැකයකින් තොරව ප්‍රකාශ කල හැකි ය.

ලංකාවේ ඉඩම් ක්‍රමයත්, ඉඩම් ලියා පදිංචි කිරීමේ ක්‍රමයත් ආදිය පිළිබඳව නීතියත් පදනම වී ඇත්තේ දැනට රෝම ලංදේසි

නීතිය යනුවෙන් සදහන් කරන ලංදේසීන් විසින් ලංකාවට ඉදිරිපත් කරන ලද නීති ඔස්සේය. අදටත් සම්පූර්ණ ඉඩම් පිළිබදව ලියාපදිංචි කිරීම හා අයිතිය තහවුරු කිරීම සම්බන්ධයෙන් නීති වශයෙන් මූලික වශයෙන් බල පවත්වන්නේ මේ නීතීන්ය. මේ හැර විවිධ අපරාධ පිළිබදව සලකා බැලීමට අධිකරනද ලංදේසීන් විසින් ඇති කරන ලදි. පරිපාලනමය අධිකරන වශයෙන් සලකන ලද ඒවා හිදී සාමාන්‍යය අපරාධ මෙන්න දේපළට අදාල නීතිත් උදාහණයක් වශයෙන් ලංදේසීන් විසින් ඔවුන්ගේ වෙළදාම සදහා ඇති කරන ලද භවබෝග වලට කිසියම් හානි පැමිණ වීම ඉතා බරපතල දඩුවම් වලට යටත් කරන ලදි. මේ කාලය තුල අපරාධ නීතියත් අපරාධ නීතිය වර්ධනය වූ ආකාරයත් ලංකාවේ අපරාධ නීතිය පිළිබදව සංස්කෘතිය තුල විශාල වෙනසක් ඇති කලේය. මේ අනුව සංස්කෘතික අපරාධ විද්‍යාව සලකා බැලීමේදී මේ යුගය ඉතා වැදගත් වේ. වර්ථමාන අපරාධ නීති පදනම වී ඇත්තේ බ්‍රිතාන්‍ය නීති ක්‍රමයන් පදනම කරගෙනය. මහා බ්‍රිතාන්‍යය තුල සාම්ප්‍රධායිකව පදනම වූ නීති, විශේෂයෙන්ම රජවරුන් විසින් නඩු ඇසීම සදහා විවිධ තැන් වලට යවන ලද විනිශ්චය කරුවන් විසින් එම නඩු විසදීමේදී යොදාගන්නා ලද මූලධර්ම හා තර්ක ක්‍රමයන් මගින් එකම ප්‍රශ්ණයක් පිළිබදව කටයුතු කල ආකාරය, විවිධ එකගතාවයන් වර්ධනය වූ ආකාරය දැකගත හැකි ය. මේ එකගතාවයන් රටේ නීතිය වශයෙන් සලකන්නට පටන් ගත්තේය. මේවා පසුකාලීනව ලිඛිත නීති බවට පත් විය. එහෙත් බ්‍රිතාන්‍යයේ ව්‍යවස්ථාව ලිඛිත නීතියක් නොවේ. එය හුදෙක්ම සම්ප්‍රදායන් ජනගත වී අධිකරණය මෙන්ම පාර්ලිමේන්තුව හා වෙනත් සංස්ථා වලින් ක්‍රියවට දමන නීති මාලාවක් බවට පත් වී ඇත. මේ නීති බොහෝ දුරට ලිඛිත නීති බවට පත්වූයේ මේ පිළිබදව දෙන ලද නඩු තීන්දු ඔස්සේය. පසු කාලයකදී මේ තීන්දු ලිඛිත නීති බවටද හරවන ලදි.

බ්‍රිතාන්‍යයන් ඉන්දියාව තමන්ගේ අධිරාජ්‍යයේ කොටසක් කරගත්තාට පසු ඇති වූ විශාල විවාදයක් නම් ඒ රට තුල බ්‍රිතාන්‍යය නීතිය වර්ධනය කරන්නනේ කෙසේද යන ප්‍රශ්නයයි. මෙහිදී ඉතා ප්‍රභල කණ්ඩායමක් එනම් උපයෝග්‍යතාවාදීන් ඃඹඑසකසඡ්රස්ඞ්* යනුවෙන් හදුන්වන දාර්ශණික ගුරුකුලයක් තර්ක කලේ බ්‍රිතාන්‍යයේ

ඇති වූ ආකාරයට සතවර්ෂ ගනනාවක් ඔස්සසේ නීතිය හැදීම මේ අලුත් තත්වයට නුසුදුසු බවය. ඔවුන්ගේ තර්කය වූයේ ලිඛිත නීති පද්ධතියක් සකස් කොට ඒවා උඩ සිට පහලට පැටවිය යුතු බවය. මෙහි ඔවුන්ගේ විශේෂ අවධානය යොමු වූයේ අපරාධ නීතිය හා එය ක්‍රියාත්මක කරන අපරාධ නඩු විධිවිධාන ක්‍රමයන් සම්බන්ධයෙනි. මේ සදහා ඉන්දියාවේ ලියන ලද නීතීන් පදනම වූයේ බ්‍රිතාන්‍යයේ එවක පැවති සම්ප්‍රදායනුකූල නීතීන් යටතේය. විශේෂයෙන්ම අපරාධ නීති සංග්‍රහය, අපරාධ නඩු විධිවිධාන ක්‍රියා පටිපාටිය හා සාක්කි නීතිය යන ප්‍රධාන නීතීන් වර්ධනය කරන ලද්දේ ඉන්දියාවේදී ක්‍රියාකල බ්‍රිතාන්‍ය නිළධාරීන් විසිනි. මොවුන් නීති සම්පාදනය කල ආකාරය ඔවුන් විසින්ම දීර්ඝව ලියා ඇති හෙයින් එම කරුණ පිළිබදව සොයා බැලීම එතරම් අමාරු නැත.

පසුකාලීනව ලංකාවට ඉදිරිපත් කරන ලද්දේද ඉන්දියාවේදී වර්ධනය කරගත් ඉහත සදහන් නීතීන්ය. මේ හැර ලංකාව බ්‍රිතාන්‍යයේ කිරුලේ කොටසක් ලෙස සලකන ලද හෙයින් එංගලන්තයේ පැවති සියලු නීතියක්ම ලංකාවට අදාල වන සේද කටයුතු කිරීම ඒ කාලයේ පැවති සම්ප්‍රධායක් විය. පසු කාලීනව මේ නීති ලංකාවේදීමද නිර්මාණය කිරීම සිදු වේ.

වඩා ගැටලු සහගත තත්වය ඇතිවූයේ මේ නීති ක්‍රියාත්මක කරන්නේ කුමන ආකාරයෙන්ද යන ප්‍රශ්ණය මතය. මේ දක්වා ලංකාවේ සංවිධානය වූ පොලිස් ක්‍රමයක් පැවතියේ නැත. පළමු වතාවට මේ පොලිස් ක්‍රම ඇතිවන්නේ යටත් විජිත කාලයේය. විශේෂයෙන්ම එය ඇතිවන්නේ බ්‍රිතාන්‍ය කාලය තුලය. මේ ඇතිවීම පිළිබදව කාණ්ඩ දෙකකින් යුත් පොතක් පොලිස් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති හෙයින් ඒ කාලය තුල පොලිස් සංවිධානය ගොඩ නැගුනේ කෙසේද යන්න පිළිබදව සොයා බැලීම එතරම් අමාරු නැත.

ඊළගට අවශ්‍යය ක්‍රමය වූයේ අධිකරණ ක්‍රමයයි. අදිකරණ ක්‍රමය බ්‍රිතාන්‍යය ක්‍රමයට අනුව සකස්කරන ලද අතර මුල් කාලයේදී බ්‍රිතාන්‍ය නඩුකාරයන් හා නීතිඥයන්ද මේ අධිකරණ වල කටයුතු කලේය. බොහෝ ලෙසින් ඔවුන් විසින් ඇති කරන ලද සම්ප්‍රදායන් අද දක්වාම බලපවත්වයි. පසු කාලයේ ලාංකිකයන් එම බ්‍රිතාන්‍යය

විශ්වවිද්‍යාල වලට යවා එහි ඔවුන් පුහුණු කර, ඔවුන් ලංකාවේ විනිශ්චයකාරවරුන් හා නීතිපති දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සේ කටයුතු කිරීමට පටන් ගනී. මීට අදාලව ලංකාවේ නීතිඥ වෘතිය ඇති විය. මෙයද සංස්කෘතික වශයෙන් සලකා බැලිය යුතු ප්‍රධාන ප්‍රශ්ණයකි. මේ වෘතිය ඇතිවූයේ කෙසේද? එම වෘතිය වර්ධනය වූයේ මොන ආකාරයකින්ද? එම වෘතිය මුහුණ දුන් ගැටලු මොනවාද? ආදී වශයෙන් කරන සමාජ විද්‍යාත්මක හැදෑරීමක් රටේ දැන් පවතින බොහෝ ප්‍රශ්ණ පිළිබඳව ගැඹුරු අවබෝධයකට මග පෑදිය හැකි ය.

මීලග අවදිය වන්නේ නිදහසේ සිට අද පවතින කාලය දක්වා කාලයයි. මේ කාලයේදී ලංකාවේ අපරාධ නීති ක්‍රමය බ්‍රිතාන්‍යය අධීක්ෂණයෙන් අත්මිදුනේය. එයත් සමගම ඇති වූ ගැටලු අද අපරාධ නීතිය මුහුණ දෙන මූලික ගැටලු වශයෙන් පවතී. අපරාධනීතිය මෙන්ම එය ක්‍රියාත්මක කල සංස්ථා පිළිබඳවද රට තුල ඉතා ගැඹුරු වටහා ගැනීමක් පැවතියේ නැත. මේවායේ මූලධර්ම බාහිර වශයෙන් පිලිගැනුන නමුත්, මේ මූලධර්ම ඇතිවූයේ කෙසේද? ඒවායේ අර්ථය කුමක්ද? ඒවා අවශ්‍යද? ආදී වශයෙන් සැලකිය යුතු විවාදයක් තවම ඇති වී නැත. මේ පිළිබඳව යම් මත විටින් විට නොයෙක් දෙනා ප්‍රකාශ කර ඇතත්, මේ දක්වා ගැඹුරු හැදෑරීමක් සිදුවී නැත. මෙය සංස්කෘතික සමාජ විද්‍යාවේ මුල් තැනක් ලැබිය යුතු කරුණක් බවට පත්වේ. නිදහසෙන් ටික කලකට පසු ලංකාවේ හදිස්සි නීතිය ඇතිවීමත්, සමග විවිද කැරලි ඇතිවීමත් හා ඒවා මර්ධනය කිරීම සම්බන්ධයෙනුත් ආදිය පදනම කරගෙන අපරාධ නීතිය තුල විශාල පරිවර්ථනයක් සිදුවී ඇත. සාමාන්‍යයෙන් බ්‍රිතාන්‍ය යුගයේ අග කාලයේදී නීතිය වශයෙන් සලකන ලද බොහෝ කරුනු අද එවනි වැදගත් කමකින් නොසලකනු ලබයි. ඊට හේතුවනම් ආරක්ෂාව පිළිබඳව විවිද නීතීන් සාමාන්‍ය නීතිය අභිබවා පැන නැගී තිබීමය. එය රටේ ඇති වූ අවශ්‍යතාවයක් යැයි සමහරු තද බල ලෙස තර්ක කලේය. එසේ වූවත් මේ ආකාරයෙන් අපරාධ නීතියත්, අපරාධ නීතිය ක්‍රියාත්මක කරන ආකාරයත්, පිළිබඳව විශාල ගැටලු මතුවී ඇති බව අද සියලු දෙනාම පිළිගන්නා කරුණකි. මේ නිසා හදිස්සි නීතිය හා ඒ මගින් අපරාධ නීතිය කෙරෙහි ඇති වූ බලපෑමත්, එය

සමාජ ජීවිතය කෙරෙහි ඇති කල බලපෑමත්, සංස්කෘතික අපරාධ විද්‍යාවේ ඉතා අත්‍යාවශ්‍ය අංගයක් සේ සැලකිය හැකි ය.

ඉහත සදහන් කර ඇත්තේ ලංකාවේ අපරාධ නීතියේ වර්ධනය සම්බන්ධයෙන් ඉතා දල සටහනකි. එහෙත් එම සටහන තුල ඉතා විශාල කාලයක ඉතිහාසයක් සටහන් වී ඇත. මානසික වශයෙන් හා සදාචාරාත්මක වශයෙන් ආදිකාලීන ස්වදේශීකයන්ගේ යුගය, එනම් අවුරුදු ලක්ෂයකට වැඩි කාලයක ඉතිහාසය තවමත් ජන මනස තුල ඉතාම ගැඹුරින් පැල පදියම් වී ඇත. එවනි දීර්ඝ කාලයක සමාජ අත්දැකීමක්, සදාකාලිකවම පවතිනවාට කිසිදු සැකයක් නැත. මේ නිසා සංස්කෘතික වශයෙන් අපරාධ නීතියේ වර්ධනය බැලීමේදී මේ අංශයට ඉතා ප්‍රධාන තැනක් දිය යුතුව ඇත. පසු කාලීනව අවුරුදු 2500 ක් වැනි කාලය තුල ඇති වූ ඉහත සදහන් වර්ධනයන් හා වර්ධනයන් තුලින් එම මුල් කාලයේ බලපෑම මුලුමනින්ම අතුගා දැමීමට බැරිවී ඇත. ඇත්තෙන්ම එය එසේ කිරීමට නොහැකිවනු ඇත. එහෙත් මේ අවධීන් දෙකේ දී සංස්කෘතිකව අපරාධ නීතීන් දෙස බලන හා ඒවා යට තිබූ වටිනාකම් පිළිබදව විශාල ගැටලු පවතී. මේ ගැටලු ඉස්මත්තට ගෙන ඒම තුලින් ලංකාව තුල වර්ථමානයට ගැලපෙන්නා වූ, ස්වදේශීය අපරාධ නීතියක් වර්ධනය කර ගත හැකිද යන ප්‍රශ්ණය, ඓතිහාසිකව වැදගත් වන කරුණකි.

# ලංකාවේ අපරාධ නීතියේ විකාශනය
# 09
## (සංස්කෘතික අපරාධ විද්‍යාවේ පසුබිම)

| | |
|---|---|
| ආදිකාලන ස්වදේශිකයන්ගේ කාලය - මෙය අවුරුදු ලක්ෂයකට වැඩි වශයෙන් සලකනු ලැබේ. රාජ්‍යය හා නීති පවතින්නේ නැත. | දඬුවම්ද නොපැවතින. පැවතියේ ජන සම්මතය මත පදනම් වූ පැවතුණ රටාවකි. මෙය පාලනය වූයේ සිරිත් විරිත් මතය. |
| පැලැටි වැවීමේ මුල් අවධිය. අවුරුදු 6000 පමණ පෙර වූවායැයි අනුමාන කල හැක. නිශ්චිත කාලය තවම තහවුරු කොට නැත. | වැවීම ඇතිවීම සමග ඊට අදාල සම්ප්‍රදායන් ජන සම්මතයේ බිහි වේ. පසු කාලයේ නීති බවට මෙම සම්ප්‍රදායන් පත් වේ. එහෙත් මෙම අවධියේදී ඒවා පවතින්නේ පිළිගැනීම් වශයෙන් හා සිරිත් විරිත් හා සම්ප්‍රදායන් වශයෙන් පමණි. |
| සංවිධානාත්මක ගොවිතැන හා අතිරික්තයක් අත්පත් කර ගැනීම අරභයා වැවීම. | මේ අපරාධ නීතිය ඇතිවීමේ ඉතාමත් වැදගත් අවස්ථාවකි. පුද්ගලික දේපළ අයිතිය, ඉඩම, මායිම රැක ගැනීම, අතිරික්තය රැක ගැනීම මත සම්ප්‍රදායන්ද, යම් දඬුවම් ක්‍රම ඇතිවේ. මේවා ඇතිවන්නේ ජන සම්මතය මත නොවේ. උඩ සිට යටට ඇතිවන බලයෙන් ක්‍රියාත්මක කරවන රීතීන් හා නීතීන් වශයෙනි. |
| රාජ්‍යත්වය ඇතිවීම | රාජ්‍යය, නීතිය, නීතිය පැනවීමේ අයිතිය, බලයෙන් නීති සම්ප්‍රදායක් ඇති කරවීම, දඬුවම් නිර්වචනය කර ක්‍රියාකරවීම පටන් ගනී. එය ක්‍රමයෙන් පළල් වේ. නීති ක්‍රමයක වැඩි දියුණු අවස්ථාවක් වශයෙන් මෙය සැලකිය හැකිය. |

| | |
|---|---|
| කුල ක්‍රමය ඇතිවීම - ලංකාව සමස්තයක් වශයෙන් එකම සංවිධානයක් බවට පත් වූයේ කුල ක්‍රමයේ ඇතවීමත් සමගය. | මෙම අවධිය ඇතිවන්නේ ඉන්දීය බලපෑම යටතේය. ඉන්දියාවේ මූලික සමාජ සංවිධාන රටාව මේ වන විට කුල ක්‍රමයය. එයම ලංකාවටද සම්ප්‍රාප්ත වෙයි. ඒ සමග රටේ පැවති සියලුම මූලික සම්ප්‍රදායන් වෙනස් වේ. සමාජ ස්ථරයන්ගේ අසමාන භාවය සමාජය සංවිධානය කිරීමේ මූලික ප්‍රතිපත්තිය බවට පත් වේ. දඬුවම් ක්‍රම ඇති වන අතර මෙම දඬුවම් ඉතා බරලතල දඬුවම් බවට පත් වේ. |
| යටත් විජිතවාදී යුගය. | යුරෝපයෙන් විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයේ නීතිය හා නීතිය ක්‍රියාත්මක වන ක්‍රමය ලංකාව තුල තැන්පත් වේ. නීතිය හා අපරාධ පිළිබඳ දර්ශනයන්ද මේ මත පදනම් වේ. එහෙත් මෙම ක්‍රමය ජන මනස තුල ගැටීම් ඇති කරයි. |
| නිදහසින් පසු | යටත් විජිතවාදී නීතිය කාලයක් පවතී. එහෙත් 1970 ගණන් වල සිට ඉතා ගැඹුරු වෙනස්කම් ඇති වේ. හදිසි නීතිය හා ත්‍රස්ත විරෝධී නීතිය මගින් නව අපරාධ හා දඬුවම් ක්‍රම ඇති වේ. නීතිය ක්‍රියාත්මක කරන සංස්ථා තුල මහා පරිවර්තනයක් ඇති වේ. |

## තුන් වන කොටස

# ධරණීය සංවර්ධනය
# Sustainable Development

# ආසියානු සිවිල් සමාජය හා මානව හිමිකම් පිළිබඳ ආචාර ධර්ම 01

විලියම් බට්ලර් යේට්ස් සිය දෙවන ආගමනය නම් කවි පන්තිය හරහා පශ්චාත් දෙවන ලෝක යුධ සමය පිළිබඳ අංශු මාත්‍රයක් ගෙන හැර දක්වයි.

*"සියල්ල බිඳී විසිර යයි ; කේන්ද්‍රයට දරාගත නොහැක ;*
*හුදු ආරාජික බවක් ලොව පුරා පැතිර යයි,*
*රුධිරයෙන් අඳුරු වූ රළ පෙළ ගොඩ ගලා*
*නිර්දෝෂීභාවයේ සැමරුම් ගිලී යයි ;*
*උත්තමයන් තුළින් සියලු විශ්වාසයන් ගිලිහී යද්දී*
*දුර්ජනයන් තීව්‍රතාවයේ ආශයන්ගෙන් පිරී යති."*

මේ කවි පන්තිය 1919 දී පළමු ලෝක යුද්ධය අවසන් වීමත් සමග ඇතිවූ දෙවන ලෝක යුද්ධයට මඟ පාදමින් බිහි වූ වාතාවරණය තුළ ප්‍රකාශයට පත් කෙරුණකි. මින් පෙර පවා දෙවියන් පිළිබඳ විශ්වාසයන් අවතැන්වීමේ ප්‍රතිඵලයක් ලෙස යුරෝපය තුළ වර්ධනය විය හැකි අතිශය කෲරතර ප්‍රචණ්ඩත්වයන් පිළිබඳව ෆ්‍රෙඩ්රික් නීට්ෂේ (Friedrich Nietzsche) පුරෝකථනය කර ඇත. මෙය යුරෝපයේ මූලික සදාචාරමය නිර්මිතය ගොඩනැගීමට

ඉවහල් වූ මූල බීජය ලෙස ද සැලකේ. 1922 දී ටී. එස්. එලියට් ගේ 'මුඩුබිම' පළ කරන ලදි. එහි එලියට් මෙසේ සඳහන් කරයි. 'මම ඔබට දූහුවිලි දෝතක අඩංගු බිය පෙන්වමි.'

එක්සත් ජනපදය හා සෝවියට් රුසියාව එක්ව ගෙන ආ පරමාණු බෝම්බ මෙන්ම දෙවන ලෝක යුද්ධය හේතුවෙන් ගොඩනැගුණු නව ලෝකයී තුළින් මානව සංහතිය වෙත නව අභියෝගයන් කැඳවාගෙන ආවේය. මානව හිමිකම් පිළිබඳ නූතන ගෝලීය ව්‍යාපෘතියේ ආරම්භය සනිටුහන් වූයේ මේ අභියෝග හමුවේ ය. මේ පසුබිම තුළ ලොව සියලුම රටවලින් පාහේ ලෝක මානව හිමිකම් ප්‍රඥප්තිය පිළිගැනීම සිදු විය. මෙසේ නව ලෝකයේ පැවැත්මෙහි පදනම ලෙස සියලු මනුෂ්‍යයන් සමාන කොට සැලකීම සම්බන්ධ රැඩිකල්වාදී මතවාදයක් ප්‍රකාශනයට පත් විය. මේ නව රැඩිකල්වාදී දෘෂ්ටිකෝණය අනුව කිසිදු මනුෂ්‍යයෙකු මින් බැහැර කිරීම සිදු නොවීය. සෑම මනුෂ්‍යයෙකුටම සමාන වූ ආත්ම අභිමානයක් හා තත්වයක් හිමිවන බවට සියල්ලෝ එකඟ වූහ.

මේ අනුව ලොව පිළිගත් අන් සියලු මානව හිමිකම් ප්‍රකාශනයන්වලින් මේ විශ්ව ප්‍රකාශනය වෙනස් මඟක් ගත්තේය. 1215 දී ප්‍රකාශයට පත් වූ මැග්නා කාර්ටා ගිවිසුමෙන් වංශාධිපතිවරුන් හා විශේෂයෙන් රජවරුන් සතු වූ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමේ, සාධාරණ නඩු විභාගයකින් තොරව රඳවා ගැනීමේ හෝ දඬුවම් කිරීමේ හෝ ඔවුනගේ දේපළ අහිමි කිරීමේ අයිතීන් හා බලය සීමා කෙරිණ. ප්‍රංශ විප්ලවයෙන් පසු ප්‍රකාශයට පත් වූ මානව හිමිකම් එම රටට පමණක් සීමා වුව ද පසුව පැතිර ගිය ප්‍රතිපත්ති විශ්වීය වටිනාකමකින් යුක්ත විය. ඇමරිකානු හිමිකම් පනතෙහි තත්වය ද මේ හා සමාන වූයේය. මේ කිසිදු ලේඛනයක කාන්තා හා සුළු ජන කොටස්වල අයිතීන් පිළිබඳව සඳහන් නොවේ. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය කුලය, පන්තිය, ලිංගභේදය හෝ අනෙකුත් වෙනස්කම් ද සෑම ආකාරයකම විචල්‍යතාවයන් ද නොසලකා හරිමින් සියලු මනුෂ්‍යයන්ට සමාන අයිතීන් හිමි බව ප්‍රකාශයට පත් කළේය.

මේ අනුව,

විශ්ව ප්‍රකාශනය යනු සමස්ත ලෝකයම එකට කැටි කොට සිතීමට ගත් උත්සාහයක් හා සියලු මනුෂ්‍යයන්ට සමාන තත්වයකින් සැලකීම පිළිබඳ ප්‍රමිතීන් ගොඩනැගීමට ගත් උත්සාහයකි.

මුල් කාලීනව බටහිර ලෝකයේ සංවර්ධනයේ දී ද මේ හා සමාන සංකල්පයක් ප්‍රකාශයට පත් වී ඇත. ඒ ශාන්ත පෝල්ගේ "................ මෙහි වහලුන් හෝ නිවහල් මිනිසුන් නොමැත. පුරුෂයන් හෝ ස්ත්‍රීන් ද නොමැත. ඔබ සියල්ලෝ ම ජේසුස් ක්‍රිස්තුන් ඉදිරියේ එක් අයෙකි.' (.........3:28) එහි වූ එකම සීමාව වූයේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳව වූ විශ්වාසයේ වෙනස යි. එනම්, ආගමානුකූල සීමා පැනවීමයි.

විශ්ව ප්‍රකාශයේ නව රැඩිකල්වාදී දෘෂ්ටිකෝණය අතිශය වැදගත්කමකින් යුක්ත වේ. දෙවන ලෝක සංග්‍රාමයට පූර්ව අවධියේ දී බොහෝ යුරෝපීය රටවල් ලෝකය ලෙස සැලකුවේ බටහිර ලෝකය යි. බොහෝ අවස්ථාවලදී උසස් ශිෂ්ටාචාරයන් මගින් සෙසු කුඩා ශිෂ්ටාචාරයන්ට එරෙහි ව අධිරාජ්‍යවාදය පැතිරවීම සාධාරණීකරණය කරනු ලැබුණි. විශ්ව ප්‍රකාශනය හරහා ලෝකය මේ ආකාරයෙන් අර්ථකථනය කිරීමේ ක්‍රමවේදය මුළුමනින්ම පාහේ තුරන් කර දමයි.

මනුෂ්‍යත්වය පුළුල්ව ග්‍රහණය කරගැනීමේ අනුමිතීන් තුළ බොහෝ අරුත්ගැන්වීම් තිබුණ ද ඒ අතරින් වඩාත් කැපී පෙනෙන අනුමිතියක් ලෙස මනුෂ්‍යත්වය තුළ පොදු සදාචාරාත්මක හා ආචාරධර්මීය ප්‍රමිතියක් වන බවට ඇති අනුමිතිය සැලකිය හැකි ය.

මෙසේ මේ පොදු සදාචාරය සුරක්ෂිත කෙරෙනු වස් අත්‍යාවශ්‍ය වූ අයිතීන්, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය හරහා එළිදැක්වුණි. වෙනස් කොට නොසැලකීම හා බැහැර නොකිරීම පිළිබඳ මතවාදයන්ගෙන් ඇරඹී මේ ප්‍රකාශනය මනුෂ්‍යයන්ගේ ආත්මාභිමානය සුරක්ෂිත කිරීමට අදාළ මූලික අවශ්‍යතා දක්වා විහිද යයි. මනුෂ්‍යයන් ලෙස ඉපදීම හේතුවෙන් හිමිවන සදාචාරාත්මක ප්‍රමිතීන්වලට එරෙහිව යන එවන් භාවිතාවන්ට විශ්වීය මට්ටමින් ප්‍රතිශේධයන් නිර්මාණය කිරීම මේ ප්‍රකාශනය මගින් සිදුවේ. ඒ අනුව නීති විරෝධී අත්අඩංගුවට ගැනීම්, නීති විරෝධී රඳවා ගැනීම්වලින් වැළකීමේ අයිතිය, දඬුවම් ලැබීමට පෙර සුදුසු ජූරියක් ඉදිරිපිට නඩු විභාගයක් ලැබීමේ අයිතිය, අභියාචනා ඉදිරිපත් කිරීමේ අයිතිය සෑම මනුෂ්‍යයෙකුට

ම උපතින් ම හිමිවන අයිතීන් ලෙස ප්‍රකාශයට පත් කොට තිබේ. සියවස් ගණනාවක් පුරා මිනිස් ජීවිත හා ස්වාධීනත්වය පරිත්‍යාග කරමින් සිදු කළ අරගලවල ප්‍රතිඵලයක් ලෙස දිනා ගත් මේ අයිතීන් සියලු දෙනාටම හිමි අයිතීන් බවට ප්‍රකාශ කරන ලදි. මේ ඓතිහාසික අරගලයන් හරහා දිනාගත් අයිතීන් සියල්ලන්ගේම උරුමයක් වන බවට අපට තර්ක කළ හැකි ය.

සියලු රාජ්‍යයන් විසින් ගරු කළ යුතු මූලික මිනිස් අයිතිවාසිකම් සමුදායක් ද විශ්ව ප්‍රකාශනය හරහා එළිදක්වනු ලැබිණ. ඒවාට ජීවත්වීමේ අයිතිය, අධ්‍යාපනය ලැබීමේ අයිතිය, සෞඛ්‍ය පහසුකම් ලැබීමේ අයිතිය, විවේක ගැනීමේ හා සංස්කෘතිකමය අයිතිය ආදිය ඇතුළත් වේ. නව ලෝකය තුළින් අපේක්ෂිත සදාචාරාත්මක ප්‍රමිතීන් මෙසේ විශ්ව ප්‍රකාශනය හරහා හඳුන්වා දෙනු ලැබිණ.

පසුකාලීන සංවර්ධනයන් හිදී මේ සදාචාරාත්මක ප්‍රමිතීන් පිළිබඳ අදහස ගිවිසුම් හා සමුළු හරහා නෛතිකමය බැඳීමක් බවට පරිවර්තනය කිරීමට ගෝලීය මානව හිමිකම් ව්‍යාපෘතිය යත්න දැරුවේය. 1966 දී ප්‍රකාශයට පත් අන්තර්ජාතික සිවිල් හා දේශපාලනික අයිතීන් පිළිබඳ ප්‍රඥප්තිය (DCCPR) හා අන්තර්ජාතික ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතීන් පිළිබඳ ප්‍රඥප්තිය (ICESCR) මේ සංවර්ධනාත්මක උත්සාහයේ කැපී පෙනෙන ජයග්‍රහණයකි. එතැන් පටන් විශ්ව ප්‍රකාශනයේ ඇතුළත් මූලික සදාචාරාත්මක වගකීම් අන්තර්ජාතික මෙන්ම දේශීය නීති පද්ධතීන්ට ඇතුළත් කිරීමට බොහෝ උත්සාහයන් වරින් වර ගෙන ඇත.

මෙසේ නීතිමය බැඳීම් ඇති කිරීමට ගන්නා උත්සාහයන්ට අමතරව අන්තර්ජාතික වශයෙන් හා දේශීය නීති පද්ධතීන් තුළද මේවා නීතිමය අයිතීන් බවට පරිවර්තනය කිරීමට දීර්ඝ උත්සාහයන් ගෙන ඇත. ගිවිසුම් මණ්ඩලයන්, වාර්තාකරණ නිලධාරීන්, වධහිංසනයන්ට එරෙහි කමිටුව වැනි විවිධ සුවිශේෂී සංවිධානයන් හා කාන්තා, ළමා අයිතීන් වෙනුවෙන් පෙනී සිටින ඒ හා සමාන කණ්ඩායම් වැනි විවිධ එක්සත් ජාතීන්ගේ මණ්ඩලයන් සියල්ල මේ උත්සාහයේ කොටස්කරුවෝ වූහ. මානව හිමිකම් පිළිබඳ

වියානා සමුළුවේ දී මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් ධුරය පිහිටුවීම මානව හිමිකම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ උසස් පියවරක් ලෙස සලකනු ලැබේ. යුරෝපීය මානව හිමිකම් පිළිබඳ අධිකරණය හා අනෙකුත් සංවිධාන පිහිටුවීම වැනි විවිධ කලාපීය යාන්ත්‍රණයන් සංවර්ධනය කිරීම ද මේ දිශානුගත ව සිදු කළ විවිධ උත්සාහයන් ලෙස හැඳින්විය හැකි ය.

පසුකාලීනව සංවර්ධනය කළ මානව හිමිකම් කවුන්සිලය මින් පෙර පැවති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ යාන්ත්‍රණයන්ට සාපේක්ෂව ඉහළ ප්‍රායෝගික වටිනාකමක් හා ඵලදායී බවක් සහිත විය යුතු වූයේ ය. විවිධ බලපෑම් හේතුවෙන් සත්‍ය වශයෙන්ම මෙහි මූලික ඉලක්කය ළඟා කර ගැනීමෙහි ලා යම් පසුබෑම් ඇති වුවද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය නිර්මාණය කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වූයේ ලොව මානව හිමිකම් ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් යම් සංවර්ධනයක් ඇති කිරීමයි. එක් එක් සිදුවීම් සම්බන්ධ කාර්යයන් ද මානව හිමිකම් කමිටුව හරහා ක්‍රියාත්මක කෙරෙයි.

රාජ්‍යයන්හි මේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා බැඳීමක් ඇති කරන ආකර්ෂක වළල්ලක් මෙන් ක්‍රියා කරනුයේ අන්තර්ජාතික සිවිල් හා දේශපාලනික අයිතීන් පිළිබඳ ප්‍රඥප්තිය හා අන්තර්ජාතික ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතීන් පිළිබඳ ප්‍රඥප්තියේ පොදු වගන්ති 2 හරහා යි. ඒ තුළින් විශ්ව ප්‍රකාශනයෙහි අන්තර්ගත අයිතීන් හා අනෙකුත් සමුළු මේ ප්‍රකාශනයන්ගේ අයිතීන් ද තහවුරු කිරීම වෙනුවෙන් නෛතිකමය අධිකරණමය හා පරිපාලනමය පියවර ගැනීම සඳහා රාජ්‍යයන්ට අනිවාර්ය බැඳීමක් ඇති කරයි.

## අභියෝග

පසුගිය දශක ගණනාව තුළ පෙර කී විශ්වීය සදාචාරාත්මක ආචාරධර්ම හා ප්‍රතිමාන විවිධ නීති සංග්‍රහයන් මෙන් ම ප්‍රායෝගික ක්‍රමවේදයන් හරහා ළඟා කරගැනීමේ දී යම් යම් සීමාවන්ට නතු වන බව නිරීක්ෂණය කළ හැකි විය.

ඉන් මූලික සීමාවක් වනුයේ, ලොව සැලකිය යුතු කොටසක සැබෑ කර නොගත් දේශපාලනික හා සමාජයීය සංවර්ධනයන්

පිළිබඳ නොසලකමින් නීති ක්‍රමවේද හරහා සදාචාරාත්මක ප්‍රතිමාන ආරක්ෂා කිරීම කෙරෙහි ප්‍රමාණවත් නොවන අවධානයක් යොමු වීමයි. ලෝකයේ බොහෝ කලාපවල දී හුදෙක් අන්තර්ජාතික එකඟතාවන් හරහා දේශපාලනික, සමාජයීය සංවර්ධනයන් තුළින් නෛතික ප්‍රතිමාණයන්ට ළඟා විය හැකි ය යන උපකල්පනය මිථ්‍යාවක් වන බව තහවුරු වී තිබේ. එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයන් හා සමුළු කෙරෙහි එකඟතාවය මෙන්ම අනුමැතිය පවා ලබා ගත හැකි වුව ද එවන් ප්‍රතිමානයන් හා ප්‍රමිතීන් සත්‍ය ලෙස ම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමේදී එම ඉලක්ක සපුරා ගත හැකි වන්නේ ඉතා පහළ මට්ටමකිනි.

එයට බලපාන මූලික ගැටළුව හඳුනාගැනීම අපහසු නොවේ. සංවර්ධිත ප්‍රජාතන්ත්‍රීය රාජ්‍යයන් එනම්, බොහෝ දුරට බටහිර ලෝකයේ රටවල් ගණනාවක එම තත්වයට ළඟා වීම සඳහා ශත වර්ෂ ගණනක් පුරා විවිධ දේශපාලනික හා සමාජ අරගලයන් සිදු කිරීමට සිදු වූයේ ය. ඒ අනුව හුදු නීති ප්‍රතිපාදන හා ගිවිසුම් හා එකඟතා ක්‍රියාත්මක කිරීමෙන් පමණක් මෙවන් සදාචාරමය ප්‍රතිමානයන් හා ප්‍රමිතීන් උසස් තලයකට ගෙන ඒමක් සිදු නොවීය. සිදු වූයේ එහි අනෙක් පැත්තයි. එනම්, සමාජයේ ඇතැම් බලවේගයන් මර්දනයට සිදුකළ අරගලයන් හි විජයග්‍රහණයන් තුළින් නෛතික ප්‍රතිපාදන හා ප්‍රකාශනයන් ගොඩනැගීමයි. විවිධ දේශපාලනික හා සමාජයීය අරගලයන් තුළින් නව බැඳීම් සමුදායක් පිළිබඳ උසස් සවිඥානික බවක් ළඟා කරගත හැකිවීමයි. විවිධ රටවල ඓතිහාසික විස්තර කථනයන් හරහා මේ අරගලයන්ගේ ස්වභාවය හා නව ප්‍රමිතීන් කරා ළඟා වූ ආකාරය අපට අවබෝධ කරගත හැකි ය. ඇත්ත වශයෙන් ම ඒ පිළිබඳව පරීක්ෂා කිරීමට අවශ්‍ය ඕනෑම පුද්ගලයෙකුට පහසුවෙන් ලබාගත හැකි පරිදි එම විස්තර කථනයන් පැහැදිලිව ලේඛනගත වී ඇත.

ලොව අනෙකුත් බොහෝ ප්‍රදේශවල එක් එක් රටවලට සුවිශේෂී වූ විවිධ හේතු නිසා එවන් අරගලයන්ගෙන් මේ හා සමාන ප්‍රතිඵල අත්කරගැනීමට හැකි වී නොමැත. බොහෝ ප්‍රදේශවල සමානාත්මතාවය ඇති කිරීමේ අරමුණින් සිදුකළ අරගලයන් සාර්ථකව මර්දනය කරමින් නැවතත් ඊට ප්‍රතිවිරුද්ධ ප්‍රමිතීන් දිගින් දිගටම බලපැවැත්වුණු අවස්ථා බොහෝවිට දැකගත හැකි

ය. අසමානතාවය පිළිබඳව ඉතිහාසය ගැඹුරින් අධ්‍යයනය කරන ඕනෑම අයෙකුට පරිවර්තනයන් සිදු කිරීමට ඇති අභිලාශයන් මර්දනයට ලක් වූ ආකාරය හෝ ඇතැම් විට ඒ අභිලාශයන් සඳහා එම රටවල බහුතර ජනමතය දිනාගැනීමට නොහැකි වූ ආකාරය දැකගත හැකි ය. මින් සරලව පැහැදිලි වන්නේ ඇතැම් රටවල සමාජය තුළ කා වැදී තිබූ අසමානතාවය සම්බන්ධයෙන් සාර්ථකව ක්‍රියාත්මක වී ඇති බවත් අනෙකුත් සමාජයන් හි එසේ ක්‍රියාත්මක වීමට අපොහොසත්ව ඇති බවත් ය.

විශ්ව ප්‍රකාශනය හා අනෙකුත් එක්සත් ජාතීන්ගේ එකඟතා හා ප්‍රඥප්තීන් වැළඳගැනීමත් සමග සංවර්ධනය වෙමින් පැවති රටවල ප්‍රායෝගිකව දේශපාලනික හා සමාජයීය සංවර්ධනයන් ඇති කරමින් ඒ රටවල් තුළ ඉහත නව රැඩිකල්වාදී මතවාදයන් කෙරෙහි ගෞරවනීය පදනමක් ඇති කිරීම සඳහා මීට වඩා ගැඹුරින් කල්පනා කළ යුතුව තිබිණ. (මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ දක්වා ඇති සදාචාරාත්මක හා නෛතිකමය කොන්දේසි අනුව)

මේ සඳහා අදාළ සංවර්ධනය වෙමින් පැවති රටවල එවන් පරිවර්තනයන් අපේක්ෂා කරන මිනිසුන් තුළ ඒ සම්බන්ධයෙන් පැවති අදහස් හා දෘෂ්ටීන් සම්බන්ධයෙන් දීර්ඝ හා සෘජු සාකච්ඡා ඇතිකළ යුතුය. ඇතැම් විට දෙවන ලෝක යුද්ධයේ අවසානයත් සමග න්‍යෂ්ටික අවි නිපදවීම හා නව ගෝලීය වාතාවරණයක් පැන නැගීමත් සමග ඉහත කරුණු සම්බන්ධ ගෝලීය සාකච්ඡාවක් පැනනැගීමට අවස්ථාව නොලැබෙන්නට ඇත. කෙසේ වෙතත්, අවසානයේදී එවන් සාකච්ඡාවක් සිදු නොවූ අතර ඒ හේතුවෙන් විශ්ව ප්‍රකාශනයේ අන්තර්ගත කරුණු හොඳින් දැනුවත් වූ සමාජ පරිසරයක් ක්‍රියාත්මක වීම ද සිදු නොවීය.

පසුව පැමිණි දශක කිහිපයේ දී මේ තත්වය මැඩලීමට ගෙන ඇත්තේ අල්ප වූ ක්‍රියාමාර්ග ප්‍රමාණයක් පමණි. වර්තමානයේදී පවා සංවර්ධනය වෙමින් පවතින රටවල (විශ්ව ප්‍රකාශනයෙන් ඉල්ලා සිටින රැඩිකල්වාදී සමානාත්මතාවය ළඟා කරගැනීමට අවශ්‍ය දේශපාලනික හා සමාජයීය සංවර්ධනය) මේ අයිතීන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි මට්ටමින් ඒ පිළිබඳ පුළුල් දැනුවත් වීමක් තවමත් සිදු වී නොමැත.

# අභ්‍යන්තරික ගැටළුව

ලෝකයේ සංවර්ධිත රටවල් යැයි හඳුනාගන්නා රටවල මානව හිමිකම් පිළිබඳ නූතන අන්තර්ජාතික නීති හරහා අර්ථකථනය කෙරෙන ප්‍රතිමානයන් හා ප්‍රමිතීන් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමත්, අනෙකුත් රටවල, එනම් සාමාන්‍යයෙන් අසංවර්ධිත හෝ සංවර්ධනය වෙමින් පවතින යැයි හඳුනාගන්නා රටවල ඒ හා සමාන ක්‍රියාවලියක් නොමැති වීමත් පිළිබඳව වටහා ගැනීම අපහසු නොවේ. මෙය ලෝකයේ ධනය බෙදී යාමේ විෂමතාවයන් හා බැඳී පවතින ගැටළුවකි. හුදෙක් විශ්ව ප්‍රකාශනය පිළිගැනීම පමණක් ලෝක ඉතිහාසයට අනුව අසංවර්ධිත යැයි සැලකෙන රටවල ප්‍රමාණවත් තරම් ආර්ථික, සමාජයීය හා දේශපාලනික සංවර්ධනයක් ඇති කිරීම සඳහා අවැසි සහයෝගය ලබා දීමට පොදු ගෝලීය එකඟතාවයක් ගොඩනැගීමට සමත් නොවීය. එම රටවල ප්‍රායෝගික වශයෙන් නීති පද්ධතීන් තුළ ඉහත අයිතීන් ස්ථාපනය කිරීමට මෙන්ම ඒ හරහා දෙවන ලෝක යුද්ධයෙන් පසු බිහි වූ නව ලෝකයට අවශ්‍ය ප්‍රතිමානයන් හා ප්‍රමිතීන් ගොඩනැගීමට ද එය ප්‍රමාණවත් නොවීය.

විශ්වීය ප්‍රතිමානයන් හා ප්‍රමිතීන්ට ගරු කරමින් භෞතික පරිසරය නිර්මාණය කිරීම.

ඇතැම් විට ලොව පවතින වඩාත්ම අසීරු ගැටළුව විය හැක්කේ අසංවර්ධිත රටවල පවතින මූලික අර්බුදයන් මැඩලීම හා එතුළින් අනෙක් රටවල් සිය ඓතිහාසික සංවර්ධනය හරහා ළඟා කරගත් ජයග්‍රහණයන් ළඟා කරගැනීමට අවශ්‍ය අවම අවශ්‍යතා සපුරාලීම කෙරෙහි පොදු එකඟතාවයක් ඇති කිරීමයි. භෞතිකමය සංවර්ධනයෙන් තොරව නව මතවාද හා අදහස් ඉපදවීම කළ නොහැකි ය. එවන් සංවර්ධනයකින් තොරව පුද්ගල ආත්මාභිමානය හා සත්‍ය වශයෙන්ම එම අභිමානය ගරු කරන උසස් චෛතසිකයක් ගොඩනැගීම කළ නොහැකි ය. අසීරුතම ගැටළුම මෙය වුවද, සමස්ත ලෝකය පුරා විශ්වීය සදාචාරමය ප්‍රතිමානයක් ලෙස හඳුනාගත් අයිතීන් සැබෑවක් කරගැනීමට නම් අනිවාර්යයෙන් ම විසඳිය යුතු ගැටළුව වන්නේ ද මෙයයි. සදාචාරමය ප්‍රතිමානයන් හා ප්‍රමිතීන් කෙරෙහි ගෞරවය

ගොඩනැගීම පිළිබඳ විවාදයේ කේන්ද්‍රය වන්නේ ද මෙයයි. ඉහත ඉලක්කය සපුරා ගැනීමට සාකච්ඡාවට බඳුන් කළ යුතු මූලික ගැටළුවද මෙයයි.

## ඒකාධිපතිවාදය පිළිබද මතවාද

ආසියාවේ බොහෝ රටවල් පිළිබඳව සියුම්ව නිරීක්ෂණයේ දී ඔවුන්ගේ දේශපාලනික ක්‍රමවේදයන් හ ප්‍රජාතන්ත්‍රීය පරිවර්තනයන් අභිබවමින් නැගී එන ඒකාධිපතිවාදී ක්‍රමවේදයන් පැහැදිලිව දැකිය හැකි ය. මානව හිමිකම් පිළිබඳ දෘෂ්ටිකෝණයෙන් බලන කල ඒකාධිපතීත්වය යනු ජනතාවගේ මූලික සිවිල් හා දේශපාලනික අයිතීන් මර්දනය කිරීම හෝ එම අයිතීන්ට දැඩි සීමාවන් පැනවීමයි.

දිනෙන් දින ඉහළ යන අදහස් ප්‍රකාශනයට හා ක්‍රියාත්මක වීමට එරෙහිව පැනවෙන සීමාවන් එම සමාජයන්හි ඒකාධිපතීත්ව ග්‍රහණය පුළුල් වීමේ සෘජු ප්‍රතිඵලයකි. මෙය නීතිය අභිබවමින් සිදුකෙරෙන පුද්ගල ඝාතනයන් හා බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලට විරුද්ධව ඇති නීතිමය බාධාවන් ලිහිල් කිරීම හා බැඳී පවතී. එයට නීති විරෝධී අත්අඩංගුවට ගැනීම්, රඳවා තබා ගැනීම්, විවිධ ශාරීරික හා මානසික වධබන්ධනයන්, සාධාරණ නඩු විභාගයක් ලැබීමට බාධා කිරීම හෝ එය අහිමි කිරීම මෙන් ම නීතියේ ප්‍රමාදයන් හා අනවධානය තුළින් රජයට දඬුවම් ලබාදීමේ බලය පුළුල් වීම ද අයත් ය. කෙටියෙන් ගත් කල විධිමත් හෝ ප්‍රායෝගික වශයෙන් සෑම ආකාරයකම නීතිමය ආරක්ෂාව ලැබීමේ මාර්ගයන් අවහිර කිරීම මෙයට අයත් ය.

මේ සියල්ලෙහි අරමුණ වන්නේ ජනතාවට සිය සමාජය ක්‍රියාත්මක කිරීමෙහි ලා හිමිවිය යුතු දේශපාලනිකමය නියෝජනය සීමා කිරීම හෝ අහිමි කිරීමයි. මේ හා සමග සමාජයීය ස්ථාවරත්වය හා ආර්ථිකමය සංවර්ධනය ඇතිකිරීමට නම් ඒකාධිපතීත්වය අත්‍යවශ්‍ය මෙවලමක්ය යන මතවාදය සංවර්ධනය කිරීම ද එකට බැඳී තිබේ. අයිතීන් පිළිබඳව හඬ නැගීම බොහෝ විට ඉක්මන් ආර්ථික සංවර්ධනයට අනර්ථදායක වූ බාහිර හෝ බටහිර මතවාදයන් හා දේශපාලනික රටාවන් ලෙස සැලකේ. ඒ අනුව සිවිල් හා දේශපාලනික අයිතීන් මර්දනය ආර්ථික සංවර්ධනයට

අත්‍යවශ්‍ය කරුණක් ලෙස සාධාරණීකරණය කරන අතර එහිදී ප්‍රජාතන්ත්‍රවාදය, නීතිය මත පාලනය හා මානව හිමිකම්වලට ගරු කිරීම යන සාධක අනිවාර්යයෙන් ම ඒ වෙනුවෙන් බිලි දිය යුතු සංකල්පයන් ලෙස පෙන්වා දෙයි. මේ මතවාදීමය ආකෘතිය හරහා ප්‍රජාතන්ත්‍රවාදය පරයමින් ඒකාධිපතිවාදය දේශපාලනික ආකෘතියක් ලෙස ඉදිරියට පැමිණේ.

## කාන්තා හා සුළු ජන කොටස් පිළිබඳ අයිතීන් හා පාරිසරික අයිතීන්

කාන්තා අයිතීන් සුරැකීම සඳහා නීති ප්‍රතිපාදන සංවර්ධනය කිරීමට යම් යම් උත්සාහයන් ගනු ලැබුවද, සුළු ජාතීන්ගේ අයිතීන් හා පාරිසරික අයිතීන් සංවර්ධනයට හෝ එම අයිතීන් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට සංවර්ධනය වෙමින් පවතින රටවල ගත් උත්සාහයන් වූයේ නම් ඒ ඉතා අල්ප වශයෙනි. සමස්තයක් ලෙස ගත් කල මේ අයිතීන් ක්‍රියාවට නැංවීම පිළිබඳව දක්නට ලැබෙනුයේ යම් පරිහානික තත්වයකි. මේ ගැටළුවට හේතුව වශයෙන් ඕනෑම අයිතියක් බලගැන්වීම සඳහා ප්‍රථමයෙන් සක්‍රීය රාජ්‍ය ප්‍රතිපාදිතයන් අවශ්‍ය වීම පෙන්වා දිය හැකි ය. සිය නෛතික හා දේශපාලනික ක්‍රමවේදයන්ගේ පරිහානියක් දක්නට ලැබෙන බහුතරයක් රටවල නීතිය මත පාලනය හරහා අපරාධ මර්දනය කිරීමේ අසාර්ථක බව දැකිය හැකි ය. මෙය විශේෂයෙන් බලපානුයේ කාන්තාවන් හා සුළු ජන කොටස් ආශ්‍රිතව වීම කණගාටුදායක තත්වයකි. එවන් සමාජයන්හි පැතිර පවතින දැඩි අනාරක්ෂිත බව තුළ කාන්තාවන් ඉතා අවදානම් සහගත තත්වයකට පත් කෙරේ.

යම් සමාජයක් කෙතරම් සුරක්ෂිත වේ ද යන්න පරීක්ෂා කිරීමට නම් එහි කාන්තාවන්ට ඇති බලපෑම නිරීක්ෂණය කළ යුතු වේ යැයි ජනප්‍රිය කියමනක් වේ. උදාහරණයක් ලෙස අඳුරු වැටීමෙන් පසු කාන්තාවන්ට නිවසින් බැහැර වීම අනාරක්ෂිත ලෙස හැඟේ නම් ඉන් ගම්‍ය වන්නේ රජයට නීතිය ක්‍රියාත්මක කිරීමට ඇති නොහැකියාවයි. මේ අනාරක්ෂිත බව සුළු ජන කොටස්වලට ද ඒ ආකාරයෙන් ම බලපායි. ලිංගික හැඩගැස්ම

හෝ පුම්තිරිබව හේතුවෙන් ඉලක්කගත වන පුද්ගලයන් ආරක්ෂා කිරීමට නොහැකියාව සඳහා ද බලපානුයේ මේ හේතුව ම බව පෙන්වා දිය හැකි ය.

අනාරක්ෂිත බව හා නීතිය බලගැන්වීමේ නොහැකියාව පරිසරයට ද ඉතා විශාල හතුරෙකු ලෙස හැඳින්විය හැකි ය. වන සංහාරය, ස්වාභාවික සම්පත් කොල්ලකෑම හෝ දූෂණය මෙන් ම ඒ හා සමාන අනෙකුත් ක්‍රියාකාරකම් හරහා ජනතාවට ජීවත් වීමට සුදුසු පරිසරයක් අහිමිකිරීම, එම ක්‍රියාකාරකම්වලට දඬුවම් නොකිරීම හේතුවෙන් වඩ වඩාත් පුළුල්ව ව්‍යාප්ත වේ.

මින් ප්‍රධානතම ගැටළුවක් වන්නේ විධිමත් ක්‍රමවේදයකින් තොරව රසායනික ද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් පානීය ජලය ලබාගැනීමට නොහැකි වීමයි. මේ තත්වය වකුගඩු අකර්මන්‍ය වීම වැනි බරපතල රෝග තත්වයනට ද විශාල වශයෙන් හේතු වේ. මෙවැනි ගැටළු විසඳීම සඳහා තීරණාත්මක ලෙස ක්‍රියාකළ නොහැකි, නීතිය බලගැන්විය නොහැකි රජයන් දුර්වල රජයන් ලෙස පෙන්වා දිය හැකි ය. ආසියාවේ බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල මීට නිදර්ශනයන් පෙන්වා දිය හැකි ය.

## මානව හිමිකම් ක්‍රියාකාරිකයෝ

සෑම ආකාරයකම මානව හිමිකම් ප්‍රවර්ධනයට හා සුරක්ෂිත කිරීමට අරගල කරන, ඒ සඳහා කැප වී සිටින පුද්ගලයන් මෙන් ම සංවිධානවලට ද සංවර්ධනය වෙමින් පවතින රටවල ඇති අනීතික වාතාවරණය තර්ජනයක් ලෙස ක්‍රියාත්මක වේ.

මානව හිමිකම් ක්‍රියාකාරිකයන්ට සිදුවන පහරදීම් පිළිබඳව නිරන්තරයෙන් අපට වාර්තාවේ. ඒකාධිපතිවාදී රාජ්‍යයන් තුළ මානව හිමිකම් ක්‍රියකාරීන් සැලකෙනුයේ සතුරු බලවේග වශයෙනි. මෙවන් මානව හිමිකම් ක්‍රියාකාරීන් නිහඬ කරවීම සඳහා ත්‍රස්ත - විරෝධී නීති සම්පාදනය කිරීමට මේ රජයන් ජාතික ආරක්ෂාව පිළිබඳ සංකල්පය යොදා ගනී.

රජය හා ජනතාව අතර ඇති බැඳීම ප්‍රචණ්ඩකාරී හා ගැටුමට තුඩු දෙන බැඳීමක් වන කල එම රජයන් සිය රාජ්‍යය තුළ සිදුවන දෑ පිළිබඳ රහස්‍යභාවයක් නඩත්තු කිරීමට විශේෂයෙන් උත්සාහ

කරති. මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලින් අනතුරුව ඒ සම්බන්ධ සියලු සාක්ෂි තුරන් කර දැමීමට බොහෝ විට ඔවුහු ක්‍රියාත්මක වෙති. එවන් ක්‍රියා හෙළිදරව් කිරීමට මෙන්ම එවන් ප්‍රචණ්ඩ ක්‍රියා හෙළිදරව් කර වැළැක්වීම සඳහා දේශීය හා අන්තර්ජාතික නීති සංවර්ධනයට උත්සාහ ගැනීම නිසා බොහෝ විට මානව හිමිකම් ක්‍රියාකාරිකයෝ ඔවුනගේ ගොදුරු බවට පත් වෙති.

ආසියානු මානව හිමිකම් ප්‍රඥප්තිය හා ආසියානු සංස්කෘතික, සාමය හා යුක්තියට ඇති අයිතිය පිළිබඳ ප්‍රකාශනයන් මෙන්ම ඉදිරියේදී හඳුන්වාදීමට නියමිත ආසියානු ප්‍රඥප්තියේ අනු ලේඛනයක් වන යුක්තිය පිළිබඳ අයිතිය ප්‍රකාශනය හරහා සාකච්ඡා කෙරෙනුයේ මේ ගැටළු පිළිබඳවයි. එමෙන් ම මානව හිමිකම් සත්‍ය ලෙස ම ක්‍රියාවට නැංවීමට අවශ්‍ය ප්‍රායෝගික ප්‍රතිසංවිධානයන්වල අවශ්‍යතාවය කෙරෙහි ද මේවායේ අවධානය යොමු වේ.

## සිවිල් සමාජයට ඇති අභියෝග

සංවර්ධනය වෙමින් පවතින රටවල ඉහත කී දේශපාලනික පරිවර්තනයන් හා මානව හිමිකම්වලට එරෙහි නිරන්තර ප්‍රහාරයන් සිවිල් සමාජයට දැවැන්ත ගැටළුවක් ව පවතී. එයට බොහෝ ආසියානු රටවල්ද අයත් වේ. එවන් ක්‍රියාවල ප්‍රවර්ධනය හේතුවෙන් සිවිල් සමාජය දැඩි ආකූලතාවයකට පත්ව සිටිති.

මෙ ආකූලතාවයන් බුද්ධිමය ජීවිතය වෙත ද කාන්දු වෙමින් ඔවුනගේ ජීවනෝපාය හා අනෙකුත් අයිතීන් වෙනුවෙන් සිදු කෙරෙන. අරගලයන්හි පදනම වන විසඳුම් හඳුනාගැනීමට අපහසුතා ඇති කරයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස පැන නගින අවිනිශ්චිතතාවන් සිවිල් සමාජයන් තුළ ඇති වන බොහෝ ගැටුම්වලට පදනම් වන අතර පොදු අරමුණු හා පොදු උපායමාර්ග ඔස්සේ ගොඩනැගෙන බලවත් සහයෝගිතා ව්‍යාපාරවලට බාධා ඇති කරයි.

එමෙන්ම මේ තත්වය පුද්ගලයන්, පවුල් හා සමස්ත සමාජය තුළ සංකීර්ණ මානසික ගැටළු ද නිර්මාණය කරයි. මෙවන් මානසික

අර්බුදවලට විසඳුම් සෙවීමට යාම ද පෙරළා සිවිල් සමාජයේ ආකුලතාවයට තුඩු දෙයි. එපමණක් නොව එතුළින් ශූන්‍යවාදී නැමියාවක් සහිත සෘණාත්මක ප්‍රතිචාරයන් ද ඇති කරයි. මේ නැමියාවන් හේතුවෙන් පෙරළා සහයෝගීතා ව්‍යාපාරවලට දැඩි බාධා හා ගැටළු පමුණුවයි. මෙවන් රටවල විකල්ප විසඳුම් ලෙස සමූහ පුද්ගල සංක්‍රමණ සුලබ ව දක්නට ලැබෙනුයේ එබැවිනි. මේ සංක්‍රමණ නිසා පැන නගින සිය සමාජය තුළම පුද්ගලයන් අවතැන් වීම හා නව තත්වයන්ට නිරාවරණය වීම මගින් නව ආකාරයක අර්බුද හා අනාරක්ෂිත බවක් ඔවුන් තුළ ගොඩනග යි. මේ තත්වය හේතුවෙන් පුද්ගලයා ආත්මීය අර්බුදයකට ඇද වැටෙන අතර එය බොහෝ විට ප්‍රචණ්ඩත්වයෙන් අවසන් විය හැකි ජාතිවාදය හා අනෙකුත් ආකාරයේ බෙදීම්වලට මඟ පාදයි.

ප්‍රජාතන්ත්‍රවාදය, නීතිය මත පාලනය හා මානව හිමිකම් සුරැකීම කෙරෙහි කැප වූ සිවිල් සමාජ ව්‍යාපාර මුහුණ දෙන අභියෝග

නව ආකාරයේ සමාජ අර්බුද හා සමාජයන් තුළ සිදුවන විවිධාකාර අවතැන්වීම් ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය සඳහා කැපවී සිටින ව්‍යාපාරයන්ගේ සංවර්ධනයට දැඩි බාධා පමුණුවයි. එයට හේතුව ඒකාධිපතිවාදය විසින් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අරගලයේ යෙදෙන සිවිල් සමාජය අඩපණ කරනු වස් නව ආකාරයේ ප්‍රහාරයන් දියත් කිරීමයි.

අදහස් ප්‍රකාශනය හා සමාගමයට එරෙහිව පනවා ඇති දැඩි සීමාවන් හේතුවෙන් බොහෝ ක්‍රියාකාරකම් අපරාධ ගණයට ඇද වැටේ. එවිට ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයන් හට අනර්ථකාරී වාතාවරණයක් නිර්මාණය කරමින් තර්ජනාත්මක සමාජ ඌරුවක් වර්ධනය වෙයි.

ඒකාධිපතිවාදයේ ප්‍රමුඛ ඉලක්කයන් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදාය මත පදනම් ව ගොඩනැගුණු දේශපාලන පක්ෂයි. එමගින් නීත්‍යානුකූල විරෝධතාවයන් පවා දඬුවම් පමුණුවන වැරදි බවට පත් කරන අතර අනෙකුත් සිවිල් සමාජ ක්‍රියාකාරකම් හා සාමකාමී විරෝධතා ප්‍රචණ්ඩත්වයෙන් මර්දනය කිරීමටත් ආරක්ෂක ප්‍රතිපාදිතයට මුවා වෙමින් නව ආවේක්ෂණ ක්‍රමවේද වර්ධනයටත් යොමු වේ. එවන් මර්දනයන්ගේ වඩාත් බියකරු

ම ස්වරූපයන් වන්නේ නිසි හේතුවකින් තොරව අත්අඩංගුවට ගැනීම, නීත්‍යානුකූල කිරීම, දීර්ඝකාලීනව රඳවා තබාගැනීමට ඉඩ ප්‍රස්ථා සැලසීම මෙන් ම නීතිවිරෝධී ඝාතනයන් හා බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම යි. එවන් මර්දනයක් බලගැන්වීමට සාමාන්‍ය තත්වයන් යටතේ පවතින නීතිය හා අධිකරණ පද්ධතියේ පරිපාලනයට එරෙහිව අධිකරණයේ ස්වාධීනත්වයට පහර එල්ල කරමින් නීති පද්ධතිය දැඩිව ලිහිල් කිරීම සිදුකරයි. එමෙන් ම රාජ්‍ය බලාධිකාරයන් විසින් සිදුකරන මානව හිමිකම් උල්ලංඝනයන් විමර්ශනයට ඇති බලය සීමා කිරීම හා පැමිණිලි කිරීමේ අවස්ථාවට බාධා පැමිණවීම ද මෙයට අයත් වේ. සිවිල් පොලිස් කටයුතුවලට උග්‍ර ගැටළු ඇතිකරමින් පොලිස් බලකාය තුළට යුද යමුදා බලඇණිවලට සමාන බලඇණි කා වැද්දවීම ද මෙහිදී සිදුවේ. මෙහි අවසන් අභිමතාර්ථය වන්නේ අධිකරණ පද්ධතිය අඩපණ කරමින් දැවැන්ත මිලිටරිකරණයක් දක්වා සමාජය රැගෙන යාමයි. සමාජය තුළ ඔවුනගේ අධිකරණ පද්ධතියට තවදුරටත් තමන් වෙත නීතිමය ආරක්ෂාවක් ලබාදිය නොහැකි බවට පොදු වැටහීමක් ඇති වීමෙන් අනතුරුව, අධිකරණ පද්ධතියට අයත් ආයතන ඔවුන් මර්දනය සඳහා ප්‍රතිසංවිධානය වී ඇති බව වටහාගැනීමෙන් අනතුරුව සිය ගැටළුවලට විසඳුම් සොයා ගැනීමේ සියලු බලාපොරොත්තු ඔවුහු අතහැර දමති.

මේ නව වාතාවරණය මානව හිමිකම් සංවිධානවලට ගැටළු ඇති කරයි. විශේෂයෙන් අධිකරණ පද්ධතිය හෝ සමස්ත නීති පද්ධතිය මත යැපිය නොහැකි අවස්ථාවකදී ඔවුනට මූලික ආරක්ෂාවක් නොලැබී යාම එයට හේතුවයි.

මානව හිමිකම් ව්‍යාපාර විරෝධතා ක්‍රමවේදයක් ලෙස ප්‍රචණ්ඩත්වය භාවිත කිරීම ප්‍රතික්ෂේප කරන බැවින් මේ හරහා ඔවුන් තුළ මහත් වික්ෂිප්තභාවයක් ඇති කරයි. පුද්ගල අයිතීන් ආරක්ෂා කිරීමට විකල්ප ක්‍රියාමාර්ගයක් නොමැති බැවින් ම සමාජයේ ඇතැම් කොටස් ප්‍රචණ්ඩත්වයට යොමු වෙති. මෙවන් කොටස්වල වර්ධනය පෙරළා රජය විසින් අනුගමනය කරනු ලබන මර්දනකාරී ක්‍රියා පිළිවෙත තවදුරටත් ශක්තිමත් කරයි. ඔවුහු මේ තත්වය දඩමීමා කරගනිමින් ඩ්‍රැකෝනියානු ත්‍රස්ත විරෝධී නීති මෙන්ම එවන් නීති ක්‍රියාත්මක කිරීමේ රළු ක්‍රමවේදයන් ද තවදුරටත් ශක්තිමත් කරති.

සංවර්ධනය වෙමින් පවතින රටවල සිවිල් සමාජ ව්‍යාපාර මුහුණදෙන සමස්ත තත්වය ඒ රටවල් තුළින් ම දෝංකාර දෙයි. ත්‍රස්තවාදය මැඩලීම හා නීතිවිරෝධි සංක්‍රමණයන් වැළැක්වීම වැනි ව්‍යාජ හේතු මවා පාමින් ගෝලීය වශයෙන් බොහෝ පරිවර්තනයන් සිදුවෙමින් පවතින අතර ඒවා බටහිර ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්ද ඇතුළුව සංවර්ධිත රටවල ප්‍රජාතන්ත්‍රවාදයනට ද තර්ජනයක් වෙමින් තිබේ.

සංවර්ධිත රටවල වර්ධනය වන දක්ශිනාංශික ප්‍රවණතාවයන් සංවර්ධනය වෙමින් පවති. රටවල ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි වන්නන් තව තවත් ශක්තිමත් කරයි. මෙය ගෝලීය සහයෝගීතා ව්‍යාපාරවල නැගී ඒමට ඉතා විශාල ගැටළු ඇති කරයි.

සංවර්ධිත රටවලින් ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාර සඳහා ප්‍රමාණවත් සහයෝගයක් නොලැබීම සංවර්ධනය වෙමින් පවතින රටවල ඇති සිවිල් සමාජ ව්‍යාපාරවල අවුල් සහගත බවට තවදුරටත් හේතු වේ.

## මානව හමිකම් සුරක්ෂිත කිරීම සඳහා නව සාකච්ඡාවක අවශ්‍යතාවය

ගෝලීය වශයෙන් මානව හිමිකම් ප්‍රවර්ධනයට හේතු වූ පශ්චාත් දෙවන ලෝක යුධ සමයේ නව ප්‍රවණතා සංකේතවත් කරමින් විශ්ව ප්‍රකාශනය හා එක්සත් ජාතීන්ගේ යාන්ත්‍රණයන් ද, සංවර්ධනය වෙමින් පවතින රටවල සිවිල් සමාජ ව්‍යාපාරවලට සහාය පළ කිරීමට සංවර්ධිත ප්‍රජාතාන්ත්‍රික රජයන් විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන් ද මේ දක්වා ම මතු වී පෙනෙන සාකච්ඡාවක් නිර්මාණය කළේය. කෙසේ වෙතත්, පෙර විස්තර කළ වාතාවරණය තුළ ගෝලීය මානව හිමිකම් ව්‍යාපාරයන් වර්තමාන තර්ජනයන්ට මුහුණ දිය හැකි සේ ශක්තිමත් විය යුතුය. සිය ශක්‍යතාවන් වර්ධනය කරගත යුතුය. පූර්වකාලීන විජයග්‍රහණයක් වූ විවිධ සමුළු හරහා මානව හිමිකම් ප්‍රතිපත්ති තහවුරු කරගැනීම පමණක් වර්තමාන තත්වයනට මුහුණ දීමේ දී නොසෑහේ.

අසංවර්ධිත රටවල හුදෙක් මානව හිමිකම් ප්‍රවර්ධනයට එකඟතා ඇතිකරගැනීමෙන් ඔබ්බට ගොස් සත්‍ය ලෙසම ඒවා ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානයක් යොමු කරමින් එම

ව්‍යාපාරවලට සහාය දැක්වීම හරහා ප්‍රායෝගිකව මෙන්ම අවබෝධය අතින් ද ගෝලීය මානව හිමිකම් ව්‍යාපාර සිය ශක්‍යතා වර්ධනය කරගත යුතුය.

මේ ප්‍රායෝගික විෂය තුළ අපක්ෂපාතී විමර්ශනයන් සිදුකළ හැකි ස්වාධීන අධිකරණයක්, ස්වාධීන රජයේ නීතිපති දෙපාර්තමේන්තුවක්, සිවිල් පොලිස් ආයතන, යුක්තිය තහවුරු කිරීම පිළිබඳ වගකීම දරණ ඒකක ප්‍රතිසංවිධානයට සහාය දැක්වීම ද වර්තමාන ඒකාධිපතිවාදී මර්දනයට එරෙහි උපාය මාර්ග සංවර්ධනය මෙන් ම වැදගත් ය. රජයේ අත්තනෝමතික ක්‍රියාවලට එරෙහි ව නීතිය මත පාලනය ශක්තිමක් කිරීම මානව හිමිකම් ප්‍රවර්ධනය හා සුරක්ෂණය සඳහා ඵලදායී නායකත්වයක් සැපයීමට සිවිල් සමාජ ව්‍යාපාරයන්ගේ ශක්‍යතා වර්ධනයට ඔවුන් සතු විය යුතු පූර්ව නිර්ණායකයක් බවට පත්ව ඇත.

සංවර්ධිත රටවලින් සංවර්ධනය වෙමින් පවතින රටවලට ඉහත ආකාරයේ සහාය ලබාදීම බොහෝ දුරට ධනය බෙදීයාම හා සම්බන්ධ ගැටළු මත පදනම් වේ. මේ සියලු ගැටළුවලට කල්පවත්නා විසඳුම් ලබාදීමේ ප්‍රමුඛතම සාධකය වන්නේ ද එයයි. ස්වාධීනභාවය පුද්ගලයන්හට අවස්ථා සම්පාදනයේ සමානාත්මතාවය ප්‍රතික්ෂේප වීමට නිදහසට හේතුවක් නොවේ. එය අප වර්තමානයේ මුහුණදෙන අතිශය දරුණු ගැටළුවලට විසඳුම් සෙවීමේ මාර්ගයේ මූලික අඩිතාලම විය යුතුය. ජෝන් රෝල්ස් හා අනෙකුත් චින්තකයන් විසින් සිදු කරන ලද දායකත්වයන්ට සියලු මනුෂ්‍යයන්ට සාමකාමී පරිසරයක් ගොඩනැගීමේ සාකච්ඡාවේ ප්‍රධාන ස්ථානයක් ලබාදිය යුතුය.

නැවත වරක් සියල්ල බිඳ වැටෙමින් පවතින අතර කේන්ද්‍රයට තවදුරටත් එය දරාගත නොහැකිවී ඇත. මානව හිමිකම් ප්‍රතිපත්තීන් තමන් ජීවත්වීමට අපේක්ෂා කරන ලෝකයට අත්‍යාවශ්‍ය සාධකයන් වන බව මනුෂ්‍යයා අවබෝධ කරගත යුතුය. ඔවුහු මානව හිමිකම් ප්‍රායෝගිකව බලගැන්වීමේ දී ඇතිවන අපහසුතා හා සංකීර්ණතාවලට මුහුණ දීමට සූදානම් විය යුතුය.

# ධරණීය සංවර්ධන න්‍යායපත්‍රය
## Sustainable Development Goals
## (02)

අවිනාශ් පාන්ඩේ

2019 ලොව ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය පිළිබඳව වාර්තාවේ ලෝකයේ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ මනස තුළ කැකෑරෙන කුසගින්න පිළිබඳ භීතිකාව මනාව පිළිඹිබු කෙරේ. මේ තත්වය මෙසේ පිළිඹිබු වූයේ අනුක්‍රමිකව තෙවන වර්ෂයට යි. දශකයකට ආසන්න කාලයක් පුරා පැවති ලෝකයම සැමරූ කුසගින්නේ ක්‍රමික අඩුවීම අවසානයකට නිශ්චිත වශයෙන්ම අවසානයකට, ළඟා වී ඇති බවත් පසුගිය වසර ගණනාව පුරා අත්කරගත් වාසිදායක තත්වයෙහි ප්‍රත්‍යාවර්තනයක් සනිටුහන් කරන අඳුරු මූසල පින්තූරයක් දෙස බැලීමට ලෝකයාට සිදුව ඇති බවත් මෙයින් තහවුරු කෙරුණි. එමෙන්ම 2030 වර්ෂයේ දී ළඟා කරගැනීමට අපේක්ෂා කළ තිරසර සංවර්ධන ඉලක්ක (SDG) කරා ගමන් කිරීම වෙනුවට වර්ෂ 2030 වන විට කුසගින්න තුරන් කිරීමේ SDG 02 ළඟා කරගැනීමේ මාර්ගයෙන් ක්‍රමයෙන් බැහැර වන බවද තහවුරු විය. 2018 ට සාපේක්ෂව යම් අඩුවක් දක්නට ලැබුණද පසුගිය වසර තුන පුරාවට කුසගින්න ඉහළයාමේ ප්‍රතිශතය ක්‍රමයෙන් වර්ධනය වී ඇති බව පැහැදිලිය.

2017 වර්ෂයේ දී ලොව පුරා පුද්ගලයන් මිලියන 815 ක් දරුණු ලෙස කුසගින්නෙන් පසු වූ බව ධ්‍යඅ 2017 වාර්තාවෙන් අනාවරණය කෙරිණ. 2018 දී එම සංඛ්‍යාව මිලියන 820 ක් දක්වා

ඉහළ ගියේය. වෙනත් ආකාරයකින් පවසන්නේ නම්, 2030 වන විට කිසිදු පුද්ගලයෙකු නිරාහාරව නොසිටීමේ ඉලක්කය ළඟා කරගනු වෙනුවට මිලියන 900 ක ජනතාවක් සාගතයෙන් පීඩා විඳි 2000 වර්ෂය දක්වා අපි පසු ගමන් කරමින් සිටින්නෙමු.

එම වාර්තාවේ කණගාටුදායක ලෙස තවදුරටත් මෙසේ දැක්වේ. ලොව බිලියන 2 ක පමණ ජනතාවක්, සෑම පුද්ගලයන් සිව් දෙනෙකුටම එක් අයෙක් බැගින් සාමාන්‍ය වශයෙන් හෝ බරපතල වශයෙන් ආහාර සුරක්ෂිතතාව පිළිබඳ බියෙන් පසුවේ. බියජනකම කරුණ වන්නේ මෙයයි. බොහෝ විට අපගේ වැඩි අවධානය ලොව දුප්පත් කලාපවලට යොමු වුව ද උතුරු ඇමරිකාව හා යුරෝපය පවා ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ගැටළුවෙන් මිදී නැති අතර මේ සමෘද්ධිමත් මහාද්වීපවල පවා ජනගහනයෙන් 8% ක ප්‍රතිශතයක් සාමාන්‍ය හෝ දරුණු ආහාර අනාරක්ෂිත බවින් පෙළෙති. එමෙන්ම සාමාන්‍ය වශයෙන් ගත් කල සෑම මහාද්වීපයක ම කාන්තාවෝ පුරුෂයන්ට සාපේක්ෂව තරමක ඉහළ ආහාර අනාරක්ෂිතභාවයකින් පීඩා විඳිති.

එසේම මෙසේ කුසගින්න ඉහළ යාම සඳහා රටවල ආර්ථික වර්ධනයේ පසුබෑම ද බලපා ඇති බව පැහැදිලි වන්නේ එවන් ආර්ථිකමය වශයෙන් පසුගාමී බොහෝ රටවල කුසගින්න ඉහළ යමින් පවතින බැවිනි. මේ බොහෝමයක් රටවල් අත්‍යාවශ්‍ය භාණ්ඩ සම්බන්ධයෙන් අන්තර්ජාතික වෙළඳාම මත දැඩි සේ යැපෙන මධ්‍යම ආදායම් මට්ටම් සහිත රටවල් වේ.

මේ සියල්ලෙහි අවසන් ප්‍රතිඵලය විය හැක්කේ 2030 SDG ඉලක්කයක් වන කුරු දරුවන්ගේ සංඛ්‍යාව අඩකින් අඩුකිරීම මෙන්ම 2025 දී ලොව පුරා අඩු බර දැරු උපත් 30% කින් අඩුකිරීමේ ලෝක සෞඛ්‍ය සමුළු ඉලක්කය ද ජයගත නොහැකි වීමයි.

සියලු දේ වැරදී ගියේ කොතැනකදී ද? ජනතාව, සමාජයන්, රජයන්, සිවිල් සමාජය හා ජාත්‍යන්තර සමාජය මෙන් ම එක්සත් ජාතීන් වැනි පාර්ශවකරුවන් වෙතින් සියලු සැලසුම් ගිලහී ගියේ කොතැනක දී ද?

මේ අර්බුදයට තුඩු දුන් ගැටළු ගණනාවක් මේ වාර්තාව මගින් පෙන්වා දෙනු ලබයි. ඒ අතර බරපතල සමූහ ජන අවතැන්වීම් ඇති

කරන ගැටුම් හා අස්ථාවර බව, දේශගුණික විපර්යාස, දේශගුණික විචල්‍යතාවයන් හා ආහාර නිෂ්පාදනයට බලපෑම් ඇති කරන අතිශය අහිතකර දේශගුණික තත්වයන්, මෙන්ම ආහාර පද්ධතීන්ට හා ග්‍රාමීය ජීවනෝපායනට බලපෑම් ඇතිකරමින් ආහාර නිෂ්පාදනයට හා ස්වභාවික සම්පත්වලට හානි කරන කාලගුණික සාධක ආදිය වේ. මේ සියලු සාධක ආහාර නිෂ්පාදන විධි, බෙදාහැරීම් හා පරිභෝජන රටා කෙරෙහි කැපී පෙනෙන බලපෑමක් ඇති කරයි. එම තත්වය පෙරළා කුසගින්න හා පෝෂණය කෙරෙහි බලපෑම් ඇති කරයි. වාර්තාව හරහා බරපතල ආහාර අනාරක්ෂිතතාවයට බලපාන පසුබෑම් හා හදිසි තත්වයන් කෙරෙහි ආර්ථික අර්බුදයේ වැදගත්කම ද පෙන්වා දෙයි.

මේ සියලු කාරණා කුසගින්න වර්ධනයෙහි ලා දැඩි බලපෑමක් ඇති කරන වැදගත් සාධකයන් වේ. එහෙත්, ඒ හරහා තවත් එක් ප්‍රමුඛ කාරණයක් පැහැදිලි කිරීමට අසමත් වේ. එනම්, අවශ්‍ය ප්‍රමාණය ද ඉක්මවමින් රට තුළ ආහාර තිබිය දී පවා බොහෝ රටවල් ඉතා ඉහළ සාගත මට්ටම් වාර්තා කරමින් සිටින බවයි.

උදාහරණයක් ලෙස ඉන්දියාවේ මිලියන සංඛ්‍යාත ජනකායක් දිනපතා කුසගින්නෙන් පෙළෙමින් සිටියදී ගබඩාකිරීමේ ගැටළු හේතුවෙන් වසරකට ධාන්‍ය ටොන් මිලියන ගණනක් නරක් වී ඉවත දැමීමට සිදුවෙයි.

එසේ නම් ඉන්දියාව වැනි රටවල පවතින සාගතයට හේතුව කුමක්ද? එයට තුඩු දිය හැකි හේතු කිහිපයක් පිළිබඳව ඉඟි මේ විස්තරාත්මක වාර්තාව තුළින් හෙළිදරව් වෙයි. වාර්තාව හරහා ඉලක්ක අංක 02 හා අනෙකුත් තිරසර සංවර්ධන ඉලක්ක අතර පවතින අන්තර් සම්බන්ධතාවය පෙන්වා දෙයි. 2019 ජූලි 15 දින පැවති SOFI හඳුන්වාදීමේ වැඩසටහනේදී එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලයේ (ECOSOC) සභාපති ඉන්ගා රොන්ඩා කිංග් SDG ඉලක්ක අංක 02, තිරසර සංවර්ධන ඉලක්ක 08 (යෝග්‍ය රැකියා හා ආර්ථික වර්ධනය), 10 (අසමානතාවය අවම කිරීම) හා 01 (දරිද්‍රතාවය තුරන් කිරීම) වැනි අනෙකුත් ඉලක්ක ගණනාවක් සමග නිර්විතන්‍ය ලෙස බැඳී තිබෙන ආකාරය මතුකර දක්වයි.

ඇත්ත වශයෙන්ම ඒ සියල්ල එක හා සමාන වැදගත්කමකින් යුක්ත වේ. කෙසේ වෙතත් ඔවුනට තවත් එක් ඉතාම වැදගත් ඉලක්කයක් මගහැරී ගොස් ඇත. එම ඉලක්කය සපුරාගැනීමෙන් තොරව 02 වන ඉලක්කය වෙත ළඟා වීම හුදු සිහිනයක් පමණි. එනම්, 16 වන ඉලක්කය යි, සාමය, යුක්තිය හා ශක්තිමත් ආයතන පිළිබඳ ඉලක්කයයි. මේ පිළිබඳව ගැඹුරින් බලන කල මූලික සාධකය වන්නේ ශක්තිමත් ආයතන යන්න බව පැහැදිලිය. කුසගින්න තුරන් කිරීම සඳහා ලෝකය කෙතරම් උත්සාහ ගත්ත ද ඵලදායී වගකීම් සහගත හා විනිවිදභාවයකින් යුතු (ඉලක්ක අංක 16.6), දූෂණයෙන් හා අල්ලසින් තොරව බිම් මට්ටමේදී ක්‍රියාත්මක වන ශක්තිමත් රජයේ ආයතන නොමැත්තේ නම් ඒ සියලු උත්සාහයන්ගෙන් වැඩි වෙනසක් සිදුකළ නොහැක්කේ ය.

පෙර කී පරිදි 2019 SOFI වාර්තාව කණගාටුදායක ලෙස වුවද නිවැරදි ව ලෝකයේ දැවැන්ත ජන අවතැන්වීම් ඇති කරමින් වර්ධනය වන ගැටුම් හා අස්ථාවරත්වය පිළිබඳව කරුණු දක්වයි. බොහෝ විට මේ හරහා එම ජන සමූහයන්ගේ ආහාර සුරක්ෂිතතාවයට ද ඍජු බලපෑම් ඇති වේ. බටහිර ආසියාව මෙසේ ගැටුම්වල බලපෑම් ඍජු ලෙස කුසගින්න වෙත හානිකර බලපෑම් ඇති කළ බවට වන කණගාටුදායක උදාහරණයකි. 2010 වර්ෂයේ පටන් මේ වන විට එහි ජනතාවගෙන් 12% ක ප්‍රතිශතයක් මන්දපෝෂණ තත්වයෙන් පෙළෙන අතර 2005 දී එම ප්‍රතිශතය වූයේ 9.4% කි.

## එහෙත් සාගතය ඇතිකරමින් එය වර්ධනය වීමට බලපාන එකම හේතුව ගැටුම් පමණක් ද?

දරුණු ලෙස කුසගින්න ඉහළ යාමට අනිවාර්යයෙන් ගැටුම් ද හේතුවකි. කෙසේ වෙතත් ශ්‍රී ලංකාව වැනි උදාහරණයක් ගෙන බැලීමේ දී මේ තත්වයට එකම හේතුව එය නොවන බව පැහැදිලි වේ. දශක තුනක් පුරා පැතිර ගිය සිවිල් යුද්ධයකින් මෑතක දී මිදුණු ශ්‍රී ලංකාවේ තවදුරටත් කුසගින්න ඉහළ යමින් පැවතීම එයට හේතුවයි. තත්වය කෙතරම් අයහපත් අතකට හැරී තිබේද යත්, ඉන්දියාව, ජිබෝටි, දකුණු සුඩානය හා සමග ශ්‍රී ලංකාව ද

වයස අවු 5 ට අඩු දරුවන් දිරාපත් වෙමින් යන අහිතකරම රටවල් 4 ට එක්වනු ඇති ය යන  සැකයට බඳුන් වී තිබේ.

ශ්‍රී ලංකාවට සාපේක්ෂව බටහිර ආසියාව තුළ කුසගින්න සම්බන්ධයෙන් ගත් වෙනස් මග කෙසේ පැහැදිලි කළ යුතුද ? එය මෙසේ සිදු කළ හැකි ය. එනම් පශ්චාත් සිවිල් යුධ සමයෙහි ඒකාධිපති පාලනයක් සමග ශ්‍රී ලංකාවේ නීති ආයතන ඇතුළු රාජ්‍ය ආයතන තුළ සිදු වූ ශීඝ්‍ර පරිහානියයි.

සිවිල් යුද්ධයකින් අනතුරුව කඩිනමින් සාර්ථකව කුසගිනි මට්ටම පහත හෙළීමට සමත් වූ රටක් ලෙස නේපාලය මෙයට ප්‍රතිවිරෝධයක් වශයෙන් දැක්විය හැකි ය. ගෘහාශ්‍රිත සම්පත් වර්ධනය, මානව අධ්‍යාපනික මට්ටම වර්ධනය, උසස් සනීපාරක්ෂක මට්ටම් මෙන් ම ගර්භණී හා නවජ සුරක්ෂිතතාව ඇතුළත් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් ඉලක්ක කරමින් නේපාලය විශාල වශයෙන් සිය රාජ්‍ය ආයතනවලට මුදල් ආයෝජනය කළේය.

එය නැවතත් අප ව ඉලක්ක අංක 16 කරා කැඳවාගෙන යයි. කුසගින්න තුරන් කිරීමට සවිමත් පියවර ගැනීමට මේ කලාපයේ බොහෝමයක් රටවල් අපොහොසත් වීම පිටුපස ඇත්තේ එක් මූලික සාධකයකි. එනම්, පෙරළා එම කලාපයේ පුවැසිභාවය පිළිබඳ අදහසයි. ඔවුනගේ ප්‍රජාතන්ත්‍රවාදය නම් ව්‍යාජ මුහුණතට පිටුපසින් කලාපයේ බොහෝ රටවල් තවමත් ක්‍රියාත්මක කරනුයේ ඔවුනගේ පූර්වජයන්ගේ යටත් විජිතවාදී සංකල්පයන් (නේපාලය සැලකීමේදී වැඩවසම්) ය. ඔවුහු තවමත් සිය මහජනතාවගෙන් බහුතරයක් කිසිදු අයිතියක් නොමැති ඉවතලිය හැකි පිරිසක් ලෙස සලකති. ඔවුහු තම පුරවැසියන්ගේ අයිතීන් අනුකම්පා විරහිත ලෙස නොසලකා හරින අතර එයට දැඩි කුසගින්නට නිරාවරණය වූ පුද්ගලයෙකුට කිසිසේත් සිදුකළ නොහැකි අභිමානයකින් යුතුව ජීවත් වීමේ අයිතිය ද නිසගයෙන් ම ඇතුළත් වේ.

ඛේදජනක ලෙස, මේ රාජ්‍යයන් හි එක හා සමානව දැකිය හැකි සක්‍රීය නීති පද්ධතියක් නොමැති වීම පුද්ගලයාට සිදුවන නොපනත්කම්වලදී එයට සාධාරණයක් අපේක්ෂා කිරීමේ පුරවැසි අයිතිය අහිමි කරයි. ඒ හරහා තවදුරටත් ඔවුනට කුසගින්නේ, වික්ෂිප්තව, දිරාපත් වෙමින් අර්ධ මනුෂ්‍යයන් ලෙස පැවතීමට බල කරනු ලබයි.

ඇත්තෙන් ම ක්‍රියාකාරී බවක් මවා පෙන්වන මුළුමනින්ම අක්‍රීය වූ රාජ්‍ය ආයතන කුසගින්න හා සාගතය තුරන් කිරීමට අසමත් වූ රටවල් සියල්ලෙහි ම දැකගත හැකි පොදු සාධකයකි. පෙර සඳහන් කළ ආකාරයට ඔවුහු සිය කුසගින්නෙන් පෙළෙන පුරවැසියන් ඔවුනට සිදුවන අසාධාරණයන්ට වන්දි සෙවීමට ගන්නා උත්සාහයන් ප්‍රතික්ෂේප කරති. මේ රටවල රාජ්‍ය ආයතනයන්හි පරිහානිය ඉතා ගැඹුරට දිව යයි. ඔවුනගේ සමාජ සුබසාධන ආයතන සාමාන්‍යයෙන් කෙතරම් දූෂිත හා අකාර්යක්ෂම ලෙස පවතී ද යත්, දිළිඳු ජනතාව වෙත කුමන හෝ සහනයක් ළඟා නොවන අතර ඒවා පද්ධතියට කා වැදී ඇති සාධක අතර අතුරුදහන් වී යයි.

තදබදයෙන් පිරී ගිය, වැඩ බරෙන් පීඩිත වූ, මූල්‍ය හා මානව සම්පත් අවම මට්ටමින් පවතී, බොහෝ විට දූෂිත වූ නීති ආයතන අගතියට පත් ජනතාවට යුක්තිය කරා ළඟා වීම ප්‍රතික්ෂේප කිරීමේ කුෘරතර චක්‍රය සම්පූර්ණ කරයි. මෙහි අවසන් ප්‍රතිඵලය පිළිබඳ ගැරී හෝගන් හා වික්ටර් බෝට්‍රොස් ඔවුන්ගේ The Locust Effect නම් කෘතියේ විශිෂ්ට ලෙස කැටි කොට දක්වති. රටවල් දරිද්‍රතාවය නම් චක්‍රයේ සිර වී සිටිනුයේ අධිකරණ පද්ධතියේ හා නීතිය බලගැන්වීමේ අසාර්ථකත්වය හා රජයන් දිනපතා දිළින්දන්ව එදිනෙදා ප්‍රචණ්ඩත්වයෙන්, වහල්භාවයෙන් හෝ බලහත්කාරයෙන් සේවයේ යෙදවීමෙන් මුදවීමෙහි නියැළි සිටින බැවින් බව ඔවුහු පවසති. රජයන් හෝ ලෝක සමාජය වෙත කුසගින්න හා සටන් කිරීමේ දහසක් උපාය මාර්ග තිබිය හැකි ය. එහෙත්, එම රජයන්ට සත්‍ය වශයෙන් ම දරිද්‍රතාවය හා කුසගින්න අවසන් කිරීමට අවශ්‍ය නම් ඔවුහු බිම් මට්ටමේ නිවර්තන යාන්ත්‍රණයන් සම්පාදනය කළ යුතුය. දිළින්දන් හා සමාජයෙන් කොන් වූවන් දිගින් දිගටම කුසගිනි හා දරිද්‍රතා චක්‍රයේ සිරකරමින් ඔවුන් වෙත ප්‍රචණ්ඩත්වය මුදාහරින රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සාධකයන් හෙවත් පීඩකයන්ට එරෙහිව සටන් කළ යුතුය. මේ නිවර්තන යාන්ත්‍රණයන් යනු අනෙකක් නොව සක්‍රිය අධිකරණ පද්ධති, සියලු දෙනාම සමානාත්මතාවයකින් සැලකීම, අපරාධකරුවන්ට කඩිනමින් දඬුවම් කිරීම හා අවසන් වශයෙන් අසාධාරණයට ලක් වූ වින්දිතයන්ට සහනයක් සැලසීම යි.

මෙය නැවතත් අපගේ අවධානය ධරණීය සංවර්ධනය වෙත යොමු කරයි. එම වාර්තාව තුළින් 'පුද්ගලයන් හා කේන්ද්‍රගත ජන කොටස්වල ආර්ථික සංවේදීතාවයන් අවප්‍රමාණය කරමින් ආකෘතිමය පරිවර්තනයන් සිදුකිරීමට හා නැවතත් කුසගින්න, ආහාර අනාරක්ෂිතබව හා සෑම ආකාරයකම මන්දපෝෂණ තත්වයන් තුරන් කිරීම සඳහා නිවැරදි මගට යොමුවීමටත් කිසිදු පුද්ගලයෙකු ඉන් මගහැරී නොයාමටත්' නිර්දේශ ඉදිරිපත් කරයි.

එපමණක් නොව ඒ හරහා 'ආහාර සුරක්ෂිතතාව හා පෝෂණ ගැටළු ද දරිද්‍රතාවය තුරන් කිරීමේ උත්සාහයන් සමග සමෝධානය කරමින් දරිද්‍රතාවය, කුසගින්න, ආහාර අනාරක්ෂිතතාව හා ජන කොටස් සමාජයෙන් බැහැර කිරීම මුලිනුපුටා දැමීමේ සහක්‍රියාව වෙත යොමු වීමේ' වැදගත්කමත් පෙන්වා දෙයි. ඒ හා සමාන්තර ව 'ස්ත්‍රී පුරුෂ අසමානාත්මතාවය හා ජන කොටස් සමාජයෙන් බැහැර කිරීම අවප්‍රමාණය කිරීමේ අවශ්‍යතාවය' පෙන්වා දෙන මේ වාර්තාව එය 'ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය ඉහළ යාමට හේතු සාධක වන බව' ද පැහැදිලි කරයි.

තවද, 'එක්සත් ජාතීන් හා අන්තර්ජාතික සමාජයන්ගේ ක්‍රියාවලියට සියලු පාර්ශවකරුවන් හා රටවල ප්‍රමුඛ මෙන්ම කේන්ද්‍රීය සහයෝගය කඩිනමින් සමෝධානය කරමින් ඔවුනගේ සංවර්ධිත ප්‍රමුඛතා ක්‍රියාවට නැංවිය යුතු බව' ද මේ වාර්තාව නිවැරදිව පෙන්වා දෙයි. 'ලෝකය දරිද්‍රතාවය, අසමානාත්මතාවය, කුසගින්න, ආහාර අනාරක්ෂිතතාවය හා සියලු ආකාරයේ මන්දපෝෂණයෙන් ගලවා ගැනීම වස් පුද්ගල කේන්ද්‍රීය පරිවර්තනයකට මඟ හෙළි කිරීමට සියලු රටවලට හැකියාව ලැබෙන පරිදි බහුවිධ එකඟතා හා ක්‍රියාකාරී සැලසුම් මේගින් සකස් කළ හැකි ය.'

ඒ පිළිබඳව පෙන්වාදීමෙන් පසුවද එම වාර්තාවෙන් මගහැරී ඇති එකම කරුණ වන්නේ මෙසේ ක්‍රියාත්මක කිරීම සඳහා සක්‍රීය රාජ්‍ය ආයතනවල අවශ්‍යතාවය යි. බොහෝ රටවල මේ උත්සාහයන් බිම් මට්ටම දක්වා රැගෙන යාමට අවශ්‍ය මෙවන් රාජ්‍ය ආයතන ඇත්තේ අල්ප වශයෙනි. මේ ක්‍රියාත්මක කිරීම්වල යම් දෝෂයක් වේ නම් ඒ සඳහා වන්දි ලබාදීමට අවශ්‍ය අධිකරණ

ආයතන ද මෙයට අවශ්‍ය ය. කෙටියෙන් ගත් විට 2 වන ඉලක්කය සපුරාලීමට නම් අප ප්‍රථමයෙන් 16 වන ඉලක්කයට ළඟා විය යුතුය. එසේ ළඟා වන තෙක් කුසගින්න තුරන් කිරීම හුදෙක් සිහිනයකට පමණක් සීමා වනු ඇත.

# සක්‍රීය රාජ්‍ය ආයතනවලින් තොරව කුසගින්න තුරන් කළ නොහැකි ය (03)

2016 වසර ආසියාවේ දිළිඳු හා අඩු ආදායම්ලාභී ජනතාවට ආහාර හා ජීවනෝපාය සුරක්ෂිතතාවය අතින් අසීරු වර්ෂයක් බවට පත්වුණි. ශ්‍රී ලංකාව වැනි රටවල ආහාර සුරක්ෂිතතාවයේ පසුබෑමක් පවා දක්නට ලැබුණි. කැපී පෙනෙන ලෙස පිලිපීනය ද ඇතුළුව ආසියාව, ඉන්දියාව, පකිස්ථානය, බංග්ලාදේශය හා ඉන්දුනීසියාව වැනි රටවල මේ වර්ෂයේ දී නාගරික දිළිඳු ජන කොටස්වලට එල්ල වූ ප්‍රහාරයන්ගේ ඉහළ යාමක් දැකගත හැකි විය. එමෙන්ම එම වසරේ දී ඉතා අසීරුවෙන් ලබාගත් ආහාර සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය පිළිබඳ නෛතික ජයග්‍රහණ හා තීන්දු ආපසු වෙනස් කළ හෝ ලිහිල් කළ අවස්ථාවන් ද වුයේය. මින් දැඩි පීඩාවකට පත් වුයේ ඉන්දියානු දිළිඳු ජනතාවයි. එපමණක් නොව මේ වර්ෂය පුරා දේශපාලනික පෙරළීන්වල සිට ස්වභාවික පෙරළීන් දක්වා විවිධාකාරයේ පෙරළීන් ගණනාවක් ද පැන නැංගේය. අවාසනාවකට මේ පෙරළීන් හේතුවෙන් ඒ ජන කොටස්වල ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට දියත් කළ ක්‍රියාමාර්ගයන්ට හානිකර බලපෑම් ඇතිවුණි.

කෙසේ වෙතත්, මේ කලාපයේ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ අරගලයට විශාලතම හානියක් සිදුවුයේ එම රජයන් විසින් මානව හිමිකම් ක්‍රියාකාරිකයන් කෙරෙහි සතුරු ආකල්පයක් දැක්වීමයි. නව

රජයන් වඩාත් ශක්තිමත් වීමත් සමඟ බංග්ලාදේශය, ඉන්දියාව හා පිලිපීනයේ රාජ්‍යයන් ක්‍රියාත්මක කළ දැඩි මර්දනකාරී ප්‍රතිපත්ති හේතුවෙන් මානව හිමිකම් ක්‍රියාකාරකම් දරුණු ප්‍රහාරයකට ලක් විය. මේ සියලු රටවල මානව හිමිකම් ක්‍රියාකාරීන් ව්‍යාජ නඩුවල පැටලැවීම, අත්අඩංගුවට ගැනීම මෙන්ම ඇතැම් අවස්ථාවල දී වධහිංසනයට ලක් කිරීම ද දැකගත හැකි විය.

මේ වසර තුළදී අධිකාරීන් විසින් බොහෝ රාජ්‍ය නොවන සංවිධාන පසුපස හඹා යන ආකාරය ද නිරීක්ෂණය කළ හැකි විය. බොහෝවිට ඒ හරහා ඔවුනගේ බලපත්‍ර අහෝසි කිරිම හා ඉතා සුළු හේතු මත ඔවුනට ලැබෙන ආධාර අත්හිටුවීම ද සිදුවිය. මේ මර්දනකාරී පිළිවෙත විශේෂයෙන් ඉන්දියාව තුළ දැකගත හැකි වූ අතර නැගෙනහිර ඉන්දියාවේ ප්‍රාන්තයක් වූ ඔඩිස්සා හි රජය විසින් ආසියානු මානව හිමිකම් කොමිසමේ හවුල් සංවිධානයක සාමාජිකයන්ට එරෙහිව අපරාධ නඩු 400 කට අධික සංඛ්‍යාවක් පැනවූ බවට වාර්තා වේ. පිලිපීන රජය සම්බන්ධයෙන් ද දැකිය හැක්කේ මේ හා සමාන ක්‍රියාකාරීත්වයකි.

අන්තර්ජාතික ආහාර ප්‍රතිපත්ති පිළිබඳ සමීක්ෂණ ආයතනයේ 2016 ගෝලීය කුසගිනි දර්ශක වාර්තාවේ එම වසරේ ප්‍රවණතාවයන් පිළිඹිබු කෙරේ. ඇති වූ යම් සංවර්ධිත තත්ත්වයන් තිබුණ ද රටවල් 50 ක කුසගිනි මට්ටම් දර්ශකය අන්තරායකර තත්ත්වයක ඇති බවත් ඉන් බොහොමයක් ආසියාතික රටවල් බවත් මේ වාර්තාවේ සඳහන් වේ.

සියුම්ව නිරීක්ෂණය කිරීමේ දී එම රටවල "ආර්ථික සංවර්ධන" මට්ටම් හා කුසගිනි මට්ටම් අතර සම්බන්ධයක් නොමැති බව පෙනී යයි. ඒ අනුව ඒ රටවල ප්‍රධාන ධාරාවේ හා දිළිඳු අඩු ආදායම්ලාභී ජන කොටස් අතර ආහාර සුරක්ෂිතතා මට්ටම්වල ඉතා විශාල අන්තරයක් ඇති බව පැහැදිලිය.

උදාහරණයක් ලෙස 118 ක් වූ සියලු රටවල් අතරින් ඉන්දියාවට 97 වන ස්ථානය ලැබීම සලකා බලමු. එය අසල්වැසි සියලු රටවල් හා සාපේක්ෂව කුසගින්න තුරන් කිරීම සම්බන්ධයෙන් පහත් මට්ටමක සිටින රටකි. ඉන්දියාව, 2015 වසරේ භූකම්පනයකින් විනාශයට පත් වූ දිළිඳු රටක් වන නේපාලය ලබාගත් 72 වන

ස්ථානය, පකිස්ථානය (107 ස්ථානය) මෙන්ම මියන්මාරය (75), ශ්‍රී ලංකාව (84) හා බංග්ලාදේශය (90) ට ද වඩා පහළ මට්ටමක සිටී. චීනය හැරුණුකොට මේ සියලු රටවල සම මට්ටමේ බරපතල කුසගිනි මට්ටමක් තිබීම ඇතැම් විට ඉන්දියානු රජයට යම් අස්වැසිල්ලක් විය හැකි ය. එහෙත් කුසගින්නෙන් පීඩා විඳින දිළිඳු ජනතාවට නම් එය කිසිදු අස්වැසිල්ලක් ගෙන නොදෙයි. 2015 වසරට සාපේක්ෂව රටේ කුසගිනි මට්ටම් මෙන්ම දර්ශක අගයේ ද පිරිහීමක් පෙන්වන ශ්‍රී ලංකාව ද, එහි අවදානම් තත්ත්වයක සිටින ජන කොටස්වල ආහාර අනාරක්ෂිතබව පහත හෙළීම කෙරෙහි දේශපාලනික ස්ථාවරභාවය පරිවර්තනය කර නොගැනීම පිළිබඳව උදාහරණ සපයයි. ශ්‍රී ලංකාවට මේ වසරේ දී 84 වන ස්ථානය හිමි වුවද 2015 දී එය හිමිකරගන්නේ 69 වන ස්ථානයයි. පහත වගුව ඇසුරෙන් ආසියානු මානව හිමිකම් කොමිසම සෘජුව ක්‍රියාකරන රටවල කුසගිනි තත්ත්වය පිළිබඳව අදහසක් ලබාගත හැකි ය.

| රට හා GHI දර්ශකය | ඌන පෝෂිත (%) | 5 ට අඩු ක්ෂය වීම (%) | 5 ට අඩු කුරුවීම් (%) | 5 ට අඩු මරණ (%) |
|---|---|---|---|---|
| 1. පකිස්ථානය (107) | 22 | 10.5 | 45 | 8.1 |
| 2. ඉන්දියාව (97) | 15.2 | 15.1 | 38.7 | 4.8 |
| 3. බංග්ලාදේශය (90) | 16.4 | 14.3 | 36.4 | 3.8 |
| 4. ශ්‍රී ලංකාව (84) | 22 | 21.4 | 14.7 | 1.0 |
| 5. නේපාලය (72) | 7.8 | 11.3 | 37.4 | 3.6 |
| 6. මියන්මාරය (75) | 14.2 | 7.1 | 31.0 | 5.0 |
| 7. කාම්බෝජය (71) | 14.2 | 9.6 | 32.4 | 2.9 |
| 8. ඉන්දුනීසියාව (72) | 7.6 | 13.5 | 36.4 | 2.7 |
| 9. පිලිපීනය (68) | 13.5 | 7.9 | 30.3 | 2.8 |
| 10. තායිලන්තය (51) | 7.4 | 6.7 | 16.3 | 1.2 |
| 11. චීනය (29) | 9.3 | 2.1 | 6.8 | 1.1 |

මේ වගුව හරහා ආසියාවේ කුසගිනි මට්ටම් මෙන්ම එය තුරන් කිරීමට රජයන් ලබාදෙන ප්‍රමුඛතාවයේ විචල්‍යතාවයන් පිළිබඳව

පැහැදිලි වේ. එහෙත් ඉන් පිළිබිඹු නොවන කරුණ වන්නේ මේ සංඛ්‍යාත්මක දත්ත හරහා සත්‍ය ලෙසම බිම් මට්ටමේ දී විඳවන සැබෑ මනුෂ්‍යයන්ගේ දැවැන්ත සංඛ්‍යාව නිරූපණය නොවීමයි. ඉන් මඟහැරී ගිය තවත් සාධකයක් වන්නේ මේ කලාපයේ බොහොමයක් රටවලට මුළුමනින් ම කුසගින්න මර්දනය කිරීමට ඇති හැකියාවයි.

උදාහරණ ලෙස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් නිකුත් කළ 2015 මානව සංවර්ධන වාර්තාවේ දැක්වෙන ආකාරයට ඉන්දියාවට "සියලු පුරවැසියන් සඳහා සාධාරණ විශ්‍රාම වැටුපක්, මූලික සෞඛ්‍ය පහසුකම්, ළමා ප්‍රතිලාභ හා සේවක පටිපාටීන් ඇතුළුව මූලික හා ප්‍රමාණවත් සමාජ ආරක්ෂණ සහතිකයන්" ලබාදිය හැකි බව සඳහන් වේ.

මෙයට අවශ්‍ය ඉතා සුළු ප්‍රතිපාදන ප්‍රමාණය වෙනුවට 2001-02 මාසයේ  සිට 2014-05 මාසය දක්වා ඉන්දියානු රජයේ සමස්ත වියදමින් ළමුන් සඳහා සෞඛ්‍ය පහසුකම් සැපයීමට වෙන් කර ඇත්තේ 0.28 - 0.31 ප්‍රතිශතයක් පමණක් බව යුනිසෙෆ් අධ්‍යයනයක් මගින් හෙළිදරව් විය. මේ ප්‍රවණතාවය තවදුරටත් ගෙන යමින් මෑත වර්ෂයන්හි දී රජයන් විසින් සෞඛ්‍ය ප්‍රතිපාදනයන්ගේ 20% ක් වූ විශාල ප්‍රතිශතයක් කපා හැරි අතර රජයේ 2015 ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්ති කෙටුම්පත විසින් ම පෙන්වා දෙන පරිදි මිලියන 63 ක් වූ ඉන්දියානු ජනතාව සෑම වසරකම දරිද්‍රතාවයට මුහුණ දෙති.

ඉන්දියාවේ විවිධ සංස්ථාවන් හා විශාල ආයතන විසින් ණය ලබා ගෙන ඒවා පෙරළා නොගෙවා පැහැර හැරීමට යොදන ආරූඪ යෙදුම හෙවත් ලාභ නොලබන වත්කම් (NPA) හේතුවෙන් මේ තත්ත්වය නැවත නැවතත් සිදුවී ඇත. අපි සංඛ්‍යාත්මක දත්ත සලකා බලමු. ඉන්දියාවේ හඡ් වටිනාකම් 2008 සැප්තැම්බර් හි වූ රු. කෝටි 53,917.00 සිට 2015 සැප්තැම්බර් වන විට රු. කෝටි 3,416,41.00 දක්වා වර්ධනය වී තිබේ. මෙය ඉන්දියාව විසින් සමාජ අංශය වෙනුවෙන් වැය කරන මුදලට වඩා බොහෝ ඉහළ අගයකි.

කලාපයේ අනෙකුත් රටවල් ඇත්තේ ද යහපත් තත්ත්වයක නොවේ. උදාහරණ ලෙස 2014 දී පකිස්ථානය සමස්ත අයවැයෙන් සෞඛ්‍ය වෙනුවෙන් වෙන්කර ඇත්තේ 0.9% ක් තරම් ඉතා අවම

ප්‍රතිශතයකි. එම වසරේ දී බංග්ලාදේශය 0.8 ක් ද, පිලිපීනය 1.6 ක් ද, කාම්බෝජය 1.3 ක් ද, ඉන්දුනීසියාව 1.1 ක් ද මේ සඳහා වෙන් කළ නමුත් කලාපයේ ඉහළම තත්ත්වයක් පෙන්නුම් කරමින් නේපාලය හා ශ්‍රී ලංකාව පිළිවෙළින් 2.3 හා 2.0 ක ප්‍රතිශතයක් වෙන් කර තිබුණ ද ඔවුන්ගෙන් ද අපේක්ෂා කළ තවත් බොහෝ සාධක ඉතිරි වී තිබේ.

රටවල් තුළ කුසගින්න තවදුරටත් හිස එසවීමට හේතුව වශයෙන් එම රටවල් සමස්ථ අයවැයෙන් මේ තරම් අවම මුදලක් පමණක් මේ සා වැදගත් හා මූලික අවශ්‍යතාවයක් සපුරාලීම සඳහා වැය කිරීම පෙන්වා දිය හැකි ය.

කුසගින්න තුරන් කිරීමට හා මූලික සමාජ ආරක්ෂණය ස්ථාපිත කිරීමට වැය කිරීම දිළිඳු ජනතාවට කරන උපකාරයක් වශයෙන් සැලකීම හාස්‍යජනකය. ඇත්ත වශයෙන්ම එය කාර්යක්ෂම ශ්‍රම බලකායක් ගොඩනැගීම තුළින් ආර්ථිකයට දැවැන්ත වාසියක් ගෙන එන හා කුසගින්න හේතුවෙන් ආර්ථිකයට අහිමි වන මානව සම්පත මෙන්ම සෞඛ්‍ය හා අනෙකුත් වියදම් වෙනුවෙන් වැය කරන වළක්වාගත හැකි මුදල් අඩු කරගැනීම සම්බන්ධ ආයෝජනයකි.

සරලව ගත් කළ දරුණු කුසගින්නට මුහුණ දෙන බහුතර ජනතාව, මෙවන් රටවල දේශපාලනඥයන් විසින් නිරන්තරයෙන් අනුශාසනා කරන "ජනගහන ලාභාංශය" ට හානි පමුණුවයි. දිරාපත් වූ කුසගින්නෙන් පෙළෙන, රෝගී ශ්‍රම බලකායක් සිටීම කිසිසේත් ම ශ්‍රම බලකායක් නොමැති වීම හා සමාන තත්ත්වයකි.

මේ කලාපයේ රටවල් කුසගින්න තුරන් කිරීමට ස්ථිර විසඳුම් මෙහෙයවීම පිටුපස ඇත්තේ එක් මූලික සාධකයකි. එනම්, යුක්තිය හා සාධාරණය පිළිබඳ ඔවුන් තුළ කිසිදු අදහසක් නොමැති වීමයි. මේ තත්ත්වය පෙරළා එම කලාපයේ පුරවැසියන් තුළට ද මුල්බැස තිබීම කණගාටුදායකය. ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රීය මවාපෑම්වලට පිටුපසින් සත්‍ය ලෙසම මේ කලාපයේ රටවල් ක්‍රියාත්මක වන්නේ ඔවුනගේ පෙර සිටි යටත් විජිත පාලකයන් (නේපාලය සැලකීමේ දී වැඩවසම්) හා සමාන ආකාරයෙනි. පාලකයෝ තවමත් සිය බහුතර ජනතාව කිසිදු අයිතියක් නොමැති

ඉවතලිය හැකි කොටසක් සේ සලකති. ඔවුහු සිය පුරවැසියන්ගේ අයිතීන් දඩි සේ නොසලකා හරින අතර ඒ හරහා දරුණු කුසගින්නට නිරාවරණය වන පුද්ගලයෙකුට කිසිසේත් අත්පත් කරගත නොහැකි අභිමානයකින් යුතුව ජීවත්වීමේ අයිතිය ද නිසඟයෙන් ම අහිමි වී යයි.

කණගාටුදායක ලෙස දිගින් දිගට ම මේ රටවල දැකිය හැකි සක්‍රීය නීති පද්ධතියක් නොමැති වීම අගතියට පත් පුරවැසියන්ට ඒ සඳහා සහනයක් ලබා ගැනීමේ අවස්ථාව ද අහිමි කරයි. ඒ හේතුවෙන් ඔවුනට දිගින් දිගටම කුසගින්නෙන්, කුරුඹවින්, දිරාපත් වෙමින් අර්ධ මනුෂ්‍යයන් ලෙස පැවතීමට බල කරනු ලබයි.

ඇත්තෙන් ම ක්‍රියාකාරී බවක් මවාපාන නමුත් ඇත්තෙන් ම සම්පූර්ණයෙන් අක්‍රීය ව පවතින රාජ්‍ය ආයතන කුසගින්න හා සාගතය තුරන් කිරීමට අසමත් වූ සියලු රටවල දැකිය හැකි පොදු වූ ලක්ෂණයකි. පෙර කී පරිදි මේ හරහා කුසගින්නට පත් පුරවැසියන් සහනයක් සොයා යාමේ සියලු උත්සාහයන් අහිමි කෙරේ. මේ රටවල රාජ්‍ය ආයතනවල පිරිහීම ගැඹුරට කා වැදී ඇත. ඔවුනගේ සමාජ සුභසාධන ආයතන පැවතිය ද සාමාන්‍යයෙන් ඒවා කෙතරම් දූෂිත හා අකාර්යක්ෂම වේද යත් දිළිඳු ජනතාව වෙත කුමන හෝ සහනයක් ළඟා නොවන අතර ඒවා පද්ධතියට කා වැදි ඇති සාධක අතර අතුරුදහන් වී යයි.

තදබදයෙන් පිරී ගිය වැඩ බරෙන් පීඩිත වු මූල්‍ය හා මානව සම්පත් අවම මට්ටමින් පවතින බොහෝ විට දූෂිත වු නීති ආයතන අගතියට ජනතාවට යුක්තිය කරා ළඟා වීම ප්‍රතික්ෂේප කිරීමේ කෲරතර චක්‍රය සම්පූර්ණ කරයි. මෙහි අවසන් ප්‍රතිඵලය පිළිබඳ ගැරී හෝගන් හා වික්ටර් බ්‍රෝටෝස් ඔවුන්ගේ ඔයැ බදජම්එ ැලෛජඑ නම් කෘතියේ විශිෂ්ට ලෙස කැටි කොට දක්වති. රටවල් දරිද්‍රතාවය නම් චක්‍රයේ සිරවී සිටිනුයේ අධිකරණ පද්ධතියේ හා නීතිය බලගැන්වීමේ අසාර්ථකත්වය හා රජයන් දිනපතා දිළින්දන් ව එදිනෙදා ප්‍රචණ්ඩත්වයෙන්, වහල්භාවයෙන් හෝ බලහත්කාරයෙන් සේවයේ යෙදවීමෙන් මුදවීමෙහි නියැළී සිටින බැවින් බව ඔවුහු පවසති. රජයන් හෝ ලෝක සමාජ වෙත කුසගින්න හා සටන් කිරීමේ දහසක් උපායමාර්ග තිබිය හැකි

ය. එහෙත් එම රජයන්ට සත්‍ය වශයෙන් ම දරිද්‍රතාවය හා කුසගින්න අවසන් කිරීමට අවශ්‍ය නම් ඔවුහු බිම් මට්ටමේ නිවර්තන යාන්ත්‍රණයන් සම්පාදනය කළ යුතුය. දිළින්දන් හා සමාජයෙන් කොන් වූවන් දිගින් දිගටම කුසගිනි හා දරිද්‍රතා චක්‍රයේ සිර කරමින් ඔවුන් වෙත ප්‍රචණ්ඩත්වය මුදාහරින රාජ්‍ය මෙන් ම රාජ්‍ය නොවන සාධකයන් හෙවත් පීඩකයන්ට එරෙහිව සටන් කළ යුතුය. මේ නිවර්තන යාන්ත්‍රණයන් යනු අනෙක් නොව සක්‍රීය අධිකරණ පද්ධති, සියලු දෙනාට සමානාත්මතාවයකින් සැලකීම, අපරාධකරුවන්ට කඩිනමින් දඬුවම් කිරීම හා අවසන් කිරීම හා අවසන් වශයෙන් අසාධාරණයට ලක් වූ වින්දිතයන් ට සහනයක් සැලසීමයි.

ඉන්දියාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සමාජ යුක්තියේ මුල් පුටුවක් වූ මැදහත් විනිශ්චයවරුන් දෙපළක් වන මධන් බී. ලෝකුර් හා යු. යු. ලලිත් 2015 සැප්තැම්බරයේ දී මේ ගැටළුව සාරාංශගත කර දැක්වූහ. ඒ හා සමඟ ම ඉන්දියානු රජය විසින් නිර්මාණය කරන එකිනෙක "නොගැළපෙන" "උත්කර්ෂවත් උපාය මාර්ගයන්" හා ඒවා ක්‍රියාත්මක කිරීමේ කණගාටුදායක තත්ත්වය හේතුවෙන් බිම් මට්ටමේ සත්‍යතාවයන් තුළ පරිවර්තනයක් ඇති නොවීම විවේචනයට ලක් කිරීම ද සිදු කළහ.

බොහෝ යෝජනා ක්‍රමයන්, පනත් හා පරක් තෙරක් නොමැති ක්‍රියාපටිපාටීන් ඇසුරෙන් කුසගින්නට එරෙහිව සටන් කිරීම පිළිබඳ මූල්‍ය ප්‍රතිපාදන හෝ නියාමනයක් නොමැති හුදු පොරොන්දු අතර වන මේ නොගැළපීම ඉන්දියාවේ පමණක් නොව මේ කලාපය පුරා දක්නට ලැබෙන නොනවතින කුසගින්න පිටුපස ඇති මූලික හේතුවයි. අවාසනාවකට ප්‍රතිපාදන ගැටළුවට විසඳුමක් ලැබුණ ද ඉහත අර්බුදය සමනයකට පත් නොවනු ඇත. එයට හේතුව කලාපයට ආවේණික තත්ත්වයක් වන දූෂණය හේතුවෙන් සොරකම්, කාන්දුවීම් හා එළිපිටම සිදුකරන කොල්ලකෑම්වලින් තොරව ජනතාවට සහන ලබාදෙන සක්‍රීය රාජ්‍ය ආයතන නොමැති වීමයි.

# කුසගින්න මුලිනුපුටා දැමීමේ මාර්ගය පොදු ආයතන සවිබලගැන්වීමයි. (04)

යමෙකු දරුණු කුසගින්නෙන් හෝ සාගතයෙන් පීඩා විඳින්නේ නම්, ඔවුනට එක්සත් ජාතීන්ගේ මහ සමුළුවේ 217 වන යෝජනාව අනුව 1948 දෙසැම්බර් 10 දින පැරීසියේ දී පැවැත්වූ එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයේ දී සම්මත කරගත් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ (UDHR) ඇතුළත් අයිතීන් බුක්ති විඳිය හැකිවේද? මේ ප්‍රශ්නයට පිළිතුර සරල ය. ඖ්‍යසඍ මගින් සෑම රටකම ජනතාව වෙත තහවුරු කරන ලද මේ අයිතීන් ඔවුනට සිදුකළ කෲර විහිළුවක් පමණක් වනු ඇත.

අවාසනාවකට ප්‍රකාශනය සම්මත වී වසර 67 කට පසුව ද, එය මුළු ලෝකය විසින් ම පිළිගනු ලැබ ගත වු වසර 19 කට පසුව ද තවමත් ලෝකයේ මිලියන ගණනක් වු කුසගින්නෙන් පෙළෙන ආත්මයන් ආහාර වේලෙන් ආහාර වේලට, දිනෙන් දිනට, මාසයෙන් මාසයට මුහුණ දෙන සත්‍යය මෙයයි. ඒ ආරක්ෂිත හා පෝෂ්‍යදායී වූද ප්‍රමාණවත් වූද ආහාර වේලක් ලබා ගැනීමට සියලු දෙනාට ඇති අයිතිය සැබෑ කිරීමයි. කුසගින්නෙන් තොර වීම සෑම පුද්ගලයෙකුගේ ම මූලික අයිතියකි. මේ සංකල්පය ඉදිරිපත් කරන ලද්දේ එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් 1996 නොවැම්බර් 13 දින රෝමයේ දී කැඳවන ලද ලෝක ආහාර සමුළුවේදී ය.

එතැන් සිට ගත වූ කාලය තුළ කුසගින්නෙන් තොර ලෝකයක් ළඟා කර ගැනීමට පැමිණි ගමනේ දී ජයග්‍රහණයන් හා සමානව විශාල පරාජයන් ද අපට දැකගත හැකි විය. 2015 ලෝක ආහාර අනාරක්ෂිතතා තත්ත්වය පිළිබඳ වාර්තාවේ (SOFI) ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ම මෙසේ සඳහන් කරයි. සංවිධානය විසින් ශතවර්ෂ සංවර්ධන ඉලක්ක සපුරාලීම පිළිබඳව නිරීක්ෂණය කරන ලද සංවර්ධනය වෙමින් පවතින රටවල් 129 න් 72 ක් එම ඉලක්ක කරා ළඟා වී ඇත. එහෙත් තවමත් 793 දක්වා අවප්‍රමාණය වී ඇති බව සැබෑ ය. එහෙත් එයින් අපට සෑහීමකට පත්විය හැකිද?

කුසගින්න පිළිබඳ කලාපීය සංඛ්‍යා දත්ත විශ්ලේෂණයේ දී තවදුරටත් ගැටළු ඇති වේ. කුසගින්න තුරන් කිරීමේ හොඳම ආයුධ වශයෙන් හැඳින්වූ ආර්ථික වර්ධනය හා සංවර්ධනය පිළිබඳ ප්‍රකාශනයන් මෙයින් කැඩී බිඳී යයි. උදාහරණ ලෙස ඉන්දියාව සිය කුසගින්නේ පසුවන පුරවැසියන් සම්බන්ධයෙන් වඩාත් අසාර්ථකත්වයට පත් රාජ්‍යයකි. කෙසේ වෙතත් 1970 තෙල් කම්පනයෙන් පසුව ලෝකය මුහුණ දුන් බරපතලම ආර්ථික කඩාවැටීම හමුවේ පවා ඉන්දියාව මේ දශකය තුළ දී රටේ වාර්ෂික සංවර්ධන අගය 7% ක තරම් ඉහළ මට්ටමක දිගින් දිගටම පවත්වාගෙන යාමට සමත් වූයේය. මේ කාල පරිච්ඡේදය තුළදී අනෙකුත් රටවල් කුසගින්න හා ආර්ථික තත්ත්වයෙන් එතරම් යහපත් මට්ටමක නොවූයේ ය. බංග්ලාදේශය වඩාත් හොඳ තත්ත්වයක් අත්කරගත්තේ ය.

දරුණු කුසගින්න පැතිර යාම පිටුපස ඇති හේතු ද එම රටවලට හා ජන කොටස්වලට අනුව විවිධාකාර වේ. සදාකාලිකව කුසගින්නෙන් පීඩාවට පත් අප්‍රිකාවේ බුර බුරා නැගී එන සන්නද්ධ අර්බුද හා කැරලි තව තවත් මිලියන ගණන් ජනතාව කුසගින්න වෙත තල්ලු කරයි. ඉන්දියාව තුළ ද මේ හා සමාන තත්ත්වයක් දැකිය හැකි වුවද එහි ප්‍රචණ්ඩත්වය දේශ සීමා කිහිපයකට පමණක් සීමා වී ඇත. අනෙක් අතට ශ්‍රී ලංකාව දශක තුනක සිවිල් යුද්ධයක් තිබිය දී පවා දැඩි ආහාර අනාරක්ෂිතභාවයකට මුහුණ දුන්නේ නැත. ලොව පුරා මිලියන ගණනක් ජනතාව ආහාර දුලබ වීම හේතුවෙන් ආහාර අනාරක්ෂිතතාවයට මුහුණ දෙති. එහෙත් ඉන්දියාවේ මිලියන ගණනක් ජනතාව කුසගින්නෙන් පෙළෙනුයේ රජයේ ගබඩාවල විශාල සහල් තොග කුණුවෙමින්

යන අතරතුරදීය.

කෙසේ වෙතත්, කුසගින්න හා සාගතය මුලිනුපුටා දැමීමට අසමත් වූ ඒ සියලු රටවල දැකිය හැකි පොදු ලක්ෂණයක් ද වෙයි. පෙනීයන පරිදි ඔවුන්ගේ සියලු රාජ්‍ය ආයතන එක්කෝ අකර්මණ්‍ය ව හෝ එසේ නොමැති නම් ක්‍රියාකාරී බවක් මවා පාන බව එම ලක්ෂණයයි. ඒ හේතුවෙන් කුසගින්නෙන් පෙළෙන පුරවැසියන්ට යම් සහනයක් ලබා ගැනීමට ඇති අවස්ථාව ද මඟහැරී යයි. මේ රටවල රාජ්‍ය ආයතනයන්හි පිරිහීම අධිකරණයේ සිට සමාජ සුබසාධන ආයතන දක්වා ගැඹුරටම කාවැදී ඇති අතර අවසන් ප්‍රතිඵල සෑම විටම සමාන වේ. මේ අවසන් ප්‍රතිඵලය පිළිබඳව ගැරී හෝගන් හා වික්ටර් බෝට්‍රොස් ඔවුන්ගේ ඔයැ බදජම්ඒ ඇෛජඑ නම් කෘතියේ විශිෂ්ට ලෙස කැටි කොට දක්වති. රටවල් දරිද්‍රතාවය නම් චක්‍රයේ සිරවී සිටිනුයේ අධිකරණ පද්ධතියේ හා නීතිය බල ගැන්වීමේ අසාර්ථකත්වය හා රජයන් දිනපතා දිළින්දන්ව එදිනෙදා ප්‍රචණ්ඩත්වයෙන්, වහල්භාවයෙන් හෝ බලහත්කාරයෙන් සේවයේ යෙදවීමෙන් මුදවීමෙහි නියැළී සිටින බැවින් බව ඔවුහු පවසති. රජයන් හෝ ලෝක සමාජය වෙත කුසගින්න හා සටන් කිරීමේ දහසක් උපාය මාර්ග තිබිය හැකි ය. එහෙත් අනිවාර්යයෙන්ම විමසිය යුතු පැනය වන්නේ බිම් මට්ටමින් පීඩකයන්ට එරෙහිව සටන් කිරීමට ඔවුන් ගන්නා පියවර මොනවාද යන්නයි. බොහෝවිට නීතිය ක්‍රියාත්මක කරන්නන් හා සමග එක්ව කුමන්ත්‍රණයේ යෙදෙන මොවුහු ප්‍රතිලාභ හිමිවිය යුතු පුද්ගලයන්ගේ එම ප්‍රතිලාභ සොරා ගන්නේ එයට වන්දි ගෙවීම් පිළිබඳව කිසිදු බියක් ඇති කර නොගනිමිනි.

"කුසගින්න යනු ආහාර හිඟවීම පමණක් නොවේ. එය ක්‍රෑරතර අසාධාරණයකි. එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බැන්-කි-මූන් වෙනත් සන්දර්භයකට අදාළව වුවද ලෝක ආහාර දිනයේ දී ප්‍රකාශ කළේය. සත්‍යයෙන් එතරම් දුරස් වූ තවත් කරුණක් තිබිය නොහැකි ය. අසාධාරණය වන්නේ කුසගින්නේ සිටින මහජනතාව වෙනුවෙන් සේවය කළ යුතු රජයේ ආයතන කුසගින්න තුරන් කළ හැකිව තිබියදී පවා එසේ සේවය නොකිරීමයි. එම ජනතාවට යුක්තිය සෙවීම සඳහා යා හැකි අධිකරණ පද්ධතියක් ද නොමැත. මේ රාජ්‍ය ආයතන තුළ දැවැන්ත ප්‍රතිනිර්මාණයක් හා ප්‍රතිසංවිධානයක් කිරීම පමණක් කුසගින්න තුරන් කිරීමේ ප්‍රධාන මාර්ගය වනු ඇත.

# දුගී වින්දිතයන්ට උපකාර කිරීම (05)

දිළිඳු හා සිය අයිතීන් වෙනුවෙන් පෙනී සිටිය නොහැකි මානව හිමිකම් වින්දිතයන්ට සිදුවන අසාධාරණකම් පිළිබඳ උදාහරණ :

අනෙකුත් ලියවිලිවල දී සාකච්ඡා කරන ලද පොදු ප්‍රතිපත්ති මෙහිදී සත්‍ය ලෙසම ප්‍රායෝගික උදාහරණ වශයෙන් ගෙන සාකච්ඡා කෙරේ. ඒ අනුව දිළිඳු ජනතාවට යුක්තිය ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීම හා ඒ සම්බන්ධයෙන් කඩිනමින් ගත හැකි පියවර මෙන්ම මධ්‍යකාලීන හා දිගුකාලීන වශයෙන් ගත හැකි පියවර ද මෙයට ඇතුළත් වේ.

උදාහරණ 1 - සාවද්‍ය තොරතුරු ලද පොලිස් නිලධාරීන් පිරිසක් එම තොරතුරු තහවුරු කරගැනීමෙන් තොරව පුද්ගලයෙකු වධහිංසනයට පත් කරති. ඔහු එසේ වධහිංසනයට පත් කරනු ලබන්නේ වරදකරුවෙකු බවට සැක කරමින් හෝ විශ්වාස කරමින් ඔහුගෙන් තොරතුරු ලබා ගැනීමේ අරමුණෙනි.

(අ) මෙයට කඩිනමින් ගත හැකි පියවර කුමක්ද? අපගේ පාර්ශ්වකරුවෙකු හරහා තොරතුරු ලැබීමෙන් හා එම තොරතුරු පරීක්ෂා කිරීමෙන් අනතුරුව වහාම අදාළ පුද්ගලයා හිංසනයට බඳුන් කෙරෙන පොලිස් ස්ථානය සෘජුව සම්බන්ධ කරගනිමින් අපට, එනම් ප්‍රාදේශීය මානව හිමිකම් සංවිධානයකට මේ තොරතුරු ලැබී ඇති බවත් එම

පුද්ගලයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අප අවධානය යොමු කරන බවත් ඔවුනට දැන්විය යුතුය.

(ආ) එයට සමගාමීව අදාළ ප්‍රදේශයේ ඉහළ පොලිස් අධිකාරීන්ට ද රටේ උසස් පොලිස් නිලධාරීන්ට ද මේ පිළිබඳ අභියාචනා ඉදිරිපත් කළ හැකි ය. එවිට මේ සිදුවීම පිළිබඳව ඉහළ නිලධාරීන්ගේ අවධානය යොමු වී ඇති බවට අදාළ පොලිස් ස්ථානය දැනුවත් වන අතර ඉහළ නිලධාරීන්ට සිද්ධිය පිළිබඳ දත්ත රැස්කර ගැනීම ද සිදුකළ හැකි ය.

(ඇ) මේ සියල්ලෙන් ප්‍රතිඵලයක් නොවේ නම්, පුද්ගලයන් දහස් ගණනක් සම්බන්ධ කරගනිමින් මේ සිද්ධියට මැදිහත් වී ඒ පිළිබඳව විමර්ශනය කොට අදාළ පුද්ගලයාට ආරක්ෂාව සැපයිය යුතු බවට එයට සම්බන්ධ අධිකාරීන්ට බල කරන ලෙස හදිසි ආයාචනයක් සිදුකළ හැකි ය.

(ඈ) එසේම අදාළ රටෙහි පුවත්පත් වෙත සම්බන්ධ විය හැකි විද්‍යුත් තැපැල ලිපින හා සමාජ මාධ්‍යජාල වෙත මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් එම සිදුවීම මහජන සාකච්ඡාවට බඳුන් වූ කරුණක් බවට පත් කළ හැකි ය.

සාමාන්‍යයෙන් කෙටිකාලීනව මේ ක්‍රමවේද හරහා කඩිනම් ප්‍රතිඵල ලැබිය හැකි බව නිරීක්ෂණය කළ හැකි ය. එයට හේතුව දිළිඳු පුද්ගලයන්ට මෙවැනි වධහිංසනයන් හා නොපනත්කම් සිදුකරනුයේ ඔවුනට එය ප්‍රසිද්ධියට පත් කිරීමට තරම් හැකියාවක් නොමැති බවට විශ්වාස කරමින් වීමයි. එය එසේ සිදුකළ හැකි බවට වටහා ගැනීමෙන් අනතුරුව, ඇත්තෙන් ම අදාළ බලධාරීන් හා මහජනයාගේ අවධානයට එය යොමුවීමෙන් පසු ලැබෙන ප්‍රතිඵලය බොහෝවිට ධනාත්මක වූවකි.

කෙසේ වෙතත්, මෙහිදී අප ගත යුතු පූර්ව ආරක්ෂිත පියවරක් වන්නේ එම පුද්ගලයන්ගේ ආරක්ෂාව තහවුරු කරන ලෙස අභියාචනයක් ඉදිරිපත් කිරීමයි. එයට හේතුව ඔවුන් මුහුණ දුන් අත්දැකීම් පිළිබඳව තොරතුරු ලබා නොදෙන ලෙස ඔවුනට බලපෑම් කළ හැකි බැවිනි. එවන් අවස්ථාවල දී අප එම පුද්ගලයන්ට අවශ්‍ය අවවාද හා මඟපෙන්වීම් ද නීතිමය සහායද ලබා ගැනීම පිළිබඳව අපගේ පාර්ශවකරුවන්ගේ හැකියාව මත විශ්වාසය තැබිය යුතුය.

මේවාට අමතරව සිද්ධිය පිළිබඳව ඊට අදාළ එක්සත් ජාතීන්ගේ ඒජන්සිවලට දැනුම් දීම ද කළ හැකි ය. වධහිංසා හා නොපනත්කම් පිළිබඳ සිදුවීම්වලදී වහාම දැනුම් දිය යුතු වන්නේ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයා හටයි. එවිට එම නියෝජිතයා විසින් නිල මට්ටමින් අදාළ සිදුවීම පිළිබඳව විමසීම් සිදු කිරීමට යොමුවන අතර සිද්ධියට මුහුණ දුන් පුද්ගලයා වෙත ආරක්ෂාව සපයන මෙන් රජයෙන් ඉල්ලීම් කළ හැකි ය.

## මධ්‍යකාලීන පියවර

මධ්‍යකාලීනව යම් පුද්ගලයෙකු වධහිංසනයට බඳුන් කිරීමෙන් අනතුරුව එම පුද්ගලයා නිර්දෝෂී බවත් වධහිංසා කිරීම ප්‍රතිඵල රහිත බවත් පොලිස් නිලධාරීන් තේරුම්ගත් පසුව බොහෝවිට සිදුවන්නේ ඔහුට විරුද්ධව සාවද්‍ය චෝදනා ගොනු කිරීමයි.

එහිදී ඇප ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හෝ සිරගත කරන බවට තර්ජනය කිරීම සිදු විය හැකි ය. සාවද්‍ය චෝදනා ඉදිරිපත් කෙරෙනුයේ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් නම් මේ තත්ත්වය විශේෂයෙන් උද්ගත විය හැකි ය. බොහෝ රටවල මෙය ඉතා බරපතල චෝදනාවක් වන බැවින් නඩු විභාගය අතරතුර දී පවා ඇප ලබාදීම ප්‍රතික්ෂේප කෙරේ. එවන් තත්ත්වයක දී අප පෙර සඳහන් කළ මූලික පියවර ගෙන තිබූයේ නම් මෙහිදී පොලීසිය අනුගමනය කළ උපායමාර්ගයේ සාවද්‍යතාව හා වංචාව පිළිබඳව හෙළිදරව් කරමින් ඒ පිළිබඳ වැඩිදුර විමර්ශනය කරන මෙන් ඉහළ බලධාරින්ට ඉල්ලීම් කළ හැකි ය. ඒ හා සමග මේ සාවද්‍ය චෝදනා පිළිබඳව මාධ්‍ය දැනුවත් කළ හැකිනම් එයද නොසලකා හැරිය නොහැකි තත්ත්වයක් බවට පත්වනු ඇත. තවද, එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයා මේ සිද්ධියට මැදිහත් වෙමින් අදාළ පුද්ගලයාගේ ආරක්ෂාව පිළිබඳ ඉල්ලීම් කරයි නම් බොහෝවිට එම රටේ බලාධිකාරයේ අවධානය මේ වෙත යොමුවෙයි. එවිට මේ ගැටළුව සමථයකට පත් කරගත හැකි ය. තවදුරටත් එසේ ගත හැකි පියවරක් වන්නේ අනුකම්පා සහගත නීතිඥවරයෙකු මාර්ග යෙන් හෝ නීතිඥ ගාස්තු ගෙවීමෙන් හෝ අදාළ සිදුවීම පිළිබඳව අධිකරණයේ අවධානය යොමු කරමින් අදාළ පුද්ගලයාගේ අයිතීන් සුරක්ෂිත කිරීමයි. දිළිඳු පුද්ගලයෙකු මෙවන් සිදුවීමකට මුහුණ දුන්

අවස්ථාවක දී ඔවුනට නීතිඥ ගාස්තු ගෙවීමට තරම් වත්කමක් නොමැති බැවින් යම් සංවිධානයක් මැදිහත්ව නඩුවට පෙනී සිටීමට අනුකම්පා සහගත නීතිඥවරයෙකු සොයා නොගත්තේ නම් ඔවුනට නීති ආධාර නොලැබී යයි.

## දිගුකාලීන පියවර

දීර්ඝ කාලීන පියවරක් වශයෙන් වධහිංසනය පිළිබඳ ගැටළුව මහජනයා අතරට ගෙනයමින් සෑම මට්ටමක දී ම විශේෂයෙන් දිළින්දන් සම්බන්ධයෙන් සිදුවන වධහිංසනයන් තුරන් කිරීම පිළිබඳ නිරන්තර සාකච්ඡාවක් පවත්වාගත හැකි ය. මධ්‍යම පාන්තිකයෙකුට හෝ ඉතා විරල සිදුවීමක් වන ධනවත් අයෙකුට හෝ මෙවන් හිංසනයක් සිදු වූ විට එයට එරෙහිව සටන් කිරීමේ මාර්ග ඔවුන් සතුය. එහෙත් දිළින්දන්ට එසේ සටන් කිරීමේ හැකියාවක් නොමැති බැවින් වධහිංසනයට ලක්වීමට අමතරව සාවද්‍ය චෝදනා මත සිරගත වීමට ද සිදුවිය හැකි ය.

එබැවින් වධහිංසනයට එරෙහි නීති සම්පාදනයට අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් ඇති කිරිම හෝ එවන් නීති දැනටමත් පවතී නම් ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිවර්තනයන් පිළිබඳව හෝ මහජන සාකච්ඡාවක් ගොඩනැගිය යුතුය. ඉහළ බලධාරීන් විසින් වධහිංසනය නැවැත්වීමට ගත යුතු පියවර පිළිබඳව මාර්ගෙ ්පදේශය සකස් කිරීම සම්බන්ධයෙන් මෙවන් අවස්ථාවල දී ශ්‍රේෂ්ඨාධිකරණය වැනි ඉහළ අධිකරණයන්ගේ සහාය ලබාග ැනීම ද වැදගත් වේ. ඒ අනුව පැමිණිලිකරුවෙකු පොලීසිය විසින් සිදුකරන ලද වධහිංසනයක්, නොපනත්කමක්, නීතිවිරෝධී ඝාතනයක්, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමක් හෝ වෙනයම් ප්‍රචණ්ඩ ක්‍රියාවක් පිළිබඳ පැමිණිල්ලක් රැගෙන පැමිණෙන ඕනෑම අවස්ථාවක දී මේ ක්‍රමවේදයන් හරහා කඩිනමින් එම පුද්ගලයාට සහනයක් සැලසීම, මෙන්ම අවශ්‍ය ප්‍රතිපත්තිමය හා නීතිමය වෙනස්කම් සිදු කිරීමට මහජන විවාදයක් ඇරඹීම ද සිදුකළ හැකි ය.

උදාහරණ 2 - මීළඟට අඩු ආදායම්ලාභී කණ්ඩායම්වල ර කියාවලට අදාළ ගැටළු වැනි තරමක වෙනස් ගැටළුවක් සලකා බලමු.

ත්‍රිරෝද රථ රියදුරන් (රික්ෂෝ රියදුරන්ට බොහෝ සේ සමාන) මෙසේ දැඩි අවදානමක සිටින එක් අඩු ආදායම්ලාභී කණ්ඩායමකි. එසේ එක් ත්‍රීරෝද රිය රියදුරු කණ්ඩායමක් සම්බන්ධයෙන් ඇති වූ ගැටළුව මෑතක දී පැන නැගුණු කොවිඩ් 19 තත්ත්වය හා සම්බන්ධ වේ. බොහෝ රටවල පනවන ලද දීර්ඝකාලීන ඇඳිරිනීතිය හා සමාජ දුරස්ථභාවය පිළිබඳ සීමාවන් හේතුවෙන් ඔවුන්ට ප්‍රමාණවත් තරම් ආදායමක් ලැබීමට නොහැකි වූ අතර, ඒ හේතුවෙන් ඔවුනට මාසිකව ෆිනෑන්ස් ආයතනවලට ගෙවිය යුතු වාරික ගෙවීමට නොහැකි වුයේය. ජනතා බලපෑම හේතුවෙන් ඇතැම් රජයන් එවැනි ගෙවීම් සඳහා සහන කාලයක් නම් කළද ඒවා හුදු ප්‍රකාශයන්ට පමණක් සීමා විය. මෙහි ඇතුළත් සිදුවීමේ දී ත්‍රි රෝද රථ ගණනාවක් වාරික ගෙවීම අතපසු වීම හේතුවෙන් ෆිනෑන්ස් ආයතන මගින් ඒ වෙනුවෙන්ම සේවයේ යොදවා ඇති අපරාධ කණ්ඩායම් හරහා ත්‍රී රෝද රිය පැහැර ගැනීමත් සමගම එක් ත්‍රි රෝද රථ සංගමයක නායකයෙකු මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ගියේය. එහි ප්‍රතිඵලය වුයේ ඔහු පැමිණෙන බව දැනගත් ෆිනෑන්ස් ආයතනය මගින් ත්‍රී රෝද රිය පැහැර ගැනීමට සාමාන්‍යයෙන් යොදවන අපරාධ කණ්ඩායමක් යොදවමින් ඔහුට පහර දී මරා දැමීමයි. මේ සිදුවීම හරහා කොවිඩ් 19 වසංගතයේ පැතිරීම හේතුවෙන් අඩු ආදායම්ලාභී කණ්ඩායම්වලට මාසික වාරික ගෙවීමට ලබා දෙන සහන කාලය පිළිබඳව සියලු දෙනාගේ සෘජු අවධානය යොමු විය. ඒ අනුව පහත ක්‍රියාමාර්ග ගනු ලැබිණ.

(අ) සිදුවීමට විශාල ප්‍රසිද්ධියක් ලබාදෙමින් ඝාතනයට සම්බන්ධ සියලු දෙනා හා ඒ පිටුපස සිටි ෆිනෑන්ස් ආයතනයේ නියෝජිතයන් අත්අඩංගුවට ගන්නා ලෙස ඉල්ලා සිටීම.

(ආ) කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ත්‍රී රෝද රථ රියදුරන් මුහුණ දෙන ගැටළු පිළිබඳව ඔවුන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් තොරතුරු රැස්කිරීම. ඒ අනුව රජය වෙත ඉදිරිපත් කිරීම සඳහා නියෝජිතයන් සූදානම් කිරීම. මේ අඩු ආදායම්ලාභී කණ්ඩායමට බලපාන බොහෝ ගැටලු ඇති බව අවබෝධ කරගැනීමෙන් පසුව විස්තරාත්මක තොරතුරු රැස් කිරීම, මාධ්‍ය ආවරණ හා නීති සහාය වැනි සේවාවන් සැපයීම මෙන්ම මේ ගැටළු විසඳීම සඳහා

අධිකාරීන් වෙත ඔවුන් නියෝජනය කරමින් කරුණු දැක්වීම ආදී ඉදිරි පියවර ගන්නා ලදි. මෙසේ එක් හුදකලා සිදුවීමකට මැදිහත්වීමට ඔබ්බෙන් යමින් ඉතා පහළ ආදායම් තත්ත්වයක් සහිත කණ්ඩායමකට අයත් ත්‍රී රෝද රථ රියදුරන්ගේ විශාල පිරිසක් සමඟ සබඳතා ගොඩනැඟීමට සමත් විය. යුක්තිය ළඟා කර ගැනීම සඳහා නීති ආධාර ලබාදීම හා වඩාත් ඉහළ ප්‍රතිලාභ ලැබෙන පරිදි නීති ප්‍රතිසංස්කරණ කරා යොමුවීම වැනි මේ හා සමාන පියවර අනෙකුත් අඩු ආදායම්ලාභී කණ්ඩායම් සම්බන්ධයෙන් ද ගත හැකි බව ඒ අනුව පැහැදිලි වේ.

(ඇ) සාපේක්ෂව අඩු ආදායම්ලාභී කණ්ඩායමකට අයත් පවුලක සාමාජිකයෙකු හට කඩිනමින් ශල්‍යකර්මයක් කිරීමට සිදු වී තිබුණ ද රෝහල විසින් එම ශල්‍යකර්මය වරින්වර කල්දැමීම හේතුවෙන් ඔහුට එම සේවාව ලබාගත නොහැකි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වෛද්‍ය ප්‍රතිකාර ප්‍රමාද වීම නිසා ඔහුට මරණය හෝ වෙනත් බරපතල තත්ත්වයකට මුහුණදීමට සිදුව තිබිණ.

පාර්ශ්වකරුවෙකුගේ මාර්ගයෙන් එම පවුල අප හා සම්බන්ධ වීමෙන් පසුව සමස්ත සිදුවීම අධ්‍යයනයට බඳුන් කර ඒ පිළිබඳව අදාළ රෝහලේ ඉහළම බලධාරියා වෙත ලිඛිතව යොමු කරමින් හැකි ඉක්මණින් මැදිහත් වී මේ ගැටලුව විසඳා දෙන මෙන් අපි ඉල්ලා සිටියෙමු. දින කිහිපයක් ඇතුළත අදාළ බලධාරියා මැදිහත්ව සිද්ධිය පිළිබඳව සොයා බැලීමට වෛද්‍ය කණ්ඩායම් දෙකක් යොමු කළ බවත් ඉතා කෙටි කාලයක් තුළ අවශ්‍ය ප්‍රතිකාර ලබාදෙමින් ශල්‍යකර්මය සිදු කළ බවත් අපට දැනගන්නට ලැබුණි. මේ සිදුවීමට මැදිහත්වීම වෙනුවෙන් පවුලේ සාමාජිකයෝ සිය කෘතඥතාවය පළ කරමින් ලිපියක් එවා තිබුණි.

මේ සිදුවීමේ දී ඍජු නීති ආධාර පිළිබඳ කිසිදු ඉල්ලීමක් නොතිබුණි. එහෙත් අවශ්‍ය බලධාරීන් සමඟ සම්බන්ධ වෙමින් කඩිනමින් අවශ්‍ය ප්‍රතිකාර ලබාදීමේ හැකියාව ලැබුණි.

# ජනශ්‍රැති පාසල් ක්‍රමවේදය (Folk School Methodology) (06)

මේ කෙටි රචනාවේ අරමුණ සඳහා ජනශ්‍රැති පාසල් යන්නෙන් මම අදහස් කරනුයේ එන්. එෆ්. එස්. ගෘන්ඩ්විග් විසින් ඩෙන්මාර්කයේ සංවර්ධනය කළ ජනශ්‍රැති පාසල් ක්‍රමවේදය හා ජනශ්‍රැති ව්‍යාපාරයයි. ඒ හා සමාන ක්‍රමවේදයක් ඇමරිකා එක්සත් ජනපදයේ මයිල්ස් හෝර්ටන් විසින් ද අනුග මනය කරන ලදි. වසර ගණනාවක් පුරා ඩෙන්මාර්කයේ ගත කළ ඔහු එහි වූ එක් එක් ජනශ්‍රැති පාසල් අධ්‍යයනයට ලක් කරමින් පසුව ඇමරිකා එක්සත් ජනපදයේ එම භාවිතාව වර්ධනය කළේය.

පක්ෂපාතීත්වය යන්නෙන් මම අදහස් කරනුයේ සිවිල් සමාජයේ දෘෂ්ටිකෝණයෙන් සමාජයට යමක් ඒත්තු ගැන්වීමේ ක්‍රමවේදයන් හා පුද්ගල අවශ්‍යතාවලට ගැඹුරු අවධානයක් යොමු කරමින් සිදු කෙරෙන ප්‍රතිපත්තිමය හා ප්‍රායෝගිකමය අනුවර්තනයන් ය.

## ජනශ්‍රැති පාසල් ක්‍රමවේදයට ම ආවේණික ලක්ෂණ මෙසේ දැක්විය හැකි ය.

1. එය පාසලක් ලෙස හැඳින්වුව ද ඉන් අදහස් වන්නේ කිසියම් තනි පුද්ගලයෙකු විසින් තවත් පුද්ගල පිරිසකගේ දැනුම වර්ධනය සඳහා සිදු කෙරෙන ඉගැන්වීමක් නොවේ.

මෙහි පාසල යනු යම්කිසි පොදු ගැටළුවක් හෝ කාරණයක් සහිත පුද්ගල පිරිසක් එක්ව ඔවුන් අතර එම ගැටළුව හෝ කාරණය සාකච්ඡාවට බඳුන් කරමින් ඒවා පිළිබඳ පොදු අවබෝධයක් ලැබීම හා ඒවා විසඳීමට ගත හැකි පියවර තීරණය කිරීමයි. එබැවින් එම කණ්ඩායම් බොහෝවිට අදාළ ගැටළුව හෝ කාරණය පිළිබඳ පොදු අවබෝධයක් සහිත පිරිසකගෙන් සමන්විත වීම මේ ක්‍රමවේදයේ දක්නට ඇති අනිවාර්ය ලක්ෂණයකි. ඒ අනුව එය පොදු ගැටළුවක් නොමැති විවිධාකාර පසුබිම් සහිත පුද්ගල කණ්ඩායමකගේ සාකච්ඡාවක් නොවේ.

2. අවබෝධය වර්ධනය කිරීමේ මූලික ක්‍රමවේදය වන්නේ මෙවන් පොදු ගැටළු හෝ කාරණාවලට මුහුණ දෙන පුද්ගලයන් අතර සාකච්ඡාක් ගොඩනැඟීමයි. ඔවුන්ගේ සාකච්ඡා පදනම් වන්නේ බොහෝවිට පිටතින් ලැබෙන තොරතුරු මත නොව බොහෝ කලක් එම ගැටළුවට මුහුණදීම හේතුවෙන් ඔවුන් තුළම කාවැදී ඇති තොරතුරු මත ය. මේ සාකච්ඡාවේ අරමුණ ඔවුන් දැනටමත් දන්නා දේ පිළිබඳව වඩාත් පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම මගින් ඔවුන් පොදුවේ මුහුණ දෙන හා ඔවුනට පොදුවේ ආවේදනය වන මේ ගැටළුව විසඳීමට ගත හැකි ක්‍රියාමාර්ග සෙවීමයි.

3. මේ සාකච්ඡාවල මුඛ්‍ය අරමුණ යමෙකුගේ දැනුම වර්ධනය හෝ රසවින්දනය උදෙසා එක්වීම නොව ඔවුන් පොදුවේ මුහුණදෙන ගැටළුවක් විසඳීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ගය හෝ ක්‍රියාමාර්ග ගවේෂණය කිරීමයි.

4. එම කාර්යයේ ස්වභාවය හේතුවෙන් ම ජනශ්‍රැති පාසල් ප්‍රවීණයෝ එවන් ජනශ්‍රැති පාසල් සැසිවලදී කිසිසේත් මතු වී පෙනීමට උත්සාහ නොදරති. ඉතිහාසය සලකා බලන කල ප්‍රවීණයන් මේ ජනශ්‍රැති පාසල්වලට සහභාගි වූයේ අදාළ ගැටළු පිළිබඳව ජනතාවගේ අන්තර්ඥානයන් අවබෝධ කරගනිමින් ඒ අනුව ඒවා විසඳීම සඳහා අවශ්‍ය උපදෙස් රජයට ලබාදීමටයි. බොහෝ සංවර්ධන ව්‍යාපෘතිවල සැලසුම් අදියරේ දී සිදුවන්නාක් මෙන් පුද්ගලයන් හට කිසියම් වෙනසක්

සිදුකරන ආකාරය පැවසීම වෙනුවට ජනශ්‍රැති පාසලක බොහෝවිට සිදුවන්නේ ප්‍රවීණයන් පැමිණ ගැටළුවෙහි පදනම පිළිබඳව හා ඒ සම්බන්ධයෙන් ඉන් බලපෑමට ලක් වූ ජනතාවගේ දෘෂ්ටිකෝණය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමයි. ප්‍රවීණයන් සතු ප්‍රධාන කාර්යභාරය එයයි. ජනතාව යම් ගැටළුවක් තේරුම් ගන්නා ආකාරය පිළිබඳව ප්‍රවීණයන් තුළ මනා අවබෝධයක් ඇතිවීමෙන් පසු ඔවුහු එම ගැටළුව විසඳීම සඳහා සැලසුම් සකස් කරන රජය හෝ වෙනයම් ආයතනයකට ලබාදිය යුතු උපදෙස් කවරේද යන්න පිළිබඳව ඔවුන් තුළ ඉහළ ප්‍රත්‍යක්ෂතාවයක් ඇතිවේ.

5. මේ අතර පුරවැසියන්ට අවබෝධයක් නොමැති තාක්ෂණික කරුණු පිළිබඳව ප්‍රවීණයන්ගේ දායකත්වය ලබාදිය හැකි ය. එයට හේතුව මෙවන් ගැටළුවලට මුහුණ දෙන බිම් මට්ටමේ පුද්ගලයන් සතුව එවන් තාක්ෂණික කරුණු පිළිබඳව අවබෝධයක් නොමැති වීමයි. ඓතිහාසික ජනශ්‍රැති පාසල්වලට සහභාගීවන්නන්ට ගැටළු විශ්ලේෂණය හා අවබෝධ කර ගැනීම සඳහා අවශ්‍ය භාෂාමය හා ගණිතමය ඉගැන්වීම් ද සිදු කෙරිණි.

6. ප්‍රවීණයන් ඵලදායී භූමිකාවක් නිරූපණය කිරීමට නම් ඔවුහු ජනශ්‍රැති පාසලට අයත් සමස්ත මූලෝපායන් හා තමන්ගේ භූමිකාව මනාව අවබෝධ කරගත යුතුය. ඔවුහු එම කාර්යයේ දී පාලකයන් ලෙස නොව හුදු සම්පත් දායකයන් ලෙස හැකි සෑම විටකදී ම අවශ්‍ය සහාය ලබාදීමට සූදානම් ව සිටිය යුතුය.

7. මේ ප්‍රවීණයන් අතර බලාධිකාරය නියෝජනය කරන්නන් සිටි නම් ඔවුහු තම ස්වච්ඡන්දයෙන් මේ සඳහා සහභාගී විය යුතු අතර සමස්ත ක්‍රියදාමය පිළිබඳ පූර්ණ අවබෝධයක් ද ලබාගත යුතුය. එසේ නොමැතිව ජනතාවට හෝ සහභාගී වන්නන්ට කළ යුතු දේ පිළිබඳව නියෝග දීමේ අදහසින් නොපැමිණිය යුතුය. මින් දෙවැනිව සඳහන් කළ කරුණ ඉතා හාස්‍යජනක ලෙස දක්නට ලැබෙනුයේ ඔවුහු යථාර්ථයෙන් ඔබ්බෙහි වූ වෙනස් සීමාසහිත සන්දර්භයක ජීවත්වෙමින්

ඕනෑම සාකච්ඡාවක් අභිබවනය කිරිමට උත්සාහ ගන්නා විටයි. දශක කිහිපයකට පෙර ශ්‍රී ලංකා රජයට එරට ධීවර කර්මාන්තය ඉහළ නැංවීමට අවශ්‍ය විය. රජය විසින් ඒ සඳහා ධීවර කර්මාන්තයට අදාළ යැයි සිතන විවිධ උපාධි සහිත පුද්ගල කණ්ඩායමක් කැඳවමින් ඔවුන්ව ඉතා දියුණු ධීවර කර්මාන්තයක් පවතී යැයි සැලකෙන ජපානය වැනි රටවලට පිටත් කර හැරියහ. ඒ සියලු දැනුම තමන් වෙත උකහා ගත් මේ ප්‍රවීණයෝ ධීවර කර්මාන්තය ඉහළ නැංවීම සඳහා වැඩසටහනක් නිර්මාණය කළහ. කෙසේ වෙතත්, මේ අවස්ථාවේ දී ඒ වන විටත් ප්‍රවීණයන් අතින් නිර්මාණය වූ වැඩසටහන අනුමත කිරීමට පෙර එයට අදාළ ජනතාවගේ යෝජනා ද එක් කළ යුතු බවට තීරණය කෙරිණි. ඒ අනුව ධීවරයන් ගණනාවකගෙන් උපදෙස් ගැනීම ආරම්භ විය. ඒ අතර වසර ගණනාවක් පුරා ධීවර කර්මාන්තයේ යෙදුණු පළපුරුදු ධීවරයන් ද වූයේය. මෙවන් එක් රැස්වීමක දී ප්‍රවීණයෝ පිරිස සිය සැලැස්ම ඉදිරිපත් කරමින් පැමිණ සිටි ධීවර කණ්ඩායමෙන් ඔවුන් ඉස්සන් අල්ලන ආකාරය පිළිබඳව විමසා සිටියහ. ඔබේ දැල්වල දිග හා පළල කීය දැයි ප්‍රවීණයෝ විමසා සිටියහ. ඔවුන් මුහුදු යන බෝට්ටුවල වේගය කොපමණ දැයි විමසූහ. (මේ ප්‍රදේශවල ධීවරයෝ සිය කර්මාන්තයට භාවිත කරනුයේ ලී බෝට්ටු ය.)

එම තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව ඉහත ආකාරයේ දැල් හා ඉහත වේගය සහිත බෝට්ටුවලින් දිනකට ඇල්ලිය හැකි ඉස්සන් ප්‍රමාණය කොපමණක් දැයි ඔවුහු විමසූහ. ධීවරයෝ යම් යම් සංඛ්‍යා ඉදිරිපත් කළහ. එවිට ප්‍රවීණයෝ "රජය විසින් දස ගුණයක් විශාල දැල් හා දස ගුණයක් වේගවත් බෝට්ටු ලබාදුනහොත් ඔබට දස ගුණයක් ඉස්සන් ඇල්ලිය හැකි වේ දැයි" ධීවරයන්ගෙන් විමසූහ. මේ ආකාරයෙන් ප්‍රශ්න කළ විට එක් පළපුරුදු ධීවරයෙක් ඔබ සියලුදෙනාට පිස්සු දැයි කෙළින්ම විමසා සිටියේය. මින් ප්‍රවීණයන් කෝපයට පත්වූවත් ඒ අතර සිටි එක් බුද්ධිමත් පුද්ගලයෙකු ධීවරයාගෙන් ඔබ එසේ විමසන්නේ ඇයි දැයි ඇසුවේය. ධීවරයා එයට මෙසේ පිළිතුරු දුන්නේය. ''ඔබ දන්නවාද අප ඉස්සන් අල්ලන ප්‍රදේශයේ කොතරම් ගල්

තියෙනවා ද කියා? අප භාවිතා කරන දැල් වර්ගය හැර වෙනත් දැල් වර්ගයක් දැමුවොත් ඒවා සියල්ල ඉරී යාවි. ඒවගේම අපි දැන් පාවිච්චි කරන බෝට්ටු වෙනුවට අධි වේග බෝට්ටු යෙදුවොත් ඒවාට මේ ගල් අතරින් යා නොහැකි බව ඔබ දන්නවාද?" එහිදී ධීවරයා පැහැදිලි කිරීමට උත්සාහ ගත්තේ ඔවුන්ගේ කර්මාන්තයේ දී මුහුණදෙන යථා තත්ත්වය හා යම් වෙනස්කමක් කරයි නම් ශතවර්ෂ ගණනාවක් පුරා ධීවර කර්මාන්තයේ යෙදෙමින් හඳුනාගත් වෙනස්කළ නොහැකි තත්ත්වයන් හා මත්ස්‍ය හැසිරීම් රටාවලට ඒ වෙනස්කම් ගැළපිය යුතු බවත් ය. චීනයේ සාමුහිකකරණ ක්‍රමවේද යෝජනා කළ අවස්ථාවේදී ද මේ හා සමාන ගැටළුවක් මීට වඩා දැවැන්ත පරිමාණයෙන් පැන නැංගේය. පක්ෂ දෘෂ්ටිකෝණයන්ගෙන් මඟපෙන්වීම් ලබාගත් ප්‍රවීණයන් හට වගා කරන ධාන්‍ය හා අනෙකුත් බෝග පරිමාණය ඉහළ නැංවීමට අවශ්‍ය වු අතර ඒ සඳහා සැලසුම් සකස් කළහ. අනතුරුව ඔවුහු එක් එක් ගම්මානවලට කිසියම් කාල සීමාවක් තුළ නිපදවිය යුතු අස්වනු ප්‍රමාණය මෙපමණක් යැයි දැනුම් දුන්හ. මේ යෝජනාවන් පිළිබඳව ගොවීන්ගේ උපදෙස් ලබා ගැනීමක් සිදු නොවුණි. ගොවීහු තම ගැටළු ඔවුන් වෙත සන්නිවේදනය කිරීමට උත්සාහ ගත්තහ. කෙසේ වෙතත්, ප්‍රවීණයන් හට ඉහළින් ලැබෙන නියෝගවලට අමතරව වෙනත් කිසිවක් විමසීමට අවශ්‍යතාවයක් නොවූයෙන් කිසිවෙකු ගොවීන් හට කන් නොදුන්නහ. එහි අවසාන ප්‍රතිඵලය වූයේ ලොව දරුණුතම සාගත තත්ත්වයකට තුඩු දුන් සමස්ත කෘෂිකාර්මික ක්ෂේත්‍රයේම සිදු වූ දැවැන්ත කඩාවැටීමයි. මේ හේතුවෙන් මිලියන ගණනක ජනතාවක් මරණයට පත් වූ බව කියවේ. මේ හා සමාන සිදුවීම් රුසියාව, යුක්රේනය, කාම්බෝජය හා තවත් බොහෝ ස්ථානවල සිදු වී ඇත. පරිවර්තනයන් පිළිබඳ ගාමක බලය ශතවර්ෂ ගණනාවක් පුරා එම කාර්යයන්ගේ නියැළී සිටින පුද්ගලයන්ගේ දැනුම තුළින් පැන නොනැඟී අතර විශ්වවිද්‍යාල උපාධි හෝ වෙනයම් ස්ථානයකින් උකහාගත් වියුක්ත දැනුම මත පදනම් වී තිබේ.

එබැවින් ජනශ්‍රැති පාසල යනු සත්‍ය වශයෙන් ම කරුණු පිළිබඳ දැනුවත් හා එසේ දන්නා බවට අනුමාන කරන දෙපිරිසක් අතර වන හුදු සංවාදයක් පමණක් නොවේ. ප්‍රථමයෙන් ම එය යම්

පිරිසක් මුහුණ දෙන ගැටළුවක් හෝ දිගු කාලයක් පුරාවට මුහුණ දුන් ගැටළු මෙතෙක් එක්ව සාකච්ඡා කිරීමට හෝ ඒවා පිළිබඳ ඔවුනගේ අදහස් ගොනු කිරීමට හෝ එම ගැටළු විසඳීමට මාර්ග සෙවීමට අවස්ථාවක් නොලද විටක එක්ව සිදුකරන කාර්යයකි. ඒ අනුව මේ ගැටළු අභිබවා යාමට ඩෙන්මාර්කයේ හා ඇමරිකා එක්සත් ජනපද මිනෙසොටා ආයතනයේ මයිල්ස් හෝර්ටන්ගේ ප්‍රධානත්වයෙන් ගත් උත්සාහයන් මොනවාද? එහිදී සිදු වූයේ ඔවුන්ගේ ගැටළු සාකච්ඡා කිරීමට මෙන් ම ඒවා විසඳීමට උපකාර විය හැකි උපාය මාර්ග පිළිබඳව සාකච්ඡා කිරීමට දීර්ඝ කාලයක් පුරා එක්රැස් වීම සඳහා අවස්ථාවන් සම්පාදනය කිරීමයි. එක්සත් ජනපදයේ, මිනෙසොටා ආයතනයට එසේ පැමිණි පිරිස අතර වූ පුද්ගලයන් දෙදෙනෙකු වූයේ එකල ළාබාල වියේ පසු වූ බාල මාර්ටින් ලූතර් කිංග් හා රෝසා පාර්ක් ය. ඔවුහු දීර්ඝ කාලයක් පුරා ඔවුනගේ ගැටළු පිළිබඳව සාකච්ඡා කළ අතර කළු ජාතික ව්‍යාපාරය මඟට ගෙන ඒමේදී ක්‍රියාත්මක කළ ඇතැම් උපායමාර්ග විස්තර වශයෙන් දශකයකට පමණ පෙර එසේ සාකච්ඡාවට බඳුන් වූ ඒවා වීම සුවිශේෂ තත්ත්වයකි.